| රුහුණ විශ්වවිද්‍යාලයේ සකසුරුවම් හා ණය සමුපකාර සමිතිය (සණසස) විසින් පිරිනමන රන් පදක්කම | ඩී.එස්. ගුණසේතර | කෘෂිකර්ම |
| රුහුණ විශ්වවිද්‍යාලයේ සකසුරුවම් හා ණය සමුපකාර සමිතිය (සණසස) විසින් පිරිනමන රන් පදක්කම | කේ.කුමාරේස්වරන් | කෘෂිකර්ම |
| රුහුණ විශ්වවිද්‍යාලයේ සකසුරුවම් හා ණය සමුපකාර සමිතිය (සණසස) විසින් පිරිනමන රන් පදක්කම | කේ.කුමාරේස්වරන් | කෘෂිකර්ම |
| චීන විද්‍යා ඇකඩමියේ සමුද්‍රීය විද්‍යා දකුණු චීන සාගර ආයතනයේ රන් පදක්කම | ජේ.පී.කේ. අශාන් | ධීවර සහ සාගර විද්‍යා සහ තාක්ෂණ |
| ධීවර හා සාගර විද්‍යා සහ තාක්ෂණ පීඨ රන් පදක්කම | කේ.කේ.ඩී. වමෝදි | ධීවර සහ සාගර විද්‍යා සහ තාක්ෂණ |
| මහාචාර්ය ආර්.එච්. විජයනායක රන් පදක්කම | ඩබ්.එස්.එස්. ගුණසේන | විද්‍යා |
| මහාචාර්ය ඉසබෙල් අට්ටාලි අනුස්මරණ රන් පදක්කම | ඒ.ඩී.ඩබ්. යාපා | විද්‍යා |
| එල්.සී.ද සිල්වා අනුස්මරණ රන් පදක්කම | ඩී.ජී.පී. නයනානි | විද්‍යා |
| මහාචාර්ය අලවත්තාගොඩ ප්‍රේමදාස අනුස්මරණ රන් පදක්කම | එච්.එම්.එම්.වයි. මුදලිගේ | විද්‍යා |
| වසන්ත මොහොට්ටි අනුස්මරණ රන් පදක්කම | එම්.වී. විජේතුංග | විද්‍යා |
| අයි.එෆ්.එස් රන් පදක්කම | ආර්.පී.ටී.යොහානි | විද්‍යා |
| තිස්සවීර සිරිවර්ධනය ජිනසේන අනුස්මරණ රන් පදක්කම | ජී.කේ.එම්. විජේපාල | විද්‍යා |
| මහාචාර්ය ආර්. එම්. රණවීර බණ්ඩා අනුස්මරණ රන් පදක්කම | බී.එම්.එන්. දිල්රුක්ෂි | මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා |
| එල්.ඩබ්.ඒ. වීරසේකර අනුස්මරණ රන් පදක්කම | ආර්.එම්.ආර්.ඒ. රත්නායක | මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා |
| ආචාර්ය ඒ.ඩී.වී. ප්‍රේමරත්න අනුස්මරණ රන් පදක්කම | එම්. ඒ. ජයසිංහ | ඉංජිනේරු |
| කොළඹපටබැඳිගේ ජිනසේන අනුස්මරණ රන් පදක්කම | එස්.පී.පී.ඒ. ගුණවර්ධන | ඉංජිනේරු |
| ලැම්බට් වීරසේකර අනුස්මරණ රන් පදක්කම | ඩී.සී.කේ. දොඩංගොඩ | ඉංජිනේරු |
| එස්.ඩී. ජයසුන්දර අනුස්මරණ රන් පදක්කම | එම්.ජී.ටී.ටී. සෙනෙවිරත්න | ඉංජිනේරු |

# රුහුණ විශ්වවිද්‍යාලයේ උපාධිධාරීන්ගේ රැකියා නියුක්ති තත්ත්වය (පීඨ අනුව)

උපාධි ප්‍රදානෝත්සවය පැවැති අවස්ථාවේ උපාධි අපේක්ෂකයන්න් වෙත ලබාදුන් ප්‍රශ්නාවලියකට ඔවුන් ලබාදුන් ප්‍රතිචාර මත පදනම්වව උපාධි අපේක්ෂකයයන්ගේ රැකියා නියුක්ති තත්ත්වය තීරණය කරන ලදී.

**පීඨ අනුව රැකියා නියුක්ති තත්ත්වය**

| පීඨය | වත්මන් රැකියා නියුක්ති තත්ත්වය % | |
|---|---|---|
| | රැකියා නියුක්ත | රැකියා විරහිත |
| කෘෂිකර්ම | 65 | 35 |
| සම සෞඛ්‍ය විද්‍යා | 80 | 20 |
| ඉංජිනේරු | 85 | 15 |
| ධීවර සහ සාගර විද්‍යා | 82 | 18 |
| මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා | 25 | 75 |
| වෛද්‍ය | 52 | 48 |
| කළමනාකරණ සහ මූල්‍ය | 88 | 12 |
| විද්‍යා | 61 | 39 |



# කොටස V

# ප්‍රාග්ධන ප්‍රධාන අරමුදල් බෙදාහැරීම

## ප්‍රාග්ධන වියදම් 2017 – 2021

| වැය ශීර්ෂ විස්තර | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
|---|---|---|---|---|---|
| ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය සහ වැඩි දියුණුකිරීම | 198,025,863 | 189,318,593 | 105,937,734 | 70,284,007 | 70,281,071 |
| ස්ථාවර වත්කම් අත්කරගැනීම | 379,938,850 | 240,754,338 | 126,307,630 | 202,255,538 | 154,577,171 |
| ඉදිකිරීම් ව්‍යාපෘති | 388,292,469 | 856,316,366 | 81,364,572 | 836,086,912 | 1,409,850,017 |
| මානව ප්‍රාග්ධනය සහ අනෙකුත් සංවර්ධන ව්‍යාපෘති | 2,972,524 | 4,720,832 | 2,898,105 | 794,610 | 1,168,902 |
| පර්යේෂණ ශක්තිමත් කිරීම | 18,052,145 | 6,873,230 | 8,399,894 | 3,064,759 | 1,927,372 |
| **මුළු ප්‍රාග්ධන වියදම් එකතුව** | **987,281,851** | **1,297,983,360** | **324,907,935** | **1,112,485,826** | **1,637,804,533** |

## යටිතල පහසුකම් සංවර්ධන (පුනරුත්ථාපන ව්‍යාපෘති)

| ව්‍යාපෘතියේ නම | ප්‍රදානය කරනු ලැබූ වටිනාකම | වැට් සහිත වටිනාකම | සටහන් |
|---|---|---|---|
| අධ්‍යයන ආයතනික ශාඛාවේ යෝජිත ප්‍රතිසංස්කරණ, රුහුණ විශ්වවිද්‍යාලය, වැල්ලමඩම, මාතර | 2,901,360,00 | 3,133,468.80 | නිමා කරන ලදී |
| නේවාසිකාගාර අංක 03 හි මායිම් තාප්පය ඉදි කිරීම රුහුණ විශ්වවිද්‍යාලය, වැල්ලමඩම, මාතර | 8,455,500.00 | 9,131,940.00 | ලංසු ඇගයීමේ අදියර |
| පිරිසිදුකිරීම් සේවා ව්‍යාපක පුවරුවේ සිට ශ්‍රවණාගාරය දක්වා යෝජිත විදුලි රැහැන් එළිම, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය, වැල්ලමඩම, මාතර | 4,369,480.00 | 4,719,038.40 | ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතී |

| ව්‍යාපෘතියේ නම | ප්‍රදානය කරනු ලැබූ වටිනාකම | වැට සහිත වටිනාකම | සටහන් |
|---|---|---|---|
| ඝාතකාගාරය සඳහා යෝජිත ගොඩනැගිල්ල, කෘෂිකර්ම පීඨය, මාපලාන, කඹුරුපිටිය, රුහුණ විශ්වවිද්‍යාලය, වැල්ලමඩම, මාතර | 9,082,130.00 | 9,808,700.40 | නිමා කරන ලදී |
| මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ සනීපාරක්ෂක පහසුකම් හා පෙහවුම් පහසුකම් වැඩි දියුණු කිරීම, රුහුණ විශ්වවිද්‍යාලය, වැල්ලමඩම, මාතර | 12,605,172.58 | 13,613,586.39 | ලංසු ඇගයීමේ අදියර |
| දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයේ යෝජිත ප්‍රතිසංස්කරණ සහ තාක්ෂණ පීඨයේ ඇලුමිනියම් බෙදුම් ඇදි සවිකිරීම සහ රාක්ක පෙට්ටි වැඩ, ප්‍රාග්ධන වැඩ ශාඛාව, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය සහ ශිෂ්‍ය ආපන ශාලාව, රුහුණ විශ්වවිද්‍යාලය, | - | 8,359,611.48 | ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතී |
| සාමාන්‍ය පරිපාලන සහ ශිෂ්‍ය සුබසාධන ඒකකයේ යෝජිත ප්‍රතිසංස්කරණ, රුහුණ විශ්වවිද්‍යාලය, වැල්ලමඩම, මාතර | - | 8,849,691.72 | ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතී |

# 2021 දෙසැම්බර් 31 දිනට සිදුකරමින් පවතින ඉදිකිරීම් ව්‍යාපෘති

| ව්‍යාපෘති නාමය | පිහිටීම | TCE වටිනාකම (බදු රහිත/ රු. මිලියන) | ව්‍යාපෘති කාලසීමාව | 2021.12.31 දිනට භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| වෛද්‍ය පීඨය සඳහා දොළොස් මහල් ගොඩනැගිලි සංකීර්ණය | වෛද්‍ය පීඨය, කරාපිටිය | 1,179.0 | මාස 12 | 11% |
| වෛද්‍ය පීඨය සඳහා නව දස මහල් මහාචාර්ය වාට්ටු සංකීර්ණය | වෛද්‍ය පීඨය, කරාපිටිය | 1,138.0 | මාස 30 | 15% |
| නාවික අධ්‍යයන සහ නැව් කටයුතු සහ ඉංජිනේරු වැඩහළේ දක්ෂිණ මධ්‍යස්ථානය සඳහා යෝජිත ගොඩනැගිල්ල | මාගාල්ල හා ඉංජිනේරු පීඨය, හපුගල | 436.0 | මාස 24 | 85% |
| තාක්ෂණ පීඨය සඳහා තෙමහල් දේශන ශාලා ගොඩනැගිල්ල | තාක්ෂණ පීඨය, කඹුරුපිටිය | 338.0 | මාස 30 | 97% |
| ප්‍රධාන පරිශ්‍රයේ පවතින ගොඩනැගිලිවල මූලික අළුත්වැඩියා කටයුතු.- ශාරීරික අභ්‍යාස පුහුණු ශාලාව | වැල්ලමඩම, මාතර | 92.0 | මාස 09 | 92% |
| සම සෞඛ්‍ය විද්‍යා පීඨය සඳහා ගොඩනැගිල්ල ඉදිකිරීම (අදියර 1) | සම සෞඛ්‍ය විද්‍යා පීඨය, ගාල්ල | 1,501.0 | මාස 30 | 20% |
| තාක්ෂණ පීඨය සඳහා ලී බඩු සහ මුළුතැන්ගේ උපකරණ සහිත ශිෂ්‍ය ආපන ශාලාව | තාක්ෂණ පීඨය, කඹුරුපිටිය | 41.0 | මාස 08 | 55% |
| උපාධි අධ්‍යයන පීඨය සඳහා මාතර, ශ්‍රී ධර්මාරාම මාවතේ අංක 115 දරන දේපළ ප්‍රතිසංස්කරණය | මාතර කොටුව | 65.0 | මාස 08 | 12% |

# 2021 වසරේ අවසන් කළ ඉදිකිරීම්

| ව්‍යාපෘති නාමය | පිහිටීම | ව්‍යාපෘති වටිනාකම (වැට් බදු රහිතව ප්‍රදානය කරන ලද මිල රු. මිලියන) | ව්‍යාපෘති කාලසීමාව | නිමා කළ දිනය |
|---|---|---|---|---|
| ප්‍රධාන පරිශ්‍රයේ පවතින ගොඩනැගිලිවල ප්‍රධාන අළුත්වැඩියා කටයුතු.- ආරාධිතයන්ගේ නිවස්න | වැල්ලමඩම පරිශ්‍රය | 44.0 | දින 180 | 2021.02.06 |
| කළමනාකරණ හා මූල්‍ය පීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණයේ දෙවන අදියර සැලසුම් කිරීම, ඉදිකිරීම, අධීක්ෂණය, භාවිතයට සුදුසු තත්වයට පත්කිරීම සහ නිමා කිරීම | වැල්ලමඩම පරිශ්‍රය | 198.0 | මාස 24 | 2021.08.31 |
| ප්‍රධාන පරිශ්‍රයේ පවතින ගොඩනැගිලිවල මූලික අළුත්වැඩියා කටයුතු.- තනිකඩ නිල නිවාස | වැල්ලමඩම පරිශ්‍රය | 77.0 | දින 180 | 2021.09.12 |

# කොටස VI

# පීඨ වාර්තා

# කෘෂිකර්ම පීඨය

## පීඨාධිපතිගේ ප්‍රකාශය

2020 වසරේ උගත් පාඩම් තුළින් කොවිඩ්-19 වසංගත තත්ත්වය මැනවින් කළමනාකරණය කර ගැනීමට 2021 වසරේදී හැකි විය. අවස්ථා දෙකකදී රට වසා දැමීම සිදුවූවත්, මනාව සකස් කර ගත් භාවිතාවන් සහ කාර්ය මණ්ඩලයේ කැපවීම මත පීඨයේ අධ්‍යයන වැඩසටහන සහ අනෙකුත් සාමාන්‍ය කටයුතු සැලකිය යුතු මට්ටමකින් ක්‍රියාත්මක විය.

මාර්ගගත ක්‍රමවේදය යොදා ගනිමින් දේශන සහ විභාග පවත්වනු ලැබීය. මාර්ගගතව විභාග පැවැත්වීම පිළිබඳ විස්තීරණ මාර්ගෝපදේශ සම්පාදනය කරන ලද අතර ඒ සඳහා සනාතන සභාවේ අනුමතිය හිමි විය. පීඨයේ ඉගෙනුම් කළමනාකරණ පද්ධති (LMS) මෘදුකාංග පද්ධතිය වැඩි දියුණු කළ නවාංග හා ධාරිතාව සහිතව උත්ශ්‍රේණි කරන ලදී. මාර්ගගත ඉගැන්වීම් හා ඉගෙනුම් ක්‍රියාකාරකම් සහ විභාග සඳහා සහාය වීම පිණිස පරිගණක ඒකකයේ උසස් තත්ත්වයේ ස(ර්)වර තුනක් ස්ථාපිත කරන ලදී . වයි-ෆයි ජාලය පුළුල් කිරීම ද සිදු කරමින් පවතී.

විෂයමාලා සංවර්ධන ක්‍රියාදාමය නිමා කිරීම මෙම වසරේ පීඨයේ සුවිශේෂී ජයග්‍රහණයක් වූ අතර 2019/2020 අධ්‍යයන වසරේදී එය ක්‍රියාවට නංවනු ලැබීය. (2019 උ/පෙළ බඳවා ගැනීම්)

පීඨය වත්මනෙහි කෘෂි - කර්මාන්ත නව්‍යකරණය සහ තාක්ෂණික කළමනාකරණ විද්‍යාවේදී උපාධිය, ආහාර තාක්ෂණ හා පෝෂණවේද විද්‍යාවේදී උපාධිය, භෝග නිෂ්පාදන හා වන තාක්ෂණ විද්‍යාවේදී උපාධිය, ජෛව විවිධත්ව සංරක්ෂණ හා කෘෂි-පාරිසරික පද්ධති කළමනාකරණ විද්‍යාවේදී උපාධිය සහ ව්‍යවහාරික ශාක අණුක ජෛවවේද විද්‍යාවේදී උපාධිය ලෙස උපාධි වැඩසටහන් පහක් පවත්වයි. 2023 වන විට නව උපාධි වැඩසටහන් 2 ක් ආරම්භ කිරීමට පීඨය මේ වන විට කටයුතු කරමින් සිටියි.

යුරෝපීය සංගම් ප්‍රදානය මගින් අරමුදල් සපයන බ්‍රිටේ (BRITAE) ව්‍යාපෘතිය යටතේ සුහුරු කෘෂි පාරිසරික පද්ධති පාදක ප්‍රත්‍යාස්ථිති මධ්‍යස්ථානය (අති නවීන තොරතුරු සන්නිවේදන තාක්ෂන පහසුකම්වලින් සමන්විත සියලු උපකරණ සහිත නවීන සම්පත් මධ්‍යස්ථානය) ස්ථාපිත කිරීම සාර්ථකව සිදු වේ.

මගේ අදහස වනුයේ 2021 වසර තුළ පීඨය සාර්ථකව සිය කාර්යයන් ඉටු කළ බව වන අතර කැපවීමෙන් කටයුතු කරන කාර්ය මණ්ඩලයක් හා ශිෂ්‍යයන් සමග කටයුතු කිරීමට ලැබීම ගැන මම සතුටු වන්නෙමි.

## පීඨ සමාලෝචනය

| වැඩසටහන/ක්‍රියාකාරකම | සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/ නිමැවුම |
|---|---|---|
| අළුතින් හඳුන්වාදුන් පාඨමාලා (පාඨමාලා ඒකක) | SS2102 තෙත්බිම් සම්පත් හා කළමනාකරණය<br>SS2103 පාංශු වෘක්ෂලතා පරිසර විද්‍යාව<br>SS2104 භූ දත්ත සිතියම්කරණය හා විශ්ලේෂණය<br>SS2101 පාංශු ක්ෂුද්‍ර ජීව විද්‍යාව<br>SS2202 බඳුන් ගෙවතු වගාවේ පෝච්චි මාධ්‍යය<br>SS2203 පාංශු සංශෝධන හා අවදානම් කළමනාකරණය<br>SS2204 පාංශු ජෛව භෞතරසායනික ගති විද්‍යාව හා අපවිත්‍රකාරක<br>SS3102 පාරිසරික අධ්‍යයන සඳහා මෙවලම් | |

| වැඩසටහන/ක්‍රියාකාරකම | සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/ නිමැවුම |
|---|---|---|
| අළුතින් හඳුන්වාදුන් පාඨමාලා (පාඨමාලා ඒකක) | SS3103 ඉඩම් පරිහරණ සැලසුම්කරණය<br>SS3105 දේශගුණික විපර්යාස හා පාංශු වායු ස්‍රාව<br>SS3201 පාංශ විද්‍යාවේ ක්ෂේත්‍ර පරිවයන්<br>SS3202 ක්ෂේත්‍ර හඳුනාගැනීම සහ පාංශු කළමනාකරණය<br>SS3204 දත්ත අර්ථ නිරූපණය හා සන්නිවේදනය<br>SS3205 පර්යේෂණ ආරම්භනය හා ප්‍රකාශයට පත් කිරීමේ ආචාර ධර්ම | |
| ජාත්‍යන්තර මට්ටමේ දායකත්වය | ජපානයේ රුයුක්යුස් විශ්වවිද්‍යාලය සමග සර්මකලාපීය කෘෂිකාර්මික වැඩසටහන | |
| ලැබුණු ප්‍රදාන (අරමුණ සහ ප්‍රමාණය)<br>- දේශීය<br>- ජාත්‍යන්තර | එරැස්මස් වැඩසටහන ( BRITAE)<br>SECRA<br>ඒකකය 4 ප්‍රත්‍යාස්ථිතිය<br>BECK ව්‍යාපෘතිය | සර්මකලාපීය කෘෂි පාරිසරික පද්ධතිවල ප්‍රත්‍යාස්ථිතිය ගොඩනැගීම පිළිබඳ විද්‍යාපති උපාධිය<br>විශ්වවිද්‍යාල කර්මාන්ත හවුල්කාරිත්වය<br>ප්‍රත්‍යාස්ථිතිය ගොඩනැගීම |
| පවත්වනු ලැබූ වැඩමුළු/ සම්මන්ත්‍රණ/සම්මේලන (අභ්‍යන්තර හා දේශීය) | තිරසර හරිත ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය- දකුණු පළාත් සභාව සමග සහයෝගයෙන් කෘෂිකර්ම පීඨයේ ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යනාංශය විසින් සංවිධානය කරනු ලැබූ ආහාර සංරක්ෂණ ශිල්පීය ක්‍රම පිළිබඳ පුහුණු වැඩමුළුව | ව්‍යාපාර ඇරඹුම කෙරෙහි උනන්දුවක් දක්වන ගම්මාන මට්ටමේ කුඩා කණ්ඩායම් (සහභාගිකයන් 25 දෙනෙකි) |
| | තිරසර හරිත ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය- දකුණු පළාත් සභාව සමග සහයෝගයෙන් කෘෂිකර්ම පීඨයේ ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යනාංශය විසින් සංවිධානය කරනු ලැබූ වටිනාකම එකතු කළ ආහාර නිෂ්පාදන පිළිබඳ පුහුණු වැඩමුළුව | |
| | දකුණු පළාතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සමග සහයෝගිතාවයෙන් කෘෂිකර්ම පීඨයේ ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යනාංශය විසින් සංවිධානය කරනු ලැබූ විජලීකෘත පළතුරු හා එළවළු පිළිබඳ වැඩමුළුව | දකුණු පළාතේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් (සහභාගිකයන් 15) |
| | දකුණු පළාතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සමග කෘෂිකර්ම පීඨයේ ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යනාංශය විසින් සංවිධානය කරනු ලැබූ ධාන්‍ය ආශ්‍රිත වටිනාකම එකතු කළ ආහාර නිෂ්පාදන පිළිබඳ වැඩමුළුව | දකුණු පළාතේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් (සහභාගිකයන් 30) |
| | තිරසර හරිත ආදර්ශ ගම්මාන පිළිබඳ වැඩමුළුව (වාරිමාර්ග දෙපාර්තමේන්තුව) | |
| | මයුරපුර ප්‍රදේශයේ මහවැලි ගොවීන් සඳහා කාබනික ගොවිතැන පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | ගොවි ප්‍රජාව |
| ප්‍රජා විනිදුම්කරණ ක්‍රියාකාරකම් | කොටපොළ ප්‍රාදේශීය සභාවේ ජල සුරක්ෂිතතාව සහ දේශගුණ විපර්යාස යළි සලකා බැලීම - කොටපොළ ප්‍රදේශයේ ප්‍රජා නායකයන් සඳහා පුරවැසි විද්‍යා වැඩසටහන | සිදුවීමට ආසන්න දේශගුණ ආශ්‍රිත ජල සුරක්ෂිතා ගැටලු සහ ජල සම්පත් සංරක්ෂණය කිරීමේ අවශ්‍යතාවය සහ ජල දූෂණය අධීක්ෂණය කිරීම පිළිබඳව දැනුවත් කිරීමට නියමිත ජල සංවේදී නායකයන් කණ්ඩායමක් (දේශපාලනඥයන්, සිවිල්) |

| වැඩසටහන/ක්‍රියාකාරකම | සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/ නිමැවුම |
|---|---|---|
| ප්‍රජා විභිදුම්කරණ ක්‍රියාකාරකම් | | සමාජය සහ නිලධාරීන්)<br>හඳුනාගැනීම<br>ප්‍රදේශයේ කෘෂිකාර්මික ඵලදායිතාවය කෙරෙහි දේශගුණික විපර්යාසයන්හි බලපෑම හඳුනාගැනීම<br>ප්‍රජා නායකයන් සඳහා ක්‍රියාකාරී සැලැස්මක් යෝජනා කිරීම |
| සබැඳි වැඩසටහන් | සකුරා විද්‍යා සැලැස්ම, සෑම වසරකම පවත්වන ජපාන-ආසියා තරුණ හුවමාරු වැඩසටහන, වැඩසටහන සඳහා සහභාගිවීම පිණිස නිත්‍ය පදනමකින් සාමාජිකයන් 8 දෙනෙකු ජපානයේ සංචාරය කරයි. කොවිඩ්-19 වසංගතය හේතුවෙන් එය මෙම වසරේ මාර්ගගත සැසියක් ලෙස පවත්වන ලදී. රුහුණ විශ්වවිද්‍යාලය සහ ජපානයේ කෝබේ විශ්වවිද්‍යාලය අතර ඇතිකර ගත් අවබෝධතා ගිවිසුම යටතේ 2020 නොවැම්බර් 11 දිනය පුරාම මාර්ගගත සැසියක් ලෙස වැඩසටහන් පැවැත්වුණි.<br>ජපානයේ රුයුක්යුස් විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම උපාධි ආයතනය සහ රුහුණ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨය අතර අවබෝධතා ගිවිසුම යටතේ ජාත්‍යන්තර කෘෂිකර්ම වැඩසටහනේ 2020 වසර සැසිය 2020 නොවැම්බර් 21 සිට දෙසැම්බර් 19 දක්වා සාර්ථකව පවත්වනු ලැබීය. රුයුක්යුස් විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම උපාධි විද්‍යාතනය මෙම වැඩසටහන සම්බන්ධීකරණය කරන ලදී. වත්මනෙහි පවතින වසංගත තත්ත්වය හේතුවෙන් එම වැඩසටහන මාර්ගගත දේශනමාලාවක් ලෙස පවත්වනු ලැබීය.<br>නිවර්තන කෘෂිකර්මය පිළිබඳ දේශන පැවැත්වීම පිණිස එක්සත් ජනපදය, නෙදර්ලන්තය, මයික්‍රොනීසියා, තායිලන්තය, ඉන්දුනීසියාව, ජපානය සහ ශ්‍රී ලංකාව යන රටවල ප්‍රමුඛ පෙළේ විද්වතුන් පහළොස් දෙනෙකුට ආරාධනා කරනු ලැබීය. (විනාඩි 50ක දේශනයක් සහ විනාඩි 10 ක ප්‍රශ්න හා පිළිතුරු සැසියක්) බොගෝර් කෘෂිකර්ම විශ්වවිද්‍යාලය (ඉන්දුනීසියාව), කොන් කේන් විශ්වවිද්‍යාලය (තායිලන්තය), ඉබරාකි විශ්වවිද්‍යාලය (ජපානය), රුයුක්යුස් විශ්වවිද්‍යාලය (ජපානය), සහ රුහුණ විශ්වවිද්‍යාලයේ (ශ්‍රී ලංකාව) කෘෂිකර්ම පීඨයේ දර්ශනපති හා උපාධි අපේක්ෂක සිසුන් 50 දෙනෙකු පමණ වැඩසටහන සඳහා සහභාගි විය.<br>මහාචාර්ය ජී.වයි. ජයසිංහ මහතා "ශ්‍රී ලංකාවේ සහස්‍ර සංවර්ධන ඉලක්ක පිළිබඳ තත්ත්වය" පිළිබඳ දේශනයක් පවත්වන ලදී.<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සී.පී. රූපසිංහ මහත්මිය "ශ්‍රී ලංකාවේ සැබෑ කුරුළු, මැයෙන් දේශනයක් පවත්වන ලදී<br>IAP 2020 සඳහා මහාචාර්ය එස්. විජේතුංග මහතා "ශ්‍රී ලංකාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය: ප්‍රතිපත්ති හා උපායමාර්ග" මැයෙන් දේශනයක් පවත්වන ලදී.<br>ඒකකය 4 ප්‍රත්‍යාස්ථිතිය<br>BECK ව්‍යාපෘතිය<br>එරැස්මස් | |

## ප්‍රකාශන හා දැනුම ප්‍රචාරණය

| කාණ්ඩය | සංඛ්‍යාව |
|---|---|
| උපුටා දැක්වීමේ සුචියේ ඇතුළත් ජාත්‍යන්තර සඟරාවල සම්පූර්ණ නිබන්ධන හෝ කෙටි සන්නිවේදන | 17 |
| උපුටා දැක්වීමේ සුචියේ ඇතුළත් නොවූ ජාත්‍යන්තර සඟරාවල සම්පූර්ණ නිබන්ධන හෝ කෙටි සන්නිවේදන | 18 |
| දේශීය සඟරාවල සම්පූර්ණ නිබන්ධන හෝ කෙටි සන්නිවේදන | 08 |
| මුද්‍රිත වාර්තාවල ඇතුළත් සම්පූර්ණ නිබන්ධන | 06 |
| වාචික ඉදිරිපත් කිරීම්වල සංක්ෂේප | 35 |
| පෝස්ටර් ඉදිරිපත් කිරීම්වල සංක්ෂේප | 09 |
| පොත් | 09 |
| පොත්වල ඡේද | 02 |
| වෙනත් ප්‍රකාශනවල ශාස්ත්‍රීය ලිපි (සඟරා, ජාතික පුවත්පත් ආදිය.) | 05 |
| සංස්කරණ කාර්යය | 01 |
| **එකතුව** | **110** |

# සම සෞඛ්‍ය විද්‍යා පීඨය

## පීඨාධිපතිගේ ප්‍රකාශය

2021 වසර පීඨ ඉතිහාසයේ තවත් එක් සුවිශේෂී වර්ෂයක් විය. කොවිඩ් -19 වසංගතය තත්ත්වය නිසා ඇතිවූ අභියෝග මධ්‍යයේ වුවද, නව තාක්ෂණය හා මානව සම්පත් යොදාගනිමින් ශාස්ත්‍රීය සහ අනෙකුත් ආශ්‍රිත ක්‍රියාකාරකම් සාර්ථකව පැවැත්වීමට සම සෞඛ්‍ය විද්‍යා පීඨයට හැකි වුණි.

රට අගුළු දමා පැවැතියද, සියලු අධ්‍යනාංශ දේශන, ප්‍රායෝගික සහ නිබන්ධන පංති 2021 ඔක්තෝබර් 01 වන දින දක්වා අඛණ්ඩව පවත්වා ගෙන යන ලදී. අධ්‍යයන කටයුතු සාර්ථකව නිමාකිරීමෙන් පසුව පීඨය පහත දැක්වෙන විභාග පවත්වනු ලැබීය.

<u>වෛද්‍ය රසායනාගාර විද්‍යා අධ්‍යනාංශය</u>

වසරාවසාන විභාගය - 4 වන වසර - 2014/2015 (08වැනි) කාණ්ඩය (18/12/2020 - 13/01/2021)
වසරාවසාන විභාගය - 4 වන වසර - 2015/2016 (09 වැනි) කාණ්ඩය (13/12/2021 - 24/12/2021)
වසරාවසාන විභාගය - 3 වන වසර - 2015/2016 (09 වැනි) කාණ්ඩය (29/03/2020 - 09/04/2021)
වසරාවසාන විභාගය - 2 වන වසර - 2016/2017 (10 වැනි) කාණ්ඩය (17/11/2020 - 22/01/2021)
වසරාවසාන විභාගය - 1 වන වසර - 2015/2016 (12 වැනි) කාණ්ඩය (15/11/2021 - 26/11/2021)

<u>හෙද විද්‍යා අධ්‍යනාංශය</u>

8වන අධ්‍යයන වාරවසාන විභාගය - 08 වන කාණ්ඩය (04.01.2021 - 19.01.2021)
7වන අධ්‍යයන වාරවසාන විභාගය - 09 වන කාණ්ඩය (04.10.2021- 08.10.2021)
5වන අධ්‍යයන වාරවසාන විභාගය - 10 වන කාණ්ඩය (18.10.2021-08.11.2021)
3වන අධ්‍යයන වාරවසාන විභාගය - 11 වන කාණ්ඩය (20.04.2021 - 20.05.2021)
1වන අධ්‍යයන වාරවසාන විභාගය - 12 වන කාණ්ඩය (19.01.2021 - 19.02.2021)
6වන අධ්‍යයන වාරවසාන විභාගය - 09 වන කාණ්ඩය (15.12.2020 - 23.12.2020)

<u>ඖෂධවේද අධ්‍යනාංශය</u>

සිව්වැනි ඖෂධවේද උපාධිය - කොටස I - 07 වන කාණ්ඩය (18.03.2021 - 26.10.2021)
සිව්වැනි ඖෂධවේද උපාධිය - කොටස II - 07 වන කාණ්ඩය (08.10.2021 - 26.10.2020)
තෙවැනි ඖෂධවේද උපාධිය - කොටස I - 08 වන කාණ්ඩය (23.04.2021 - 25.10.2021)
තෙවැනි ඖෂධවේද උපාධිය - කොටස II - 07 වන කාණ්ඩය (09.12.2021- 23.12.2021)
දෙවන ඖෂධවේද උපාධිය - කොටස I - 09 වන කාණ්ඩය (22.03.2021 - 07.04.2021)
දෙවන ඖෂධවේද උපාධිය - කොටස II - 09 වන කාණ්ඩය (25.11.2021 - 08.12.2021)
පළමු ඖෂධවේද උපාධිය - කොටස II - 10 වන කාණ්ඩය (08.11.2021 - 19.11.2021)

මීට අමතරව, නොකඩවා සිව්වන වසරටත් පීඨයේ වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණය වන RuFARS – 2021 පීඨයේ පළමු අතත්‍ය පර්යේෂණ සම්මන්ත්‍රණය ලෙස සාර්ථකව පැවැත්වීමට සම සෞඛ්‍ය විද්‍යා පීඨයට හැකි වුණි. මෙම වසරේ අප උද්ධෘත 64ක් ක් ප්‍රකාශයට පත්කරන ලදී.

2021 මාර්තු 21 දින පවත්වන ලද 18 වන ශාස්ත්‍රීය සැසි සහ 17 වන උපකුලපති සම්මාන ප්‍රදානෝත්සවයේ සම සත්කාරකත්වය දැරීමේ භාග්‍යය සම සෞඛ්‍ය විද්‍යා පීඨයට හිමි වුණි.

තවද, තායිලන්තයේ චුලාබෝර්න් උපාධි ආයතනය සහ ජපානයේ අන්තර්ජාතික සීමාවාසී උපද්ශන සේවාවේ ආසියානු සංවර්ධන මධ්‍යස්ථාන සංගමය (ADCA) සමග අවබෝධතා ගිවිසුම් දෙකක් අත්සන් තැබීම පිණිස පීඨය විදේශ කටයුතු දෙපාර්තමේන්තුවේ අනුමතිය අපේක්ෂාවෙන් සිටී. පීඨයේ 13 වන ශිෂ්‍ය කාණ්ඩයේ සමාරම්භක උත්සවය 2020.07.12 දින පැවැත්වූ අතර අධ්‍යනාංශ තුනෙහිම අධ්‍යයන කටයුතු 30.08.2021 දින ආරම්භ කරන ලදී.

2021 වසර තුළ පීඨය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 10ක් පවත්වනු ලැබීය.

**පරිපාලන තනතුරු**

අපගේ ආචාර්යවරු විශ්වවිද්‍යාලයේ පහත දැක්වෙන පරිපාලන තනතුරු ලබා ගන්නා ලදී.

**ප්‍රධානී, ඖෂධවේද අධ්‍යනාංශය** - කේ.ඒ.කේ.ඩී.විජේසේකර මිය (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/ඖෂධවේද අධ්‍යනාංශය)

**උසස්වීම්**

අප ආචාර්යවරුන් පහත පරිදි උසස්වීම් ලබාගන්නා ලදී.

**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - I ශ්‍රේණිය**

ආචාර්ය එස්.කේ. හෙට්ටිහේවා මහත්මිය - ඖෂධවේද අධ්‍යනාංශය

**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - II ශ්‍රේණිය**

ආචාර්ය ආර්.එච්.එම්.පී.එන්. රත්නායක මයා - හෙදවිද්‍යා අධ්‍යනාංශය
ටී.යූ.ඩබ්ලිව්. අබේගුණසේකර මහතා - හෙදවිද්‍යා අධ්‍යනාංශය
ඒ.ඩී.එස්.එස්. කරුණානායක මිය - හෙදවිද්‍යා අධ්‍යනාංශය

**කථිකාචාර්ය (තනතුරේ ස්ථීර කරන ලදි)**

ආචාර්ය ජේ.ඒ.එන්. සඳමාලි මිය - වෛද්‍ය විද්‍යාගාර විද්‍යා අධ්‍යනාංශය
ආචාර්ය කේ.ජී.පී. නිර්මාණි මිය - හෙදවිද්‍යා අධ්‍යනාංශය
ඒ.ඩී.එස්.එස්. කරුණානායක මිය - හෙදවිද්‍යා අධ්‍යනාංශය
ටී.යූ.ඩබ්ලිව්. අබේගුණසේකර මහතා - හෙදවිද්‍යා අධ්‍යනාංශය

**නව බඳවාගැනීම්**

2021 වසර තුළ පහත දැක්වෙන නව සාමාජිකයන් පීඨයට බඳවා ගන්නා ලදී.

ආචාර්ය පී.කේ.එස්. තිසේරා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, වෛද්‍ය විද්‍යාගාර විද්‍යා අධ්‍යනාංශය
කේ.පී.යසරත්න මිය - කථිකාචාර්ය (පරිවාස), ඖෂධවේද අධ්‍යනාංශය
ආචාර්ය එන්.ඩී.ඩී. සිල්වා - කථිකාචාර්ය (පරිවාස), ඖෂධවේද අධ්‍යනාංශය
ජේ. සමරකෝන් මිය - කථිකාචාර්ය (පරිවාස), පීඨාධිපති කාර්යාලය
එන්.සී. ගුණරත්න මිය - කථිකාචාර්ය (පරිවාස), පීඨාධිපති කාර්යාලය

**පීඨ යටිතල පහසුකම් සංවර්ධන කටයුතු**

- සම සෞඛ්‍ය විද්‍යා පීඨය සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් අක්කර 10ක් අත්කර ගැනීම සඳහා රු. මිලියන 15 ක් ලබා දෙන ලදී.
- අදියර 1 ඉදිකිරීම් (අධ්‍යයන ගොඩනැගිල්ල -මහල් 06, පරිපාලන ගොඩනැගිල්ල -මහල් 03 සහ සේවා ගොඩනැගිල්ල -මහල් 02) 2021 වසර පුරා සාර්ථකව සිදුකරන ලදී.
- සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ ශිෂ්‍යයන් සඳහා සියලු උපකරණ සහිත පරිගණක විද්‍යාගාරයක් ස්ථාපිත කිරීමට පීඨයට හැකි විය- උළුවිටිකේ පරිශ්‍රය
- සම සෞඛ්‍ය විද්‍යා පීඨය සඳහා ප්‍රාග්ධන උපකරණ මිලදී ගැනීම පිණිස 2021 වසරේදී රු. මිලියන 07ක් වැය කරන ලදී.

## පීඨ සමාලෝචනය

| වැඩසටහන/ක්‍රියාකාරකම | සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/ නිමැවුම |
|---|---|---|
| අළුතින් හඳුන්වාදුන් උපාධි අපේක්ෂක උපාධි වැඩසටහන් | නව උපාධි වැඩසටහන් සකස් කිරීමේ කටයුතු පීඨය ආරම්භ කරන ලදී. | වැඩි ශිෂ්‍ය සංඛ්‍යාවකට විශ්වවිද්‍යාලයට ඇතුළුවී වෘත්තිමය උපාධි ලබාගැනීමේ ඉඩ ප්‍රස්ථා පුළුල් කරයි. |
| ප්‍රජා සේවා | **<u>හෙදවිද්‍යා අධ්‍යනාංශය</u>**<br>හෙදවිද්‍යා උපාධි අපේක්ෂකයන් සඳහා ප්‍රජා සායනික පත්වීම්. | පවුලේ/ප්‍රජාවේ සෞඛ්‍ය අධ්‍යාපනය, සෞඛ්‍ය ප්‍රවර්ධනය |
| විෂයමාලා සංවර්ධනය | පහත දැක්වෙන නව උපාධි වැඩසටහන් සකස් කිරීම සඳහා අවශ්‍ය කටයුතු පීඨය අඛණ්ඩව සිදු කරන ලදී.<br>• මහජන සෞඛ්‍ය විද්‍යා විද්‍යාවේදී ගෞරව උපාධිය<br>• සෞඛ්‍ය තාක්ෂණ විද්‍යාවේදී ගෞරව උපාධිය<br>(ප්‍රධාන ක්ෂෙත්‍රයන් තුනක්, එනම් කන්තුක තාක්ෂණවේදය, විද්‍යුත් ස්නායු රෝග විනිශ්ච තාක්ෂණවේද ආවරණය කරයි)<br>• සෞඛ්‍ය මැදිහත්වීම් චිකිත්සාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය(සංලග්න හා විකලාංග හා ව්‍යාවෘතික චිකිත්සාව)<br><br>**<u>වෛද්‍ය විද්‍යාගාර සේවා අධ්‍යනාංශය</u>**<br>2019/2020 ශිෂ්‍ය කණ්ඩායම සමගින් වෛද්‍ය විද්‍යාගාර සේවා විද්‍යාවේදී උපාධි වැඩසටහන අධ්‍යයන වාර ක්‍රමය ආරම්භ කරන ලදී.<br>අධ්‍යයන වාර ක්‍රමය අධ්‍යයන සමාසික ක්‍රමයක් බවට පත් කිරීම සඳහා විෂයමාලා සංශෝධනයක් සිදුකරන ලදී.<br>**<u>හෙදවිද්‍යා අධ්‍යනාංශය</u>**<br>හෙද විද්‍යා උපාධි වැඩසටහනේ විද්‍යාවේදී ගෞරව උපාධියේ විෂයමාලාව ප්‍රතිශෝධනය කිරීමේ ක්‍රියාදාමය අධ්‍යනාංශය මේ වන විට සිදුකරමින් පවතියි.<br>**<u>ඖෂධවේද අධ්‍යනාංශය</u>**<br>ඖෂධවේද උපාධි වැඩසටහනේ විෂයමාලාව ප්‍රතිශෝධනය කිරීමේ ක්‍රියාදාමය අධ්‍යනාංශය ආරම්භ කර තිබේ. | වැඩි ශිෂ්‍ය සංඛ්‍යාවකට විශ්වවිද්‍යාලයට ඇතුළුවී වෘත්තිමය උපාධි ලබාගැනීමේ ඉඩ ප්‍රස්ථා පුළුල් කරයි.<br><br>ශිෂ්‍යයන්ට උසස් අධ්‍යාපනය සඳහා විදේශයන්හි රැකියා සඳහා වැඩි අවස්ථා නිර්මාණය වනු ඇතැයි පීඨය අපේක්ෂා කරයි. |
| කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන් | 2021 වසර තුළ ශිෂ්‍යයන් හා අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පීඨය වැඩමුළු ගණනාවක් පැවැත්වූ අතර ඒවායින් කිහිපයක් පහත දැක්වේ.<br>• ජාත්‍යන්තර පශ්චාත් උපාධි අවස්ථා<br>• ඖෂධවේද ශිෂ්‍යයන් සඳහා ඕස්ට්‍රේලියාවේ උපාධි අධ්‍යයන අවස්ථා<br>• මානසික සෞඛ්‍ය පිළිබඳ වැඩමුළුව | අළුතින් බඳවාගත් කාර්යමණ්ඩලය සංවර්ධනය |

| වැඩසටහන/ක්‍රියාකාරකම් | සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/ නිමැවුම |
|---|---|---|
| කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන් | • ඖෂධවේදීන් සඳහා ශ්‍රී ලංකාවේ පවතින වෘත්තිය හැඩගැස්ම හා රැකියා අවස්ථා<br>• දත්ත විශ්ලේෂණය සඳහා SPSS භාවිතය<br>• තොරතුරු මූලාශ්‍ර<br>• පර්යේෂණ සිදුකිරීම සඳහා ක්ෂුද්‍ර ජීවවිද්‍යාත්මක යෙදුම්<br>• රැකියා සම්මුඛ පරීක්ෂණයකට මුහුණ දෙන්නේ කෙසේද<br>• මූලික පර්යේෂණ ක්‍රමවේදය | අළුතින් බඳවාගත් කාර්යමණ්ඩලය සංවර්ධනය |
| ජාතික සංවර්ධනය සඳහා දායකත්වය | **<u>හෙදවිද්‍යා අධ්‍යනාංශය</u>**<br>සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ ශිෂ්‍යයන් හා කාර්ය මණ්ඩලය විසින් පැවැත්වූ කොවිඩ්-19 වසංගතයේ සෞඛ්‍ය හා සමාජීය බලපෑම විමර්ශනය කිරීමේ ප්‍රජා පර්යේෂණය<br><br>හෙදවිද්‍යා උපාධි අපේක්ෂකයන් විසින් ප්‍රජා සංචාර සිදුකිරීම<br>**<u>ඖෂධවේද අධ්‍යනාංශය</u>**<br>ආචාර්ය එච්.ඩබ්.ඒ.එස්.සුබසිංහ මහතා ජාතික ඖෂධ නියාමන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු ලෙස නම් කරන ලදී. | දකුණු ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ආශ්‍රිත ගැටලු/ සංඛ්‍යාලේඛන හඳුනාගැනීම<br><br>සෞඛ්‍ය අධ්‍යාපනය, පවුලේ/ප්‍රජාවේ සෞඛ්‍ය ප්‍රවර්ධනය<br><br>දැනුම ප්‍රචාරණය |
| ජාත්‍යන්තර සංවර්ධනයේදී දායකත්වය | දේශීය සහ අන්තර්ජාතික සෞඛ්‍යරක්ෂණ අවශ්‍යතාවන්ට අදාළ පර්යේෂණ තුනක් අධ්‍යනාංශය විසින් සිදුකරන ලදී.<br><br>ඊට අමතරව, පීඨයේ වාර්ෂික පර්යේෂණ සමුළුව: RuFARS – 2021 තෙවන අනුගාමී වසරටත් සාර්ථකව පවත්වන ලදී. මෙම වසරේ අප උද්ධෘත 56ක් ක් ප්‍රකාශයට පත්කරන ලදී. | දැනුම ප්‍රචාරණය |
| කමිටු සහ ඒවාට සම්බන්ධ සාමාජික සංඛ්‍යාව | විෂයමාලා සංවර්ධන හා ඇගයීම් කමිටුව 10<br>දුක්ගැනවිලි කමිටුව 07<br>නේවාසිකාගාර, ආපනශාලා හා ආරක්ෂකකමිටුව 12<br>පුස්තකාල හා තොතා.කමිටුව 09<br>දේශන ශාලා කමිටුව 03<br>ශිෂ්‍යත්ව කමිටුව 06<br>පර්යේෂණ කමිටුව 07<br>නවක වද මර්ධන කමිටුව 16<br>අත් පොත් කමිටුව 04<br>ක්‍රියාකාරී සැලැස්ම සමාලෝචන කමිටුව 08<br>තාක්ෂණික පැවැරුම් කමිටුව 05 | |
| සම්මාන/පේටන්ට බලපත්‍ර/ විශේෂ සාධන | **<u>වෛද්‍ය විද්‍යාගාර සේවා අධ්‍යනාංශය</u>**<br>කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ 2020 වාර්ෂික අධ්‍යයන සැසිවලදී පී. විජේවර්ධන මියට දෙවන ස්ථානය සඳහා සම්මානය හිමි විය. | කාර්ය මණ්ඩලයේ ගුණාත්මකබව ඉහළ නැංවීම |

| වැඩසටහන/ක්‍රියාකාරකම | සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/ නිමැවුම |
|---|---|---|
| සම්මාන/පේටන්ට බලපත්‍ර/ විශේෂ සාධන | එස්. මහකුමාර, කේ.බී. ගුණවර්ධන සහ සම්පත් ගුණවර්ධන, ගාල්ල දිස්ත්‍රික්කයේ තෝරාගත් පාසල්වල ළමුන් පිටේ එල්ලා ගෙන යන මලුවල බර සහ ගුණාත්මකබව පිළිබඳ ඇගයීම, RuFARS – 2020 හි සිදුකළ පෝස්ටර් ඉදිරිපත් කිරීම සඳහා කුසලතා සම්මානය<br><br>ආචාර්ය ජේ.ඒ.එන්. සඳමාලි මිය ඖෂධවේද පිළිබඳ ඉදිරිපත් කිරීම සඳහා ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය පිරි නමන සම්මානය දිනා ගන්නා ලදී.<br><br><u>**හෙද විද්‍යා අධ්‍යනාංශය**</u><br><br>ආචාර්ය ආර්.එච්.එම්.පී.එන්. රත්නායක රුහුණ විශ්වවිද්‍යාලයේ උපාධි අධ්‍යයන පීඨය විසින් ප්‍රදානය කරන 2020 වසරේ හොඳම පශ්චාත් උපාධි ශිෂ්‍යයාට පිරිනමන සම්මානය දිනා ගන්න ලදී. | |
| පවත්වන ලද වැඩමුළු/ සම්මන්ත්‍රණ/ සම්මේලන (ජාත්‍යන්තර හා දේශීය) | RuFARS – 2021 රුහුණ විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය පීඨයේ පර්යේෂණ සමුළුව, 2021.08.26 -දේශීය<br><br>පළිබෝධනාශක ෆොස්ෆේට් විසවීම පිළිබඳ ආරාධිත දේශනය -මහාචාර්ය මයිකල් එඩ්ල්ස්ටන් , සායනික ධූලකවේදය පිළිබඳ මහාචාර්ය ධූරය, ධූලකවේදය පිළිබඳ මහාචාර්ය සහ ලිස්ටර් පර්යේෂණ ත්‍යාග අධිසාමාජික, භෘත්කන්තුක විද්‍යා මධ්‍යස්ථානය, එඩිංබරෝ විශ්වවිද්‍යාලය, එක්සත් රාජධානිය<br><br>මානසික සෞඛ්‍යය හා ප්‍රථමාධාර වැඩමුළුව- ආචාර්ය හැනා මොරිසේ, ඖෂධවේද පාසල, වුල්වහැම්ප්ටන් විශ්වවිද්‍යාලය, එක්සත් රාජධානිය<br><br>නේවර්බෑන්ක් 8000+ ලීවරණය ජෛවඅනාවරණය සඳහා සමූදීය එකතුව- සහකාර මහාචාර්ය රොහාන් ඩේවිස්,ග්‍රිෆිත් විශ්වවිද්‍යාලය, ඕස්ට්‍රේලියාව<br><br>පශ්චාත් උපාධි සඳහා ඇ.එ.ජනපදයේ ඇති අවස්ථා පිළිබඳ ආරාධිත දේශනය- මහාචාර්ය නිශාන්ත රාජකරුණා, කැලිෆෝනියා බහුතාක්ෂණ රාජ්‍ය විශ්වවිද්‍යාලය, සැන් ලුයිස් ඔබිස්පෝ, කැලිෆෝනියා<br><br><u>ඖෂධවේද අධ්‍යනාංශය</u><br><br>මහාචාර්ය පී.ඒ.බෝල් සහ ආචාර්ය එච්. මොරිසේ පවත්වනු ලැබූ සායනික ඖෂධවේද වැඩමුළුව, වුල්වහැම්ප්ටන් විශ්වවිද්‍යාලය, එක්සත් රාජධානිය<br><br><u>වෛද්‍ය විද්‍යාගාර සේවා අධ්‍යනාංශය</u><br><br>පවත්නා විෂයමාලාව ප්‍රතිශෝධනය හා වාර ක්‍රමය අධ්‍යයන සමාසික ක්‍රමයක් බට පරිවර්තනය කිරීම | කාර්ය මණ්ඩලයේ සහ ශිෂ්‍යන්ගේ ගුණාත්මකබව ඉහළ නැංවීම<br><br>වැඩි ශිෂ්‍ය සංඛ්‍යාවකට විශ්වවිද්‍යාලයට ඇතුළුවී වෘත්තිමය උපාධි ලබාගැනීමේ ඉඩ ප්‍රස්ථා පුළුල් කරයි.<br><br>නවත් සිසුන්ට විශ්වවිද්‍යාල ප්‍රවේශ වීමට සහ වෘත්තීය උපාධි ලබා ගැනීමට ඇති අවස්ථා පුළුල් කිරීම<br><br>ශිෂ්‍යයන් හා ආචාර්ය මණ්ඩලය |

| වැඩසටහන/ක්‍රියාකාරකම | සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/ නිමැවුම |
|---|---|---|
| සබැඳි වැඩසටහන් | <u>හෙදවිද්‍යා අධ්‍යනාංශය</u><br><br>අන්තර්ජාතික සීමාවාසිකත්ව සඳහා ආසියා සංවර්ධන මධ්‍යස්ථාන සංගමය සමග අවබෝධතා ගිවිසුමක් අත්සන් තබන ලදී.<br><br>හෙදවිද්‍යා උපාධි අපේක්ෂකයන් සඳහා සීමාවාසික වැඩසටහනක් ආරම්භ කිරීම පිණිස ජපානයේ ඔසාකාහි අන්තර්ජාතික සීමාවාසිකත්ව උපදේශන සේවාවේ ආසියා සංවර්ධන මධ්‍යස්ථාන සංගමය සහ රුහුණ විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ හෙදවිද්‍යා අධ්‍යනාංශය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් තබන ලදී.<br><br>ස්වීඩනයේ ක්‍රිස්ටියන්ස්ටැඩ් විශ්වවිද්‍යාලය සමග සහයෝගිතාවයෙන් රුහුණ විශ්වවිද්‍යාලය (හෙදවිද්‍යා අධ්‍යනාංශය, සම සෞඛ්‍ය පීඨය) ඇතුළුව ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පහක් විත්ත වික්ෂේපය පිළිබඳ විද්‍යාපති උපාධියක් ආරම්භ කරන ලදී. | |

## ප්‍රකාශන හා දැනුම ප්‍රචාරණය

| කාණ්ඩය | සංඛ්‍යාව |
|---|---|
| උපුටා දැක්වීමේ සුචියේ ඇතුළත් ජාත්‍යන්තර සඟරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 16 |
| උපුටා දැක්වීමේ සුචියේ ඇතුළත් නොවූ ජාත්‍යන්තර සඟරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 01 |
| දේශීය සඟරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 09 |
| මුද්‍රිත වාර්තාවල ඇතුළත් සම්පූර්ණ පත්‍රිකා | 04 |
| වාචික ඉදිරිපත්කිරීම්වල සංක්ෂේප | 28 |
| පෝස්ටර් ඉදිරිපත්කිරීම්වල සංක්ෂේප | 17 |
| පොත්වල ඡේද | 02 |
| වෙනත් ප්‍රකාශනවල ශාස්ත්‍රීය ලිපි (සඟරා, ජාතික පුවත්පත් ආදිය.) | 17 |
| සංස්කරණ කාර්යය | RuFARS 2021 සංස්කරණ මණ්ඩල සාමාජික තාක්ෂණ පැවැරුම් කාර්යාලය (TTO) විසින් නිකුත් කරන RUBlink පුවත් හසුනේ ප්‍රධාන සංස්කාරක ලෙස ආචාර්ය එස්.ආර්.හෙට්ටිහේවා මහතා පත්කරන ලදී |
| **එකතුව** | **94** |

# ඉංජිනේරු පීඨය

## පීඨාධිපතිගේ ප්‍රකාශය

2021 වසර තුල කොවිඩ් වසංගත තත්ත්වය උත්සන්න වීම සහ රජය විසින් පැනවූ නිති හා රෙගුලාසි හේතුවෙන් පීඨයට සිය අධ්‍යයන කාර්යයන් සහ අනෙකුත් ක්‍රියාකාරකම් රැසක් භෞතිකව පැවැත්වීමට නොහැකි විය. 2019 ජනවාරි 1 වනදා සිට පීඨාධිපති ලෙස කටයුතු කරන සිවිල් හා පාරිසරික ඉංජිනේරු විද්‍යා අධ්‍යනාංශයට අනුයුක්ත ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය එච්.පී.සූරියආරච්චි මහතාගේ නායකත්වය යටතේ පීඨය සිය කටයුතු පවත්වා ගෙන යන ලදී.

ශිෂ්‍යයන් 532 කින් සමන්විත 22 වන ශිෂ්‍ය කාණ්ඩය 2021 මාර්තු 24 දින ඉංජිනේරු පීඨයට ඇතුලත් කරගන්නා ලදී. පෙර වසර සැලකිල්ලට ගැනීමේදී 2019 උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල අනුව වැඩිපුර සිසුන් 235 දෙනෙකු සාගර විද්‍යා සහ නාවුක වාස්තු විද්‍යාව (ශිෂ්‍යයන් 10), පරිගණක ඉංජිනේරු විද්‍යා උපාධි වැඩසටහන (ශිෂ්‍යයන් 200)මෙන්ම සිවිල් හා පාරිසරික ඉංජිනේරු විද්‍යා අධ්‍යනාංශය සඳහා අතිරේක බඳවා ගැනීම් (ශිෂ්‍යයන 25) ලෙස පීඨයට බඳවා ගන්නා ලදී.

2019 උසස් පෙළ විභාගයෙන් බඳවාගත් ශිෂ්‍යයන්ට පහසුකම් සැපයීම පිණිස දේශන ශාලා සඳහා ගෘහ භාණ්ඩ සහ ප්‍රතිසංස්කරණ පිරිවැය ලෙස වි.ප්‍ර.කොමිෂන් සභාව රු. මිලියන 101.4 ක් නිදහස් කරන ලදී. පළමු වසරේ ආසන සැකැස්ම හා පළමු වසර සඳහා සපයන ලද උපකරණවලින් කොටසක් සඳහා පීඨය රු. මිලියන 130 ක් වැය කරනු ලැබීය. විශේෂ බඳවාගැනීම් සඳහා මූ රු. මිලියන 100 ක් හා නොගෙවූ ප්‍රාග්ධන සඳහා වූ රුපියල් මිලියන 30ක් මීට අයත් විය. අනෙකුත් ප්‍රමුඛතා අයිතම අතර, අතිරේකව බඳවාගත් ශිෂ්‍යයන් 235 දෙනා සඳහා පරිගණක මධ්‍යස්ථානයක් සංවර්ධනය කිරීම සඳහා අරමුදල් උපයෝගී කරගන්නා ලදී. සාගර විද්‍යා සහ නාවුක වාස්තු විද්‍යා වැඩසටහන් සඳහා මේ වසරේ උපකරණ වෙනුවෙන් රු. මිලියන 100ක් ද වැඩිපුර ශිෂ්‍යයන් බඳවාගැනීම වෙනුවෙන් රු. මිලියන 200 ක් ද පීඨයට ලැබී තිබේ.

ශිෂ්‍යයන් වැඩිපුර බඳවාගැනීම හේතුවෙන් සංවර්ධන ව්‍යාපෘති 24ක් හඳුනාගෙන ඇති අතර එම යෝජනාව අනුමතිය සඳහා දැනටමත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙ වෙත ඉදිරිපත් කර තිබේ. විදුලි හා තොරතුරු ඉංජිනේරු විද්‍යා අධ්‍යනාංශයේ යෝජිත ගොඩනැගිල්ල සඳහා ඉඩම අත්කර ගැනීම පීඨය සම්පූර්ණ කර තිබේ. පැල සිටුවීමේ ව්‍යාපාර පීඨය සංවිධානය කර ඇති අතර 22 වන ශිෂ්‍ය කණ්ඩායම සම්බන්ධ කර ගනිමින් ගස් 1000 ක් සිටුවීමට අපේක්ෂා කෙරේ.

සිවිල් හා පරිසරික ඉංජිනේරු විද්‍යා ක්ෂෙත්‍රයේ විශේෂ උපාධිය හදාරන 19 වන කාණ්ඩයේ උපාධි අපේක්ෂකයන් සඳහා මිනින්දෝරු වැඩ කඳවුරක් 2021 ජනවාරි 26 දින සිට 2021 පෙබරවාරි 7 වනදා දක්වා මාපලාන හා කඹුරුපිටියේ පිහිටි රුහුණ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨ පරිශ්‍රයන්හි පවත්වන්නට යෙදුණි. ජාතික ආධුනිකත්ව සහ කර්මාන්ත පුහුණු අධිකාරියේ සහාය ඇතිව, පීඨයේ ඉංජිනේරු විද්‍යා අධ්‍යාපන මධ්‍යස්ථානය 4 වැනි සහ 6වැනි වසරවල ඉංජිනේරු උපාධි අපේක්ෂකයන් සඳහා දිවයිනේ විවිධ කර්මාන්ත ශාලාවල තෙමස් කර්මාන්ත පුහුණුවක් සඳහා කටයුතු යොදන ලදී. 8වන වර්ෂාර්ධ ශිෂ්‍යයන්ගේ කර්මාන්ත පුහුණු කාල සීමාව 2021 ජූනි 14 සිට 2022 සැප්තැම්බර් 5 වන දින දක්වා සම්පූර්ණ කරන ලදී. රටේ වත්මනෙහි පවතින වසංගත තත්ත්වය පීඨයේ ක්‍රියාකාරකම් කෙරෙහි දැඩි බලපෑමක් ඇතිකරන ලදී. බොහෝ කාර්ය මණ්ඩල සාමාජිකයන් සහ ශිෂ්‍යයන් අධ්‍යයන කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යාම සඳහා උපරිම උත්සාහ දරනු ලැබීය. කාර්ය මණ්ඩල සාමාජිකයන් සහ ශිෂ්‍යයන් සැලකිය යුතු ප්‍රමාණයක් කොවිඩ් -19 වෛරස ආසාදනයට ලක් විය. එනිසා දේශන මාර්ගගතව පැවැත්වූ අතර මාර්ගගත විභාග සාර්ථකව පවත්වන ලදී.

ජපානයේ සයිටමා විශ්වවිද්‍යාලය හා සහයෝගිතාවයෙන් රුහුණ විශ්වවිද්‍යාලයේ සිවිල් හා පාරිසරික ඉංජිනේරු විද්‍යා අධ්‍යනාංශය විසින් ACEPS – 2021 සම්මන්ත්‍රණය සංවිධානය කර පවත්වන ලදී. 2021 ඔක්තෝබර් 07 වන දින තථ්‍යසම වේදිකාවක පවත්වන ලදී.

## පීඨ සමාලෝචනය

| වැඩසටහන/ක්‍රියාකාරකම | සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/ නිමැවුම |
|---|---|---|
| අළුතින් හඳුන්වාදුන් පාඨමාලා (පාඨමාලා ඒකක) | නව මොඩියුලය CE 5253 (ව්‍යාපෘති කළමනාකරණය සඳහා ගොඩනැගිලි තොරතුරුආදර්ශනය) | සිවිල් හා ඉංජිනේරු වැඩසටහන්වල උපාධි අපේක්ෂකයන් |
| | නව මොඩියුලය EE6209 (ජෛව-වෛද්‍ය ඉංජිනේරු විද්‍යාව පිළිබඳ හැඳින්වීමක්) | DEIE/DMME පාඨමාලා දෙකෙම ශිෂ්‍යයන් |
| ප්‍රජා සේවා | IESL දකුණු ශාඛාවේ සහ රුහුණ විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ සහයෝගයෙන් පරිගණක පරිත්‍යාග කිරීමේ ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘතිය | උපාධි අපේක්ෂක ශිෂ්‍යයන් |
| | ගා/ගින්තොට ජාතික පාසලේ 12 ශ්‍රේණියට අළුතින් බඳවාගත් උසස් පෙළ ශිෂ්‍යයන් සඳහා අභිප්‍රේරණාත්මක සම්මන්ත්‍රණයේ ප්‍රධාන දේශක | උ/පෙළ ශිෂ්‍යයන් |
| | "ඉන්ටනෙට් සමාජය" ශ්‍රී ලංකා ශාඛාව විසින් සංවිධානය කරනු ලැබූ "ජල ගුණත්වය" මාතෘකාව පිළිබඳව සාමන්‍ය මහජනයා සඳහා වෙබිනාර් දේශනය | සාමාන්‍ය මහජනතාව |
| | IESL රුහුණ ශාඛාවේ සහයෝගයෙන් පීඨයේ පළමු වසරේ සිසුන් සඳහා පරිගණක බැහැර දීමේ වැඩසටහන | උපාධි අපේක්ෂක ශිෂ්‍යයන් |
| | IESL රුහුණ විධායක කමිටුව ලෙස IESL තරුණ සාමාජික අංශය ගාල්ලේ පාසල් වැඩසටහනක දේශනයක් සංවිධානය කරන ලදී | පාසල් ශිෂ්‍යයන් |
| විෂයමාලා සංවර්ධනය (පාඨමාලා ඒකක/විෂය වැඩි දියුණු කිරීම්) | විදුලි හා තොරතුරු ඉංජිනේරු විද්‍යා වැඩසටහන සඳහා කර්මාන්ත උපදේශන කමිටු රැස්වීමක් | මීළඟ පාඨමාලා ප්‍රතිශෝධන ඉලක්ක කරමින් (2023 සිට ඉදිරියට) |
| | ඩියුක් සම්පත් දායකයන් වන ආචාර්ය එරික් රිවඩ්සන් හා ආචාර්ය ඇන් සැටර්බැක් පැවැත්වූ වැඩමුළු 4 | විෂයමාලාවට නව ඉංජිනේරුමය සැලසුම් මොඩියුලයක් හඳුන්වාදීම |
| කාර්යමණ්ඩල සංවර්ධන වැඩසටහන් | පහත දැක්වෙන සැසි සඳහා සම්පත් දායකයකු: රුහුණ විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලැබූ CCPDHE වැඩසටහනේ "කාලය සහ ආතති කළමනාකරණය" | අළුතින් බඳවාගත් අධ්‍යයන කාර්යමණ්ඩලය |
| | රුහුණ විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලැබූ CCPDHE වැඩසටහනේ ඒකක 2 සැසිය "චින්තාපර භාවිතාව සහ චිත්තවේගී බුද්ධිය" | |
| ජාතික සංවර්ධනය සඳහා දායකත්වය | උසස් පෙළ ප්‍රශ්න පත්‍ර සකස් කිරීම කටයුතු සඳහා සහභාගි විය. | විභාග දෙපාර්තමේන්තුව, අධ්‍යාපන අමාත්‍යාංශය |
| | බලශක්ති තාක්ෂණය හා කළමනාකරණය සඳහා වක්‍රීය ආර්ථිකය පිළිබඳ විද්‍යාපති උපාධි වැඩසටහන සකස් කිරීම සඳහා යුරෝපා සංගම් එරැස්මස්+ අරමුදලින් ක්‍රියාත්මක EUSL බලශක්ති ව්‍යාපෘතියේ සහයෝගිතා පාර්ශවකරුගේ සහදායක | පශ්චාත් උපාධි ශිෂ්‍යයන් |
| | මොරටුව විශ්වවිද්‍යාලයේ ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු විද්‍යා අධ්‍යනාංශයේ ජෛව වෛද්‍ය ඉංජිනේරු විද්‍යා උපාධිය සඳහා IESL උපාධි පිළිගැනීම් මණ්ඩලයේ කණ්ඩායම් සාමාජික | උපාධි අපේක්ෂක හා පශ්චාත් උපාධි ශිෂ්‍යයන් |

| වැඩසටහන/ක්‍රියාකාරකම | සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/ නිමැවුම |
|---|---|---|
| ජාතික සංවර්ධනය සඳහා දායකත්වය | ප්‍රධාන පරීක්ෂකවරයකු ලෙස උසස් පෙළ විභාග කටයුතුවලට සහභාගි විය. 2020 උසස් පෙළ විභාගය ඉංජිනේරු තාක්ෂණය, ප්‍රධාන විභාග පරීක්ෂකවරයකු ලෙස කටයුතු කරන ලදී. | විභාග දෙපාර්තමේන්තුව, අධ්‍යාපන අමාත්‍යාංශය |
| | වෙනත් විශ්වවිද්‍යාලයක සම්පත් දායකයන් ප්‍රමිතිකාරක හා දෙවන විභාග පරීක්ෂකවරු, බාහිර කථිකාචාර්ය: CE61008: මිනුම් කඳවුර | ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය |
| | ගාල්ල දිස්ත්‍රික්කය සඳහා ‘‘ගංවතුර ආරක්ෂණ හා බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ’’ තාක්ෂණ සමාලෝචන කමිටුවේ සාමාජික | පොදු ජනතාව |
| | ඇල්පිටිය මූලික රෝහලේ කොවිඩ් වැළඳුණු රෝගීන් 400 දෙනෙකු වෙනුවෙන් සකස් කිරීමට යෝජිත වාට්ටුවේ අපජල පිරියම් හා අපහරණ පද්ධතිය සඳහා ව්‍යුහාත්මක ඉංජිනේරුවරයකු ලෙස කටයුතු කිරීම (අවශ්‍ය සැලසුම් හා නිර්මාණ ඇඳීම් සිදුකරන ලදී) | සෞඛ්‍ය අමාත්‍යාංශය |
| | ජාතික විද්‍යා පදනමේ රුහුණ විශ්වවිද්‍යාල ඉංජිනේරු පීඨයේ නියෝජිත ලෙස කටයුතු කරන ලදී. | ශිෂ්‍යයන්, අධ්‍යයන කාර්ය මණ්ඩලය |
| | රුහුණ විශ්වවිද්‍යාලයේ IESL සම්බන්ධීකරණ නිලධාරී ලෙස කටයුතු කරන ලදී. | |
| | IESL රුහුණ ශාඛා විධායක කමිටුවේ සාමාජිකයකු ලෙස කටයුතු කරන ලදී. | උපාධි අපේක්ෂකයන්, කාර්ය මණ්ඩලය, ඉංජිනේරු වෘත්තිකයන්, පොදු ජනතාව |
| | ජාත්‍යන්තර ජල සංගමයේ (IWA) ශ්‍රී ලංකා ශාඛාවේ 2021 මැයි 8 වන දින පැවැති පාලන කමිටු රැස්වීම සඳහා සහභාගි වන ලදී. | උපාධි අපේක්ෂකයන්, ඉංජිනේරු වෘත්තිකයන්, පොදු ජනතාව |
| | SOS ළමා ගම්මානයේ සාමාන්‍ය පෙළ ශිෂ්‍යයන් සඳහා 2020 දෙසැම්බර් මාසයේදී ගණිතය සම්මන්ත්‍රණ මාලාවක් පවත්වන ලදී | SOS ළමා ගම්මානයේ ශිෂ්‍යයන් |
| | විදුලි හා තොරතුරු ඉංජිනේරු විද්‍යා අධ්‍යනාංශය අධි ධාරිතා ඉංජිනේරු විද්‍යාවට අදාළ විද්‍යාගාර සැසියක් පවත්වන ලදී. | ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන් 68 දෙනෙකු |
| | ඔම්ඩෙනා ශ්‍රී ලංකා ශාඛාව හරහා මුල පුරන ලද ජාතික AI ව්‍යාපෘති දෙකක් විදුලි හා තොරතුරු ඉංජිනේරු විද්‍යා අධ්‍යනාංශය විසින් සංවිධානය කරන ලදී. (කෘතිම බුද්ධිය භාවිතා කරමින් තේ කොළවල ගුණාත්මකභාවය නිර්ණය කිරීම) | වි.තො.ඉ.විද්‍යා අධ්‍යනාංශයේ උපාධි අපේක්ෂකයන්, විද්‍යා පීඨය |
| | ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මගින් පිරිනමන ඉලෙක්ට්‍රොනික සන්නිවේදන ඉංජිනේරු විද්‍යා පිළිබඳ ඉංජිනේරු තාක්ෂණවේද (ගෞරව) උපාධිය පිළිගැනීම සඳහා ඇගයීම් සමාලෝචන රැස්වීම් දෙකකට සහභාගි විය. | ඉලෙක්ට්‍රොනික විද්‍යා ඉංජිනේරු උපාධි අපේක්ෂක ශිෂ්‍යයන් |
| ප්‍රජා සේවා | අධ්‍යයන මණ්ඩල සාමාජිකයන් බොහෝ දෙනෙකු දකුණු පළාතේ කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ තාක්ෂණික ඇගයීම් කමිටුවල සභාපතිවරුන් ලෙස කටයුතු කරන ලදී. | දේශීය කර්මාන්ත |

| වැඩසටහන/ක්‍රියාකාරකම | සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/ නිමැවුම |
|---|---|---|
| ජාත්‍යන්තර මට්ටමේ දායකත්වය | OWSD එල්ස්වියර් පදනම් සම්මානයේ තේරීම් කමිටු සාමාජිකයකු ලෙස කටයුතු කරන ලදී. | 2022 OWSD එල්ස්වියර් පදනම් සම්මානලාභීන් තේරීම කමිටුව විසින් සම්පූර්ණ කරන ලදී. |
| | ජපානයේ ටෝකියෝ විශ්වවිද්‍යාලයේ නාගරික ඉංජිනේරු විද්‍යා අධ්‍යනාංශයේ උපාධි අපේක්ෂක ශිෂ්‍යයන් සඳහා ආචාර්ය ජී.ජීවී. වම්න්ද මහතා ආරාධිත දේශනයක් පවත්වන ලදී. | ජපානයේ ටෝකියෝ විශ්වවිද්‍යාලයේ නාගරික ඉංජිනේරු විද්‍යා අධ්‍යනාංශයේ උපාධි අපේක්ෂක ශිෂ්‍යයන් |
| | සන අපද්‍රව්‍ය තාක්ෂණය හා කළමනාකරණය සඟරාවේ සමාලෝචකයකු ලෙස කටයුතු කරන ලදී. | විශ්වවිද්‍යාල ප්‍රජාව, පර්යේෂණ ප්‍රජාව, ශිෂ්‍යයන් |
| | ගෝලීය විපර්යාස පර්යේෂණ සඳහා ආසියා ශාන්තිකර ජාල විද්‍යා විවරණිකාවේ සංස්කාරක උපදේශක කමිටුවේ සාමාජිකයකු ලෙස කටයුතු කරන ලදී. | විද්‍යා ප්‍රජාව |
| | 10 වැනි උපාධි අපේක්ෂක පර්යේෂණ සම්මන්ත්‍රණයේ සම්බන්ධීකාරකයකු හා තිරසර සංවර්ධනය සඳහා සිවිල් හා පාරිසරික ඉංජිනේරු විද්‍යා භාවිතාවන්හි ප්‍රගමන පිළිබඳ ජාත්‍යන්තර සමුළුවේ සම්බන්ධීකාරකයකු ලෙස කටයුතු කරන ලදී. | උපාධි අපේක්ෂක පර්යේෂණ කටයුතු ප්‍රකාශයට පත් කිරීම |
| | මැලේසියාවේ TVFTආයතනය ඇගයීම පිණිස APACC ප්‍රතීතන මණ්ඩලයේ සාමාජිකයකු ලෙස කටයුතු කරන ලදී. | |
| | ඉංජිනේරු විද්‍යා SKN සිංහල විද්‍යාලයේ සම්මන්ත්‍රණය සඳහා තාක්ෂණික සහකාරකයකු ලෙස ක විදුලි හා තොරතුරු ඉංජිනේරු විද්‍යා අධ්‍යනාංශය ටයුතු කරන ලදී. | සම්මන්ත්‍රණ සැසි මුලසුන දැරීම |
| කමිටු සහ ඒවාට සම්බන්ධ සාමාජික සංඛ්‍යාව | ඉංජිනේරු විද්‍යා පීඨ මණ්ඩලය 58<br>නීවාස අනු කමිටුව 05<br>පීඨ පර්යේෂණ කමිටුව 08<br>ඉංජිනේරු විද්‍යා අධ්‍යයන මණ්ඩලය 12<br>තො.ස.තා. කළමනාකරණ කමිටුව 06<br>පීඨ දුක්ගැනවිලි කමිටුව 06<br>ගොඩනැගිලි හා ඉඩම් කමිටුව 08<br>ආරක්ෂක කමිටුව 12<br>පීඨයේ තාක්ෂණ පැවැරුම් CEL 05<br>නේවාසිකාගාර හා ආපනශාලා කමිටුව 10<br>ක්‍රීඩා උපදේශන කමිටුව 02<br>ඉංජිනේරු පීඨයේ අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ ඒකකය 10<br>ඉංජිනේරු පීඨයේ ඉංජිනේරු විද්‍යාවේදී උපාධියේ විෂයමාලාව හා අතුරු නීති ප්‍රතිශෝධන අනු කමිටුව 10<br>ඉංජිනේරු පීඨයේ ආචාර ධර්ම සමාලෝචන කමිටුව 06<br>ඉංජිනේරු පීඨයේ නවක වද මර්ධන කමිටුව 11<br>ඉංජිනේරු පීඨයේ පුස්තකාල කමිටුව 07 | |

| වැඩසටහන/ක්‍රියාකාරකම | සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/ නිමැවුම |
|---|---|---|
| කමිටු සහ ඒවාට සම්බන්ධ සාමාජික සංඛ්‍යාව | රුහුණ විශ්වවිද්‍යාලයේ ඉතිහාසය ලේඛන ගතකිරීමේ කමිටුව (විශ්වවිද්‍යාල මට්ටම) සාමාජිකයන් 13 | ආචාර්ය කේ.ජේ.සී. කුමාර මහතා සහ රුහුණ විශ්වවිද්‍යාලය |
| | සංවිධායක කමිටුව, දේශීය පාර්ශවකරුවන් සඳහා ත්‍රී ලංකා ආරම්භක රැස්වීම හා වැඩමුළුව (විශ්වවිද්‍යාල මට්ටම) සාමාජිකයන් 10 | ශ්‍රී ලංකාවේ බලශක්ති අංශයේ කර්මාන්ත |
| | ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතන ප්‍රතීතන කණ්ඩායමේ මඩුලු සාමාජික (මොරවුව විශ්වවිද්‍යාලය ප්‍රදානය කරන ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ ඉංජිනේරු විද්‍යා විද්‍යාවේදී උපාධි වැඩසටහන) | ඊ.එච්. ජයතුංහ මහතා |
| | AMIESL සඳහා ඉංජිනේරු උපාධි වැඩසටහන් පිළිගැනීමේ මඩුලු සාමාජික (ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය විසින් ප්‍රදානය කරනු ලබන විදුලි හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු විද්‍යා උපාධි වැඩසටහනේ ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය) | ඊ.එච්. ජයතුංහ මහතා |
| | FAB ලංකා පදනම පවත්වන ලද DigiEduHack අභියෝග තරඟයේ පූරි මණ්ඩල සාමාජික | ආචාර්ය එස්.එච්.ගුණවර්ධන මයා |
| | ශ්‍රී ලංකා හරිත ගොඩනැගිලි සභාවේ ජාතික හරිත ගොඩනැගිලි ඇගයීම් කණ්ඩායමේ සාමාජික | ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්තය |
| ලැබුණු ප්‍රදාන (අරමුණ සහ ප්‍රමාණය)<br>- දේශීය<br>- ජාත්‍යන්තර | <u>ජාත්‍යන්තර</u><br>පහත දැක්වෙන ප්‍රදානය ලැබුණි උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ධාරිතා ගොඩනැංවීම සඳහා යුරෝපා සංගම් එරැස්මස්+ ප්‍රදානය - ප්‍රදානය: යුරෝ මිලියන 9.8 | ශිෂ්‍යයන්, බලශක්ති අංශයේ සේවකයන් |
| | <u>දේශීය</u><br>දකුණු පළාතේ කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් පර්යේෂණ හා සංවර්ධන අරමුදල් ලැබුණි. ප්‍රදානයේ මුළු වටිනාකම ඇ.ඩො. මිලියන 0.9 (2020-2021) | දේශීය කර්මාන්ත |
| | දකුණු පළාතේ කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් පර්යේෂණ හා සංවර්ධන අරමුදල් ලැබුණි. ප්‍රදානයේ මුළු වටිනාකම ඇ.ඩො. මිලියන 0.9 (2020-2021) | |
| | දකුණු පළාතේ කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් පර්යේෂණ හා සංවර්ධන අරමුදල් ලැබුණි. ප්‍රදානයේ මුළු වටිනාකම ඇ.ඩො. මිලියන 0.1 (2021) | විශ්වවිද්‍යාල ප්‍රජාව, පර්යේෂණ ප්‍රජාව, ශිෂ්‍යයන් |
| | ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවෙන් රු. 500,000 පර්යේෂණ ප්‍රදානය | ආචාර්ය සී.කේ.ඩබ්ලිව් සෙනෙවිරත්න |
| සම්මාන/ පේටන්ට් බලපත්‍ර/විශේෂ සාධන | ජාතික පර්යේෂණ සභාව විසින් පිරනමන විද්‍යාත්මක ප්‍රකාශනය සඳහා වූ කුසලතා සම්මානය | පර්යේෂකයන් |
| | “5G NR ජාලයන්හි විෂමජාතීය mMTC සන්නිවේදනය සඳහා ගතික අවකාශ විභාජනය සහිත ප්‍රමුඛතා බලදායී ප්‍රදාන රහිත ප්‍රවේශය” නම් මාතෘකාවෙන් යුත් පර්යේෂණ පත්‍රිකාව සඳහා IEEE සන්නිවේදන සමිතියේ සන්නිවේදන පද්ධති ඒකාබද්ධ කිරීම හා ආදර්ශන තාක්ෂණික කමිටුව(COMSOC) විසින් 2021 වසර සඳහා හොඳම සහරා පත්‍රිකා සම්මානයේ දෙවන ස්ථානය පිරි නමන ලදී. | ආචාර්ය ටී.එන්. වීරසිංහ<br>ආචාර්ය බී.අයි.ඒ. මෙන්ඩිස් |
| | ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය විසින් සංවිධානය කරනු ලැබූ “සෞඛ්‍ය නව්‍යකරණ සම්මාන 2021” දී විශ්වවිද්‍යාල කාණ්ඩය යටතේ සමස්ත ලංකා 3වන ස්ථානය පිරි නමන ලදී. | පසිඳු කහවෙච්තාන මහතා<br>නුවන් බන්දුලසේන මහතා<br>අශිකා හන්සිනි මිය<br>ආචාර්ය චතුර සෙනෙවිරත්න මහතා |

| වැඩසටහන/ක්‍රියාකාරකම | සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/ නිමැවුම |
|---|---|---|
| සම්මාන/ පේටන්ට් බලපත්‍ර/විශේෂ සාධන | | ආචාර්ය අමරනාත් කරුණානායක (වෛද්‍ය පීඨය, රු.වි.)<br>ආචාර්ය ජගත් ගමගේ මහතා (නොවෙල්ඩා, නෝර්වේ) |
| | 2021 SLASSCOM ජාතික නව නිර්මාණ සම්මාන ප්‍රදාන උළෙලේදී "හොඳම නව්‍යකරණ නිෂ්පාදනය-විශ්වවිද්‍යාල කාණ්ඩය" සම්මානය දිනා ගන්නා ලදී. | ආචාර්ය සී.කේ.ඩබ්ලිව් සේනාරත්න මහතා |
| | SLASSCOM බුද්ධි ස්වයංක්‍රීයකරණයේ පර්යේෂණ අංශයේ විධායක කමිටු සාමාජික | ආචාර්ය එස්.එච්. ගුණවර්ධන මහතා |
| | සෝලාර් EPC සංගමයේ (SEPCA) පළමු වාර්ෂික මහා සභා රැස්වීමේ ප්‍රධාන අමුත්තා | ආචාර්ය කේ.එම්.අයි.යූ. රණවීර මහතා |
| | AIESEC ශ්‍රී ලංකා අංශය විසින් සංවිධානය කරනු ලැබූ ජාතික නායකත්ව සංවර්ධන සමුළු සම්මාන උළෙලේදී සම්මාන දෙකක් දිනා ගන්නා ලදී. | රුහුණ විශ්වවිද්‍යාලයේ AIESEC |
| පවත්වනු ලැබූ වැඩමුළු/සම්මන්ත්‍රණ/සම්මේලන (අභ්‍යන්තර හා දේශීය) | ජාතික හා ජාත්‍යන්තර සමුළුවලදී ජාත්‍යන්තර වැඩසටහන් කමිටු සභාපති හා සැසි සභාපති ලෙස අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් පස් දෙනෙකු කටයුතු කරන ලදී. | දේශීය හා ජාත්‍යන්තර ඉංජිනේරු ප්‍රජාව, විද්වතුන් හා ශිෂ්‍යයන් |
| | අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් බොහෝ දෙනෙකු පුහුණු වැඩසටහන්වල සම්පත් දායකයන් ලෙස කටයුතු කරන ලදී. | දේශීය ඉංජිනේරු ප්‍රජාව |
| | උපාධි අපේක්ෂක පර්යේෂණ සම්මන්ත්‍රණය | අවසන් වසරේ උපාධි අපේක්ෂකයන් (ඔවුන් සියලු දෙනාටම සිය අවසන් වසරේ පර්යේෂණ ව්‍යාපෘතිය ඉදිරිපත් කිරීමේ අවස්ථාව හිමි විය.) |
| | පිලිපීනයේ මැනිලාහි මපුවා විශ්වවිද්‍යාලයේ සම්මන්ත්‍රණයක ප්‍රධාන දෙසුම | සම්මේලනයේ ජාත්‍යන්තර නියෝජිත පිරිස |
| | තිරසර සංවර්ධනය සඳහා සිවිල් හා පාරිසරික ඉංජිනේරු විද්‍යා භාවිතයන්හි ප්‍රගමන පිළිබඳ 8වැනි ජාත්‍යන්තර පරිසංවාදයේ සම්මේලන ලේකම් ලෙස කටයුතු කරන ලදී, (ACEPS-2021), 2021 ඔක්තෝබර් 7 | දේශීය හා ජාත්‍යන්තර ඉංජිනේරු ප්‍රජාව, විද්වතුන්, ශිෂ්‍යයන් |
| | රුහුණ විදුලි හා තොරතුරු ඉංජිනේරු විද්‍යා ආදි විද්‍යාර්ථීන්ගේ සංගමය විසින් සංවිධානය කරනු ලැබූ වැඩමුළු මාලාව- (AAREIE) වැඩමුළු 7<br>1. විදුලිබල පරිණාමකය හා ජාල උප පොළ භූගත කිරීම<br>2. උසස් දත්ත සන්නිවේදන සැලැස්ම, විඩම්බනය හා දෝෂාවේක්ෂණය (කොටස I හා II)<br>3. මීළඟ වසර 5 සඳහා සැලසුම් කිරීම (දේශීය රැකියාවන්ට සාපේක්ෂව ජාත්‍යන්තර රැකියාවන්, ඉගෙනගත යුතු තාක්ෂණවේද, ඔබේ රැකියාව අධිආරෝපණය කරන්න, එළඹෙන අභියෝග)<br>4. කර්මාන්තයකට පුහුණු වන්න: අන්තර්පුද්ගල අන්තර්ක්‍රියාකාරකම්වල සංජානන ප්‍රග්‍රහණය කිරීම.<br>5. ගුවන් සේවාවන් ආශ්‍රිත විද්‍යුත් ඉංජිනේරු විද්‍යාව<br>6. ස්ථාවර ප්‍රවේශ ජාල පරිණාමය (xPON , FTTx) සහ ප්‍රකාශ බෙදාහැරීම් ජාල සැලසුම්කරණය<br>7. රැහැන් රහිත ජාල පරිණාමය (4G LTE සහ 5G) | පීඨයේ උපාධි අපේක්ෂකයන් |

| වැඩසටහන/ක්‍රියාකාරකම | සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/ නිමැවුම |
|---|---|---|
| පවත්වනු ලැබූ වැඩමුළු/සම්මන්ත්‍රණ/සම්මේලන (අභ්‍යන්තර හා දේශීය) | උපාධි අපේක්ෂකයන් සඳහා වෙබිනාර් පහක් පවත්වන ලදි. | පීඨයේ උපාධි අපේක්ෂකයන් |
| | EIES සමග සහයෝගිතාවයෙන් ශ්‍රී ල.ඉ.ආයතනය විසින් සංවිධානය කරනු ලැබූ වැඩ සටහන් දෙකක්. | පීඨයේ උපාධි අපේක්ෂකයන් |
| | QUIZZARD- රුහුණ විශ්වවිද්‍යාලයේ IEEE ශිෂ්‍ය ශාඛාව විසින් සංවිධානය කරනු ලැබූ අන්තර් විශ්වවිද්‍යාල ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන | සමස්ත දිවයිනේ විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් |
| ප්‍රජා විභිදුම්කරණ ක්‍රියාකාරකම් | සැම්සන් ඉන්ටනැෂනල් සමාගමේ නිෂ්පාදන කාර්යක්ෂමතාව ඉහළ නැංවීම පිණිස සහයෝගිතා ස්වයංක්‍රීයකරණ ව්‍යාපෘති ආරම්භ කිරීම | අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා උපදේශනය. අධි ධාරිතා ඉංජිනේරු විද්‍යාගාරයේදී විදුලි පරිවරණ පැදුරු පරීක්ෂා කිරීම |
| | ලෝක විදුලි හා විද්‍යුත් ඉංජිනේරුවන්ගේ ආයතන (IEEE) දින ගාල්ල කලේගාන SOS ළමා ගම්මානයේ "සිප්මන්සල" පුණ්‍ය කටයුත්ත | ගාල්ල කලේගාන SOS ළමා ගම්මානයේ ළමුන් |
| | තෝරාගත් ජා.ව.සු. 4/5 මට්ටමේ ශිෂය කණ්ඩායමක් සඳහා "තොරතුරු සන්නිවේදන තාක්ෂණ ස්වේච්ඡා වැඩසටහන" සඳහා සම්පත් දායකයන් | ටී.ඩී. ගමගේ මයා හේවාපතිගේ අසේල මයා |
| | රුහුණ විශ්වවිද්‍යාලයේ IEEE ශිෂ්‍ය ශාඛාව යටතේ IEEE සන්නිවේදන සංගමය (ComSoc)සහ IEEE පරිගණක ඉංජිනේරු සංගමය ස්ථාපිත කිරීම | පීඨයේ උපාධි අපේක්ෂකයන් |
| සබැඳි වැඩසටහන් | ජපානයේ කනසාවා විශ්වවිද්‍යාලය, තායිලන්තයේ කසෙට්සාර්ට් විශ්වවිද්‍යාලය සහ ඉන්දියාවේ බණිජ තෙල් හා බලශක්ති අධ්‍යයන විශ්වවිද්‍යාලය සමග නව නිල සහයෝගිතා පර්යේෂණ ආරම්භ කරන ලදී. | රුහුණ විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ උපාධි අපේක්ෂක හා පශ්චාත් උපාධි අපේක්ෂක ශිෂ්‍යයන් |
| | ඉන්දියාවේ යුනයිටඩ් විශ්වවිද්‍යාලය සහ රුහුණ විශ්වවිද්‍යාලය අතර නවසහයෝගිතායක් ආරම්භ කරන ලදී. (අනුමතිය අපෙක්ෂිතයි) | රුහුණ විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ කාර්ය මණ්ඩලය, උපාධි අපේක්ෂකයන් |
| | "යුනිවර්සිටාස් ශිෂ්‍යත්ව කැඳවුම- 2021" යටතේ බෙල්ජියමේ බ්‍රසල්ස් විශ්වවිද්‍යාලයේ හාස්ත්‍රපති උපාධිය හැදෑරීම පිණිස උපදේශකයන් තිදෙනෙකු පිටත් කර හරින ලදී. | ස්ථිර/තාවකාලික කාර්ය මණ්ඩලය |

## ප්‍රකාශන හා දැනුම ප්‍රචාරණය

| කාණ්ඩය | සංඛ්‍යාව |
|---|---|
| උපුටා දැක්වීමේ සුචියේ ඇතුළත් ජාත්‍යන්තර සහරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 28 |
| ජාත්‍යන්තර සහරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 02 |
| දේශීය සහරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 12 |
| මුද්‍රිත වාර්තාවල පූර්ණ නිබන්ධන | 67 |
| වාචික ඉදිරිපත්කිරීම්වල සංක්ෂේප | 25 |
| පෝස්ටර් ඉදිරිපත්කිරීම්වල සංක්ෂේප | 12 |
| පොත් | 01 |
| පොත්වල ඡේද | 07 |
| වෙනත් ප්‍රකාශනවල ශාස්ත්‍රීය ලිපි (සහරා, ජාතික පුවත්පත් ආදිය) | 03 |
| සංස්කරණ කාර්යයන් | 16 |
| **එකතුව** | **173** |

# ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨය

## පීඨාධිපතිගේ ප්‍රකාශනය

2021 වර්ෂය 2005 වසරේදී ස්ථාපිත කරනු ලැබූ ධීවර හා සාගර විද්‍යා හා තාක්ෂණ පීඨයේ 16 වැනි වසරයි. මේ දක්වා පීඨය ධීවර, ජලජීවී වගාව, සාරස විද්‍යාව, සාගර විද්‍යාව, සමුද්‍රීය භූ විද්‍යාව සහ ජල තාක්ෂණය යන ක්ෂේත්‍රයන්හි විශේෂ ප්‍රාගුණ්‍යයක් සහිත උපාධිධාරීන් කණ්ඩායම් නවයක් බිහි කොට තිබේ. වඩාත්ම වැදගත් කරුණ වනුයේ සාගර සහ මිරිදිය විද්‍යා විද්‍යාවේදී ගෞරව උපාධි වැඩසටහන හැදෑරූ පළමු ශිෂ්‍ය කාණ්ඩය 2021 වසරේදී උපාධිය ලබා ගැනීම වන අතර මිරිදිය විද්‍යා විද්‍යාවේදී ගෞරව උපාධි වැඩසටහනේ 5 වැනි ශිෂ්‍ය කාණ්ඩය 2021 වසරේදී බඳවා ගන්නා ලදී. මෙමගින් 2021 වසරේදී ඇතුළු කරගත් ශිෂ්‍ය සංඛ්‍යාව 200 කින් ඉහළ නැංවුණි. තවද, සාගර සේවා සහ සම්පත් කළමනාකරණ විද්‍යාවේදී ගෞරව උපාධි වැඩසටහන නම් නව උපාධි වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට පීඨය මුල පුරා ඇති අතර, ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨය සහ කළමනාකරණ හා මූල්‍ය පීඨය විසින් 2023 වසරේ සිට එය පවත්වනු ඇත. ධීවර කර්මාන්තයට අදාළ චාරිත්‍රමය නීතිය, ජාතික සහ අන්තර්ජාතික නීතිකරණ, විසිතුරු මත්ස්‍ය අභිජනනය සහ වගාව සහ මත්ස්‍ය පසු අස්වනු ශිල්ප ක්‍රම නමින් කෙටි පාඨමාලා තුනක් සකස් කර ක්‍රියාත්මක කිරීම පිණිස දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයට බාර දෙන ලදී.

කොවිඩ්-19 වසංගතය හේතුවෙන් අධ්‍යයන වැඩසටහන මාස දෙකකින් ප්‍රමාද විය. කෙසේ වෙතත්, සූම් තාක්ෂණය යොදාගනිමින් පීඨය මාර්ගගත ඉගෙනුම් සාර්ථකව පවත්වනු ලැබූ අතර අනතුරුව ආරක්ෂිත මාර්ගෝපදේශ අනුගමනය කරමින් ප්‍රායෝගික පංති සහ සහ විභාග භෞතිකව පවත්වනු ලැබීය.

එසේම, ප්‍රජා විනිදුම්කරණ ක්‍රියාකාරකම් පීඨය අඛණ්ඩව සිදුකළ අතර, ශ්‍රී ලංකා මධ්‍යම පරිසර අධිකාරියේ ලියාපදිංචි විද්‍යාගාරයක් ලෙස ධී සහ.සා.වි හා තා. පීඨයේ සාරස විද්‍යා හා ජලතාක්ෂණ අධ්‍යනාංශයේ විද්‍යාගාරයේදී දකුණු පළාතේ කර්මාන්තශාලාවල ජලය සහ අපජලය පරීක්ෂා කිරීම වැනි සේවාවන් මගින් සමාජීය සේවාවන් ඉටු කරන ලදී. සමාජය සමග දැනුම හා අත්දැකීම් බෙදාහදා ගනිමින් පීඨයේ ශිෂ්‍යයන්, කාර්ය මණ්ඩලය හා ආදි විද්‍යාර්ථීන් වෙබ් සම්මන්ත්‍රණ කිහිපයක් පැවැත්වීය. අධ්‍යයන කාර්ය මණ්ඩලය මගින් සැපයූ ජාතික සේවාවන්ට 2021 වසරේ ජාතික විද්‍යා පදනම වෙත ඉදිරිපත් කරනු ලැබූ පර්යේෂණ යෝජනා ඇගයීම සඳහා වන මෙහෙයුම් කමිටුවේ සාමාජිකයකු ලෙස මහාචාර්ය කේ.එච්.එම්.ඒ. දීපානන්ද මහතා කටයුතු කිරීම සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව ආරක්ෂණ මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු ලෙස මහාචාර්ය ටී.පී.ඩී. ගමගේ මහතා කටයුතු කිරීම අයත් විය.

පීඨ සාමාජිකයන් 2021 වසරේදී ජාත්‍යන්තර සුවිගත වාරසඟරාවල ලිපි 30 ක් සහ විවිධ සංසදවලදී උධෘත30 ක් ප්‍රකාශයට පත් කර තිබේ, ඊට අමතරව, කාර්ය මණ්ඩලයේ පර්යේෂණ ප්‍රකාශන සඳහා 2021 වසර තුළ ලත් උපුටන සංඛ්‍යාව 500කට ආසන්න විය

## පීඨ සමාලෝචනය

| වැඩසටහන/ක්‍රියාකාරකම | සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/නිමැවුම |
|---|---|---|
| අළුතින් හඳුන්වාදුන් පාඨමාලා (පාඨමාලා ඒකක) | සියලු ශිෂ්‍යයන් සඳහා උපාධි නොවන පාඨමාලාවක් ලෙස වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය 'මෘදු කුසලතා' පාඨමාලාව හඳුන්වා දෙන ලදී.<br><br>ධීවර සහ සාගර විද්‍යා විද්‍යාවේදී ගෞරව උපාධිය මට්ටම IV සඳහා ප්‍රතිශෝධිත පාඨමාලාව 2020 දී හඳුන්වා දෙනු ලැබීය. | උපාධිධාරීනගේ මෘදු කුසලතා වැඩි දියුණු වීම |

| වැඩසටහන/ක්‍රියාකාරකම | සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/නිමැවුම |
|---|---|---|
| අළුතින් හඳුන්වාදුන් පාඨමාලා (පාඨමාලා ඒකක) | නව උපාධි වැඩසටහන සඳහා විෂයමාලා සංවර්ධනය ක්‍රියාත්මක කිරීම: සමුද්‍රීය සේවා සහ සම්පත් කළමනාකරණය සාකච්ඡා කරමින් පවතී. | සුදුසුකම් සහිත උපාධිධාරීන්ගෙන් රැකියා වෙළඳපොළෙහි පවතින හිඳැස පිරවීම |
| දුරස්ථ අධ්‍යාපන වැඩසටහන් හෝ ව්‍යාප්ති පාඨමාලා | ධීවර කර්මාන්තයට අදාළ චාරිත්‍රමය නීතිය, ජාතික සහ අන්තර්ජාතික නීතිකරණ, විසිතුරු මත්ස්‍ය අභිජනනය සහ වගාව සහ මත්ස්‍ය පසු අස්වනු ශිල්ප ක්‍රම නමින් කෙටි පාඨමාලා තුනක් ද.අ.අ.ඒකකයේ අධ්‍යයන මණ්ඩලය හරහා හඳුන්වා දෙන ලදී. | ධීවර ප්‍රජාවේ සාමාජිකයන්, ධීවර සහ ජලජීවී වගා ක්ෂෙත්‍රයන් හා සම්බන්ධ කුඩා පරිමාණ ව්‍යවසායකයන් සහ රාජ්‍ය නිලධාරීන්ගේ අධ්‍යාපනය ඉහළ නැංවීම |
| ගාස්තු අයකරන පාඨමාලා | සමුද්‍රීය සේවා සහ සම්පත් කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව පීඨ මණ්ඩලය සහ .සා.වි.තා සහ මූ.ක.පීඨයේ තත්ත්ව ආරක්ෂණ ඒකක විසින් නිර්දේශ කරනු ලැබිය. | සමුද්‍රීය සේවා අංශයේ රැකියා වෙළඳපොළෙහි පවතින හිඳැස පිරවීම සහ පීඨ දෙක අතර (ධී.සා.වි.තා සහ මූ.ක.පීඨ) අත්දැකීම් බෙදාහදා ගැනීම |
| ප්‍රජා සේවා | ජලය සහ අපජලය පරීක්ෂාව සඳහා සාරස විද්‍යා සහ ජල තාක්ෂණ අධ්‍යනාංශයේ ඇති ධී.සා.වි.පීඨයේ සේවා විද්‍යාගාරය අඛණ්ඩව පවත්වා ගැනීම (ශ්‍රී ලංකා මධ්‍යම පරිසර අධිකාරියේ ලියාපදිංචි කර ඇත)<br><br>නීති විරෝධී ක්‍රම මගින් අල්ලා ගත් මසුන් ප්‍රමාණය හඳුනා ගැනීම සහ ධීවර හා ජලජීවී අධ්‍යනාංශය විසින් අධිකරණයට වාර්තා ඉදිරිපත් කිරීම | පරිසර දූෂණය අවම කිරීම පිණිස ජලයේ ගුණත්වය පරීක්ෂා කිරීමේ වැදගත්කම පිළිබඳව ප්‍රාදේශීය කර්මාන්ත දැනුවත් කිරීම<br><br>පිරිසිදු පරිසරයක් පවත්වා ගැනීම සඳහා ජනතාව දැනුවත් කිරීම |
| විෂයමාලා සංවර්ධනය (පාඨමාලා ඒකක/ විෂය වැඩිදියුණු කිරීම) | ඇතැම් පාඨමාලා ඒකක අනිවාර්ය පාඨමාලා ලෙසත් තවත් සමහරක් පාඨමාලා වෛකල්පික තත්ත්වයටත් වෙනස් කරන ලදී | විෂයමාලාවේ නිමවුම් පාදක අධ්‍යාපනය වැඩි දියුණු කිරීම |
| කාර්යමණ්ඩල සංවර්ධන වැඩසටහන් | කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් පවත්වනු ලැබූ සංවර්ධන වැඩසටහන් සඳහා කාර්යමණ්ඩල සාමාජිකයන් සහභාගි විය. | කාර්යමණ්ඩලයේ කාර්යක්ෂම හා ඵලදායී සේවාව ඉහළ නැංවීම |
| ජාතික සංවර්ධනය සඳහා දායකත්වය | ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනයේ ගුණාත්මකභාවය පිළිබඳ වාර්තාව සඳහා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය හා ලංකා සෝල්ට් පුද්ගලික සමාගමේ ඉල්ලීම මත ශ්‍රී ලංකාවේ ලුණු කර්මාන්තයේ ජල තුළුමුව සහ ලුණු ලේවා විශ්ලේෂණය<br><br>මහාචාර්ය කේ.එච්.එම්.ඒ.දීපානන්ද:ජාතික ජලජීවී සම්පත් නියෝජිතායතනයේ පාලක මණ්ඩලයේ සාමාජික, ජාතික විද්‍යා පදනමේ පර්යේෂණ අංශයේ ධීවර හා ජලජීවී වගා පර්යේෂණ හා සංවර්ධනය පිළිබඳ මෙහෙයුම් කමිටුවේ සාමාජික<br><br>ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ටී.පී.ඩී. ගමගේ මහතා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව ආරක්ෂණ මණ්ඩලයේ අධ්‍යක්ෂ<br><br>මහාචාර්ය පී.බී.ටී.පී. කුමාර මයා- ශ්‍රී ලංකාවේ ගංගා හා සාගරවල ප්ලාස්ටික් පිළිබඳ එ.ජා. පාරිසරික කලාපීය මූලාරම්භයේ තාක්ෂණික සහකාරක, IUCN, එක්ස්ප්‍රස් පර්ල් නෞකාව මගින් ඇතිවූ විනාශයේ සමුද්‍රීය හා වෙරළබඩ බලපෑම් ඇගයීම සඳහා වූ කණ්ඩායමේ සාමාජික | ශ්‍රී ලංකාවේ ලුණු නිෂ්පාදනයේ ගුණත්වය ඇගයීම සඳහා දායකවීම<br><br>අදාළ ජාතික ආයතන සමග දැනුම හා අත්දැකීම් බෙදාහදා ගැනීම |

| වැඩසටහන/ක්‍රියාකාරකම | සංක්ෂිප්ත තොරතුරු | | ප්‍රතිලාභීන්/නිමැවුම |
|---|---|---|---|
| කමිටු සහ ඒවාට සම්බන්ධ සාමාජිකයන් ගණන | අතුරු නීති සමාලෝචන කමිටුව | 07 | |
| | ඉතිහාසය ලිවීමේ කමිටුව | 03 | |
| | පශ්චාත් උපාධි අධ්‍යයන මණ්ඩලය | 06 | |
| | සාගර විද්‍යා සහ සම්පත් කළමනාකරණ ඩිප්ලෝමාව/ උපාධිය හඳුන්වාදීම සඳහා කමිටුව | 11 | |
| | පීඨයේ දුක්ගැනවිලි කමිටුව | 04 | |
| | අත්පොත සහ කාලසටහන සකස්කිරීමේ කමිටුව | 05 | |
| | විෂයමාලා සංවර්ධන කමිටුව | 12 | |
| | අධ්‍යයන මණ්ඩල -දු.අ.අ.ක. | 05 | |
| | පීඨයේ පුස්තකාල කමිටුව | 07 | |
| | තාක්ෂණික පැවැරුම් ඒකකය | 07 | |
| | පර්යේෂණ යාත්‍රාව සංවර්ධනය සඳහා කමිටුව | 04 | |
| | කිමිදුම් ඒකකය | 03 | |
| | ශිෂ්‍ය විනය කමිටුව | 03 | |
| | පර්යේෂණ හා සංවර්ධන කමිටුව | 04 | |
| | ශිෂ්‍යත්ව කමිටුව | 04 | |
| | ශිෂ්‍ය ඉල්ලීම් කමිටුව | 04 | |
| | ආචාරධර්ම කමිටුව | 05 | |
| | පීඨයේ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ කමිටුව | 07 | |
| | CoRAC කමිටුව | 04 | |
| | පීඨය සඳහා විද්‍යාගාර ආරක්ෂණ ලේඛන සකස්කිරීම සඳහා කමිටුව | 04 | |
| | පර්යේෂණ හා සංවර්ධන අයදුම්පත් ඇගයීම් කමිටුව | 05 | |
| | මූල්‍ය අනුකමිටුව | 06 | |
| | පීඨ ශ්‍රවණාගාර කමිටුව | 05 | |
| | පර්යේෂණ සම්මන්ත්‍රණ කමිටුව | 08 | |
| | පීඨ සංවර්ධන අරමුදල් කළමනාකරණ කමිටුව | 05 | |
| | වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය | 04 | |
| ලැබුණු ප්‍රදාන (අරමුණ සහ ප්‍රමාණය)<br>- දේශීය<br>- ජාත්‍යන්තර | ආචාර්ය යූ.ඒ.ඩී.ජයසිංහ මහතාව ජාත්‍යන්තර කෘෂිකර්ම පර්යේෂණ සඳහා ඕස්ට්‍රේලියානු මධ්‍යස්ථානයෙන් ඕස්ට්‍රේලියන් ඩොලර් 478,566 ක ( රු.මිලියන 79ට වැඩි) ප්‍රදානයක් ලැබුණි | | ශ්‍රී ලංකාවේ ජලජීවී වගාව පිළිබඳ පර්යේෂණ සංවර්ධනය සහ ජාතික සංවර්ධනය සඳහා දායකත්ය |
| සම්මාන/ පේටන්ට් බලපත්‍ර/විශේෂ සාධන | රුහුණ විශ්වවිද්‍යාලයේ 17 වැනි උපකුලපති සම්මාන ප්‍රදානෝත්සවයේදී මහාචාර්ය කේ.එච්.එම්.ඒ.දීපානන්ද මහතාට දක්ෂතම ජාත්‍යන්තර ප්‍රවර්ධක/සහකාරක සම්මානයෙන් පිදුම් ලැබීය | | පීඨයේ කාර්ය මණ්ඩලය දිරිමත් කිරීම |

| වැඩසටහන/ක්‍රියාකාරකම | සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/නිමැවුම |
|---|---|---|
| පවත්වනු ලැබූ වැඩමුළු/සම්මන්ත්‍රණ/සම්මේලන අභ්‍යන්තර හා දේශීය | ධීවර හා සාගර විද්‍යා තාක්ෂණ පීඨයේ ආදි ශිෂ්‍ය සංගමය විසින් පවත්වනු ලැබූ වෙබිනාර් මාලාව (ධීවර හා ජලජීවී වගාව සඳහා නව නිපැයුම් හා නව්‍යකරණ, 2021 අගෝස්තු 21, ලෝක සාගර දින සැමරුම 2021 ජූනි 8, ධීවර, ජලජීවී වගාව, සමුද්‍රීය හා මිරිදිය විද්‍යා උසස් අධ්‍යාපන අවස්ථා 2021 ඔක්තෝබර් 23, ජල කළමනාකරණයේ වැදගත්කම 2021 සැප්තැම්බර් 25)<br><br>සාගර විද්‍යා හා ජල තාක්ෂණ ශිෂ්‍ය සංගමය වෙබිනාර් සම්මන්ත්‍රණ මාලාවක් පවත්වනු ලැබීය. (2021 ජූනි 5 වැනි දින ලෝක පරිසර දිනය සැමරීම සඳහා, ජල දින සැමරුම, 2021 මාර්තු 22)<br><br>ලෝක සාගර දින සැමරීම සඳහා 2021 ජූනි 6 වන දින සජීව වෙබිනාර් සම්මන්ත්‍රණයක් සාගර විද්‍යා හා සමුද්‍රීය භූ විද්‍යා සංගමයේ ශිෂ්‍යයන් විසින් පවත්වනු ලැබීය | සමාජය සමග දැනුම හා අත්දැකීම් බෙදාහදා ගැනීම |
| ප්‍රජා විනිදුම්කරණ ක්‍රියාකාරකම් | සාගර විද්‍යා හා ජල තාක්ෂණ ශිෂ්‍ය සංගමයේ ශිෂ්‍යයන් ඔලුදොල සංවේදී පාරිසරික පද්ධති පිළිබඳ අධ්‍යයන පිළිබඳ ව්‍යාපෘතියක් සහ රුහුණ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ පොකුණේ නිවර්තන තත්ත්වය පිළිබඳ ඇගයීමක් සිදු කරන ලදී | සමාජය සමග අත්දැකීම් බෙදාහදා ගැනීම සහ ශිෂ්‍යයන්ගේ සමාජීය කුසලතා වර්ධනය කිරීම |

## ප්‍රකාශන හා දැනුම ප්‍රචාරණය

| කාණ්ඩය | සංඛ්‍යාව |
|---|---|
| උපුටා දැක්වීමේ සුචියේ ඇතුළත් ජාත්‍යන්තර සඟරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 30 |
| දේශීය සඟරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 02 |
| වාචික ඉදිරිපත්කිරීම්වල සංක්ෂේප | 30 |
| පොත්වල ඡේද | 01 |
| **එකතුව** | **63** |

# පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය

## පීඨාධිපතිගේ ප්‍රකාශනය

රටට සහ ලෝකයට කරන්නා වූ සේවයක් ලෙස, උසස් ඉගැන්වීම්, ඉගෙනුම් සහ පර්යේෂණ සඳහා විශිෂ්ඨත්වයේ උත්කෘෂ්ඨ මධ්‍යස්ථානයක් වීම ඉලක්ක කරගනිමින් විවිධ ක්ෂේත්‍රයන්හි උසස් දැනුමැති ඉහළ මට්ටමේ විද්වතුන් සහ පර්යේෂකයන් බිහිකිරීමට පීඨය කැපව සිටියි. කොවිඩ්-19 වසංගතය හේතුවෙන් පසුගිය වසරේ රටේ සෑම අංශයකම අත්විඳි පසුබෑම් මධ්‍යයේ පීඨයේ මූලික කාර්යය වුයේ කිසිදු බාධාවකින් තොරව දැනට පවතින වැඩසටහන් පවත්වාගෙන යාමයි. පීඨය ඉතාමත් සාර්ථකව එම කාර්යය ඉටුකරගත් අතර සාමාන්‍ය තත්ත්වය පැවැති කාලයේදී මෙන්ම කිසිදු අඩුවීමකින් තොරව දැනට ක්‍රියාත්මක වැඩසටහන් සඳහා නව ශිෂ්‍ය කාණ්ඩ බඳවාගැනීමට සමත් විය.

කෙසේ වෙතත්, විද්‍යා පශ්චාත් උපාධි පාඨමාලා සඳහා මෙම වසරේ තරමක් අඩුවීමක් සිදුවූ අතර එය අනෙකුත් විශ්වවිද්‍යාලයන්ට ද පොදු වූ සංසිද්ධියක් විය.

## පශ්චාද් උපාධි වැඩසටහන්වල ශිෂ්‍ය බඳවාගැනීම් - 2021

| පශ්චාත් උපාධි වැඩසටහන | අළුතින් බඳවා ගැනීම් |
|---|---|
| ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධි ඩිප්ලෝමාව/ව්‍යාපාර පරිපාලන ශාස්ත්‍රපති උපාධිය | 35 |
| ව්‍යාපාර කළමනාකරණ ශාස්ත්‍රපති උපාධිය | 96 |
| ආර්ථික විද්‍යා ශාස්ත්‍රපති උපාධිය | 65 |
| විද්‍යාපති/ව්‍යුහාත්මක ඉංජිනේරු විද්‍යා විද්‍යාපති උපාධිය | 40 |
| විද්‍යාපති/ජල හා පාරිසරික ඉංජිනේරු විද්‍යා විද්‍යාපති උපාධිය | 17 |
| සමාජවිද්‍යා ශාස්ත්‍රපති උපාධිය | 87 |
| භෝග නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | 12 |
| කෘෂිකාර්මික ආර්ථික විද්‍යා සහ සංවර්ධන විද්‍යාපති උපාධිය | 30 |
| **එකතුව** | **217** |

## පර්යේෂණ උපාධි වැඩසටහන්වල ශිෂ්‍ය බඳවාගැනීම්

| පශ්චාත් උපාධි වැඩසටහන | අළුතින් ඇතුලත්කර ගැනීම් |
|---|---|
| දර්ශනපති | 18 |
| දර්ශනවේදී | 09 |

## පශ්චාත් උපාධි වැඩසටහන් පාඨමාලාවලින් ලැබූ ආදායම

| තථ්‍ය ආදායම | තථ්‍ය වියදම | ශේෂය |
|---|---|---|
| 53,468,753.47 | 152,942,719.46 | 99,473,965.99 |

# මානව ශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා පීඨය

## පීඨාධිපතිගේ ප්‍රකාශනය

රුහුණු විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය ආර්ථික විද්‍යාව, ඉංග්‍රීසි සහ වාග් විද්‍යාව, ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම, භූගෝල විද්‍යාව, ඉතිහාසය හා පුරා විද්‍යාව, පාලි සහ බෞද්ධ අධ්‍යයන, රාජ්‍ය ප්‍රතිපත්ති, සිංහල හා සමාජ විද්‍යාව යන අධ්‍යනාංශ නවයෙන්; තොරතුරු තාක්ෂණ ඒකකයකින් සහ නූතන භාෂා සහ ශිෂ්ඨාචාරය සහ ආපදා කළමනාකරණය යන මධ්‍යස්ථාන දෙකින් සමන්විත වේ.

2021 වසර තුළ පීඨයේ ක්‍රියාකාරකම් පිළිබඳ කෙටි සමාලෝචනයක් විශ්වවිද්‍යාලයේ උපායමාර්ගික සැලැස්මේ අරමුණ 07 ක් යටතේ සංක්ෂිප්තව පහත දක්වා ඇත.

**අධ්‍යාපනය, පර්යේෂණ සහ සේවා වෙත ප්‍රවේශය පුළුල් කිරීම** - පීඨය 2021 වසරේදී සිය පැරණි විෂය නිර්දේශය හා අළුතින් හඳුන්වාදුන් විෂය නිර්දේශය අඛණ්ඩව පවත්වා ගෙන යන ලදී. පැරණි විෂය නිර්දේශය යටතේ, 2020 වසරට පෙර ලියාපදිංචි වූ ශිෂ්‍යයන් සඳහා ශාස්ත්‍රවේදී උපාධි (සාමාන්‍ය) සහ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි වැඩසටහන් පවත්වන ලදී. 2020 සිට ලියාපදිංචි වූ ශිෂ්‍යයන් සඳහා නව විෂය නිර්දේශය යටතේ උපාධි වැඩසටන් පවත්වන ලදී. නව විෂය නිර්දේශය යටතේ ශාස්ත්‍රවේදී ගෞරව උපාධි වැඩසටහන් 12ක් පිරිනමනු ලබයි. වර්ෂයක් සඳහා පීඨයේ ධාරිතාවය ශිෂ්‍යයන් 350ක් සඳහා වුවත්, 2021 වසර තුළදී ශිෂ්‍යයන් විශාල සංඛ්‍යාවකට ශාස්ත්‍රවේදී උපාධි වැඩසටහන් හැදෑරීමට අවස්ථාව ලබා දෙමින් පීඨය ශිෂ්‍යයන් 755 දෙනෙකු බඳවාගන්නා ලදී. පීඨය සිය ප්‍රකාශන පළකිරීම අඛණ්ඩව සිදු කළ අතර 2021 වසරේදී සමාජ විද්‍යා සහ මානව ශාස්ත්‍ර සමාලෝචන සඟරාවේ නිකුතු 03ක් ද මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පිළිබඳ පීඨ සඟරාවේ නිකුතු එකක් ද ප්‍රකාශයට පත්කරන ලදී. මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පිළිබඳ පර්යේෂණ හා ප්‍රකාශන මධ්‍යස්ථානයක් ස්ථාපනය කරනු ලැබූ අතර පීඨයේ ශිෂ්‍යයන් හා ආචාර්යවරුන්ගේ පර්යේෂණ ධාරිතාවය ඉහළ නැංවීම පිණිස වැඩමුළු කිහිපයක් පවත්වන ලදී.

**අධ්‍යාපන පර්යේෂණ සහ සේවාවන්හි ගුණාත්මකභාවය අභිවර්ධනය කිරීම** - ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය සහ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතිය පීඨය පූර්ණව ක්‍රියාවට නංවන ලදී. කොවිඩ් 19 වසංගත තත්ත්වය මධ්‍යයේ වුවද, පීඨය හැකි සෑමවිටම සිය අධ්‍යයන ක්‍රියාකාරකම් භෞතිකව ද සහ මාර්ගගතව ද පවත්වනු ලැබීය. පීඨයේ ආචාර්යවරුන්ගෙන් 90% කට පමණ පශ්චාත් උපාධි සුදුසුකම් තිබේ. ආචර්ය උපාධිධාරීන්ගේ ප්‍රතිශතය තවමත් 43% ක මට්ටමක පවතින අතර 2021 වසර තුළදී ආචාර්යවරුන් 06 දෙනෙකු සිය ආචාර්ය උපාධිය නිමා කළ අතර තවත් 05 දෙනෙකු ආචාර්ය උපාධිය සඳහා ලියාපදිංචි වන ලදී.

**අධ්‍යාපනයේ සහ පර්යේෂණවල අදාළත්වය අභිවර්ධනය කිරීම** - සමාජීය අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් පීඨය සිය උපාධි වැඩසටහන් සංශෝධනය කරනු ලැබීය. ඉංග්‍රීසි භාෂාව, තොරතුරු සන්නිවේදන තාක්ෂණය, කළමනාකරණ කුසලතා වැනි අත්‍යාවශ්‍ය කුසලතා සහ ජීවිත හා මනෝ විභිති සුසමාදර්ශයේ දැක්ම ආශ්‍රිත පාඨමාලා ඒකක කිහිපයක් 2021 වසර තුළදී විෂය නිර්දේශයට අන්තර්ගත කරන ලදී. සමාජයේ පවතින ඉල්ලුම සපුරාලනු සඳහා ශිෂ්‍යයන්ගේ දැනුම හා කුසලතා ඉහළ නැංවීම පිණිස පීඨය විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය සමග හවුල්කාරිත්වයෙන් යුතුව පාඨමාලා කිහිපයක් පැවැත්වීය. 2021 වසරේදී පවත්වනු ලැබූ වාර්ෂික ශිෂ්‍ය සැසිවලදී (RASAS-2021), ශිෂ්‍යයන් විශාල සංඛ්‍යාවකට තමන් පර්යේෂණවලින් අනාවරණය කරගත් කරුණුබෙදා හදා ගැනීමටත් පර්යේෂණ ක්‍රියාකාරකම් පිළිබඳවා වැඩිදුර ඉගෙනුමටත් අවස්ථාව සැලසුණි. පීඨ ආචාර්යවරුන්ට සහ පර්යේෂකයන්ට සිය පර්යේෂණ ප්‍රතිඵල ඉදිරිපත් කිරීමට, සාකච්ඡා කිරීමට සහ බෙදාහදා ගැනීමට ඉඩ ප්‍රස්ථා සපයමින් යේ වාර්ෂික ජාත්‍යන්තර සමුළුව ද (RUICHSS-2021) පවත්වන්නට යෙදුණි. පීඨය පළමුවරට බෞද්ධ

අධ්‍යයන පිළිබඳ සිය පළමු අන්තර්ජාතික සමුළුව පැවැත්වීය. එසේම අළුතින් බඳවාගත් සිය සිසුන් සඳහා පීඨය තීව්‍ර ඉංග්‍රීසි භාෂා සහ තොරතුරු සන්නිවේදන පාඨමාලාවක් පවත්වන ලදී.

**ස්ත්‍රී පුරුෂ සමාජභාවය, වාර්ගිකත්වය, ආගම සහ විශේෂ අවශ්‍යතාවයන් සහිත පුද්ගලයන්ට අදාළව සාධරණත්වය සහ යුක්තිය සහතික කිරීම** - පීඨය සිංහල හා දෙමළ යන භාෂා මාධ්‍ය දෙකින්ම උපාධි වැඩසටහන් පවත්වයි. සිංහල භාෂා කුසලතා හා දෙමළ භාෂා කුසලතා පිළිබඳ පාඨමාලා අනිවාර්ය විෂයයන් ලෙස උපාධි වැඩසටහන් 12 හිම විෂය නිර්දේශවලට ඇතුළත් කරන ලදී. Erasmus + අරමුදල් සැපයීම යටතේ ආබාධ සහිත සිසුන් සඳහා අන්තර්කරණ අධ්‍යාපන වැඩසටහනක් සකස් කිරීමේ ව්‍යාපෘතිය 2021 වසරේදී අඛණ්ඩව පවත්වා ගෙන යනු ලැබීය. එම ව්‍යාපෘතිය යටතේ ආබාධ සහිත සිසුන් ඉලක්ක කරමින් ආරාධිත දේශන කිහිපයක් පවත්වන ලදී. පීඨයේ නූතන භාෂා සහ ශිෂ්ඨාචාර ඒකකය දෙමළ, චීන, ප්‍රංශ, හින්දි, ජර්මන් සහ ජපන් භාෂා සහතිකපත්‍ර පාඨමාලා පවත්වන ලදී. රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යනාංශය ජාතික සාම මණ්ඩලය සමග එක්ව, බහුත්වවාදය සහ සාමය හා සංහිඳියාව පිළිබඳව ශිෂ්‍යයන්ගේ දැනුම ඉහළ නැංවීම පිණිස වැඩමුළු කිහිපයක් පැවැත්වීය.

**සම්පත් සඵලව සහ කාර්යක්ෂමව කළමනාකරණය මගින් යහපාලනය අභිවර්ධනය කිරීම** - පීඨයේ ස්ථිර පුරප්පාඩු 90%ක් පමණ ද තාවකාලික පුරප්පාඩු 100 % ක් ද පුරවනු ලැබූ අතර ඉතිරි ඇබෑර්තු සඳහා දැන්වීම් පළකරන ලදී. ශිෂ්‍ය උපදේශන හා ශිෂ්‍ය අභිමන්ත්‍රන වැඩසටහන් සාර්ථකව පැවැත්වීය

## පීඨ සමාලෝචනය

| වැඩසටහන | ක්‍රියාකාරකම /සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/නිමැවුම |
|---|---|---|
| අළුතින් හඳුන්වාදුන් උපාධි අපේක්ෂක උපාධි වැඩසටහන් | භූගෝලීය තොරතුරු පද්ධතිය පිළිබඳ විද්‍යාවේදී උපාධිය (සනාතන සභාවේ අනුමතිය සඳහා යෝජනාව ඉදිරිපත් කර ඇත)<br><br>තොරතුරු තාක්ෂණය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය | ආසන්න වශයෙන් උපාධි අපේක්ෂක ශිෂ්‍යයන් 150ක් පමණ |
| අළුතින් හඳුන්වාදුන් පාඨමාලා (පාඨමාලා ඒකක) | නව පාඨමාලා ඒකක 05ක් හඳුන්වා දෙන ලදී. | පීඨයේ උපාධි අපේක්ෂකයන් (2000ක් පමණ) |
| දුරස්ථ අධ්‍යාපන වැඩසටහන් හෝ ව්‍යාප්ති පාඨමාලා | භාස්ත්‍රවේදී (බාහිර) උපාධි වැඩසටහන, උසස් ඩිප්ලෝමා/ඩිප්ලෝමා වැඩසටහන් සහ උසස් සහතිකපත්‍ර/ සහතිකපත්‍ර පාඨමාලා දෙකක් පීඨය පවත්වනු ලබයි | අ.පොෂ. උසස් පෙළ හා සාමාන්‍ය පෙළ සමත් 2500 දෙනෙකු පමණ |
| ගාස්තු අයකරන පාඨමාලා | සියලු දුරස්ථ අධ්‍යාපන පාඨමාලා, එනම් ශාස්ත්‍රවේදී (බාහිර) පාඨමාලාව, මනෝවිද්‍යා උපදේශන ඩිප්ලෝමාව, ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාව, ඉංග්‍රීසි ඩිප්ලෝමාව සහ ඉංග්‍රීසි උසස් ඩිප්ලෝමාව ගාස්තු අයකරන පාඨමාලා ලෙස පවත්වාගෙන යන ලදී. තවද, ගාස්තු අයකරන පාඨමාලා ලෙස පීඨය උපාධි අධ්‍යයන පීඨය සමග එක්ව පශ්චාත් උපාධි ශික්ෂණ පාඨමාලා තුනක් (සමාජ විද්‍යා ශාස්ත්‍රපති උපාධිය, සාමය හා සංවර්ධනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සහ ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය) පවත්වා ගෙන යයි | ආසන්න වශයෙන් 2000 ක් වන අතර ඔවුන්ගෙන් බහුතරයක් විවිධ ක්ෂෙත්‍රයන්හි නියැළෙන වෘත්තිකයන් විය. |
| ප්‍රජා සේවා | ප්‍රජා ධාරිතා ගොඩනැගීම, හුවමාරු වැඩසටහන්, පුහුණු වැඩමුළු, සහ සමාජ සුබසාධන ක්‍රියාකාරකම් වැනි විවිධ ප්‍රජා සේවා ක්‍රියාකාරකම් ගණනාවක් පීඨය පවත්වන ලදී. | ගුරුභවතුන්, පාසල් ශිෂ්‍යයන් සාමාන්‍ය මහජනතාව |
| විෂයමාලා සංවර්ධනය (පාඨමාලා ඒකක/විෂයයන් වැඩි දියුණු කිරීම) | භූගෝලීය තොරතුරු පද්ධති හා තො.ස.නව උපාධි වැඩසටහන් සඳහා නව විෂයමාලාව සකස් කරන ලදී | පීඨයේ සියලු අභ්‍යන්තර හා බාහිර ශිෂ්‍යයන් (ආසන්න වශයෙන් 3500) |

| වැඩසටහන | ක්‍රියාකාරකම /සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/නිමැවුම |
|---|---|---|
| විෂයමාලා සංවර්ධනය (පාඨමාලා ඒකක/විෂයයන් වැඩි දියුණු කිරීම) | පවතින උපාධි වැඩසටහන් විෂයමාලාවට නව පාඨමාලා ඒකක 05ක් හඳුන්වා දෙන ලදී<br><br>ශාස්ත්‍රවේදී (බාහිර) උපාධි වැඩසටහන සඳහා අභ්‍යන්තර ශිෂ්‍යන් සඳහා පිරිනමන විෂයමාලාව හා සංසන්දනීය නව විෂයමාලාවක් හඳුන්වා දෙන ලදී | |
| කාර්යමණ්ඩල සංවර්ධන වැඩසටහන් | විශ්වවිද්‍යාලයේ කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය සමග සහයෝගිතාවයෙන් ශාස්ත්‍රීය ලේඛනය, ප්‍රකාශන ආචාර ධර්ම, විෂයමාලා සැලසුම්කරණය, ශිෂ්‍ය ඇගයීම, සන්නිවේදන කුසලතා ආදි කාර්යමණ්ඩල සංවර්ධන වැඩසටහන් කිහිපයක් පවත්වන ලදී. කාර්යමණ්ඩලයේ කුසලතා හා දැනුම වර්ධනය පිණිස පීඨයේ පර්යේෂණ හා ප්‍රකාශන අංශය වැඩමුළු මාලාවක් පවත්වන ලදී | පීඨයේ ස්ථිර හා තාවකාලික ආචාර්යවරුන් සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය (160ක් පමණ) |
| ජාතික සංවර්ධනය සඳහා දායකත්වය | පීඨයේ අධ්‍යනාංශ 09 අතුරින් 06ක් අපොස උසස් පෙළ උත්තර පත්‍ර ඇගයීමේ ක්‍රියාදාමය සඳහා පීඨයේ අධ්‍යනාංශ හයක් දායක වන ලදී<br><br>ආචාර්යවරුන් ජාතික මට්ටමේ වෘත්තීය ආයතන නියෝජනය කරන ලදී. (ශ්‍රී ලංකා පුරාවිද්‍යා මණ්ඩලයේ සමලේකම්, ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සංගමය- සභා සාමාජික, ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අධ්‍යයන කටයුතු මණ්ඩලයේ සාමාජික) | අ.පොස උසස් පෙළ උත්තර පත්‍ර ඇගයීම සඳහා පීඨ සාමාජිකයන්ගේ දායකත්වය රටේ උසස් පෙළ සිසුන් 50,000 කඩ වැඩි පිරිසකට උපකාරක වන ලදී |
| ජාත්‍යන්තර මට්ටමේ දායක්තවය | යුරෝපයේ විශ්වවිද්‍යාල සමග හවුල්කාරිත්වයෙන් යුතුව ජාත්‍යන්තර ව්‍යාපෘති දෙකක් ක්‍රියාත්මක කරමින් පවතී<br><br>ජාත්‍යන්තර වැඩමුළු දෙකක් සංවිධානය කර පවත්වන ලදී | ජාත්‍යන්තර ශාස්ත්‍රීය හා පර්යේෂණ ආයතනයන්හි පරයේෂකයන් හා විද්වතුන් |
| කමිටු සහ ඒවාට සම්බන්ධ සාමාජිකයන් ගණන | අධ්‍යාපනය, සමාජ සුබසාධනය, පරිසරය සහ සංස්කෘතික උරුමය පිළිබඳ ජාතික සහ පළාත් අමාත්‍යාංශවල ජාතික සහ පළාත් මට්ටමේ විවිධ කමිටුවලට පීඨ සාමාජිකයන් සම්බන්ධ විය | පොදු ජනතාව/ජාතික සහ පළාත් ප්‍රතිපත්ති |
| ලැබුණු ප්‍රදාන (අරමුණ සහ ප්‍රමාණය)<br>- දේශීය<br>- ජාත්‍යන්තර | භූගෝල විද්‍යා සහ රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යනාංශයට 2020 වසරේදී AHEAD ප්‍රදාන ලැබුණු අතර එම කටයුතු 2021 වසරේද අඛණ්ඩව පවත්වා ගෙන යන ලදී<br><br>එරස්මස්+ ව්‍යාපෘති දෙකක් ද ක්‍රියාත්මක කරමින් පවතී | පීඨයේ සියලුම ශිෂ්‍යයන්<br><br>AHEAD ප්‍රදාන යටතේ ආචාර්ය උපාධිය හදාරන ආචාර්යවරු තිදෙනෙකු |
| සම්මාන/ පේටන්ට් බලපත්‍ර/විශේෂ සාධන | ආචාර්යවරුන් තිදෙනෙකුට රුහුණ සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලවලින් හොඳම නිබන්ධන ඉදිරිපත් කරන්නා සම්මාන හිමිවුණි.<br><br>එක් අධ්‍යයන සාමාජිකයකුට ඕස්ට්‍රේලියාවේ නිව් ඉන්ග්ලන්ඩ් විශ්වවිද්‍යාලය පිරි නැමූ ජාත්‍යන්තර පශ්චාත් උපාධි පර්යේෂණ සම්මානය හිමිවුණි.<br><br>තිරසර සංවර්ධන ඉලක්ක -05 ‘ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ කාන්තාවන් ආර්ථිකව සවිබල ගැන්වීම’ සපුරාලීම කෙරෙහි මුලිකවම අවධානය යොමුකරන්නා වූ එක්සත් ව්‍යාපාරික කාන්තා සංගමයේදී 2021 ජූනි මස සිට මෙරට තානාපතිවරයකු ලෙස කටයුතු කිරීමට පීඨයේ එක් අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයකු නම් කර තිබේ | පීඨයේ ආචාර්යවරුන් 05 දෙනෙකු |

| වැඩසටහන | ක්‍රියාකාරකම /සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/නිමැවුම |
|---|---|---|
| පවත්වනු ලැබූ වැඩමුළු/සම්මන්ත්‍රණ/සම්මේලන (අභ්‍යන්තර හා දේශීය) | "නව සාමාන්‍යයට අනුව කටයුතු කිරීම: සමාජ-සංස්කෘතික අභියෝග හා අවස්ථා" යන තේමාව යටතේ පීඨයේ 07 වැනි ජාත්‍යන්තර සම්මේලනය පවත්වන ලදී<br><br>බෞද්ධ අධ්‍යයන පිළිබඳ 01වැනි ජාත්‍යන්තර සම්මේලනය 2021 වසරේදී පීඨය විසින් සංවිධානය කර පවත්වන ලදී<br><br>අනුගාමී සයවැනි වසරටත් රුහුණු කලා සිසුන්ගේ වාර්ෂික සැසි (RASAS-2020) පවත්වන ලදී | ආචාර්යවරුන්ට සහ පර්යේෂකයන්ට තම පර්යේෂණ නිමැවුම් බෙදාහදා ගැනීමට ජාත්‍යන්තර සම්මේලනය අත්වැලක් විය<br><br>ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල වල මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨවල ශිෂ්‍ය ශිෂ්‍යාවන් 150 කට පමණ මෙම ශිෂ්‍ය සැසිවලින් ප්‍රතිලාභ හිමිවුණි |
| ප්‍රජා විහිදුම්කරණ ක්‍රියාකාරකම් | 2021 වසරේදී පීඨය ප්‍රජා සේවා ව්‍යාපෘති 05ක් පවත්වන ලදී<br><br>ප්‍රජා විහිදුම්කරණ ක්‍රියාකාරකම් ලෙස පීඨය විවිධ විෂයයන් සඳහා පාසල් ගුරුවරුන් රාශියකට පුහුණු වැඩසටහන් පවත්වන ලදී<br><br>විවිධ තේමාවන් ඔස්සේ ආචාර්යවරුන්, ගුරුවරුන් හා සාමාන්‍ය මහජනතාව සඳහා මාර්ගගත සැසි 50කට වැඩි සංඛ්‍යාවක් පවත්වන ලදී | සාමාන්‍ය ප්‍රජාව<br><br>පාසල් ගුරුවරුන් සහ ශිෂ්‍යයන් |
| සබැඳි වැඩසටහන් | ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් අධ්‍යනාංශය ශ්‍රී ලංකාවේ එක්සත් ජනපද තානාපති කාර්යාලය සමග සහයෝගිතාවයෙන් විසින් අතථ්‍ය ඉංග්‍රීසි භාෂා අධිශිෂ්‍යත්ව වැඩසටහන (VELF) සංවිධානය කරන ලදී.<br><br>යුරෝපීය උසස් අධ්‍යාපන ආයතන 06ක් සහ ජාතික උසස් අධ්‍යාපන ආයතන 03ක් සමග හවුල්කාරිත්වයෙන් Erasmus + වැඩසටහන් දෙකක් ඉදිරියට පවත්වා ගෙන යන ලදී.<br><br>ශිෂ්‍යයන් හා ආචාර්යවරුන් සඳහා චීන භාෂා පුහුණුව ලබාදීම පිණිස චීන ආයතනයක් සමග එක් හවුල්කාරිත්වයක් ස්ථාපිත කරගන්නා ලදී. | සියලු පීඨවල අධ්‍යයන කාර්යමණ්ඩල, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ උපාධි අපේක්ෂකයන්<br><br>සියලු පීඨවල අධ්‍යයන කාර්යමණ්ඩල, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ උපාධි අපේක්ෂකයන් |

## ප්‍රකාශන හා දැනුම ප්‍රචාරණය

| කාණ්ඩය | සංඛ්‍යාව |
|---|---|
| උපුටා දැක්වීමේ සුචියේ ඇතුළත් ජාත්‍යන්තර සඟරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 03 |
| උපුටා දැක්වීමේ සුචියේ ඇතුළත් නොවූ ජාත්‍යන්තර සඟරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 10 |
| දේශීය සඟරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 37 |
| මුද්‍රිත වාර්තාවල පූර්ණ නිබන්ධන | 14 |
| වාචික ඉදිරිපත්කිරීම්වල සංක්ෂේප | 89 |
| පෝස්ටර් ඉදිරිපත්කිරීම්වල සංක්ෂේප | 03 |
| පොත් | 06 |
| පොත්වල ඡේද | 03 |
| වෙනත් සඟරාවල ශාස්ත්‍රීය ලිපි (සඟරා, ජාතික පුවත්පත් ආදිය.) | 26 |
| සංස්කරණ කාර්යයන් | 34 |
| **එකතුව** | **225** |

# කළමනාකරණ සහ මූල්‍ය පීඨය

## පීඨාධිපතිගේ ප්‍රකාශනය

කළමනාකරණ හා මූල්‍ය පීඨය 2003 අප්‍රේල් 29 වන දින රුහුණ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පරිශ්‍රයේදී ස්ථාපිත කරනු ලැබීය. කළමනාකරණ සහ මූල්‍ය පීඨයේ ව්‍යාපාර පරිපාලන ගෞරව උපාධි වැඩසටහන දේශීයව මෙන්ම ජාත්‍යන්තරවද ව්‍යාපාර කළමනාකරණ වෘත්තියේ මතුවෙමින් පවතින අවශ්‍යතා සපුරාලීමට හැකි වඩා ඉහළ මට්ටමේ උපාධිධාරීන් බිහිකිරීම අරමුණු කර ඇත. ගණකාධිකරණය සහ මූල්‍ය අධ්‍යනාංශය, මානව සම්පත් කළමනාකරණ අධ්‍යනාංශය, කළමනාකරණ සහ ව්‍යවසායකත්ව අධ්‍යනාංශය, අලෙවිකරණය අධ්‍යනාංශය, මූල්‍ය අධ්‍යනාංශය සහ ව්‍යාපාර කළමනාකරණ අධ්‍යනාංශය ලෙස පීඨය අධ්‍යනාංශ හයකින් සමන්විත වේ.එම අධ්‍යනාංශවලට අමතරව, පීඨය සතුව පරිගණක ඒකකයක් ද පවතී. ළඟදීම හඳුන්වාදීමට නියමිත යෝජිත උපාධි වැඩසටහන් වන්නේ ජාත්‍යන්තර ව්‍යාපාර පිළිබඳ ව්‍යාපාරවේදී උපාධිය හා ව්‍යාපාර නීතිය පිළිබඳ ව්‍යාපාරවේදී උපාධියයි.

පීඨයේ සියලු උපාධි වැඩසටහන් ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවේ 6 වන මට්ටමේ ස්ථානගත සිවි අවුරුදු ගෞරව උපාධි වැඩසටහන් වේ. මෙම වැඩසටහන් හැදෑරීම මගින්, නූතන ව්‍යාපාර පරිපාලන විෂය ක්ෂේත්‍රය හැඩගස්වන සාධක අවබෝධ කරගැනීමට සහ කළමනාකරණය කිරීමට අවශය කරනු ලබන සන්නිවේදන කුසලතා, විශ්ලේෂණාත්මක කුසලතා සහ ගැටලු විසඳීමේ කුසලතා සමගින් විශේෂඥතා ක්ෂෙත්‍ර හතරකට අදාළ (එනම් ගිණුම්කරණය, ව්‍යවසායකත්වය, මානව සම්පත් කළමනාකරණය සහ අලෙවිකරණය) මූලික සංකල්ප, න්‍යාය සහ ශිල්පීය ක්‍රම ශිෂ්‍යයන් ඉගෙන ගනු ඇත. තවද, ආරක්ෂා කළ හැකි තර්ක ගොඩනැගීමේදී, අනිවාර්ය ස්වාධීන පර්යේෂණ ව්‍යාපෘතිය යාවජීව ඉගෙනුම් කුසලතා හා නිපුණතා ප්‍රවර්ධනය කරන අතර සීමාවාසික පුහුණුව ශිෂ්‍යයන් ලබාගෙන ඇති දැනුම, කුසලතා හා ආකල්ප ආයතනික පරිසරයක් තුළ කෙසේ ආදේශ කරන්නේද යන්න පිළිබඳ අත්දැකීම් ලබාදෙමින් ශිෂ්‍යයන් කර්මාන්තයට නිරාවරණය කරයි.

වත්මනෙහි පීඨය ව්‍යාපාර පරිපාලන ශාස්ත්‍රවේදී උපාධි දක්වා දිවෙන විෂය ක්ෂෙත්‍ර පරාසය පාඨමාලා පවත්වයි. විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ, පාඨමාලා ඒකක පාදක උපාධි අපේක්ෂක වැඩසටහන් 2001 සැප්තැම්බර් මස සිට ක්‍රියාත්මක වන පරිදි හඳුන්වා දෙනු ලැබීය. මෙම ප්‍රතිසංස්කරණත් සමගින් පීඨය ව්‍යාපාර පරිපාලන ශාස්ත්‍රවේදී උපාධිය පිරිනමනුයේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණි.

උපාධි අපේක්ෂක උපාධි වැඩසටහන්වලට අමතරව, පීඨය ස්වාධීන පර්යේෂණ පාදක දර්ශනවේදී උපාධි වැඩසටහන් සම්බන්ධීකරණය කරයි. ව්‍යාපාර කළමනාකරණ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, ව්‍යාපාර පරිපාලන දර්ශනපති උපාධිය සහ ව්‍යාපාර කළමනාකරණ දර්ශනපති උපාධිය පීඨය විසින් පවත්වනු ලබන විශේෂ උපාධි වැඩසටහන් වන අතර ඒවා මූලිකවම පාඨමාලා වැඩ සහ පර්යේෂණ සංරචකයකින් සමන්විත වේ.

පීඨය නිරන්තර පදනමකින් තම උපායමාර්ගික සැලැස්ම සමාලෝචනය කරන අතර විශ්වවිද්‍යාල සංයුක්ත සැලැස්ම-2023හි නිශ්චිතව දක්වා ඇති ඉලක්ක සාක්ෂාත් කරගැනීමට ප්‍රයත්න දරයි. පහත වගු 2021 වසරේ සාධන පිළිබඳ විස්තර සපයයි.

## පීඨ සමාලෝචනය

| වැඩසටහන | ක්‍රියාකාරකම/ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/නිමැවුම |
|---|---|---|
| අළුතින් හඳුන්වාදුන් උපාධි අපේක්ෂක උපාධි වැඩසටහන් | උපාධි වැඩසටහන් දෙකකි.<br>- ව්‍යාපාර කළමනාකරණයේ ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය<br>- මූල්‍යයනය පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය | නව උපාධි වැඩසටහන් දෙකකි.<br>උසස් අධ්‍යාපන අවස්ථා<br>මානව සම්පත් සංවර්ධනය |
| දුරස්ථ අධ්‍යාපන වැඩසටහන් හෝ ව්‍යාප්ති පාඨමාලා | - මානව සම්පත් කළමනාකරණ ඩිප්ලෝමාව<br>- අලෙවිකරණ ඩිප්ලෝමාව<br>- ගිණුම්කරණ ඩිප්ලෝමාව<br>- අලෙවිකරණ ඩිප්ලෝමාව | විශ්වවිද්‍යාලවලට ඇතුළුවීමට නොහැකිවූවන් සඳහා උසස් අධ්‍යාපන අවස්ථා |
| ගාස්තු අයකරන පාඨමාලා | පශ්චාත් උපාධි වැඩසටහන් දෙකකි.<br>ව්‍යාපාර පරිපාලන ශාස්ත්‍රපති (ශ්‍රීලසුරා 9)<br>ව්‍යාපාර කළමනාකරණ ශාස්ත්‍රපති (ශ්‍රීලසුරා 10)<br>ඩිප්ලෝමා වැඩසටහන් හතරක් | පශ්චාත් උපාධි සහ උසස් අධ්‍යාපන අවස්ථා<br>පීඨ සහ අධ්‍යනාංශ සංවර්ධන අරමුදල් වෙත දායකත්වය<br>කර්මාන්තය සමග ජාලගතවීම<br>මානව සම්පත් සංවර්ධනය |
| ප්‍රජා සේවා | උසස් පෙළ විභාග සම්මන්ත්‍රණ | ප්‍රජා වැඩසටහන් සඳහා පහසුකම් සැපයීම<br>ජාලකරණය |
| විෂයමාලා සංවර්ධනය (පාඨමාලා ඒකක/විෂයයන් වැඩි දියුණු කිරීම) | නව උපාධි වැඩසටහන් හඳුන්වාදීම; සංචාරක ව්‍යාපාරය පිළිබඳ ව්‍යාපාර පරිපාලන උපාධිය, සැපයුම්දාම කළමනාකරණ ව්‍යාපාර පරිපාලන උපාධිය | උපාධි වැඩසටහන් උත්ශ්‍රේණි කිරීම<br>තො.ස.තා. සහතිකපත්‍ර |
| කාර්යමණ්ඩල සංවර්ධන වැඩසටහන් | කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය - CCPDHE සම්පත් පුද්ගල දායකත්වය<br>පාසල් ශිෂ්‍යයන් හා සාමාන්‍ය ජනතාව ඉලක්ක කරමින් ආකල්ප සහ මෘදු කුසලතා සංවර්ධනය කිරීමේ වෙබ් සම්මන්ත්‍රණ 02ක් පවත්වන ලදී. ඒවා සම්මන්ත්‍රණය කරනු ලැබුයේ සිංහ සමාජයේ ජාත්‍යන්තර සංගමයයි<br>උපාධි අපේක්ෂකයන්ගේ ආකල්ප සහ මෘදු කුසලතා සංවර්ධනය කිරීමේ වැඩමුළු (වෙබ් සම්මන්ත්‍රණ) 05ක් පවත්වන ලදී.(කෘෂිකර්ම පීඨය/රු.වි. වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය, රු.වි. වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය, මොරටු විශ්වවිද්‍යාලය)<br>ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා කාර්මික සංවර්ධන මණ්ඩල සම්මන්ත්‍රණය පවත්වන ලදී<br>ව්‍යවසායකත්ව සංවර්ධන සංසදවල සම්පත් දායක<br>අයි නාලිකාවේ “ගුරුගෙදර” අධ්‍යාපන වැඩසටහනේ උසස් පෙළ ගිණුම්කරණ විෂයට අදාළව රූපවාහිනී වැඩසටහන් 06 ක් පවත්වන ලදී. (පැය 12)<br>ශ්‍රී ලංකා දෘශ්‍ය හා ප්‍රසාංගික කලා විශ්වවිද්‍යාලය විසින් නව රූපවාහිනී නාලිකාවක් හඳුන්වාදීමේ ශක්‍යතාව ඇගයීම පිණිස පර්යේෂණ අධ්‍යයනයක් සිදුකරන ලදී. (ආචාර්ය තාරක විජේසුන්දර සමග) | CCPDHE සහ කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථාන වැඩසටහන |

| වැඩසටහන | ක්‍රියාකාරකම/ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/නිමැවුම |
|---|---|---|
| කාර්යමණ්ඩල සංවර්ධන වැඩසටහන් | උපාධිධාරී පුහුණු වැඩසටහන්වල දේශන පවත්වන ලදී | |
| ජාත්‍යන්තර මට්ටමේ දායකත්වය | ජාත්‍යන්තර සහරා සඳහා සමාලෝචක දායකත්ව | ජාත්‍යන්තර සහරා සමාලෝචක, ආචාර්ය උපාධි වැඩසටහන් විභාග පරීක්ෂක: පීඨයේ ජාත්‍යන්තර සම්මේලනය - ICME 2021 |
| කමිටු සහ ඒවාට සම්බන්ධ සාමාජිකයන් ගණන | OTS තාක්ෂණික ඇගයීම් කමිටු/ ELTA ELSE ව්‍යාපෘතිය; ශිෂ්‍ය විනය කමිටුව, ශිෂ්‍ය උපදේශනය, විභාග වැරදි, කාර්යමණ්ඩල සංවර්ධනය, තත්ත්ව ආරක්ෂණය, වෘත්තීය මාර්ගෝපදේශනය | ව්‍යාපෘති සම්පූර්ණ කිරීම<br><br>විශ්වවිද්‍යාලය, පීඨය සහ අංශ, අධ්‍යනාංශ ආදියේ මෙහෙයුම් කටයුතු සඳහා පහසුකම් සැපයීම |
| ලැබුණු ප්‍රදාන (අරමුණ සහ ප්‍රමාණය)<br>- දේශීය<br>- ජාත්‍යන්තර | AHEAD ආචාර්ය උපාධි ශිෂ්‍යත්වය<br><br>ELTA ELSE පීඨ ප්‍රදානය | ආචාර්ය උපාධි- කාර්යමණ්ඩල සාමාජිකයන් තිදෙනෙක්<br><br>පීඨයේ ඉගැන්වීම් ඉගෙනුම් පරිසරය අභිවර්ධනය කිරීම, මාර්ගගත ඉගැන්වීම් පහසුකම; තොරතුරු සන්නිවේදන තාක්ෂණ විද්‍යාගාරය, භාෂා විද්‍යාගාරය, දැනුම් සංවාද මණ්ඩප, කාර්මික සබඳතා, අති නවීන ශ්‍රව්‍ය දෘශ්‍ය මධ්‍යස්ථානය හා සාකච්ඡා කාමර ආදිය සඳහා රු. මිලියන 120 ක් |
| පවත්වනු ලැබූ වැඩමුළු/සම්මන්ත්‍රණ/සම්මේලන<br>- අභ්‍යන්තර<br>- දේශීය | 10 වැනි කළමනාකරණ හා ආර්ථික විද්‍යා ජාත්‍යන්තර සම්මේලනය 2020 (ICME 2020)<br><br>උපාධි අපේක්ෂක පර්යේෂණ සංසදය 2021<br><br>Idea Cloud 2020 | ආචාර්යවරුන්, පශ්චාත් උපාධි ශිෂ්‍යයන් සහ කර්මාන්තය<br><br>ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල උපාධි අපේක්ෂක ශිෂ්‍යයන් |
| ප්‍රජා විනිදුම්කරණ ක්‍රියාකාරකම් | උසස් පෙළ ගුරුවරුන්ගේ වැඩමුළුව -වාණිජ විෂය ධාරාව<br><br>ව්‍යාපෘති යෝජනා සකස් කිරීමේ සම්පත් දායක<br><br>ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් | දකුණු පළාතේ උසස් පෙළ ගුරුවරුන් සහ ශිෂ්‍යයන් |

## ප්‍රකාශන හා දැනුම ප්‍රචාරණය

| කාණ්ඩය | සංඛ්‍යාව |
|---|---|
| උපුටා දැක්වීමේ සුචියේ ඇතුළත් ජාත්‍යන්තර සහරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 20 |
| උපුටා දැක්වීමේ සුචියේ ඇතුළත් නොවූ ජාත්‍යන්තර සහරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 08 |
| මුද්‍රිත වාර්තාවල පූර්ණ නිබන්ධන | 20 |
| වාචික ඉදිරිපත්කිරීම්වල සංක්ෂේප | 05 |
| පොත්වල ඡේද | 02 |
| **එකතුව** | **55** |

# වෛද්‍ය පීඨය

## පීඨාධිපතිගේ ප්‍රකාශනය

කොවිඩ්-19 වසංගතය හේතුවෙන් රටේ පැවැති අවිනිශ්චිත තත්ත්වය හමුවේ වුවද පීඨයක් ලෙස ප්‍රධාන ඉලක්ක සාක්ෂාත් කරගැනීමට හැකි වුණි.

ශිෂ්‍යයන්ට උසස් අධ්‍යාපන අවස්ථා ඉහළ නැංවීමේ රාජ්‍ය ප්‍රතිපත්තියට සහාය වෙමින් 2019 උසස් පෙළ විභාගයෙන් බඳවා ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කරමින් නව ශිෂ්‍ය කණ්ඩායම තුළ ශිෂ්‍යයන් 263 දෙනෙකුට ඉඩ පහසුකම් සලසාලීමට අපට හැකි වූ අතර ඒ අනුව ඉහළම බඳවා ගැනීම සහිත වෛද්‍ය පීඨය බවටට පත්වීමට අපට හැකි විය.

සියලු අහිතකර තත්ත්වයන් මධ්‍යයේ වුවද, මාර්ගගත හා භෞතික යන දෙයාකාරයෙන්ම අධ්‍යයන කටයුතු අවහිරයකින් තොරව පවත්වාගෙන යනු ලැබීය. සුළු බාධක කිහිපයක් පමණක් හැරුණු විට සායනික පුහුණුව වර්ෂය පුරාම පවත්වා අවසන් වසරේ සිසුන් නියමිත පරිදි පුහුණුව නිමා කිරීමට කටයුතු සැලැස්වූ අතර අනෙකුත් සියලු ප්‍රධාන විභාග සැලකිය යුතු ප්‍රමාදයකින් තොරව පවත්වනු ලැබීය.

නේවාසිකාගාර තුළ මෙන්ම නේවාසිකාගාර වලින් පිටතදී ද සිසුන් සුළු පිරිසකට කොවිඩ් වැළඳුණු අතර එය සාර්ථකව පාලනය කර අධ්‍යයන වැඩසටහන බාධාවකින් තොරව නොකඩවා පවත්වාගෙන යන ලදී.

පීඨයේ සියලු ප්‍රධාන අධ්‍යයන කාර්යයන් සිදුකළ අතර කොවිඩ් වසංගතය හේතුවෙන් කල් දැමූ 2020 වසරේ වෛද්‍ය පීඨ අධ්‍යයන සැසි 2021 මාර්තු මාසයේ පැවැත්වීමට අමතරව 2021 වසරේ වෛද්‍ය පීඨයේ අධ්‍යයන සැසි දෙසැම්බර් මස දෙමුහුන් ඉසව්වක් ලෙස සාර්ථකව පවත්වනු ලැබීය.

දානමය පුණ්‍ය කර්මය සහ පිරිත් පිංකම කොවිඩ් මාර්ගෝපදේශවලට අනුගත වෙමින් සීමිත පිරිසකගේ සහභාගිත්වයෙන් 2021 මාර්තු මස සිදුකරන ලදී.

වෛද්‍ය පීඨයේ සංස්කෘතික මධ්‍යස්ථානය සාහිත්‍යය, කාව්‍යය, සිනමාව, සංගීතය සහ අත්කම් ආශ්‍රිත සංස්කෘතික උත්සව ගණනාවක් පැවැත්වූ අතර වසර අවසානයේදී නත්තල් කැරොල් ගී ප්‍රසංගයක් ද මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍රයන්ගේ මනමේ විශේෂ දැක්මක් ද වේදිකාගත කරන ලදී.

**ශිෂ්‍ය සාධන**

අදාළ සංගම් සහ සමිති විසින් පවත්වන ලද ළමා රෝග විද්‍යා ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන, විකිරණවේදය පිළිබඳ ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන සහ කායික විද්‍යා ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන වැනි වැඩසටහන් රැසකට ශිෂ්‍යන්ට සහභාගිවීමට හැකි වූ අතර 2021 අන්තර් විශ්වවිද්‍යාල වෙස් ශූරතාවයේදී වෛද්‍ය පීඨ සිසුන් 4 දෙනකු ඇතුලත් වූ විශ්වවිද්‍යාලයේ කණ්ඩායම අනුශූරතාව දිනා ගන්නා ලදී. එහිදී වෛද්‍ය පීඨය නියෝජනය කරනු ලැබුයේ 39 වන ශිෂ්‍ය කාණ්ඩයේ නෙත්මි යසාරා විතානගේ (නායිකා) සහ මල්ෂා දනුදී, 40 වන ශිෂ්‍ය කාණ්ඩයේ සිනෙලි කුමාරසිංහ සහ 41 වන ශිෂ්‍ය කාණ්ඩයේ තුෂාර එදිරිවීර යන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ය.

රුහුණ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ 41වන ශිෂ්‍ය කාණ්ඩයේ ශිෂ්‍යයකු වූ මෙවන් ඉඳුරුව විශ්වවිද්‍යාල ක්‍රීඩා සම්මේලනයේ ස්වේච්ඡා නායක ඇකඩමියෙහි ශ්‍රී ලංකාව නියෝජනය කිරීම සඳහා තෝරා ගනු ලැබීය.

ඉන්දුනීසියානු විශ්වවිද්‍යාල ක්‍රීඩා සම්මේලනය විසින් සත්කාරකත්වය දැරූ වෙස් තරඟාවලියේදී, 40වන ශිෂ්‍ය කාණ්ඩයේ සිනෙලි කුමාරසිංහ ශ්‍රී ලංකාව නියෝජනය කරනු ලැබීය. එහිදී ඇය ලකුණු 4ක් ලබාගත් අතර සමස්ත තරඟයේ 7වන ස්ථානය ශ්‍රී ලංකාවට හිමි වුණි.

ඩබ්ලියු.පී.එම්. මෙන්ඩිස්, ඩබ්ලියු. එච්. ඒ. ප්‍රශාන්ති භාග්‍යා, ඊ.එස්. ඩිල්ෂරා ද සිල්වා, ටී.ටී.පතිරගේ, කේ.පී.එස්. කල්පනා සහ ඩබ්ලියු.පී.එච්. අමරදාස ඇතුළු වෛද්‍ය ශිෂ්‍ය කණ්ඩායමක් ශ්‍රී ලංකා විකිරණවේදීන්ගේ සංගමය මගින් නොවැම්බර් 6 දින සංවිධානය කර පළමුවරට පවත්වනු ලැබූ ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනට සහභාගි විය.

36වන ශිෂ්‍ය කාණ්ඩයේ ඩබ්.කේ. මිතුන් සහ නිමිසිස් හංසිනි ශ්‍රී ලංකා භිෂග්වේද හා චිකිත්සා සංගමය විසින් සංවිධානය කරනු ලැබූ පෝස්ටර් තරඟයේ දෙවන හා තෙවන ස්ථාන දිනාගත් අතර නිමිසිස් හංසින් මෙනෙවියගේ පෝස්ටරය ජාත්‍යන්තර මූලික භිෂග්වේද හා චිකිස්සා සංගමයේ හොඳම පෝස්ටර් 10 අතරට තෝරා ගන්නා ලදී. හොඳම පෝස්ටර් 10 අතරට තේරුණු එකම ශ්‍රී ලාංකික නිර්මාණය එය විය.

**කාර්ය මණ්ඩලය**

පහත දැක්වෙන නම කාර්ය මණ්ඩල සාමාජිකයන් බඳවා ගන්නා ලදී.

ආචාර්ය වී.ජී.සී. රාජකරුණා මහතා පරිවාස කථිකාචාර්යවරයකු ලෙස ප්‍රජා වෛද්‍ය අධ්‍යනාංශයට බඳවා ගන්නා ලදී.

වෛද්‍ය අධ්‍යාපන හා කාර්ය මණ්ඩල සංවර්ධන ඒකකයේ ශාලිකා පතිරණ මිය පරිවාස කථිකාචාර්යවරියක ලෙස සම්බන්ධ විය.

ඒ.කේ.ඩී.වී.කේ. විමලසිරි මහතා පරිවාස කථිකාචර්යවරයකු ලෙස ජෛවරසායන අධ්‍යනාංශයට බඳවා ගන්නා ලදී.

ඩබ්.එන්.ඩී ද සිල්වා මිය පරිවාස කථිකාචර්යවරයකු ලෙස ජෛවරසායන අධ්‍යනාංශයට බඳවා ගන්නා ලදී.

ආචාර්ය ඩී. ලියනගේ මහතා පරිවාස කථිකාචර්යවරයකු ලෙස න්‍යාෂ්ඨික වෛද්‍ය විද්‍යා ඒකකයට බඳවා ගන්නා ලදී.

ආචාර්ය ඩී.ජී.සී.එච්. ජයවර්ධන මහතා පරිවාස කථිකාචර්යවරයකු ලෙස ප්‍රජා වෛද්‍ය විද්‍යා අධ්‍යනාංශයට බඳවා ගන්නා ලදී.

ආචාර්ය විශාරි ද සිල්වා මිය පරිවාස කථිකාචර්යවරයකු ලෙස ප්‍රජා වෛද්‍ය විද්‍යා අධ්‍යනාංශයට බඳවා ගන්නා ලදී.

ආචාර්ය අයි.එල්. වික්‍රමනායක පරිවාස කථිකාචර්යවරයකු ලෙස ව්‍යාධිවේද අධ්‍යනාංශයට බැඳුණි.

ආචාර්ය ශානක මොහොට්ටි මහතා පරිවාස කථිකාචර්යවරයකු ලෙස කායික විද්‍යා අධ්‍යනාංශයට බඳවා ගන්නා ලදී.

ආචාර්ය ඩී.එන්. හිරිමුතුගොඩ මහතා පරිවාස කථිකාචර්යවරයකු ලෙස කාය ව්‍යවච්ඡේද අධ්‍යනාංශයට බැඳුණි.

**උසස්වීම්**

ව්‍යවච්ඡේද අධ්‍යනාංශයේ මහාචාර්ය ඉසුරාණි ඉලේපෙරුම මහත්මිය ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ධුරයට උසස් කරන ලදී.

පහත දැක්වෙන සාමාජිකයන් මහාචාර්යවරුන්/සහාය මහාචාර්යවරුන් ලෙස උසස් කරන ලදී

ආචාර්ය එච්.එම්.එම්. හේරත්
වෛද්‍ය විද්‍යා අධ්‍යනාංශය
ආචාර්ය ගයනි ලියනගේ
භිෂග්වේද අධ්‍යනාංශය
එල්.ඩබ්.ජී.ආර්. අල්විස්
ව්‍යවච්ඡේද අධ්‍යනාංශය
ආචාර්ය අමරනාත් කරුණානායක
කායික විද්‍යා අධ්‍යනාංශය
ආචාර්ය එයිෂා වෛද්‍යරත්න
ව්‍යවච්ඡේද අධ්‍යනාංශය
ආචාර්ය එම්.ටී. නාපාගොඩ
ජෛවරසායන අධ්‍යනාංශය
ආචාර්ය එන්.ජේ. දහනායක
වෛද්‍ය විද්‍යා අධ්‍යනාංශය

ප්‍රජා වෛද්‍ය විද්‍යා අධ්‍යනාංශයේ ආචාර්ය කේ.කේ. ඩබ්.ජේ. සී ද සිල්වා මයා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු II ශ්‍රේණියට උසස් කරන ලදී.

ප්‍රජා වෛද්‍ය විද්‍යා අධ්‍යනාංශයේ පරිවාස කථිකාචාර්ය ආචාර්ය අයි.එල්.ඒ.එන්. දර්ශන මහතා සේවයේ ස්ථිර කරන ලදී.

**සම්මාන**

ආචාර්ය ඩී. ලියනගේ මහතා සහ මහාචාර්ය එම්.හෙට්ටිආරච්චි මහතා "වෛද්‍ය පීඨයේ ආජන්ම මන්දතයිරොයිඩතාව පරීක්ෂා කිරීමේ කාර්යසාධනය කෙරෙහි කොවිඩ්-19 වසංගත තත්ත්වයේ බලපෑම්" පිළිබඳව ඉදිරිපත් කළ පෝස්ටරය සඳහා ගාල්ල වෛද්‍ය සංගමයේ 80 වැනි වාර්ෂික ශාස්ත්‍රීය සැසිවලදි හොඳම ඉදිරිපත් කිරීම සඳහා සම්මානය දිනාගන්නා ලදී.

**යටිතල පහසුකම් සංවර්ධනය**

රටේ පැවැති අයහපත් තත්ත්වය මධ්‍යයේ වුව ද, පීඨයේ යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සිදු කෙරුණි.

විභාග ශාඛාව පුළුල් කොට වැඩි දියුණු කරන ලද අතර පීඨාධිපති කාර්යාලය පුළුල් කරන ලදී. මුදල් ශාඛාව ප්‍රධාන කාර්යාල සංකීර්ණයේ සිට මෑතකදි අළුත්වැඩියා කරන ලද වඩා ඉඩ පහසුකම් සහිත නව ස්ථානයක් කරා රැගෙන යන ලදී.

දේශන ශාලා තුනක් වායු සමන හා තිර රෙදි යොදා වැඩි දියුණු කර වැඩියෙන් බඳවාගත්

ශිෂ්‍යයන් වෙනුවෙන් වඩා යහපත් ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කරන ලදී.

**වැඩසටහන් සමාලෝචනය**

විභාග අත්පොතේ දී ඇති මාර්ගෝපදේශ ප්‍රකාරව ප්‍රධාන විභාගයේදී සිදුකරන බැවින් පාඨමාලා ඇගයීම් ක්‍රියාවලිය සුසංවිධිත කරන ලදී.

විභාග සහ සියලු විෂය ක්ෂෙත්‍රවල ඒකීයත්වය පවත්වා ගනු පිණිස ලකුණු සටහන් පත්‍රිකා ඇතුළුව විභාග ලකුණු ලේඛනකරණය යාවත්කාලීන කරන ලදී.

වෛද්‍ය පීඨ ඉතිහාසයේ ප්‍රථම වරට, වෙනස් විභාග පරීක්ෂකවරුන්ගේ ලකුණු අතර අසාධාරණ විෂමතාවක් ඇති බව නිරීක්ෂණය වූ හෙයින් වෛද්‍ය උපාධි අවසාන විභාගයේ ශල්‍ය වෛද්‍ය ලකුණු නැවැත සලකා බලා නිවැරැදි කරන ලද අතර එහි ප්‍රතිඵලයක් ලෙස ශිෂ්‍යයන් 9 දෙනෙකු අවසාන විභාගය සමත්වූ අතර කණ්ඩායමේ අනෙකුත් ශිෂ්‍යයන් සමග සීමාවාසික පුහුණුව ඔවුනට ලබාදීම පිණිස උචිත ක්‍රියාමාර්ග ගන්නා ලදී.

2019 ප්‍රගති සමාලෝචනයේදී ලබා දුන් නිර්දේශවලින් 50% කට වැඩි ගණනක් සම්පූර්ණ කර ඇති අතර ඉතිරි නිර්දේශ මැනවින් ප්‍රගතිය කරා ගමන් කරමින් පවතී. පීඨයේ තත්ත්ව ආරක්ෂණ ඒකකය ප්‍රතිසංස්කරණය කරන ලද ගොඩනැගිල්ලක වඩා ඉඩකඩ ඇති නව කාර්යාලයකට රැගෙන යන ලදී.

මෙම වසරේ ඉතා වැදගත් සිදුවීම් දෙකක් වූයේ ශිෂ්ය දුක්ගැනවිලි කමිටුව ස්ථාපිත කිරීම හා ලිංගික හිංසනය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පාදක ප්‍රචණ්ඩත්වය පිළිබඳ පැමිණිළි කළමනාකරණය කිරීම පිණිස පද්ධතියක් සකස් කිරීමයි.

හදිසි අවස්ථාව ඇමතුම් අංකයක් හරහා දවසේ ඕනෑම වේලාවක ශිෂ්‍ය උපදේශකයන් වෙත ප්‍රවේශ විය හැකි පරිදි ශිෂ්‍යයන් සඳහා පැය 24 පුරා ක්‍රියාත්මක මාර්ගගත සේවා සහිතව ශිෂ්‍ය උපකාරක සේවාව එය මුලින් පිහිටා තිබූ ස්ථානයේ නැවැත ස්ථාපනය කරන ලදී.

වෛද්‍ය ශිෂ්‍යයන් සහ කාර්ය මණ්ඩලයේ පූර්ණ සහභාගිත්වය සහිතව ජාතික කොවිඩ් මධ්‍යස්ථානය සමග සබැඳි කොවිඩ් ඇමතුම් මධ්‍යස්ථානයක් පීඨය පවත්වා ගෙන ගිය අතර එය මාස කිහිපයක් පුරා අඛණ්ඩව ක්‍රියාත්මක වූ අතර කොවිඩ් වංසංගත තත්ත්වය පහව යාමත් සමගින් එහි කටයුතු අත්හිටුවන ලදී.

**විෂයමාලා ප්‍රතිශෝධනය**

පසුගිය වසර කිහිපය පුරා පීඨය විෂය නිර්දේශයේ ප්‍රධාන වෙනස්කම් සිදුකිරීමේ නිරතව සිටි අතර එම කටයුතු මේ වන විට අවසන් වෙමින් පවතින අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමේ කටයුතු සිදුකරමින් පවතී

## පීඨ සමාලෝචනය

| වැඩසටහන | ක්‍රියාකාරකම/ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/නිමැවුම |
|---|---|---|
| අළුතින් හඳුන්වා දුන් පාඨමාලා (පාඨමාලා ඒකක) | <u>ප්‍රසවවේද හා නාරීවේද අධ්‍යනාංශය</u><br>විගණන යෝජනාවක් සකස් කිරීමේ පැවැරුම<br><br><u>ප්‍රසවවේද හා නාරීවේද අධ්‍යනාංශය</u><br>වාචික පරීක්ෂණ සහිත ලොග් පොත් ඇගයුම | සිව්වැනි වසරේ වෛද්‍ය ශිෂ්‍යයන් (40 වන කාණ්ඩයේ සිට ඉදිරියට) |
| දුරස්ථ අධ්‍යාපනය වැඩසටහන් හෝ ව්‍යාප්ති පාඨමාලා | <u>ප්‍රසවවේද හා නාරීවේද අධ්‍යනාංශය</u><br>විද්‍යාවේදී (හෙද) උපාධි වැඩසටහන<br>කථිකාචාර්යවරු :ආචාර්ය එම්.ඩී.සී.එස්. කුලරත්න<br>ආචාර්ය ජේ.ඒ.පී. ධම්මික<br>ආචාර්ය කේ.ඒ.ගුණරත්න<br>විභාග : ආචාර්ය එම්.එෆ්.එම්. රමීස්<br>පරීක්ෂකවරු ආචාර්ය ඩී.එල්.ඩබ්. දසනායක<br>ආචාර්ය එම්.ඒ.සී. ඉරේෂා<br><br><u>ප්‍රසවවේද හා නාරීවේද අධ්‍යනාංශය</u><br>කථිකාචාර්යවරු: ආචාර්ය එම්.ඩී.සී.එස්. කුලරත්න<br>ආචාර්ය ජේ.ඒ.පී. ධම්මික<br>ආචාර්ය කේ.ඒ.ගුණරත්න<br>ආචර්ය එම්.එෆ්.එම්.රමීස් | සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ පරිපූරක වෛද්‍ය උපාධි වැඩසටහනේ හෙද විද්‍යා උපාධි අපේක්ෂකයන්<br><br>පශ්චාත් මූලික හෙදියන්, අභ්‍යාසලාභී හෙදියන් සහ පවුල් සෞඛ්‍ය සේවිකාවන් හෙද පුහුණු පාසල, ගාල්ල (සෞඛ්‍ය අමාත්‍යාංශය) |

| වැඩසටහන | ක්‍රියාකාරකම/ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/නිමැවුම |
|---|---|---|
| දුරස්ථ අධ්‍යාපනය වැඩසටහන් හෝ ව්‍යාප්ති පාඨමාලා | විභාග පරීක්ෂකවරු: ආචාර්ය ඩී.එල්.ඩබ්. දසනායක, ආචාර්ය එම්.ඒ.ජී. ඉරේෂා පශ්චාත් මූලික හෙදියන්, අභ්‍යාසලාභී හෙදියන් සහ පවුල් සෞඛ්‍ය සේවිකාවන් සඳහා සුති විද්‍යා පුහුණුව | |
| ගාස්තු අයකරන පාඨමාලා | <u>භිෂග්වේද අධ්‍යනාංශය</u><br>මහාචාර්ය සුධීරා අමරසිංහ, මහාචාර්ය ගයනි ලියනගේ, ආචාර්ය ඉසුරු අමරසිංහ, ආචාර්ය ආර්.ඒ. වාසනා සෙව්වන්දි, ආචාර්ය සහන් මෙන්ඩිස්, ආචාර්ය තිලිණි එම් මධුෂිකා - භිෂග්වේද අධ්‍යනාංශය විසින් කරාපිටිය ශික්ෂණ රෝහලේ භානිකර ඖෂධ ප්‍රතික්‍රියා වාර්තා කිරීම. | ප්‍රතිලාභීන්-රෝගීන්, වෛද්‍යවරුන්<br>නිමැවුම_ ඖෂධවල අහිතකර ප්‍රතික්‍රියා පිළිබඳ වාර්තාව<br>වාචික ඉදිරිපත්කිරීම් සහ පීඨයේ ශාස්ත්‍රීය සැසි මගින් ගාල්ල වෛද්‍ය සංගමයේ වාර්ෂික ශාස්ත්‍රීය සැසිවලදී නිරීක්ෂණ ඉදිරිපත් කිරීම |
| ප්‍රජා සේවා | <u>ප්‍රසවවේද හා නාරිවේද අධ්‍යනාංශය</u><br>ආචාර්ය එම්.ඩී.ඕ.එස්. කුලරත්න -කාර්යමණ්ඩල සංවර්ධන වැඩසටහන<br>ආචාර්ය ඩී.එල්.ඩබ්. දසනායක මදසාළල්‍යතා මව්වරුන් වෙනුවෙන් ප්‍රජාව සඳහා පොතක් ලියන ලදී.<br>සමාජ මාධය ඔස්සේ මද සාළල්‍යතා යුවල, පුරෝසූති මව්වරුන් දැනුවත් කිරීම<br>ආචාර්ය එම්.ඒ.ජී. ඉරේෂා - මද සාළල්‍යතා යුවල් දැනුවත් කිරීම පිණිස රූපවාහිනී වැඩසටහන<br><u>ව්‍යාධිවේද අධ්‍යනාංශය</u><br>සේවා කර්තව්‍ය: කරාපිටිය ශික්ෂණ රෝහලේ මහාචාර්ය ඒකක සඳහා රෝග නිර්ණක සේවා පටකව්‍යාධිවේදය (රෝගීන් 657 දෙනෙකුගේ ජෛවේක්ෂා)<br>සේවා කර්තව්‍ය: කරාපිටිය ශික්ෂණ රෝහලේ මහාචාර්ය ඒකක සඳහා රෝග නිර්ණක සේවා සෛලව්‍යාධිවේදය (රෝගීන් 139 දෙනෙකුගේ ජෛවේක්ෂා)<br>සේවා කර්තව්‍ය: කරාපිටිය ශික්ෂණ රෝහලේ මහාචාර්ය ඒකක සඳහා රෝග නිර්ණක සේවා මූත්‍රවල ද්විරූපී රතු සෛල (රෝගීන් 27 දෙනෙකුගේ ජෛවේක්ෂා)<br>ඇට මිදුලු සඳහා විශේෂ රංජන - දකුණු පළාතේ රෝහල්<br><u>ප්‍රජා වෛද්‍ය විද්‍යා අධ්‍යනාංශය</u><br>මාතෘ හා ළමා සෞඛ්‍ය සායන සහ පාසල් වෛද්‍ය පරීක්ෂාකිරීම් සඳහා බෝපේ පෝද්දල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය සමග ප්‍රජා වෛද්‍ය විද්‍යා අධ්‍යනාංශය එක්වන ලදී.<br>ආචාර්ය ටී.වී. පොන්නම්පෙරුම - පවුල් ප්‍රතිකාර සායන පවත්වන ලදී, වෛද්‍ය පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය | අක්මීමන සෞඛ්‍ය වෛද්‍ය කාර්යාල කාර්ය මණ්ඩලයේ වෛද්‍යවරුන්, හෙදියන් හා සුති විද්‍යා කාර්ය මණ්ඩලය මද සාළල්‍යතා කාන්තාවන්<br>මද සාළල්‍යතා කාන්තාවන්<br>රෝසූති මව්වරුන් සහ මද සාළල්‍යතා කාන්තාවන්<br>මද සාළල්‍යතා කාන්තාවන්<br>ශික්ෂණ රෝහල, ශල්‍ය වෛද්‍ය මහාචාර්ය ඒකකය. දකුණු පළාතේ ජනතාව, පශ්චාත් උපාධි අභ්‍යාසලාභීන්<br>දකුණු පළාතේ රෝගීන්<br>බෝපේ පෝද්දල ප්‍රදේශයේ ළමා හා මාතෘ සෞඛ්‍ය රැකවරණ ලබන්නන්<br>සායනයට පැමිණෙන රෝගීන් |

| වැඩසටහන | ක්‍රියාකාරකම/ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/නිමැවුම |
|---|---|---|
| ප්‍රජා සේවා | ආචාර්ය පී.එල්.ඒ.එන්. ලියනගේ - බෝපේ පෝද්දල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල ප්‍රදේශයේ සහ තලපිටිය පවුල් වෛද්‍ය සායනයේ වර්මවේද සායන පවත්වන ලදී. | රුහුණ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ශිෂ්‍යයන්<br><br>බෝපේ පෝද්දල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල ප්‍රදේශයේ ජනතාව සහ තලපිටිය ප්‍රදේශයේ රෝගීන් |
| විෂයමාලා සංවර්ධනය (පාඨමාලා ඒකක/විෂයයන් වැඩි දියුණු කිරීම) | ආචාර්ය එම්.ඩී.සී.එස්. කුලරත්න- සාමාජික - ප්‍රසවවේදය සහ නාරීවේදය හර විෂයමාලාව<br><br>ආචාර්ය ඩී.එල්.ඩබ්. දසනායක- සාමාජික - පවුල් සැලසුම්කරණය -හර විෂයමාලාව<br><br>සමාලෝචක- නව විෂයමාලාව- මහජන සෞඛ්‍ය හෙද වැඩසටහන, ස.සෞ.පී.<br><br>සමාජික -හර විෂයමාලාව, වි.ප්‍ර.කොා.සභාව<br><br>සාමාජික- වෛද්‍ය පීඨය සඳහා යෝජිත නව විෂයමාලාව, වෘත්තීය හා පුද්ගල සංවර්ධන මොඩියුලය<br><br>සාමාජික- වෛද්‍ය විද්‍යා ආචාර්ය උපාධියේ විෂයමාලා සංශෝධනය (ප්‍රසව හා නාරීවේද) වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය<br><br><u>ප්‍රජා වෛද්‍ය විද්‍යා අධ්‍යනාංශය</u><br>බාහිර විශේෂඥයන් මගින් විෂයමාලා අන්තර්ගතය හා ඉගෙනුම්/ඉගැන්වීම් ක්‍රමවේද සමාලෝචනය කරවීම අධ්‍යනාංශය ආරම්භ කරන ලදී | උපාධි අපේක්ෂකයන්<br><br>උපාධි අපේක්ෂකයන් විශ්වවිද්‍යාල පරිපාලන පද්ධතිය සමසෞඛ්‍ය විද්‍යා පීඨයේ හෙද උපාධි ශිෂ්‍යයන්<br><br>වෛද්‍ය උපාධි අපේක්ෂකයන්<br><br>විශ්වවිද්‍යාල පරිපාලන පද්ධතිය<br><br>වෛද්‍ය උපාධි අපේක්ෂකයන්<br><br>ප්‍රසවවේද හා නාරීවේද පශ්චාත් උපාධි පුහුණුලාභීන්<br><br>රුහුණ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ශිෂ්‍යයන් |
| කාර්යමණ්ඩල සංවර්ධන වැඩසටහන් | <u>ඖෂධවේද අධ්‍යනාංශය</u><br>ආචාර්ය ආර්.ඒ. වාසනා සෙව්වන්ද, ආචාර්ය එම් තිලිණි මධුශිකා- 2021 වසරේදී CCPDHE සම්පූර්ණ කරන ලදී<br><br>ආචාර්ය සහන් මෙන්ඩිස් CCPDHE සඳහා සහභාගි විය<br><br><u>ප්‍රසවවේද හා නාරීවේද අධ්‍යනාංශය</u><br>ආචාර්ය ජේ.ඒ.පී. ධම්මිකා, මහමෝදර ශික්ෂණ රෝහලේ විශ්වවිද්‍යාල ඒකකයේ සාමාජිකයන් සඳහා සතිපතා අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් පවත්වන ලදී | තමනගේ වෘත්තීමය සංවර්ධනය<br><br>ප්‍රතිලාභීන් - කථිකාචාර්යවරුන්, ශිෂ්‍යයන්<br><br>ප්‍රසවවේද හා නාරීවේද අධ්‍යනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් සහ පශ්චාත් උපාධි පුහුණුලාභීන් (ප්‍රසව හා නාරීවේද) මහමෝදර ශික්ෂණ රෝහලේ ප්‍රසව හා නාරීවේද විශ්වවිද්‍යාල ඒකකයට අනුබද්ධිත සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වෛද්‍ය නිලධාරීන් |
| ජාතික සංවර්ධනය සඳහා දායකත්වය | <u>භිෂග්වේද අධ්‍යනාංශය</u><br>මහාචාර්ය සුධීරා ජයසිංහ - ජාතික ඖෂධ නියාමන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, ජා.ඖ.නි.අ. ලේඛන ගොනු ඇගයීම්කරු, වෛද්‍ය උපකරණ සඳහා විශ්වාස්‍යතා පථයේ කමිටු සාමාජික සාමාජික, සායනික පරීක්ෂණ ඇගයීම් කමිටුව, ජා.ඖ.නි.අ. සම්බන්ධීකාරක, විද්‍යාවේදී උපාධිය, වෛද්‍ය ධූලකවේදය, වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | |

| වැඩසටහන | ක්‍රියාකාරකම/ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/නිමැවුම |
|---|---|---|
| ජාතික සංවර්ධනය සඳහා දායකත්වය | මහාචාර්ය ගයනි ලියනගේ- සායනික භිෂග්වේදය සහ චිකිත්සා විද්‍යාවේදී උපාධි අධ්‍යයන මණ්ඩල සාමාජික සහ වෛද්‍ය ධූලකවේදය, වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය බාහිර කථිකාචාර්ය | |
| | <u>ව්‍යාධිවේද අධ්‍යනාංශය</u><br>ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයට සේවා සපයන ලදී ISO 15189 ප්‍රමිතිය ප්‍රකාරව ප්‍රතීතනය සඳහා වෛද්‍ය විද්‍යාගාර ඇගයීම | ශ්‍රී ලංකා රජය<br>ජාත්‍යන්තර පිළිගැනීම |
| | ප්‍රතීතනය පිළිබඳ ජාතික වැඩමුළුවේ සම්පත් දායක | දිවයින පුරා මහජනතාව |
| | වෛද්‍ය රසායනාගාර ශිලපීන් සඳහා පවත්වනු ලැබූ ජාතික වැඩමුළුවේ සම්පත්දායක | |
| | ශ්‍රී ලංකා රක්තවේදීන්ගේ සංගමය විසින් පවත්වනු ලැබූ විද්‍යාගාර කළමනාකරණ සහතිකපත්‍ර පාඨමාලාවේ සම්පත් දායක | රෝගීන්, සායනික වෛද්‍යවරුන් |
| | යාපනය සහ රුහුණ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය හා වෛද්‍ය රසායනාගාර විද්‍යා උපාධි අපේක්ෂකයන්ට ඉගැන්වීම | ජාතික සෞඛ්‍යරක්ෂණයේ ගුණාත්මකබව සහ ආරක්ෂාව ඉහළ නැංවීම |
| | වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ විභාග පරීක්ෂක හා රක්තවේදය පිළිබඳ පශ්චාත් උපාධි ශිෂ්‍යාන්ගේ පුහුණුකරු | |
| | <u>ප්‍රජා වෛද්‍ය විද්‍යා අධ්‍යනාංශය</u><br>මහාචාර්ය පී.බී. පෙරේරා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ හෙද විද්‍යා උපාධි වැඩසටහනේ “සෞඛ්‍ය සංඛ්‍යාලේඛන” පාඨමාලා ඒකකය සඳහා සම්පත් දායකයකු විය | |
| | මහාචාර්ය පී.වී. ද සිල්වා කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වෛද්‍ය පරිපාලන අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයකු ලෙස කටයුතු කරන ලදී | ප්‍රතිපත්ති සම්පාදකයන්, වෘත්තිකයන්, පර්යේෂකයන් සහ ශ්‍රී ලංකාවේ සාමාන්‍ය ජනතාව |
| | වෛද්‍ය පර්යේෂණ ආයතනයේ පෝෂණ අධ්‍යනාංශය සහ කැළණිය විශ්වවිද්‍යාලයේ මහජන සෞඛ්‍ය අධ්‍යනාංශය සහ එක්සත් රාජධානියේ ලංඩන් නුවර ඉම්පීරියල් විද්‍යාතනය විසින් සංවිධානය කරනු ලැබූ සෞඛ්‍ය සම්පන්න ආහාර පරිසර ප්‍රතිපත්ති දර්ශකය- ශ්‍රී ලංකාව/සාක්ෂි වලංගුකරණය පිළිබඳ වැඩමුළු දෙකක තාක්ෂණික විශේෂඥයකු ලෙස ආචාර්ය සී.ජේ. විජේසිංහ මහතා සහභාගි විය | විද්වතුන් හා මහජන සෞඛ්‍ය සේවා සපයන්නන් |
| | ශ්‍රී ලංකා ප්‍රජා වෛද්‍යවරුන්ගේ ආයතනයේ දක්ෂිණ ශාඛාවේ සභාපති ලෙස ආචාර්ය සී.ජේ. විජේසිංහ මහතා කටයුතු කරන ලදී. | |
| | ආචාර්ය සී.ජේ. විජේසිංහ මහතා කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ප්‍රජා වෛද්‍ය විද්‍යා අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයකු ලෙස කටයුතු කරන ලදී. | |
| | ආචාර්ය ටී.ටී. පොන්නම්පෙරුම මහතා කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පවුල් වෛද්‍ය විද්‍යා අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයකු ලෙස කටයුතු කරන ලදී. | |

| වැඩසටහන | ක්‍රියාකාරකම/ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/නිමැවුම |
|---|---|---|
| ජාතික සංවර්ධනය සඳහා දායකත්වය | ආචාර්ය පී.එල්.ඒ.එන්. ලියනගේ මහතා කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වර්මවේද අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයකු ලෙස කටයුතු කරන ලදී. | වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ප්‍රසවවේද හා නාරිවේද පුහුණුලාභීන් |
| | ආචාර්ය කේ.කේ.ඩබ්.ජේ.සී. ද සිල්වා මහතා ශ්‍රී ලංකාවේ ජන්ම ඌනතා පිළිබඳ ජාතික විද්වත් කමිටුවේ සාමාජකයකු ලෙස සේවය කරන ලදී. | ප්‍රසවවේදීන් හා නාරීවේදීන් සහ මාතෘ සත්කාරක සේවාවන් හා සම්බන්ධ සියලු දෙනා<br>රුහුණ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය උපාධි අපේක්ෂකයන් |
| | <u>ප්‍රසවවේද හා නාරිවේද අධ්‍යනාංශය</u> | |
| | ආචාර්ය එම්.ඩී.සී.එස්. කුලරත්න ප්‍රසවවේද හා නාරිවේද අධ්‍යයන මණ්ඩලයේ විභාග පරීක්ෂක හා සාමාජික ,වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය | මහජන සෞඛ්‍ය සේවිකාවන් |
| | සෞඛ්‍ය අමාත්‍යාංශයේ මාතෘ සෞඛ්‍ය හා පවුල් සැලසුම් පිළිබඳ තාක්ෂණික උපදේශන කමිටුවේ සාමාජික | ප්‍රසවවේද හා නාරිවේද සායනික වෛද්‍යවරුන් |
| | රුහුණ විශ්වවිද්‍යාල උපාධි අධ්‍යයන පීඨයේ අධ්‍යයන මණ්ඩලයේ සාමාජික | හෙදවිද්‍යා විද්‍යාවේදී ශිෂ්‍යයන් |
| | සභාපති-ගාල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය රෝහල්වල පවුල් සෞඛ්‍ය සේවිකා ඇබෑර්තු ආශ්‍රිත ගැටලු විසඳීම පිණිස විද්වත් කමිටුවක් ස්ථාපිත කිරීම. | පවුල් සෞඛ්‍ය සේවිකාවන් |
| | සාමාජික- ප්‍රසවවේදය හා නාරිවේදය - විශේෂඥතා ක්ෂෙත්‍ර හතරෙහිම සායනික දර්ශක සමාලෝචනය හා ප්‍රතිශෝධනය | ප්‍රසවවේද හා නාරිවේද පශ්චාත් උපාධිධාරීන් |
| | ඒකක සංස්කාරක- NGU5404 (මාතෘ, නව්‍ය සුති සහ නාරිවේද හෙද විද්‍යාව) හෙදවිද්‍යා විද්‍යාවේදී ගෞරව උපාධි වැඩසටහන් පාඨමාලාව, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය | ප්‍රසවවේද හා නාරිවේද සායනික වෛද්‍යවරුන් |
| | සාමාජික- ශ්‍රී ලංකාවේ මූලික පවුල් සෞඛ්‍ය සේවිකා පුහුණුව සඳහා පුහුණු ආයතනයක්/ ජාලයක්/ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා වන ශක්‍යතා අධ්‍යයනයට මග පෙන්වීම හා පහසුකම් සැපයීම පිණිස ඉගැන්වීම් සම්බන්ධීකරණ කමිටුව | පුද්ගලික අංශයේ ජාතික සෞඛ්‍යසේවා සැපයුම |
| | ආචාර්ය සී.එල්.ඩබ්. දසනායක - විභාග පරීක්ෂක වෛද්‍යවේදී උපාධිය කොටස I සහ II, වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, සාමාජික- මාර්ගෝපදේශ සංවර්ධන කමිටුව - ශ්‍රී ලංකා නාරිවේදීන්ගේ ආයතනය | |
| | ACHS සඳහා සමීක්ෂක EQuIP 7 සඳහා නියමු විගණනයක් පවත්වන ලදී. | |
| | <u>ප්‍රජා වෛද්‍ය විද්‍යා අධ්‍යනාංශය</u> | |
| | මහාචාර්ය පී.වී. ද සිල්වා මහතා ඇ.එ.ජනපදයේ ඩියුක් විශ්වවිද්‍යාලයේ අනුබද්ධ මහාචාර්යවරයකු ලෙස කටයුතු කරන ලදී. | |
| කමිටු සහ ඒවාට සම්බන්ධ සාමාජිකයන් ගණන | ශ්‍රවණාගාර කමිටුව 11<br>පුස්තකාල කමිටුව 12<br>දේශන ශාලා කමිටුව 09<br>තොරතුරු තාක්ෂණ කමිටුව 09 | |

| වැඩසටහන | ක්‍රියාකාරකම/ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/නිමැවුම |
|---|---|---|
| කමිටු සහ ඒවාට සම්බන්ධ සාමාජිකයන් ගණන | වෛද්‍ය අධ්‍යාපනය හා කාර්මණ්ඩල සංවර්ධන කමිටුව 16<br>සෞඛ්‍ය කෞතුකාගාර කමිටුව 07<br>පර්යේෂණ කමිටුව 13<br>ආචාර ධර්ම සමාලෝචන කමිටුව 22<br>විෂයමාලා සංශෝධන කමිටුව 22<br>නේවාසිකාගාර කමිටුව 08<br>නිවාස කමිටුව 05<br>විෂයමාලා සංවර්ධන හා ඇගයීම් කමිටුව 50 | |
| ලැබුණු ප්‍රදාන (අරමුණ සහ ප්‍රමාණය)<br>- දේශීය<br>- ජාත්‍යන්තර | <u>භිෂග්වේද අධ්‍යනාංශය</u><br>ආචාර්ය එම්.ටී. -ගාල්ල වෛද්‍ය සංගමයේ පර්යේෂණ ප්‍රදානය රු. 100,000.00 (කරාපිටිය ශික්ෂණ රෝහලේ හානිකර ඖෂධ ප්‍රතික්‍රියා වාර්තාකරණය වැඩි දියුණු කිරීමේදී නව ජංගම යෙදුමක සහ වෙනස් කරන ලද හස්තමය ක්‍රියාදාමයක සඵලතාව මැයෙන් වූ ආචාර්ය උපාධි අධ්‍යයනය)<br>මහාචාර්ය සුධීරා ජයසිංහ- අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් සඳහා පීඨ පර්යේෂණ ප්‍රදානය (රු.103,000)<br><u>ක්ෂුද්‍රජීවවිද්‍යා අධ්‍යනාංශය</u><br>පීඨ පර්යේෂණ ප්‍රදානය | සක්‍රීය ආවේක්ෂණය මගින් හානිකර ඖෂධ ප්‍රතික්‍රියාවන්ට අදාළව ජංගම යෙදුමක සහ වෙනස් කරන ලද හස්තමය ක්‍රියාදාමයක සඵලතාව සොයා බැලීම.<br>කොවිඩ්-19 ආශ්‍රිතව සෞඛ්‍ය සේවකයන්ගේ සහ වෛද්‍ය උපාධි අපේක්ෂකයන්ගේ දැනුම, ආකල්ප හා පරිවයන් පිළිබඳ වැඩමුළුවක් ආචාර්ය එස්.එස්. වික්‍රමසිංහ මහතා පවත්වන ලදී. |
| සම්මාන/ පේටන්ට්<br>බලපත්‍ර/විශේෂ සාධන | <u>ප්‍රසවවේද හා නාරීවේද අධ්‍යනාංශය</u><br>ආචාර්ය ඩී.එල්.ඩබ්. දසනායක - ශ්‍රී ලංකා ප්‍රසවවේදීන්ගේ සංගමයේ වාර්ෂික විද්‍යාත්මක කොංග්‍රසයේ තරුණ ප්‍රසවවේදීන්ගේ ඉදිරිපත්කිරීම්වල දෙවන හොඳම නිබන්ධය<br><u>ක්ෂුද්‍රජීවවිද්‍යා අධ්‍යනාංශය</u><br>2021වෛද්‍ය පීඨ ශාස්ත්‍රීය සැසිවල හොඳම පෝස්ටරය<br><u>ව්‍යාධිවේද අධ්‍යනාංශය</u><br>ශ්‍රී ලංකා රක්තවේදීන්ගේ සංගමයේ වාර්ෂික සැසිවල හොඳම පෝස්ටරය සඳහා සම්මානය<br><u>ප්‍රජා වෛද්‍ය විද්‍යා අධ්‍යනාංශය</u><br>“ශ්‍රී ලංකාවේ නව යෞවනයන්ගේ මානසික සෞඛ්‍ය නිමැවුම් කෙරෙහි ක්ෂතික අත්දැකීම් සහ දෛනික ආතතිකාරකවල සාපේක්ෂ බලපෑම” මැයෙන් වූ නිබන්ධනය වෙනුවෙන් 2018 වසර සඳහා ජාතික පර්යේෂණ සභා කුසලතා සම්මානය ආචාර්ය ටී.ටී. පොන්නම්පෙරුමට හිමි විය. | ප්‍රසවවේද හා නාරීවේද සායනික වෛද්‍යවරුන්<br>එස්. ගුණසේන, එන්.පී. වීරසිංහ, ඩබ්.එම්.ඩී.ජී.බී. විජයරත්න, ඒ නාගහවත්ත, එස්.එස්. වික්‍රමසිංහ, එච්.එච්.පී.එම්.ජේ.තාබ්‍රෑ |

| වැඩසටහන | ක්‍රියාකාරකම/ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/නිමැවුම |
|---|---|---|
| පවත්වනු ලැබූ වැඩමුළු/සම්මන්ත්‍රණ/සම්මේලන (අභ්‍යන්තර හා දේශීය) | ආචාර්ය එම්.ඩී.සී.එස්. කුලරත්න, ආචාර්ය ජේ.ඒ.පී. ධම්මික, ආචාර්ය කේ.ඒ.ගුණරත්න, ආචාර්ය එම්.එෆ්.එම්. රමීස්- සම්පත් දායකයන්, ආචාර්ය ඩී.එල්.ඩබ්. දසනායක, ආචාර්ය එම්.ඒ.ජී. ඉරේෂා- පශ්චාත් උපාධි අධ්‍යයන දිනය | ප්‍රසවවේද හා නාරීවේද පශ්චාත් උපාධි පුහුණුලාභීන් |
| | ආචාර්ය ඩී.එල්.ඩබ්. දසනායක- හදිසි අවස්ථා වෛද්‍ය ලේඛාධිකාරිවරුන් සඳහා වැඩමුව 2ක් ද ප්‍රසවවේද හා නාරීවේද පශ්චාත් උපාධි පුහුණුලාභීන් සඳහා හදිසි අවස්ථා ප්‍රසවවේදය පිළිබඳ වැඩමුළු 2ක් ද පවත්වන ලදී. | හදිසි අවස්ථා වෛද්‍ය පශ්චාත් උපාධි පුහුණුලාභීන්<br><br>ප්‍රසවවේද හා නාරීවේද පශ්චාත් උපාධි පුහුණුලාභීන් |
| | වෛද්‍ය අධ්‍යාපනය හා කාර්යමණ්ඩල සංවර්ධන ඒකකය- මාතෘකා 15ක් යටතේ පර්යේෂණ ක්‍රමවේදය සකස් කිරීමේදී නිශ්චිත ක්ෂෙත්‍ර පිළිබඳ වැඩමුළු මාලාව | |
| | <u>ප්‍රජා වෛද්‍ය විද්‍යා අධ්‍යනාංශය</u> | |
| | සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් සඳහා "පර්යේෂණ යෝජනා සමාලෝචනය කරන ආකාරය" පිළිබඳ වැඩමුළුව සඳහා සම්පත් දායකයකු ලෙස මහාචාර්ය පී.බී.පෙරේරා මහතා සහභාගි විය. | සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් |
| | රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය 2021 මාර්තු 01 දින සංවිධානය කරන ලැබූ වෛද්‍යවරුන් සඳහා සායනික පර්යේෂණ උපකාරක කණ්ඩායමේ "උචිත අධ්‍යයන සැලැස්ම තෝරා ගැනීම" පිළිබඳ වැඩමුළුව සඳහා සම්පත් දායකයකු ලෙස ආචාර්ය ටී.ටී. පොන්නම්පෙරුම මහතා සහභාගි විය. | පශ්චාත් උපාධි ශිෂ්‍යයන්, කණිෂ්ඨ වෛද්‍යවරුන් |
| | ශ්‍රී ලංකා පෝෂණ සංගමය විසින් 2021 මැයි මාසයේ සංවිධානය කරනු ලැබූ "ගුණාත්මක ජෙව වෛද්‍ය පර්යේෂණයක් ආරම්භ කිරීම" පිළිබඳ වැඩමුළුව සඳහා සම්පත් දායකයන් ලෙස මහාචාර්ය පී.වී. ද සිල්වා, ආචාර්ය සී.ජේ. විජේසිංහ සහ ආචාර්ය ටී.ටී. පොන්නම්පෙරුම සහභාගි විය. | පශ්චාත් උපාධි ශිෂ්‍යයන්, කණිෂ්ඨ වෛද්‍යවරුන්, පර්යේෂකයන් |
| | වෛද්‍ය පීඨයේ වෛද්‍ය අධ්‍යාපන හා කාර්ය මණ්ඩල සංවර්ධන ඒකකය විසින් සංවිධානය කරනු ලැබූ පර්යේෂණ ක්‍රමවේද පිළිබඳ වැඩමුළු මාලාව සඳහා සම්පත් දායකයන් ලෙස මහාචාර්ය පී.වී. ද සිල්වා, ආචාර්ය සී.ජේ. විජේසිංහ සහ ආචාර්ය ටී.ටී. පොන්නම්පෙරුම සහභාගි විය. | පශ්චාත් උපාධි ශිෂ්‍යයන්, කණිෂ්ඨ වෛද්‍යවරුන් |
| | අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ ඒකකය- ස්වයං ඇගයීම් වාර්තා ලිවීම පිළිබඳ වැඩමුළු 02 | සභාපති/අ.ත.ආ.ඒ. |
| ප්‍රජා විහිදුම් ක්‍රියාකාරකම් | <u>භිෂග්වේද අධ්‍යනාංශය</u> | |
| | මහාචාර්ය සුධීරා ජයසිංහ - සම සංස්කාරක-ගාල්ල වෛද්‍ය සංගමය, මහාචාර්ය සුධීරා ජයසිංහ, කථිකාචාර්ය හා විභාග පරීක්ෂක, වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, මහාචාර්ය ගයනි ලියනගේ- කථිකාචාර්ය හා විභාග පරීක්ෂක, වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | |
| | <u>ප්‍රජා වෛද්‍ය විද්‍යා අධ්‍යනාංශය</u> | දකුණු පළාතේ නාවික හමුදා පිරිස් |
| | ආචාර්ය පී.එල්.ඒ.එන්. ලියනගේ මහතා බ්‍රිස්ස SLNS නිපුණ නාවුක හමුදා රෝහලේ මාසික වර්මවේද සායනයක් පවත්වන ලදී. | |
| | <u>ව්‍යවච්ඡේද විද්‍යා අධ්‍යනාංශය</u> | මනෝ චිකිත්සා තෝරා ගැනීමේ විභාගය සඳහා සූදානම් වන ආචාර්ය උපාධි පුහුණුලාභීන් |
| | මනෝවෛද්‍යවරුන්ගේ සංගමය විසින් සංවිධානය කරනු ලැබූ මනෝ විද්‍යා ආචාර්ය උපාධි පුහුණු වැඩසටහනේ සම්පත් දායක | |

## ප්‍රකාශන හා දැනුම ප්‍රචාරණය

| කාණ්ඩය | සංඛ්‍යාව |
|---|---|
| උපුටා දැක්වීමේ සුචියේ ඇතුළත් ජාත්‍යන්තර සඟරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 81 |
| උපුටා දැක්වීමේ සුචියේ ඇතුළත් නොවූ ජාත්‍යන්තර සඟරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 10 |
| දේශීය සඟරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 13 |
| මුද්‍රිත වාර්තාවල පූර්ණ නිබන්ධන | 06 |
| වාචික ඉදිරිපත්කිරීම්වල සංක්ෂේප | 39 |
| පෝස්ටර් ඉදිරිපත්කිරීම්වල සංක්ෂේප | 34 |
| පොත් | 02 |
| පොත්වල පරිච්ඡේද | 03 |
| වෙනත් සඟරාවල ශාස්ත්‍රීය ලිපි (සඟරා, ජාතික පුවත්පත් ආදිය.) | 10 |
| සංස්කරණ කාර්යයන් | 06 |
| **එකතුව** | **204** |

# විද්‍යා පීඨය

## පීඨාධිපතිගේ ප්‍රකාශනය

උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව, පරිගණක විද්‍යාව, ගණිතය, භෞතික විද්‍යාව සහ සත්ත්ව විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයන්හි අධ්‍යයනාංශ හයකින් පීඨය සමන්විත වන අතර. විද්‍යා පීඨය භෞතීය විද්‍යා, ජෛවීය විද්‍යා සහ පරිගණක විද්‍යා සඳහා සාමාන්‍ය සහ විශේෂ උපාධි පිරිනමයි.

මූල්‍ය ගණිතය සහ කර්මාන්ත සංඛ්‍යානනය පිළිබඳ නව විද්‍යාවේදී (ගෞරව) උපාධි වැඩසටහන සඳහා 2019 වසරේ අ.පොෙ.ස. උසස් පෙළ විභාගයට පෙනී සිටි ශිෂ්‍යයන් අතරින් බඳවාගත් පළමු ශිෂ්‍ය කණ්ඩායම 2021 වසරේදී අධ්‍යයන ක්‍රියාකාරකම් ආරම්භ කරනු ලැබීය.

විද්‍යාවේදී උපාධිය සහ පරිගණක විද්‍යා උපාධිය යන උපාධි වැඩසටහන් දෙකම සඳහා බඳවාගන්නා ශිෂ්‍ය ප්‍රමාණය පීඨය ඉහළ නංවා තිබේ. 2019 වසරේ අ.පොෙ.ස. (උසස් පෙළ) විභාගයට මුහුණ දුන් ශිෂ්‍ය කණ්ඩායමෙන් බඳවා ගන්නා ලද වැඩිපුර ශිෂ්‍ය සංඛ්‍යාවේ සාරාංශයක් පහත වගුවෙන් නිරූපණය වේ.

අතිරේක මුළු බඳවාගැනීම් 290 පිළිබඳ තොරතුරු සහිතව එක් එක් වැඩසටහන සඳහා ශිෂ්‍ය සංඛ්‍යාව

| උපාධි වැඩසටහන | **2019/2020** අධ්‍යයන වර්ෂය් සිට යෝජිත බඳවාගැනීම් | බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව | සටහන් |
|---|---|---|---|
| විද්‍යාවේදී උපාධිය (B.Sc.) භෞතීය විද්‍යා ධාරාව, ජෛවීය විද්‍යා ධාරාව | 300 | 262 | ඇබෑර්තු 38 |
| | 250 | 248 | ඇබෑර්තු 02 |
| පරිගණක විද්‍යා විද්‍යාවේදී උපාධිය (BCS) | 100 | 101 | තවත් 01 අයෙක් බඳවා ගන්නා ලදී |
| මූල්‍ය ගණිතය සහ කර්මාන්ත සංඛ්‍යානන විද්‍යාවේදී (ගෞරව) උපාධිය | 50 | 59 | තවත් 09ක් බඳවා ගන්නා ලදී |
| **එකතුව** | **700** | **670** | **නොපිරවූ ඇබෑර්තු මුළු සංඛ්‍යාව 30** |

ඉහළ නැංවුණු ශිෂ්‍ය බඳවා ගැනීම් වෙනුවෙන් ඉල්ලා සිටි අධ්‍යයන කාර්ය මණ්ඩල 38 අතුරින් පීඨයට ලැබුණේ අතිරේක අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් 15 දෙනෙකු පමණි. ඉහළ නැංවුණු බඳවාගැනීම්වලට අදාළව තාවකාලික නිදර්ශක/ තාවකාලික උපදේශක තනතුරු වැනි අනධ්‍යන කාර්ය මණ්ඩල තනතුරු කිසිවක් නොලැබුණි. අතිරේකව බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාවේ අවශ්‍යතා සැපිරීම පිණිස උපකරණ හා ගෘහභාණ්ඩ මිලදී ගැනීම පිණිස විද්‍යා පීඨයට රු. මිලියන 133ක මුදලක් වෙන් කරනු ලැබූ අතර ප්‍රසම්පාදන ක්‍රියාදාමය ආරම්භ කර තිබේ.

පීඨය තුල සහ ඉන් බාහිර අධ්‍යයන කාර්යමණ්ඩලය සමග ඒකාබද්ධව පීඨය ලෙසින් මෙන්ම තනි තනි අධ්‍යනාංශ අයදුම්පත් ඉදිරිපත් කළ බැවින් උසස් අධ්‍යාපනය ව්‍යාප්තිය සහ සංවර්ධනය වේගවත් කිරීමේ (AHEAD)ව්‍යාපෘතිය යටතේ විවිධ ප්‍රදාන හතකට අදාළව ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ කටයුතු පීඨය සාර්ථකව ඉදිරියට පවත්වා ගෙන යමින් සිටියි.

විද්‍යාවේදී ගෞරව උපාධි වැඩසටහන සඳහා යෝජනා අවසන් ලෙස සකස් කිරීමේ ක්‍රියාදාමයේ පීඨය වත්මනෙහි නිරතව සිටින අතර සංශෝධිත යෝජනා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව ආරක්ෂණ සහ ප්‍රතීතන සභාව වෙත ඉදිරිපත් කරනු ඇත. නව ගෞරව උපාධි වැඩසටහන් හඳුන්වාදීම සඳහා යෝජනාවක් පීඨය යළි සලකා බැලූ අතර යෝජිත වැඩසටහන්වල වෙනස්කම් කිහිපයක් සිදුකිරීමේ අවශ්‍යතාව, විශේෂයෙන්ම එක් එක් ද්වි ප්‍රධාන විෂය

ගෞරව උපාධි වැඩසටහන් සඳහා අර්ඝ 45ක් තිබීමේ අවශ්‍යතාව හඳුනාගන්නා ලදී.

අටවැනි රුහුණ ජාත්‍යන්තර විද්‍යා සහ තාක්ෂණ සම්මේලනය පීඨය සාර්ථකව පවත්වන ලද අතර පීඨයේ සාමාජිකයන් තම පර්යේෂණ අනාවරණ දේශීය සහ ජාත්‍යන්තර පර්යේෂණ සම්මේලන සහ සඟරා තුලින් ප්‍රකාශයට පත් කරන ලදී.

පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් ගණනාවකට විවිධ ආයතන වෙතින් සහ ප්‍රදාන යෝජනා ක්‍රම මගින් ප්‍රදාන ගණනාවක් හිමිවුණි.

ඊට අමතරව, පීඨ සාමාජිකයන් විශ්වවිද්‍යාලය තුළ සහ ඉන් බාහිරව විවිධ ආකාරයේ අරමුණු සඳහා විශේෂ කමිටුවල කටයුතු කරන ලදී.

විෂයමාලා සංවර්ධනය, පර්යේෂණ නිමැවුම, ජාතික සේවා, ප්‍රජා සේවා, විශ්වවිද්‍යාල සේවා පිළිබඳ සහ ජාත්‍යන්තර දායකත්වය වෙනුවෙන් එක් එක් අධ්‍යනාංශයේ දායකත්වය පිළිබඳ නිශ්චිත තොරතුරු පහත වගුවල දැක්වේ.

## පීඨ සමාලෝචනය

| වැඩසටහන | ක්‍රියාකාරකම/ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/නිමැවුම |
|---|---|---|
| අළුතින් හඳුන්වාදුන් උපාධි අපේක්ෂක උපාධි වැඩසටහන් | මූල්‍ය ගණිතය සහ කර්මාන්ත සංඛ්‍යානනය පිළිබඳ නව විද්‍යාවේදී (ගෞරව) උපාධි වැඩසටහන | 2020 උසස් පෙළ ශිෂ්‍යයන් |
| දුරස්ථ අධ්‍යාපන වැඩසටහන් හා ව්‍යාප්ති පාඨමාලා | පාසල් හැරයන්නන් සඳහා ඉලෙක්ට්‍රොනික විද්‍යාව පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාවක් ආරම්භ කිරීම සඳහා අධ්‍යනාංශය යෝජනාවක් ඉදිරිපත් කර ඇති අතර එය බාහිර සමාලෝචකයකු විසින් සමාලෝචනය කරනු ලැබූ අතර අනුමතිය ලැබීමෙන් පසු ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ. | දකුණු පළාතේ පාසල් හැරයන්නන් |
| | සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ වෛද්‍ය රසායනාගාර විද්‍යා අධ්‍යනාංශයේ බාහිර කථිකාඩාර්යවරයකු සහ අධීක්ෂකයකු මෙන්ම විභාග නිරීක්ෂකයකු ලෙස කටයුතු කරන ලදී. | සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ වෛද්‍ය රසායනාගාර විද්‍යා උපාධි වැඩසටහනේ ශිෂ්‍යයන් |
| ගාස්තු අයකරන පාඨමාලා | කේ.ඒ.එස්. ලක්ෂාන් මහතා ඉලෙක්ට්‍රොනික විද්‍යා උසස් සහතික පත්‍ර පාඨමාලාවේ යෝජනාව ලියන ලදී. | දකුණු පළාතේ පාසල් හැර යන ශිෂ්‍යයන් |
| | ඉලෙක්ට්‍රොනික විද්‍යා උසස් සහතික පත්‍ර පාඨමාලාව සඳහා යෝජනාව සකස් කිරීමේ කමිටු සාමාජිකයකු ලෙස එස්.එස්.අබේවික්‍රම මහතා සහභාගි විය. | උසස් පෙළ විභාගයෙන් පසුව පාසල් හැර යන සිසුන්, රුහුණ විශ්වවිද්‍යාලය, විද්‍යා පීඨය, භෞතික විද්‍යා අධ්‍යනාංශය |
| ප්‍රජා සේවා | මහාචාර්ය ජී.ඩී.කේ. මහානාම මහතා, ආචාර්ය එන්.ටී.වික්‍රමසූරිය මහතා, ආචාර්ය ඊ.ජේ.කේ.පී. නන්දන මහතා සහ එස්.එස්.අබේවික්‍රම මහතා විද්‍යා පීඨ ශිෂ්‍යයන් සඳහා සමීපස්ථ ආචාර්යවරුන් ලෙස කටයුතු කරන ලදි. | විද්‍යා පීඨයේ සිසුන් |
| | ආචාර්ය ඩේ.ඒ.පී. බෝධික මහතා පාසල් ශිෂ්‍යයන්ගේ නව නිපැයුම් නංවාලීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 05ක් පැවැත්වූ අතර දකුණු පළාත් පාසල් මට්ටමේ නව නිපැයුම් තරඟය පවත්වන ලදී. | පාසල් ශිෂ්‍යයන් |
| | කේ.ඕ.එන්. ශාන්තිදේවි මහත්මිය සංස්කෘතික මධ්‍යස්ථාන සම්බන්ධීකාරකයකු ලෙස සේවය කරන ලදී. | **රුහුණ විශ්වවිද්‍යාලය** |
| | සක්‍රිය පුරවැසි වැඩසටහන හරහා ප්‍රජා ව්‍යාපෘති | පාසල් ශිෂ්‍යයන් |
| | දැනුවත්කිරීමේ වැඩසටහන | වෙරළබඩ පදිංචිකරුවන් |
| | වැල්ලමඩම රෝහණ විද්‍යාලයේ පුස්තකාලයක් ස්ථාපිත කිරීම | |

| වැඩසටහන | ක්‍රියාකාරකම/ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/නිමැවුම |
|---|---|---|
| විෂයමාලා සංවර්ධනය (පාඨමාලා ඒකක/විෂයයන් වැඩි දියුණු කිරීම) | යෝජිත නව උපාධි වැඩසටහන සඳහා නව පාඨමාලා ඒකක නවයක් හඳුන්වාදෙන ලදී.<br><br>දැනට පවතින විද්‍යාවේදී උපාධිය සංශෝධනය කරන ලදී- විද්‍යාවේදී උපාධිය -පරිගණක විද්‍යාව, පරිගණක විද්‍යා උපාධි වැඩසටහනේ විද්‍යාවේදී විශේෂ උපාධියේ විෂය සැලසුම්කරන ලදී. | අනාගත උපාධි අපේක්ෂකයන්<br><br>විද්‍යා පීඨයේ සිසුන් |
| කාර්යමණ්ඩල සංවර්ධන වැඩසටහන් | සිකුරාදා දිනයන්හි කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් සංවිධානය කරනු ලැබූ වැඩමුළු කිහිපයකට මහාචාර්ය ජී.ඩී.කේ. මහානාම මහතා සහභාගි විය<br><br>“දෛනික පාඩම් සැලසුම් සකස් කිරීම හා පාඨමාලා ඒකක අනුරූපණය”, “ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය හරහා මාර්ගගත විභාග පැවැත්වීම”, “ආයතනික නෛතික පරිසරය”, “හොඳ ප්‍රශ්න පත්‍රයක් සකස් කිරීමේ න්‍යායාත්මක හා ප්‍රායෝගික අංග”, “ආතතිය අඩුකිරීම පිණිස නිසැක ක්‍රමයක්- එළඹසිටි සිහියෙන් සිටීම”, “ප්‍රශ්න පත්‍රයක් moderate කරන්නේ කෙසේද?”, “උසස් අධ්‍යාපනය සඳහා ආදර්ශ ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය”, “නිමැවුම් පාදක අධ්‍යාපනය හා ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගැන්වීම”, “ටර්නිටින් සමානතා පරීක්ෂණ සේවාව භාවිතා කරන්නේ කෙසේද?” පිළිබඳව පැවැත්වූ වැඩමුළුවලට ආචාර්ය එන්.ටී. වික්‍රමසූරිය සහභාගි විය.<br><br>උසස් අධ්‍යාපන වැඩසටහනේ ගුණාත්මය සංවර්ධනය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාවේ මොඩියුලය 6 (මාතෘකාව: උසස් අධ්‍යාපනයේ තො.ස.තා. කුසලතා) 2021 සැප්තැම්බර් 7 සහ 8<br><br>නවක සේවකයන් සඳහා පුහුණු වැඩසටහන (මාතෘකාව: තොරතුරු හා සන්නිවේදන කුසලතා) 2021 ඔක්තෝබර් 11 සිට 15 දක්වා | මහාචාර්ය ජී.ඩී.කේ. මහානාම මහතා සහ අනාගත උපාධි අපේක්ෂකයන්<br><br>විද්‍යා පීඨයේ සියලු අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන්ට හා ශිෂ්‍යයන්ට ප්‍රයෝජනවත් විය. |
| ජාතික සංවර්ධනය සඳහා දායකත්වය | මහාචාර්ය කේ.කේ.ඒ.එස්. යාපා - රුහුණ විශ්වවිද්‍යාලයේ තත්ත්ව ආරක්ෂණ ඒකකයේ සභාය අධ්‍යක්ෂ ලෙස කටයුතු කරන ලදී. ආයතනික සමාලෝචනයේ සමස්ත සම්බන්ධීකාරක, කැළණිය විශ්වවිද්‍යාලයේ ආයතනික සමාලෝචනයේ සමාලෝචන මඩුල්ලේ සාමාජික<br><br>මහාචාර්ය ජී.ඩී.කේ. මහානාම - භෞතික විද්‍යා අධ්‍යනාංශයේ ප්‍රධානියා ලෙස කටයුතු කරන ලදී. 2020 උසස් පෙළ විභාගයේ ප්‍රධාන විභාග පරීක්ෂක, ආයතනක සමාලෝචනයේ නිර්ණායක 1 හි සභාපති, කොළඹ විශ්වවිද්‍යාලයේ දර්ශනපති උපාධියේ බාහිර විභාග පරීක්ෂක, දර්ශනපති උපාධිය ආචාර්ය උපාධිය දක්වා උත්ශ්‍රේණි කිරීමේ බාහර සමාලෝචක<br><br>ආචාර්ය සුනිල් ජයතිලක - අ.පොෂ. උසස් පෙළ විභාගයේ පිළිතුරු පත්‍ර ඇගයීමේ මණ්ඩලයේ ප්‍රධාන පරීක්ෂක ලෙස කටයුතු කරන ලදී.<br><br>ආචාර්ය රේ.ඒ.ජී. බෝධික - ජාතික පාරිසරික රෙගුලාසි (ශබ්ද පාලන) ප්‍රතිශෝධන කමිටුවේ සාමාජිකයකු ලෙස කටයුතු කරන ලදී.<br><br>වාහන ශබ්ද රෙගුලාසි තාක්ෂණික ඇගයීම් කමිටුවේ සභාපති ලෙස කටයුතු කරන ලදී. | රුහුණ විශ්වවිද්‍යාලය කැළණිය විශ්වවිද්‍යාලය<br><br>භෞතික විද්‍යා අධ්‍යනාංශය, මෙරට පාසල් සිසුන්, රුහුණ විශ්වවිද්‍යාලය, කොළඹ විශ්වවිද්‍යාලය<br><br>ප්‍රදේශයේ සිවිල් වැසියන් |

| වැඩසටහන | ක්‍රියාකාරකම/ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/නිමැවුම |
|---|---|---|
| ජාතික සංවර්ධනය සඳහා දායකත්වය | එස්.එස්.අබේවික්‍රම මහතා මාතර අධ්‍යාපන කලාපයේ පාසල් ශිෂ්‍යයන්ගේ නව්‍යකරණ හා නව නිපැයුම් ඇගයීමේ ඇගයුම්කරුවකු ලෙස කටයුතු කරන ලදී.<br><br>ශ්‍රී ලංකා සංදර්භය තුළ පර්යේෂණ ක්‍රියාකාරකම් පැවැත්වීම - ගොවි නැණ ව්‍යාපෘතිය<br><br>ආචාර්ය ඊ.ජේ.කේ.පී. නන්දනි, ආචාර්ය කේ.ඩී.ප්‍රසංගිකා, ආචාර්ය බී.ජී.එස්.ඒ. ප්‍රදීප්, ආචාර්ය එල්.ඩබ්. සෝමතිලක, ආචාර්ය එම්.සී.එස්. ප්‍රනාන්දු යන මහත්ම මහත්මීන් 2021 වසරේ උසස් පෙළ සංයුක්ත ගණිතය විෂයයෙහි ප්‍රධාන පරීක්ෂකවරුන් ලෙස කටයුතු කරන ලදී.<br><br>ආචාර්ය ඩී.එම්.සමරතුංග අ.පොෂ.ස. උසස් පෙළ සංයුක්ත ගණිතය ප්‍රශ්න පත්‍ර සැකසුම් මඩුල්ලේ සාමාජිකයකු ලෙස කටයුතු කරන ලදි.<br><br>ජාතික විද්වත් කමිටුව- කඩොලාන සංරක්ෂණය හා කළමනාකරණය, මහවැලි අමාත්‍යාංශය | මාතර අධ්‍යාපන කලාපයේ පාසල් ශිෂ්‍යයන් |
| ජාත්‍යන්තර මට්ටමේ දායකත්වය | 9වැනි රුහුණ ජාත්‍යන්තර විද්‍යා සහ තාක්ෂණවේදී සම්මේලනයේ (RISTCON 2022) නිබන්ධන ඇගයුම්කරුවකු ලෙස මහාචාර්ය ජී.ඩී.කේ. මහානාම කටයුතු කරන ලදී.<br>9වැනි රුහුණ ජාත්‍යන්තර විද්‍යා සහ තාක්ෂණවේදී සම්මේලනයේ (RISTCON 2022) නිබන්ධන ඇගයුම්කරුවකු ලෙස ආචාර්ය ආචාර්ය සුනිල් ජයතිලක කටයුතු කරන ලදී.<br><br>ආචාර්ය සාරංග පෙරේරා ශ්‍රී ලංකා සබරගමු විශ්වවිද්‍යාලයේ 8වැනි ජාත්‍යන්තර සමුළුවේ මණ්ඩලීය සාමාජිකයකු ලෙස කටයුතු කරන ලදී.<br><br>9වැනි රුහුණ ජාත්‍යන්තර විද්‍යා සහ තාක්ෂණවේදී සම්මේලනයේ (RISTCON 2022) නිබන්ධන ඇගයුම්කරුවකු ලෙස ආචාර්ය සාරංග පෙරේරා කටයුතු කරන ලදී<br><br>දර්ශනපති වැඩසටහනක් ස්ථාපිත කිරීම (ඉරස්මුස් මුන්ඩාස්)<br><br>දේශගුණික විපර්යාස සහ සහ ජෛව විවිධත්වය කෙරෙහි එහි බලපෑම පිළිබඳ සම්පත් දායකයකු ලෙස දේශනයක් පැවැත්වීම පිණිස ජාත්‍යන්තර සම්මේලනයකට සහභාගි වන ලදි, කලා වාණිජ සහ විද්‍යා විද්‍යාලය, සොනායි, ඉන්දියාව 2020 | පර්යේෂණ ප්‍රජාව<br><br>පරිසර ආරක්ෂාව පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීමට හේතු කාරක වන පරිදි සහභාගිවන්නන් 1000කට දැනුම ප්‍රචාරණය සහ තිරසර සංවර්ධනය සඳහා උපාය මාර්ග සෙවීම සඳහා මෙහෙයවීම |
| කමිටු සහ ඒවාට සම්බන්ධ සාමාජිකයන් ගණන | තාක්ෂණික ඇගයීම් කමිටුව 05<br>දුක්ගැනවිලි කමිටුව 06<br>ශිෂ්‍යත්ව කමිටුව 05<br>ශිෂ්‍ය ඉල්ලීම් කමිටුව 05<br>පර්යේෂණ කමිටුව 19<br>විද්‍යා පීඨ පුස්තකාල කමිටුව 08<br>පීඨ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය 08<br>අ.ත.ආ.ක. 11<br>කොවිඩ් 19 ප්‍රතිචාර කමිටුව 17<br>පීඨ දිනය 07<br>වෘත්තීය මාර්ගෝපදේශන කමිටුව 07 | |

| වැඩසටහන | ක්‍රියාකාරකම/ සංක්ෂිප්ත තොරතුරු | | ප්‍රතිලාභීන්/නිමැවුම |
|---|---|---|---|
| කමිටු සහ ඒවාට සම්බන්ධ සාමාජිකයන් ගණන | වැඩසටහන් සමාලෝචනය - සාක්ෂි රැස්කිරීම | 25 | |
| | කාර්මික පුහුණුව හා පර්යේෂණ | 06 | |
| | පීඨ දින සංවිධායක කමිටුව | 07 | |
| | ආචාර ධර්ම සමාලෝචන කමිටුව | 07 | |
| | ස්වයං ඇගයීම් වාර්තා ලිවීමේ හා සාක්ෂ රැස්කිරීමේ කමිටුව | 11 | |
| | වෛද්‍ය කමිටුව | 06 | |
| | ජාත්‍යන්තර විද්‍යා සහ තාක්ෂණවේද සම්මේලනය | 09 | |
| | වැඩසටහන් සමාලෝචනය | 19 | |
| ලැබුණු ප්‍රදාන (අරමුණ සහ ප්‍රමාණය)<br>- දේශීය<br>- අන්තර්ජාතික | පර්යේෂණ, නව්‍යකරණ සහ වාණිජකරණ ප්‍රදානය<br><br>FSPI- SEDRIC (ජාත්‍යන්තර) | | |
| සම්මාන/ පේටන්ට් බලපත්‍ර/විශේෂ සාධන | රුහුණ විශ්වවිද්‍යාලයේ 18වැනි ශාස්ත්‍රීය සැසි හා 17වැනි උපකුලපති සම්මාන ප්‍රදානෝත්සවයේදී විශිෂ්ඨතම විද්වතා සඳහා වන සම්මානය ආචාර්ය එන්.එම්. වික්‍රමගේ මහතාට පිරිනමන ලදී. | | ආචාර්ය එන්.එම්. වික්‍රමගේ සහ අධ්‍යනාංශය |
| | පේටන්ට් සහයෝගිතා ප්‍රඥප්තියක් ප්‍රකාශයට පත්කරන ලදී. | | මහාචාර්ය ජී.ඩී.කේ මහානාම මහතා සහ AHEAD කණ්ඩායම සහ අධ්‍යනාංශය සඳහා |
| | මහාචාර්ය ජී.ඩී.කේ මහානාම විසින් අධීක්ෂණය කරනු ලැබූ එක් දර්ශනපති උපාධියක් සම්පූර්ණ කරන ලදී | | පර්යේෂණ ශිෂ්‍යයන් හා අධ්‍යනාංශය සඳහා |
| | මහාචාර්ය ජී.ඩී.කේ මහානාම මහතා සහ AHEAD කණ්ඩායම ප්‍රකාශන කර්තෘ හිමිකම් දෙකක් සිදුකරන ලදී. | | භෞතික විද්‍යා අධ්‍යනාංශය හා කණ්ඩායම |
| | හොඳම විද්‍යා පෝස්ටරය ඉදිරිපත් කිරීම | | |
| පවත්වනු ලැබූ වැඩමුළු/සම්මන්ත්‍රණ/සම්මේලන (අභ්‍යන්තර හා දේශීය) | සේවයේ නිරතව සිටියදී ශිෂ්‍යයන්ගේ ගැටලු නිරාකරණ කුසලතා වැඩිදියුණු කිරීම පිණිස අතථ්‍ය කාර්මික සංචාරයක් ආචාර්ය එන්.එම්. වික්‍රමගේ මහතා විසින් සංවිධානය කරන ලදී. | | AHEAD ELTA-ELSE පීඨ ව්‍යාපෘතිය යටතේ විද්‍යා පීඨයේ වෙනස් ශිෂ්‍ය සංගම් සමග මෙම සියලු වැඩමුළු සංවිධානය කරන ලදී. |
| | මාළඹේ පිහිටි කාර්මික තාක්ෂණ ආයතනය වෙත අතථ්‍ය කාර්මික සංචාරයක් ආචාර්ය එන්.එම්. වික්‍රමගේ මහතා විසින් සංවිධානය කරන ලදී. | | වැඩමුළුවල අරමුණ වූයේ කර්මාන්ත සමග ශිෂ්‍යාන්ගේ සම්බන්ධයේ ධාරිතාව ශක්තිමත් කිරීම හා කාර්මික පුහුණුව සඳහා අවස්ථා ලබා ගැනීමයි. |
| | ආචාර්ය ජේ.ඒ.පී.බෝධික මහතා සමාගම් 35ක සහභාගිත්වය සහිතව පීඨ වෘත්තීය පොළක් සංවිධානය කොට පවත්වනු ලැබූ අතර උපාධි අපේක්ෂකයන්ගේ වෘත්තීන් නගා සිටුවීම පිණිස වැඩමුළු 16ක් සංවිධානය කරන ලදී. අභිප්‍රේරණාත්මක හා ආතති සහන වැඩමුළුව/ පශ්චාත් උපාධියක් කරා යාමේ මගේ ගමන පිළිබඳ අත්දැකීම් බෙදාහදා ගැනීම. | | විද්‍යා පීඨ උපාධි අපේක්ෂකයන් 200 |
| ප්‍රජා විහිදුම්කරණ ක්‍රියාකාරකම් | ආචාර්ය එන්.ඩී. වික්‍රමසූරිය RISTCON 2021හි වාචික සැසිවල කැඳවුම්කරුවකු ලෙස කටයුතු කරන ලද අතර ශිෂ්‍ය උපදේශකයකු ලෙස කටයුතු කරන ලදී. | | ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල හා පර්යේෂණය ආයතන |

| වැඩසටහන | ක්‍රියාකාරකම්/ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/නිමැවුම |
|---|---|---|
| ප්‍රජා විනිදුම්කරණ ක්‍රියාකාරකම් | ආචාර්ය ඊ.ජේ.කේ.පී. නන්දනි 2021 වසරේදී ශිෂ්‍ය උපදේශකයකු ලෙස කටයුතු කරන ලදී.<br>ආචාර්ය කේ.ඩී. ප්‍රසාංගිකා මිය 2021 වසරේදී විද්‍යා පීඨයේ ගණිත හා සංඛ්‍යාන සංගමයේ ප්‍රධාන සංස්කාරක ලෙස කටයුතු කරන ලදී.<br>කේ.ජී.පී. හන්සනි මිය 2021 වසරේදී ශිෂ්‍ය උපදේශිකාවක් ලෙස කටයු තු කරන ලදී.<br>RISTCON සහ රුහුණ විද්‍යා සහරාවේ සමාලෝචකයකු ලෙස කටයුතු කරන ලදී. | විද්‍යා පීඨයේ ශිෂ්‍යයන් |
| සබැඳි වැඩසටහන් | භෞතික විද්‍යා අධ්‍යනාංශයට CERN සමග සබැඳි වැඩසටහනක් ඇති අතර ශ්‍රී ලංකා– CERN සහයෝගිතාව 2018 වසරේදී ආරම්භ විය. | CERN ගිම්හාන වැඩසටහන සඳහා ශිෂ්‍ය සහභාගිත්වය<br>ආචාර්ය උපාධි වැඩසටහන (වත්මනෙහි ශ්‍රී ලංකාවේ විවිධ විශ්වවිද්‍යාලවලින් ශිෂ්‍යයන් හතර දෙනෙකු සම්බන්ධව සිටියි)<br>ගුරු පුහුණු වැඩසටහනක් පවත්වන ලදී |

## ප්‍රකාශන හා දැනුම ප්‍රචාරණය

| කාණ්ඩය | සංඛ්‍යාව |
|---|---|
| උපුටා දැක්වීමේ සුචියේ ඇතුළත් ජාත්‍යන්තර සහරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 105 |
| උපුටා දැක්වීමේ සුචියේ ඇතුළත් නොවූ ජාත්‍යන්තර සහරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 15 |
| දේශීය සහරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 07 |
| මුද්‍රිත වාර්තාවල පූර්ණ නිබන්ධන | 07 |
| වාචික ඉදිරිපත්කිරීම්වල සංක්ෂේප | 100 |
| පෝස්ටර් ඉදිරිපත්කිරීම්වල සංක්ෂේප | 26 |
| පොත් | 05 |
| පොත්වල ඡේද | 05 |
| වෙනත් ප්‍රකාශනවල විද්වත් ලිපි (සහරා, ජාතික පුවත්පත් ආදිය) | 03 |
| සංස්කරණ කාර්යයන් RISTCON 2021 සංස්කරණ කාර්යය සමාජිකයෙකි. | 11 RISTCON 2021 සංස්කරණ කාර්යය සමාජිකයෙකි |
| උපුටා දැක්වීම් දර්ශකයේ ඇති ජාත්‍යන්තර සහරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදනය | 105 |
| **එකතුව** | **389** |

# තාක්ෂණ පීඨය

## පීඨාධිපතිගේ ප්‍රකාශනය

2021 වසර තුළ තාක්ෂණ පීඨය අතත්‍ය ක්‍රමවේද ඔස්සේ සිය අධ්‍යයන වැඩසටහන් නොකඩවා සිදුකරන ලදී. ඒ අනුව, සියලු න්‍යායාත්මක කොටස් ඉගැන්වීම මාර්ගගතව සිදුකරන ලදී. එසේම රට තුළ කොවිඩ්-19 වසංගත තත්ත්වය පැතිරීමත් සමග සියලු අඛණ්ඩ ඇගයීම් ද මාර්ගගත ක්‍රමවේද භාවිතයෙන් සිදු කරන ලදී. ප්‍රායෝගික සැසි පැවැත්වීම පිණිස විවිධ අධ්‍යයන මට්ටම්වල ශිෂ්‍යයන් අධ්‍යයන අංශ අනුව භෞතිකව කැඳවනු ලැබූ අතර ප්‍රායෝගික සැසි නිමා කිරීමෙන් අනතුරුව අධ්‍යයන වාර අවසන් විභාග ශිෂ්‍ය කාණ්ඩ අනුව පවත්වා ඔවුන් නිවෙස් කරා යොමු කරන ලදී. හැකි සෑම අවස්ථාවකම, අධ්‍යයන කටයුතු / විභාග ආරම්භ කිරීමට පෙර නිරෝධායන ක්‍රියාදාමය අනුව කටයුතු කිරීමට අවශ්‍ය පියවර පරිපාලනය විසින් ගන්නා ලදී.

සදහන් කරනු ලැබ ඇති දින අනුව ශිෂ්‍ය කණ්ඩායම් සඳහා අධ්‍යයන ක්‍රියාකාරකම් වරින් වර මාර්ගගතව ආරම්භ කරන ලදි.

2021 වසර තුළ පහත දැක්වෙන විභාග භෞතිකව පවත්වන ලදී.

මට්ටම 3 අධ්‍යයන වාරය I විභාගය - ජනවාරි 2021

මට්ටම 2 අධ්‍යයන වාරය I විභාගය - මාර්තු/අප්‍රේල් 2021

මට්ටම 4 අධ්‍යයන වාරය II විභාගය - අගෝස්තු 2021

මට්ටම 2 අධ්‍යයන වාරය II විභාගය - ඔක්තෝබර්/නොවැම්බර් 2021

මට්ටම 1 අධ්‍යයන වාරය I විභාගය - දෙසැම්බර් 2021

ඉහත සියලු විභාග සාර්ථකව පවත්වා නිම කරන ලද අතර රට තුළ පැවැති කොවිඩ්-19 වසංගත තත්ත්වය මධ්‍යයේ වුවද, 2021 වසර තුළ මට්ටම 2 අධ්‍යයන වාරය II විභාගය පැවැත්වීමට පීඨයට හැකි විය. එම තත්ත්වය යටතේ විභාගය පැවැත්වීමට අප විශේෂ වැඩ පිළිවෙළක් යෙදූ අතර ශිෂ්‍යයන් සහ කාර්ය මණ්ඩලය ලබා දුන් අනගි සහාය හේතුවෙන් එකී විභාග ඉතා කඩිනමින් හා සාර්ථකව භෞතිකව පැවැත්වීමට හැකියාව ලැබුණි. 2021 සැප්තැම්බර් 11 වන දින පළමු ශිෂ්‍ය කණ්ඩායමට උපාධිය ලබා දීමට ද හැකි වුණි.

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිෂන් සභාව විසින් සංවිධානය කරනු ලැබූ "සහසක් නිමවුම් 2021" ප්‍රදර්ශනයේදී පදක්කම් හයක් සහ 6වැනි කොරියානු තරුණ ඔලිම්පියාඩ් 4i 2021(KIYO4i 2021) තරඟයේදී පදක්කම් දෙකක් දිනා ගැනීමට තාක්ෂණ පීඨයේ සිසුන් සමත් වුණි. ඊට අමතරව, වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් ලැබුණු ට්‍රැක්ටරයක් ඇතුළුව වාහන කිහිපයක් පීඨයේ වැඩපොළ තුළ අළුත්වැඩියා කිරීමට පීඨයේ ශිෂ්‍යයන්ට හා කාර්ය මණ්ඩලයට හැකි විය.

තාක්ෂණ පීඨයට බඳවා ගන්නා පස්වැනි ශිෂ්‍ය කණ්ඩායම 340 දක්වා ඉහළනැංවූ අතර පෙර සූදානම් කිරීමේ වැඩසටහන අතථ්‍ය වේදිකාවන් යොදා ගනිමින් සාර්ථකව පවත්වනු ලැබීය. 2019/2020 අධයයන වර්ෂය අවසන් වූ වහාම එම ශිෂ්‍ය කණ්ඩායම භෞතිකව කැඳවනු ඇත.

රට තුළ පැවැති අර්බුදකාරී වතාවරණය මධ්‍යයේ වුවද, සෑම අංශයකින්ම පීඨය ඉදිරියට ගමන් කර තිබේ.

## පීඨ සමාලෝචනය

| වැඩසටහන | ක්‍රියාකාරකම/ සංක්ෂිප්ත තොරතුරු | ප්‍රතිලාභීන්/නිමැවුම |
|---|---|---|
| විෂයමාලා සංවර්ධනය (පාඨමාලා ඒකක/විෂයය වැඩිදියුණු කිරීම) | විෂයමාලා සංශෝධනය සිදුකළ අතර අනුමතිය ලබාගැනීමේ ක්‍රියාදාමය සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතී.<br>කුඩා විෂයමාලා සංශෝධනය | 06වන කාණ්ඩයේ සිට ඉදිරියට |
| කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන් | CCPDHE –ETD සඳහා දේශන 4කට සහභාගි විය.<br><br>CCPDHE – ICT සඳහා දේශන 2කට සහභාගි විය.<br><br>CCPDHE – BST සඳහා දේශන 6කට සහභාගි විය. | අධ්‍යයන කාර්ය මණ්ඩලය<br><br>අධ්‍යයන කාර්ය මණ්ඩලය<br><br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් 02 ක් හා පරිවාස කථිකාචාර්යවරුන් 4 ක් |
| ජාතික සංවර්ධනය සඳහා දායකත්වය | දිලීරාගාරය ස්ථාපිත කරන ලදී. NYBG Steere ශාකාගාරයට අනුබද්ධව රුහුණ විශ්වවිද්‍යාලයේ දිලීරාගාරය (දිලීර ශාකාගාරය/මයිකොටා ශාකාගාරය) ස්ථාපිත කරනු ලැබූ අතර එය තාක්ෂණ පීඨයේ පෛවපද්ධති තාක්ෂණ අධ්‍යනාංශය අනුයුක්ත කර තිබේ. රුහුණ විශ්වවිද්‍යාලය සඳහා ලියාපදිංචි දිලීරාගාර කේතය වනුයේ “FUOR” ය. | කාර්ය මණ්ඩලය හා ශිෂ්‍යයන්, මෙරට හා විදේශයන්හි ඕනෑම පර්යේෂකයකු |
| කමිටු හා ඒවාට සම්බන්ධ සාමාජිකයන් ගණන | තා.ඇ.කමිටු, AS2022, වෙබ් කමිටුව<br>ශිෂ්‍ය ඉල්ලීම් කමිටුව :08 | |
| පවත්වනු ලැබූ වැඩමුළු/සම්මන්ත්‍රණ/සම්මේලන (අභ්‍යන්තර හා දේශීය) | ශිෂ්‍යයන් සඳහා කර්මාන්ත වැඩමුළු 5ක් | |
| සබැඳි වැඩසටහන් | ඩයලොග් ඇක්සියාටා සමග අවබෝධතා ගිවිසුම | අධ්‍යයන කාර්ය මණ්ඩලය හා ශිෂ්‍යයන් |

## ප්‍රකාශන හා දැනුම ප්‍රචාරණය

| කාණ්ඩය | සංඛ්‍යාව |
|---|---|
| උපුටා දැක්වීමේ සුචියේ ඇතුළත් ජාත්‍යන්තර සඟරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 08 |
| උපුටා දැක්වීමේ සුචියේ නොමැති ජාත්‍යන්තර සඟරාවල සම්පූර්ණ පත්‍රිකා හෝ කෙටි සන්නිවේදන | 01 |
| වාචික ඉදිරිපත්කිරීම්වල සංක්ෂේප | 78 |
| පෝස්ටර් ඉදිරිපත්කිරීම්වල සංක්ෂේප | 19 |
| **එකතුව** | **106** |

# කොටස VII

# සම්මාන සහ විශේෂ සිදුවීම්

# ජාතික සහ ජාත්‍යන්තර පර්යේෂණ සම්මේලන

## 1. 18 වැනි ශාස්ත්‍රීය සැසි 17 වැනි උපකුලපති සම්මාන ප්‍රදානෝත්සවය

රුහුණ විශ්වවිද්‍යාලයේ 18 වැනි ශාස්ත්‍රීය සැසි සහ 17 වැනි උපකුලපති සම්මාන ප්‍රදානෝත්සවය ‘‘විශිෂ්ඨත්වය කරා එක්ව’’ යන තේමාව යටතේ 2021 මාර්තු 3 වැනි දින වෛද්‍ය පීඨයේ මහාචාර්ය ටී.ඩබ්ලිව්. වික්‍රමනායක ශ්‍රවණාගාරයේදී දී සාර්ථකව පවත්වන ලදී. එය වෛද්‍ය පීඨය හා සම සෞඛ්‍ය විද්‍යා පීඨය එකාබද්ධව සංවිධානය කරනු ලැබිය.

සමාරම්භක උත්සවයේ ප්‍රධාන ආරාධිතයා වූයේ රුහුණ විශ්වවිද්‍යාලය් උප කුලපති, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුජීව අමරසේන මහතාය. ‘‘ශ්‍රී ලංකාවේ පර්යේෂණ සංස්කෘතියක් ගොඩනැගීම’’ යන මාතෘකාව යටතේ ප්‍රධාන දෙසුම පවත්වන ලද්දේ කොළඹ විශ්වවිද්‍යාලයේ ළමා රෝග විද්‍යාව පිළිබඳ මහාචාර්ය ෂාමන් රාජීන්ද්‍රජීත් මහතා වන අතර ‘‘ආර්ථවාභාවය: කාන්තාවන්ගේ ජීවිතයේ වැදගත් සංධිස්ථානයක්’’ මැයෙන් ආරාධිත දෙසුම පවත්වන ලද්දේ ආචාර්ය ආර්.එච්.එම්.පී.එන්. රත්නායක මහතාය. මෙම අවස්ථාවට සහභාගි වූ සම්භාවනීය ආරාධිතයන් අතර රුහුණ විශ්වවිද්‍යාලයේ කුලපති අතිපූජ්‍ය අකුරටියේ නන්ද නායක නාහිමි, නියෝජ්‍ය උපකුලපති මහාචාර්ය සමන් වන්දන, සියලුම පීඨවල පියාධිපතිවරුන්, ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන්, සම්මානිත මහාචාර්යවරුන් හා අධ්‍යයන හා අනධ්‍යන කාර්ය මණ්ඩල සාමාජිකයන් විය. මෙම උත්සවයේදී උපකුලපති සම්මාන හා සම්මානිත මහාචාර්ය ධූර පිරිනමන ලදී.

**සම්මානිත මහාචාර්ය**

මහාචාර්ය කේ.ඩී.සී.ඊ. ලියනගේ මිය

මහාචාර්ය රන්ජිත් සේනාරත්න මයා

මහාචාර්ය එස්.ජී.ජේ.එන්. සේනානායක මයා

මහාචාර්ය ඩබ්ලිව්.ජී.ඩී. ධර්මරත්න මයා

මහාචාර්ය එම්.වී. වීරසූරිය මිය

**විශිෂ්ඨතම විද්වතා**

ආචාර්ය නදීශා එම් වික්‍රමගේ මිය

විශිෂ්ඨතම තරුණ පර්යේෂක

ආචාර්ය අමිල බුද්ධික සිරිසේන මයා

**ඉහළම පර්යේෂණ ප්‍රදානලාභියා**

ආචාර්ය ශිරාණි මානෙල් කුමාරි මිය

විශිෂ්ඨතම ජාත්‍යන්තර සබඳතා ප්‍රවර්ධක

මහාචාර්ය කේ.එච්.එම්. අශෝක දීපානන්ද මයා

## 2. කෘෂිකර්මය සහ පරිසරය පිළිබඳ ජාත්‍යන්තර සාකච්ඡා මුළුව - ISAE 2021

කෘෂිකර්මය සහ පරිසරය පිළිබඳ ජාත්‍යන්තර සාකච්ඡා මුළුව (ISAE) 2020, රුහුණ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේදී 2020 පෙබරවාරි 14 වැනි දින පවත්වන ලදී. කෘෂිකර්ම පීඨය විසින් සංවිධානය කරනු ලබන ප්‍රධානතම සමුළුවක් වන මෙහිදී ශිෂ්‍යයන් සහ කාර්ය මණ්ඩලය කෘෂිකර්මය හා පරිසරය සුරක්ෂිත කිරීමේ අරමුණින් ලොව විවිධ රටවල විෂයවස්තුකයන් මුණ ගැසෙයි. මෙවර සාකච්ඡා මුළුවේ තේමාව වූයේ *"කෘෂිකාර්මික හා පාරිසරික ප්‍රතිපත්ති යළි අර්ථ නිරූපණය කිරීම: මතුවන නව අභියෝග හා නව දසුන්"* යන්නයි. මෙම උත්සවයේ ප්‍රධාන ආරාධිතයා වූයේ ශ්‍රී ලංකාවේ ප්‍රංශ තානාපති එරික් ලැවර්ටු මහතායි. පර්යේෂණ තේමා 12කට අදාළ විද්වත් ලිපි 170ක් පමණ එහිදී ඉදිරිපත් කරන ලද අතර සමුළුව සඳහා දේශීය හා ජාත්‍යන්තර සහභාගිකයන් 400 ක් පමණ පැමිණෙන ලදී.

## 3. රුහුණ ජාත්‍යන්තර විද්‍යා සහ තාක්ෂණ සම්මේලනය (RISTCON) 2021

රුහුණ විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨය විසින් සංවිධානය කරනු ලැබූ 8 වැනි රුහුණ ජාත්‍යන්තර විද්‍යා සහ තාක්ෂණ සම්මේලනය -2021 (RISTCON 2021) ප්‍රධාන ආරාධිත ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුජීව අමරසේන මහතා සහ විශේෂ ආරාධිත ශ්‍රී ලංකාවේ ප්‍රංශ තානාපති එරික් ලැවර්ටු මහතාගේ සහභාගිත්වයෙන් 2021 පෙබරවාරි 17වන දින පවත්වන්නට යෙදුණි. ඕස්ට්‍රේලියාවේ, ක්‍රෝලිහි බටහිර ඕස්ට්‍රේලියා විශ්වවිද්‍යාලයේ කීර්තිමත් විද්‍යාඥ ආචාර්ය ඩැනියෙල් ගෝර්මන් CSIRO මහතාගේ ප්‍රධාන දෙසුමෙන් RISTCON 2021 සාරවත් වූ අතර පූර්ණ සැසියේ දේශනය පවත්වනු ලැබුයේ ඇමෙරිකා එක්සත් ජනපදයේ ආර්කන්සාස්හි ආර්කන්සාස් ෆෝට් ස්මිත් විශ්වවිද්‍යාලයේ සම්භාවනීය විද්‍යාඥයකු වූ මහාචාර්ය රසුපති කන්නන් මහතාය. සම්මේලනයට සහභාගි වූ සියලු දෙනාට (ඉදිරිපත් කරන්නන් 150ක් පමණ) තමන්ට අදාළ පර්යේෂණ ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන වන නවතම අනාරවණ පිළිබඳව සවන් දීමට සහ ඔවුන්ගේ පුළුල් අත්දැකීම් තුළින් ඉගෙනීමට මෙම සමුළුව මහඟු අවස්ථාවක් විය.

## 4. වෛද්‍ය පීඨ ශාස්ත්‍රීය සැසි - 2020

2020 වසරේ රුහුණ විශ්වවිද්‍යාලයීය වෛද්‍ය පීඨ ශාස්ත්‍රීය සැසි කොවිඩ්-19 මාර්ගෝපදේශවලට අනුගතව "වයිරස වසංගත: නව ආරම්භයක්" යන තේමාව යටතේ පෙබරවාරි මස 3 වැනි දින වෛද්‍ය පීඨයේ මහාචාර්ය ටී.ඩබ්ලිව්. වික්‍රමනායක ශ්‍රවණාගාරයේදී සාර්ථකව පවත්වන ලදී. එහි ප්‍රධාන ආරාධිතයා වූයේ රුහුණ විශ්වවිද්‍යාලයේ උප කුලපති, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුජීව අමරසේන මහතායි. බෝවන රෝග පිළිබඳ ජාතික ආයතනයේ විශේෂඥ වෛද්‍ය ආනන්ද විජේවික්‍රම මහතා "කොවිඩ්-19 අර්බුදය සමග බලාපොරොත්තු: කිසිවක් හෝ තිබේද?" යන මාතෘකාව යටතේ ප්‍රධාන දේශනය පවත්වනු ලැබීය. "පශ්චාත් ප්‍රසව අන්තර් ගර්භාෂ උපකරණ සේවාව ආයතනකරණය: සාර්ථකව ක්‍රියාවට නැංවීමේ ප්‍රවාදයක්" මැයෙන් වෛද්‍ය පීඨ ශාස්ත්‍රීය සැසියේ විශේෂ දේශනය පවත්වනු ලැබුයේ රුහුණ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ප්‍රසවවේද හා නාරීවේද අධ්‍යනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ලංකා දසනායක මහතායි.

2020 වසරේ සමස්ත යහපත් කාර්යසාධනය වෙනුවෙන් වෛද්‍ය ශිෂ්‍යයන් තිදෙනෙකු වන යූ.එම්.සී. විජේසිංහ, පී.එන්.එස්.එල්. ප්‍රියදර්ශන සහ වෛද්‍ය ජේ.ජී.ජී. අකලංක යන මහත්වරුන්ට පීඨාධිපති සම්මානය උප කුලපති, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුජීව අමරසේන මහතා සහ රුහුණ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ පීඨාධිපති මහාචාර්ය වසන්ත දේවසිරි මහතා විසින් පිරිනමන ලදී.

## 5. වෛද්‍ය පීඨ ශාස්ත්‍රීය සැසි - 2021

2021 වසරේ රුහුණ විශ්වවිද්‍යාලයීය වෛද්‍ය පීඨ ශාස්ත්‍රීය සැසි "වඩා සෞඛ්‍ය සම්පන්න හා සුරක්ෂිත හෙට දිනක් වෙනුවෙන් අභියෝග මැදින් ගමන හසුරුවා ගැනීම" යන තේමාව යටතේ පෙබරවාරි මස 3 වැනි දින වෛද්‍ය පීඨයේදී සාර්ථකව පවත්වන ලදී. "සතුන් යොදා සිදුකරණ පරීක්ෂණවලට විකල්ප: විද්‍යාත්මක පර්යාලෝකයක්" පිළිබඳව ශ්‍රී ලංකා සත්ත්ව පරීක්ෂා කිරීමට විකල්ප සඳහා සංගමය සමග සහයෝගිතාවයෙන් 2021 දෙසැම්බර් 8 වන දින පූර්ව සම්මේලන වෙබිනාරය පවත්වන ලදී. 2021 වසරේ වෛද්‍ය පීඨ ශාස්ත්‍රීය සැසියේ ප්‍රධාන ආරාධිතයා වූයේ රුහුණ විශ්වවිද්‍යාලය් උප කුලපති, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුජීව අමරසේන

මහතායි. ‘‘ළමා රෝග විද්‍යා පර්යේෂණ: බහුරූපේක්ෂ පුද්ගලික නැහැසුමක්’’ යන මාතෘකාව යටතේ ප්‍රධාන දේශනය පවත්වනු ලැබුයේ ළමා රෝග වෛද්‍ය විශේෂඥ, ලංකා වෛද්‍ය සඟරාවේ සංස්කාරක, ශ්‍රී ලංකා ළමා සෞඛ්‍ය සඟරාවේ සම සංස්කාරක වෛද්‍ය බී.ජේ.සී. පෙරේරා මහතායි. වෛද්‍ය පීඨ ශාස්ත්‍රීය සැසිවල ආරාධිත දේශනය ‘‘ශල්‍යකර්ම, සාර්ථකත්වය හා සතුට:කථාවක් තුළ කථාවක්’’ නම් මාතෘකව යටතේ පවත්වනු ලැබුයේ ශල්‍ය වෛද්‍ය විද්‍යා සම්මානිත මහාචාර්ය හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හිටපු සභාපති මහාචාර්ය මොහාන් සිල්වා මහතායි. පිළිවෙළින් හොඳම 2වන වෛද්‍ය උපාධි ශිෂ්‍යයා ලෙස මෙවන් ඉඳුරුව මහතාත් හොඳම 3වන වෛද්‍ය උපාධි ශිෂ්‍යයා ලෙස නෙත්මී යසාරා මෙනෙවියත් උපකුලපති සම්මානයෙන් පිදුම් ලැබීය.

## 6. මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා රුහුණ ජාත්‍යන්තර සම්මේලනය (RUICHSS) 2021

රුහුණ විශ්වවිද්‍යාලයේ සත්වැනි මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා ජාත්‍යන්තර සම්මේලනය (RUICHSS) 2021 ,නව සාමාන්‍යයට අනුගතවීම: සමාජ සංස්කෘතික අභියෝග හා අවස්ථා’’ යන මාතෘකාව යටතේ 2021 නොවැම්බර් 17 වන දින සාර්ථකව පවත්වනු ලැබිය. රුහුණ විශ්වවිද්‍යාලයේ උප කුලපති, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුජීව අමරසේන මහතා එහි ප්‍රධාන ආරාධිතයා විය. ‘‘කොවිඩ් සාමාන්‍යය’’ මැයෙන් ප්‍රධාන දේශනය පවත්වනු ලැබුයේ ඉන්දියාවේ හයිද්‍රබාද් විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි අධ්‍යනාංශයේ මහාචාර්ය ප්‍රමෝද් කේ නායර් මහතායි, නියෝජ්‍ය උපකුලපති මහාචාර්ය සමන් වන්දන එදිරිවීර හා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ පීඨාධිපති මහාචාර්ය උපාලි පන්නිලගේ මෙම අවස්ථාවට සහභාගි වූ සම්භාවනීය අමුත්තන් අතර විය.

## 7. රුහුණ තත්ත්ව ආරක්ෂණ සැසි

තත්ත්ව ආරක්ෂණ ඒකකය විසින් සංවිධානය කරනු ලැබූ රුහුණ විශ්වවිද්‍යාලයේ සමාරම්භක තත්ත්ව ආරක්ෂණ සැසි සූම් තාක්ෂණය උපයෝගී කර ගනිමින් 2021 සැප්තැම්බර් මස 21 වන දින පවත්වනු ලැබූ අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති මහාචාර්ය සම්පත් අමරතුංග මහතා ප්‍රධාන අමුත්තා ලෙස මෙම අවස්ථාවට එක් විය. ‘‘අභ්‍යන්තර ආරක්ෂණයේ යහපත් පරිචයන් සමාග්‍රහණය කිරීම’’ යන මාතෘකාව යටතේ ප්‍රධාන දෙසුම පවත්වන ලද්දේ සම්මානිත මහාචාර්ය කොලින් එන්. පීරිස් මහතා විසිනි. උත්සවයේ විශේෂ ආරාධිතයා වූ උපකුලපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව ආරක්ෂණ මණ්ඩලයේ සභාපති, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තිලක් පී.ඩී. ගමගේ සමාරම්භක උත්සවය වර්ණවත් කළ සම්භාවනීය ආරාධිතයන් අතර විය. සැසිවලදී නිබන්ධන 20කට වැඩි ගණනක් ඉදිරිපත් කරනු ලැබූ අතර ඒවායේ වාර්තා ප්‍රකාශයට පත්කරන ලදී.

## 8. කළමනාකරණය සහ ආර්ථික විද්‍යාව පිළිබඳ ජාත්‍යන්තර සම්මේලනය (ICME) 2021

‘‘වෙනස සමග අනුගතවීම සහ පශ්චාත් වසංගත සංදර්භය තුළ ව්‍යාපාර සහ ආර්ථිකය නැවත ක්‍රමාංකනය කිරීම’’ යන තේමාව යටතේ කළමනාකරණ සහ මූල්‍ය පීඨය ස්ලෝවැකියාවේ ප්‍රෙසොව් විශ්වවිද්‍යාලය සමඟ හවුල්කාරිත්වයෙන් සංවිධානය කරන ලද කළමනාකරණ සහ ආර්ථික විද්‍යාව පිළිබඳ 10 වැනි ජාත්‍යන්තර සම්මේලනය (ICME 2021) 2021 සැප්තැම්බර් 02 වැනි දින පවත්වන ලදී.

රුහුණ විශ්වවිද්‍යාලයේ කළමනාකරණ හා මූල්‍ය පීඨයේ පීඨාධිපති මහාචාර්ය පී.ඒ.පී. සමන්ත කුමාර මහතා ICME 2021හි සමුළු සභාපති ලෙස කටයුතු කළ අතර ආචාර්ය හේමමාලි ගනේවත්ත මිය සහ තනුක මහේෂ ද සිල්වා මහතා පිළිවෙළින් සම්මේලන සම්බන්ධීකාරක හා ලේකම් ලෙස කටයුතු කරන ලදී. ඕස්ට්‍රේලියාවේ ක්වීන්ස්ලන්ඩ් තාක්ෂණ විශ්වවිද්‍යාලයේ නියෝජ්‍ය උපකුලපති (ව්‍යවසායකත්ව) මහාචාර්ය රොවෙනා බැරට් මහත්මිය සහ ශ්‍රී ලංකා උඟව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ආරම්භක උපකුලපති ආචාර්ය චන්ද්‍රා ඇඹුල්දෙණිය මහතා සම්මේලනයේ අන්තර්දෘෂ්ටික ප්‍රධාන දෙසුම් මාර්ගගතව පවත්වන ලදී.

## 9. කෘෂිකාර්මික ඉංජිනේරු විද්‍යාව හා පාරිසරික තාක්ෂණවේදය පිළිබඳ උපාධි අපේක්ෂක පර්යේෂණ සමුළුව (URSAE) 2021

කෘෂිකාර්මික ඉංජිනේරු විද්‍යාව සහ පාරිසරික තාක්ෂණවේදය පිළිබඳ උපාධි අපේක්ෂක සාකච්ඡා මුළුව (URSAE) රුහුණ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ කෘෂිකර්ම අධ්‍යනාංශය විසින් සංවිධානය කරනු ලබන සම්මන්ත්‍රණයක් වන අතර එහිදී කෘෂිකර්මයේ සහ පරිසරයේ අනාගතය සුරක්ෂිත කිරීමේ අරමුණින් ලොව පුරා වෘත්තිකයන් සමග එක්ව කටයුතු කිරීම පිණිස කාර්ය මණ්ඩලයට හා ශිෂ්‍යයන්ට බුද්ධිමය වේදිකාවක් සැපයේ. URSAE 2021 පරිසංවාදය 2021 ඔක්තෝබර් 4,5 සහ 6 යන දිනයන්හිදී පවත්වනු ලැබීය. මෙවර එය පැවැත්වූයේ ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයේ දැවැන්ත සංවර්ධනය සඳහා කාලීන අවශ්‍යතාවයක් වන ‘‘තිරසර ප්‍රත්‍යාස්ථිති දේශයක් කරා නව්‍යකරණ සුහුරු කෘෂිකර්මාන්තයක්’’ යන්නයි.

## 10. ‘‘කොවිඩ්-19 ට එරෙහි සටන ශක්තිමත් කිරීමේදී මාධ්‍යයේ වගකීම’’ පිළිබඳ සම්මන්ත්‍රණය

සමාජ විද්‍යා අධ්‍යනාංශය ඇතැම් දේශීය හා විදේශීය විශ්වවිද්‍යාල සමග සහයෝගීතාවයෙන් ‘‘කොවිඩ්-19ට එරෙහි සටන ශක්තිමත් කිරීමේදී මාධ්‍යයේ වගකීම’’ පිළබඳ සාකච්ඡා මුළුවක් ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨයේ ශ්‍රවණාගාරයේදී 2021 මාර්තු 19 වැනි දින සංවිධානය කරනු ලැබීය. මෙම සම්මන්ත්‍රණයේ මුඛ්‍ය අරමුණ වූයේ පර්යේෂණ මගින් සොයා ගත් කරුණු දකුණු පළාතේ ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ සහ මාධ්‍යවේදීන්ගේ අවධානයට යොමු කිරීමයි.

මෙම සම්මන්ත්‍රණය සඳහා ප්‍රධාන අමුත්තා ලෙස රුහුණ විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය සුජීව අමරසේන මහතාට ආරාධනා කරනු ලැබීය.

# ජාතික සහ ජාත්‍යන්තර සම්මාන

## 1. විද්‍යාත්මක පර්යේෂණ සඳහා ජනාධිපති සම්මාන - 2021

ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ ආයතනයේ ශ්‍රවණාගාරයේදී 2021 අප්‍රේල් 6 වැනි දින පවත්වනු ලැබූ විද්‍යාත්මක පර්යේෂණ සඳහා ජනාධිපති සම්මාන ප්‍රදානෝත්සවයේදී කෘෂිකර්ම පීඨයේ කෘෂි ඉංජිනේරු විද්‍යා අධ්‍යනාංශයේ මහාචාර්ය ජී.වයි. ජයසිංහ, කෘෂිකර්ම පීඨයේ කෘෂි ජෛව විද්‍යා අධ්‍යනාංශයේ ආචාර්ය ධනංජලී මෙඛලා ගමගේ, වෛද්‍ය පීඨයේ ක්ෂුද්‍ර ජීවවිද්‍යා අධ්‍යනාංශයේ ක්ෂුද්‍ර ජීවවිද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය සුනේත්‍රා ගුණසේන යන මහත්ම මහත්මීන්ට ජනාධිපති සම්මාන හිමි විය. ශ්‍රී ලංකාව තුළ කටයුතු කරන විද්‍යාඥයන් විසින් සැළකිය යුතු දායකත්වයක් ලබා දෙමින් 2018 වසරේදී කීර්තිමත් සහරාවල පළ කරන ලද හොඳම ලිපි 100 වෙනුවෙන් සම්මාන පිරිනමන ලදී.

## 2. විශ්වවිද්‍යාල ජනාධිපති සම්මාන

කෘෂිකර්ම පීඨයේ කෘෂිකාර්මික ඉංජිනේරු විද්‍යා අධ්‍යනාංශයේ කථිකාචාර්යවරයකු (පරිවාස) වන ඩබ්.බී.එම්.ඒ.සී. බණ්ඩාර මහතා 2021 මාර්තු මාසයේදී ජපානයේ රුයුක්යුස් විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයෙහි සිය දර්ශනපති උපාධිය නිමා කරන ලදී. ඔහුගේ ශාස්ත්‍රීය සාධනය සහ රුයුක්යුස් විශ්වවිද්‍යාලයට දැක්වූ දායකත්වය අගයමින් 2021 මාර්තු 23 වන දින පැවැති උපාධි ප්‍රදානෝත්සවයේදී ඔහුට විශ්වවිද්‍යාල ජනාධිපති ගෞරව සම්මානය ප්‍රදානය කරන ලදී.

## 3. අන්තර්ජාතික සංවර්ධන සඳහා අන්තර්ක්‍රියාකාරී සැලැස්ම සඳහා සම්මානය

ප්‍රධාන පුස්තකාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිණියක් වන තේජා කුරුප්පුආරච්චි මියට ඉතාලියේ බාරි හි 2021 සැප්තැම්බර් 1 දින පැවැති මානව පරිගණක අන්තර්ක්‍රියා පිළිබඳ INTERACT2021, IFIP TC13 සම්මන්ත්‍රණයේදී "LIFT: ශ්‍රී ලංකාවේ බුද්ධිමය ඌනතා සහිත යෞවනයන් සඳහා වෙබ් සෙවුම් වෙත ඊ-ඉගෙනුම් හැඳින්වීමක්" මැයෙන් යුත් සමුද්දිෂ්ඨ නිබන්ධනයේ ඉදිරිපත් කරනු ලැබූ සංවර්ධනය වන රටවල ජනතාවගේ සමාජීය හා ආර්ථික සංවර්ධනය සඳහා අන්තර්ක්‍රියාකාරී පද්ධති භාවිතය කෙරෙහි වූ විශිෂ්ඨතම දායකත්වය පිළිගනිමින් අන්තර්ජාතික සංවර්ධනය සඳහා අන්තර්ක්‍රියාකාරී සැලැස්ම සඳහා සම්මානය එම සම්මන්ත්‍රණයේදී පිරිනමන ලදී. කොළඹ විශ්වවිද්‍යාලය හා ඒකාබද්ධව ක්වීන්ස්ලන්ත තාක්ෂණික විශ්වවිද්‍යාලයේදී සිදුකරනු ලැබූ ඒ මහත්මියගේ දර්ශනශූරී පර්යේෂණ ව්‍යාපෘතියේ කොටසක් ලෙස එම නිබන්ධනය පළ කරන ලදී.

## 4. විශිෂ්ඨ සාධන සම්මානය

රුහුණ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ව්‍යාධිවේද අධ්‍යනාංශයේ ප්‍රධානී, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය චන්දන වික්‍රමරත්න මහතාට මානව හිමිකම් සංවිධානයේ මානුෂීය මූලධර්ම වෙනුවෙන් අභිමානයෙන් හා කැපවීමෙන් ඉටු කළ ගෞරවනීය සේවාව පිළිගනිමින් ශ්‍රී ලංකා මානව හිමිකම් සංවිධානය විසින් "සෞඛ්‍ය සේවා ගුණාත්මකභාවය, ප්‍රතීතනය, වෛද්‍ය හා සම සෞඛ්‍ය විද්‍යා අධ්‍යාපනය" පිළිබඳ විශිෂ්ඨ සාධන සම්මානය පිරිනමන ලදී. එම සම්මාන ප්‍රදානය 2021 පෙබරවාරි මස 27 වන දින කොළඹ ටාජ් සමුද්‍ර හෝටලයේදී පවත්වන ලදී. එහි ප්‍රධාන ආරාධිතයා වූයේ ගරු අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත මහතායි.

## 5. ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැසුම් (NARP) සම්මාන

ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව ජාතික කෘෂිකාර්මික පර්යේෂණ පද්ධතියේ ඉහළම ආයතනය වන අතර ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය හා ඊට සම්බන්ධ ක්ෂෙත්‍රයන් ආශ්‍රිත පර්යේෂණවලට ආධාරවීම, ප්‍රවර්ධනය කිරීම,සම්බන්ධීකරණය සහ අධීක්ෂණය සමගින් උපදේශනාත්මක කාර්යභාරයක වගකීම ඊට පැවැරී තිබේ. ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලැස්ම යනු කෘෂිකාර්මික පර්යේෂණවලට සහායවීම

පිණිස වන වැඩසටහනකි. විවිධ විෂය ක්ෂෙත්‍රයන් පිළිබඳ වූ ජාතික කමිටු 12ක් හරහා ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව විසින් සිදුකරනු ලබන ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලසුම් පර්යේෂන ප්‍රදාන ආශ්‍රිත යෝජනා ඇගයීම, ව්‍යාපෘති අධීක්ෂණය සහ ආන්තික වාර්තා ඇගයීම සිදුකරනු ලබන්නේ ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවයි. වාර්ෂිකව තෝරා ගනු ලබන ව්‍යාපෘති කෘෂිකර්ම අමාත්‍යාංශය හරහා මහා භාණ්ඩාගාරය විසින් අරමුදල් සඳහා නිර්දේශ කරනු ලබයි. "ශ්‍රී ලංකාවේ අලෙවිකරණ පිටි කළ කිරි නිෂ්පාදන පිළිබඳ පාරිභෝගික වරණය සහ මිලදී ගැනීමේ අභිප්‍රායන් ඇගයීම" පිළිබඳව ඉදිරිපත් කරනු ලැබූ යෝජනාව සඳහා මහාචාර්ය ගංගානී චන්දිමා සමරවීර මහත්මියට තරඟකාරී පර්යේෂණ ප්‍රදානය පිරි නමන ලදී. (වැය ශීර්ෂ අංක 425-02-03-005-2507 සහ ප්‍රදාන අංක NARP/21/UR/AG/01 යටතේ රුපියල් දස ලක්ෂ හයසිය හැත්තෑ පනදහසක්)

## 6. සමස්ත ලංකා සෞඛ්‍ය නව්‍යකරණ සම්මාන




රුහුණ විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ දර්ශනශූරී ශිෂ්‍යාවක වන කේ.ජී. පියුමී වාසනා මිය ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය විසින් සංවිධානය කරනු ලැබූ සමස්ත ලංකා සෞඛ්‍ය නව්‍යකරණ සම්මාන උළෙලේ විශ්වවිද්‍යාල කාණ්ඩයේ රන් පදක්කම දිනා ගන්නා ලදී. අළුතින් හඳුනාගත් වර්ගය 2 මධු මේහය සහිත රෝගීන්ට කොසිනියා ග්‍රැන්ඩිස් (එල්) වොජීටි ශාකසාර කැප්සියුලයේ සමාජ්ත උභය දෘශ්‍ය අස්වැසුම් ඔසු පාලිත සායනික පරීක්ෂණය මත පාදකව "වර්ගය 2 මධු මේහය සඳහා නව්‍ය දියවැඩියා මර්ධන කාරකයක්" නමැති නව්‍යකරණය සඳහා මෙය පිරිනමන ලදී.

## 7. පළමු අතථ්‍ය ජාතික කාටා තරඟය

2021 වසරේ පළමු අතථ්‍ය ජාතික කාටා ශූරතාවලිය 2021 ඔක්තෝබර් 15 සිට 25 දක්වා පවත්වන ලදී. එම ශූරතාවලියේදී ජ්‍යෙෂ්ඨ පිරිමි කාටා මට්ටම 3 ඉසව්වෙන් ඉංජිනේරු පීඨයේ කේ.ඩී. ප්‍රභාත් මධුසංඛ ලෝකඩ පදක්කමක් දිනා ගන්නා ලදී.

## 8. පළමු අතථ්‍ය අන්තර් විශ්වවිද්‍යාල ටයික්වොන්ඩෝ ශූරතාවලිය

2021 වසරේ පළමු අතථ්‍ය අන්තර් විශ්වවිද්‍යාල ටයික්වොන්ඩෝ ශූරතාවලිය 2021 නොවැම්බර් 11 සිට 13 දක්වා පවත්වන ලදී. එහිදී කොළ පටි පිරිමි කාණ්ඩයේ ලෝකඩ පදක්කමක් දිනා ගැනීමට විද්‍යා පීඨයේ පී.එච්.බී.එස් . සඳරුවන්ට හැකි විය.

# ජාත්‍යන්තර සහයෝගිතා

## 1. ප්‍රත්‍යාස්ථික ප්‍රජාවක් සඳහා විශ්වවිද්‍යාල ව්‍යවසාය සහයෝගිතාව ශක්තිමත් කිරීම පිළිබඳ විශේෂ සැසිය "SECRA"

ව්‍යුහාත්මක ඉංජිනේරු විද්‍යාව සහ ඉදිකිරීම් කළමනාකරණය පිළිබඳ 12වැනි අන්තර්ජාතික සම්මන්ත්‍රණය-2021 පේරාදෙණිය විශ්වවිද්‍යාලය, මොරටුව විශ්වවිද්‍යාලය, රුහුණ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තාක්ෂණික සම අනුග්‍රාහකත්වය සහිතව පවත්වනු ලැබීය. මෙම සම්මන්ත්‍රණයේදී, ප්‍රත්‍යාස්ථික ප්‍රජාව සඳහා විශ්වවිද්‍යාල ව්‍යවසායක සහයෝගිතාව ශක්තිමත් කිරීම පිළිබඳ විශේෂ සැසියක් 2021 දෙසැම්බර් 18 වනදා ප.ව. 4.00 සිට 6.30 දක්වා මාර්ගගතව සංවිධානය කරන ලදී. එම විශේෂ සැසියේ අරමුණ වූයේ ව්‍යාපෘති කාර්යය සහ ඒවායේ ප්‍රතිඵලයක් ලෙස ඇතිවන මූලාරම්භ පිළිබඳ දැනුම බෙදා හදා ගැනීම, අවස්ථා පිළිබඳ පර්යේෂණ ප්‍රජාව දැනුවත් කිරීම සහ අදාළ ක්ෂෙත්‍රයන් ආශ්‍රිතව සිදුකරමින් පවතින පර්යේෂණ සාකච්ඡා කිරීමයි.

## 2. ට්‍රොපිමුන්ඩෝ දර්ශනපති වැඩසටහනේ සමාරම්භක උත්සවය



ට්‍රොපිමුන්ඩෝ (TROPIMUNDO) යනු යුරෝපීය සංගම් අරමුදලින් ක්‍රියාත්මක අධ්‍යාපන විශිෂ්ඨතාවයේ ලේබලය දරණ එරාස්මුස් මුන්ඩස් ඒකාබද්ධ නිවර්තන ජෛවවිවිධත්වය සහ පාරිසරික පද්ධති පිළිබඳ ඒකාබද්ධ දර්ශනපති උපාධි වැඩසටහනකි. (https://www.tropimundo.eu/). උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුජීව අමරසේන, නියෝජ්‍ය උපකුලපති මහාචාර්ය සමන් චන්දන එදිරවීර, වැඩසටහනේ මෙරට සම්බන්ධීකාරක ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එල්.පී. ජයතිස්ස සහ ආචාර්ය කේ.ඒ. සුනන්ද කොඩිකාර යන මහත්වරුන්ගේ සහභාගිත්වයෙන් 2021 අප්‍රේල් 09 දින දෙවන ශිෂ්‍ය කාණ්ඩය ට්‍රොපිමුන්ඩෝ දර්ශනපති උපාධි වැඩසටහන වෙත සාදරයෙන් පිළිගන්නා ලදී.

## 3. යුරෝපීය සංගම් අරමුදලින් ක්‍රියාත්මක ශ්‍රී ලංකා ව්‍යාපෘතිය ආරම්භ කිරීමේ රැස්වීම

දේශීය පාර්ශවකරුවන් සඳහා යුරෝපා සංගම් එරස්මස්+ අරමුදලින් ක්‍රියාත්මක ශ්‍රී ලංකා (ශ්‍රී ලංකාවේ පුනර්ජනනීය බලශක්ති තාක්ෂණවේද සඳහා පුහුණු මධ්‍යස්ථානය) අප්‍රේල් 4 වැනි ඉරු දින ගරු බලශක්ති අමාත්‍ය ඩලස් අලහප්පෙරුම මහතා සහ රුහුණ විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමන්ගේ සහභාගිතවයෙන් ගාල්ල ජෙට්වින් හෝටලයේදී පවත්වන ලදී.

## 4. අතථ්‍ය සකුරා විද්‍යා තරුණ හුවමාරු වැඩසටහන

2020 වසර සඳහා සකුරා විද්‍යා තරුණ හුවමාරු වැඩසටහන කෘෂිකර්ම පීඨයේ පාංශු විද්‍යා අධ්‍යනාංශය මාර්ගගත දෙදින වැඩසටහනක් ලෙස ජපානයේ ඔකයාමා විශ්වවිද්‍යාලය සමග 2021 මාර්තු 1 සහ 2 යන දිනවලදි පවත්වන ලදී.

## 5. ස්වීඩන විශේෂඥයන් සමඟ සහයෝගිතාවයෙන් "උණ බට කෙඳි භෝගය" පිළිබඳ ක්ෂේත්‍ර සැසිය

රුහුණ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ භෝග විද්‍යා අධ්‍යනාංශය ස්වීඩනයේ "ප්ලැන්ට්බූ" උණ රෝපණ සමාගම සමඟ සහයෝගිතාවයෙන් උණ බට භෝග ස්ථාපිත කිරීම හා කළමනාකරණය පිළිබඳව උපාධි අපේක්ෂක ශිෂ්‍යයන් සඳහා ක්ෂෙත්‍ර සැසි මාලාවක් සංවිධානය කරන ලදී. එක්සත් රාජධානියේ සහ ස්වීඩනයේ වෘත්තිකයන්ගෙන් සැදුම් ලත් විශේෂඥ කණ්ඩායම 2021 දෙසැම්බර් 17 වන දින රුහුණ සරසවියේ සංචාරයක නිරත වන ලදී.

# අනෙකුත් විශේෂ සිදුවීම්

## 1. වර්ණ රාත්‍රිය 2018/2019

රුහුණ විශ්වවිද්‍යාලයේ 2018/2019 වර්ණ රාත්‍රිය 2021 මාර්තු 27 දින විශ්වවිද්‍යාලයීය රබීන්ද්‍රනාත් තාගෝර් අනුස්මරණ ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී.




විශ්වවිද්‍යාලයේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ සුවිශේෂී දස්කම් පිළිගැනීමට හා ඇගයීමට ලක්කරන වර්ණ රාත්‍රිය විශ්වවිද්‍යාලයේ සියලු දෙනා ඉමහත් අපෙක්ෂාවෙන් බලා සිටින සහ ගෞරවාන්විත උත්සවයක් සේ සලකනු ලබයි. ක්‍රීඩකයකුට හෝ ක්‍රීඩිකාවකට සිය සරසවි ජීවිතය තුළ ලබාගත හැකි ඉහළම සම්මානය වන්නේ විශ්වවිද්‍යාල වර්ණලාභියකු වීමයි. වර්ණ රාත්‍රියේ ප්‍රධාන ආරාධිතයා ලෙස රුහුණ විශ්වවිද්‍යාලයේ උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුජීව අමරසේන මහතා සහභාගී වූ අතර විශේෂ සම්භාව්‍ය අමුත්තා වූයේ ප්‍රජා වෛද්‍ය විශේෂඥ සහ යුධ හමුදාවේ නිවාරණ වෛද්‍ය හා මානසික සෞඛ්‍ය සේවා නියෝජ්‍ය අධ්‍යක්ෂ වෛද්‍ය සචීන් සේමගේ මහතායි.

වර්ණලාභීන්ගේ මතකයේ සදා රැඳෙන සතුට හා ප්‍රමෝදය සපිරි සුවිශේෂී අවස්ථාවක් වන වර්ණ රාත්‍රිය ඔවුන්ගේ පවුල්වලට ආඩම්බර විය හැකි මෙන්ම පුහුණුකරුවන්ට කෘතවේදීත්වය පළ කිරීමේ අවස්ථාවක් ද වේ. 2018 සහ 2019 වසර සඳහා මුළු වර්ණ ලාභීන් සංඛ්‍යාව 185ක් වූ අතර, හොඳම ක්‍රීඩක ක්‍රීඩිකාවන් 65 දෙනෙකුට හා විශේෂ ත්‍යාගලාභීන් 16 දෙනෙකුට සම්මාන ප්‍රදානය කරන ලදී.

**2018/2019 වසර සඳහා විශිෂ්ඨතම ක්‍රීඩකයා**

එස්.යූ.එස්.බී. විජේවික්‍රම - කෘෂිකර්ම පීඨය

**2018/2019 වසර සඳහා විශිෂඨතම ක්‍රීඩා දක්ෂතාව**

එඩ්.පී.ඒ. ජයමිණි - ඉංජිනේරු පීඨය

## 2. රුඑඩිකා'21 - රුහුණ අධ්‍යාපන සහ රැකියා පොළ

2021 වසරේ රුහුණ අධ්‍යාපන හා රැකියා පොළ 2021 නොවැම්බර් 30 වන දින රුහුණ විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨ පරිශ්‍රයේදී පවත්වන ලදී. එය සංවිධානය කරන ලද්දේ විද්‍යා පීඨ ශිෂ්‍යයන්ගේ වෘත්තීය කවය සහ විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකයයි. එහි සමාරම්භක උත්සවය සඳහා රුහුණ විශ්වවිද්‍යාලයේ උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුජීව අමරසේන මහතාද විශේෂ ආරාධිතයා ලෙස නියෝජ්‍ය උපකුලපති මහාචාර්ය ඊ.පී.එස්. චන්දන මහතා ද සහභාගි විය. පුද්ගලික අංශයේ සමාගම් 50 ක් පමණ සහ ශිෂ්‍යයන් 300කට අධික සංඛ්‍යාවක් රුඑඩිනා '21 සඳහා සහභාගි විය. විද්‍යා පීඨයේ වෘත්තීය කවය අදියර දෙකකින් මෙය සංවිධානය කර තිබුණි. පළමු අදියර යටතේ රැකියා පොළ සඳහා ශිෂ්‍යයන් සූදානම් කිරීම පිණිස වැඩමුළු මාලාවක් රැකියා කවය සංවිධානය කර තිබූ අතර දෙවන අදියර වූයේ රැකියා පොළ '21 යි.



## 3. රුධිරය දන් දී ජීවිතයක් බේරා ගන්න- රුධිර හා ඉන්ද්‍රීය පරිත්‍යාග කිරීමේ ව්‍යාපාරය

රුහුණ විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යනාංශය විසින් සංවිධානය කරනු ලැබූ පළමු රුධිරය පරිත්‍යාග කිරීමේ ව්‍යාපාරය 2021 මාර්තු 18 වන දින අධ්‍යනාංශ පරිශ්‍රයේදී පැවැත්වුණි. මෙම අභියෝගාත්මක කොවිඩ්-19 වසංගත කාල සීමාව තුළ රුධිර සැපයුම සපුරාලීම පිණිස පීඨයේ ශිෂ්‍යයන් සහ කාර්ය මණ්ඩල සාමාජිකයන් ඇතුළුව රුධිර පරිත්‍යාගශීලීන් සියයකට අධික සංඛ්‍යාවකගේ නොමසුරු සහයෝගය මෙම වැඩසටහන සඳහා ලැබුණි. මෙම වැඩසටහනට සමගාමීව ඉන්ද්‍රියන් පරිත්‍යාග කිරීම සඳහා ලියාපදිංචි කිරීමේ ව්‍යාපාරයක් ද දියත් කළ අතර ඒ සඳහා ද සියයකට අධික පිරිසක් ලියාපදිංචි වුණි.

## 4. වෙනස් හැකියාවන් ඇති ශිෂ්‍යයෙකු සඳහා ඉලෙක්ට්‍රොනික පාපැදියක් පරිත්‍යාග කිරීම

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ අවසන් වසරේ ශිෂ්‍යයකු වන කේ.එච්. නුවන් බුද්ධිකට ඔහුගේ පාද ආශ්‍රිත ආබාධයක් නිසාවෙන් එදිනෙදා කටයුතු කරගෙන යාමේදී ඇතිවන බාධක වැළැක්වීමට පහසුකම් සපයනු පිණිස ඉලෙක්ට්‍රොනික පාපැදියක් පරිත්‍යාග කරන ලදී.



## 5. එක්ස්පර්ට් එස්පෙරින්සා

පීඨයේ ව්‍යවසායකත්ව අධ්‍යයන කවය වෙනස් කර්මාන්තවල විවිධ ව්‍යක්තිකයන්ට ආරාධනා කිරීම මගින් සූම් තාක්ෂණය ඔස්සේ වෙබ්මන්ත්‍රණ මාලාවක් පැවැත්වීමේ නිරතව සිටියි. මෙම වෙබ්මන්ත්‍රණ මාලාවේ පළමු සැසිය ප්‍රධාන ආරාධිතයන් ලෙස කසුන් සහ චමරි දීගොඩ ගමගේ යන තරුණ යුවලගේ සහභාගිත්වයෙන් 2021 නොවැම්බර් 03 වන දින සාර්ථකව පවත්වනු ලැබූ අතර එහිදී 'බිරිඳ සමග සංචාරය කරන්න' නම් යූටියුබ් නාලිකාව සමගින් ආකාර්ෂණීය අයුරින් සමාජ මාධ්‍ය භාවිතයේ වෙනසක් ඇති කිරීමට ඔවුන සමත් විය. මෙම වැඩසටහනේ අත්‍යන්ත අරමුණ සමාජයේ ධනාත්මක වෙනසක් ඇති කිරීම පිණිස අපගේ උපාධි අපේක්ෂකයන් සාර්ථක ව්‍යවසායකයන් බවට පත් කිරීමට මග පෙන්වීම වුවත්, වැඩසටහන මූලිකවම අවධානය යොමු කළේ විශේෂ උපාධිය සඳහා ව්‍යවසායකත්වය හදාරන 2000 සහ 3000 මට්ටම අධ්‍යයන වාර 2 ශිෂ්‍යයන් කෙරෙහිය.

## 6. බහුත්වවාදය සඳහා නිර්මාණශීලී තරුණ සහභාගිත්වයේ (CYEP) රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනාංශයේ ශිෂ්‍යයන්

රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනාංශයේ ශිෂ්‍යයන් විශ්වවිද්‍යාලය විසින් පමණක් නොව අනෙකුත් ආයතන සංවිධානය කරනු ලැබූ ක්‍රියාකාරකම් ගණනාවකට ද සහභාගි විය. "බහුත්වවාදය සඳහා නිර්මාණශීලී තරුණ සහභාගිත්වය" යන ව්‍යාපෘතිය යටතේ, ශ්‍රී ලංකා ජාතික සාම මණ්ඩලය අග්නිදිග විශ්වවිද්‍යාලය, සබරගමුව විශ්වවිද්‍යාලය, යාපනය විශ්වවිද්‍යාලය සහ රුහුණ විශ්වවිද්‍යාලයේ රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනංශය සමග එක්ව "බහුත්ව ශ්‍රී ලංකාවක් පිළිබඳ ජාතික සම්මන්ත්‍රණය: ප්‍රතිසන්ධානය කරා ඇති මාර්ග සොයා බැලීම-2021"නමින් ජාතික පර්යේෂණ සම්මන්ත්‍රණයක් සංවිධානය කරනු ලැබීය. සියලු සෞඛ්‍ය මාර්ගෝපදේශයන්ට දැඩිව අනුගත වෙමින් සහ කොවිඩ්-19 වසංගත තත්ත්වය තුළ ආරක්ෂිත පරිසරයක් සහතික කරමින් බත්තරමුල්ලේ වෝටර්ස් එජ් හෝටලයේදී 2021 නොවැම්බර් 14 වනදා එහි සමාරම්භක උත්සවය පවත්වනු ලැබීය.

# කොටස VIII

# පුස්තකාලය

## පුස්තකාලයාධිපති ප්‍රකාශය

රුහුණ විශ්වවිද්‍යාලයේ පුස්තකාලය ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ පිහිටි වඩාත්ම සම්පත් සපිරි අධ්‍යයන පුස්තකාල අතුරින් එකකි. මේ වන විට එහි ඇති පොත් පත් එකතුව මිලියන 2.4 ඉක්මවා ඇති අතර එය සේවා කේන්ද්‍රීය ආයතනයක් ලෙස ක්‍රියාත්මක වේ. කෙසේ වෙතත්, 2021 වසරේදී කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් පැන නැගුණු අභියෝගයන්ට මුහුණ දීමට පුස්තකාලයට සිදු විය. එබැවින් අවශ්‍යතාවය පරිද පරිශීලක සේවා නැවැත සකස් කරන ලදී. භෞතික වටපිටාවකට සමාන ආකාරයේම ගුණාත්මකබව පවත්වා ගනිමින් මාර්ගගත ද්වාර භාවිතා කරමින් පරිශීලක ප්‍රජාවට පුස්තකාල සේවා බහුතරයක් ලබා දෙන ලදී. උදාහරණයක් ලෙස, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ කොළඹ විශ්වවිද්‍යාලයේ උපකාරයෙන් සහ බ්‍රිතාන්‍ය මණ්ඩල පුස්තකාලයේ සහයෝගිතාවයෙන් ලේඛන බෙදාහැරීමේ සේවාව රුහුණ විශ්වවිද්‍යාල පුස්තකාලය විසින් ආරම්භ කරනු ලැබීය. මෙම සේවාව, මුළුමණින්ම ගාස්තු අයකිරීමකින් තොර අතර රුහුණ විශ්වවිද්‍යාලයේ අධ්‍යයන, ශිෂ්‍ය හා පර්යේෂණ ප්‍රජාවේ තොරතුරු අවශ්‍යතා සපුරාලන ලදී.

2021 වසරේදී, විවිධ සේවාවන් විවිධ ආකාරයෙන් සැපයීම මගින් පුස්තකාලය රුහුණ විශ්වවිද්‍යාලයට සිය දායකත්වය ලබා දෙන ලදී. උදාහරණයක් ලෙස, හැඳුනුම්පත් සකස් කිරීමේ ඒකකය විශ්වවිද්‍යාලයට අවශ්‍ය එක් සේවාවක් සපයන ලදී. තවද, රුහුණ විශ්වවිද්‍යාලයේ මාධ්‍ය ඒකකය විශ්වවිද්‍යාලයීය පුස්තකාලයාධිපතිගේ මග පෙන්වීම යටතේ ක්‍රියාත්මක වේ.

පුස්තකාල පරිශීලක ප්‍රජාවට වඩා යහපත් සේවයක් සැපයීම පිණිස ඉදිරියේදී පුස්තකාල සම්පත් එකතුව හා යටිතල පහසුකම් තවදුරටත් සංවර්ධනය කිරීම අපගේ අපේක්ෂාවයි. විශේෂයෙන්ම අපගේ මාර්ගගත ඊ-සම්පත් සහ සේවා වෙත ප්‍රවේශ විමේදී දැනට පවතින ගැටලු විසඳාලීම කෙරෙහි අප අවධානය යොමු කරන්නෙමු.

වැඩබලන පුස්තකාලයාධිපති

## සාමාජිකත්ව විස්තර

| | ප්‍රධාන | කෘෂි. | ස.සෞ.වි. | ඉංජී. | වෛද්‍ය | තාක්ෂණ |
|---|---|---|---|---|---|---|
| **වත්මන් සාමාජිකත්වය** | | | | | | |
| • ශිෂ්‍යයන් | 6558 | 1018 | 438 | 1509 | 1154 | 627 |
| • අධ්‍යයන කාර්යමණ්ඩල | 356 | 138 | 31 | 70 | 97 | 42 |
| • අනධ්‍යයන කාර්ය මණ්ඩලය | 295 | 48 | 15 | 55 | 114 | 21 |
| **නව සාමාජිකත්ව (2021 වසරෙහි)** | | | | | | |
| • ශිෂ්‍යයන් | 2381 | - | 133 | 805 | 265 | - |
| • අධ්‍යයන කාර්යමණ්ඩලය | 36 | 06 | - | 04 | 09 | 10 |
| • අනධ්‍යයන කාර්ය මණ්ඩලය | 04 | 03 | 19 | - | 05 | 01 |

## විවෘතව තබන වේලාවන්

| | ප්‍රධාන | කෘෂි. | ස.සෞ.වි. | ඉංජී. | වෛද්‍ය | තාක්ෂණ |
|---|---|---|---|---|---|---|
| **විවෘතව තබන වේලාවන් (පෙ.ව.– ප.ව.)** | | | | | | |
| • සතියේ දින | 8.00 - 4.00 | 8.00 - 6.00 | 8.00 - 6.15 | 8.00 - 6.00 | 8.00 - 6.00 | 8.30 - 4.30 |
| • සෙනසුරාදා | 8.30 - 5.00 (විභාග කාලසීමාව සඳහා පමණි) | 8.00 - 6.00 (විභාග කාලසීමාව සඳහා පමණි) | 8.15 - 5.15 | 8.00 - 5.00 | 8.00 - 6.00 | - |
| • ඉරිදා | වසා ඇත | 8.00 - 6.00 (විභාග කාලසීමාව සඳහා පමණි) | වසා ඇත | - | 8.00 - 6.00 | - |
| **බහුමාධ්‍ය මධ්‍යස්ථානය** | | | | | | |
| • විවෘතව තබන වේලාවන් | ක්‍රියාත්මක නොවේ | සේවා ලබාගත නොහැක | සතියේ දින – පැය 10 සතිඅන්ත – පැය 9 | සේවා ලබාගත නොහැක | සේවා ලබාගත නොහැක | සේවා ලබාගත නොහැක |
| **ස්වයං-ඉගෙනුම් ප්‍රදේශය** | 8.00 – 6.00 | සේවා ලබාගත නොහැක | සේවා ලබාගත නොහැක | පැය 24 | සේවා ලබාගත නොහැක | සේවා ලබාගත නොහැක |

## දඩ, බැහැර දුන් සහ ඡායා පිටපත්

| | ප්‍රධාන | කෘෂි. | ස.සෞ.වි. | ඉංජී. | වෛද්‍ය | තාක්ෂණ |
|---|---|---|---|---|---|---|
| **ප්‍රමාදිත පොත් සඳහා දඩ (රු.)** | 91141.00 | 6352.00 | 3383.00 | 12774.00 | 37946.00 | 310.00 |
| **අන්තර් පුස්තකාල හුවමාරු** | | | | | | |
| • යැවූ | - | 01 | - | 04 | - | - |
| • ලැබුණු | - | - | - | - | - | - |
| **ඡායා පිටපත් සංඛ්‍යාව** | | | | | | |
| • නිල කාර්යයන් සඳහා | 3000 | 870 | 5001 (ඡායා පිටපත් හා මුද්‍රිත) | 1200 | 450 | 850 |

## පොත් සහ වාර ප්‍රකාශන

| | ප්‍රධාන | කෘෂි. | ස.සෞ.වි | ඉංජී. | වෛද්‍ය | තාක්ෂණ |
|---|---|---|---|---|---|---|
| **වාර ප්‍රකාශන** | | | | | | |
| • දැනටමත් ඇති මුළු වාර ප්‍රකාශන ගණන | 59 | - | 38 | 68 | 366 | 45 |
| • අළුතින් මිලදී ගත් | - | - | - | 02 | - | 02 |
| • නව පරිත්‍යාග | - | 19 | - | 05 | 05 | 01 |
| **පොත්** | | | | | | |
| • දැනටමත් ඇති මුළු පොත් සංඛ්‍යාව | 245839 | 23419 | 4056 | 15780 | 25352 | 2440 |
| • අළුතින් මිලදී ගත් | 224 | 101 | 15 | 08 | 54 | 25 |
| • නව පරිත්‍යාග | 214 | 58 | 196 | 09 | 143 | 02 |
| • පරිගණක ගත කළ පොත් | | | | | | |
| - ඉංග්‍රීසි | 418 | 43 | 211 | 15 | 197 | 108 |
| - සිංහල | 20 | - | - | 03 | - | - |
| - සංයුක්ත තැටි | - | - | - | - | - | - |
| **නිකුත් කළ පොත් සංඛ්‍යාව** | | | | | | |
| • ශිෂ්‍යයන් | 2154 | 197 | 950 | 129 | 1882 | 31 |
| • අධ්‍යයන කාර්ය මණ්ඩලය | 1202 | 247 | 165 | 86 | 498 | 86 |
| • අනධ්‍යන කාර්ය මණ්ඩලය | 2154 | 369 | 94 | 178 | 48 | 91 |

# කොටස IX

# ව්‍යාප්ති සේවා

# වෛද්‍ය මධ්‍යස්ථානය

වෛද්‍ය මධ්‍යස්ථානය විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂකයන්, අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල වෙත වෛද්‍ය හා පරිපූරක වෛද්‍ය සේවා සපයන අතර විවිධ විශේෂ අවස්ථා සඳහා සෞඛ්‍ය සේවා සපයයි. (උදා: උපාධි ප්‍රදානෝත්වය, විශ්වවිද්‍යාල ක්‍රීඩා තරඟ, අනෙකුත් විශේෂ අවස්ථා ආදී)

## වෛද්‍ය මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය

| කාණ්ඩය | සංඛ්‍යාව |
|---|---|
| ප්‍රධාන වෛද්‍ය නිලධාරී (වැඩ බලන) සහායක පදනමින් | 01 |
| විශ්වවිද්‍යාල වෛද්‍ය නිලධාරීන් (සහායක පදනමින් ) | 02 |
| දන්ත ශල්‍ය වෛද්‍ය | 01 |
| හෙද නිලධාරී | 02 |
| ඖෂධවේදී | 01 |
| මහජන සෞඛ්‍ය නිලධාරීන් (සහායක පදනමින්) | 01 |
| වෛද්‍ය රසායනාගාර ශිල්පීන් (සහායක පදනමින්) | 01 |
| තාක්ෂණ නිලධාරී | 01 |
| උපස්ථායක (කාන්තා) | 01 |
| උපස්ථායක (පිරිමි) | 03 |
| වැඩ සහායක | 01 |

## සායනික සේවා

| සේවාව | ශිෂ්‍ය | කාර්යමණ්ඩලය | එකතුව |
|---|---|---|---|
| බාහිර රෝගී අංශය | 632 | 1297 | 1929 |
| දන්ත වෛද්‍ය ඒකකය | 45 | 110 | 155 |
| රසායනාගාර සේවා | 27 | 120 | 147 |
| විශේෂ ශායන සඳහ යොමුකිරීම | 07 | 02 | 09 |

## නිවාරණ සෞඛ්‍ය සේවා

1) බෝවන රෝග පාලනය
2) වාහක පාලනය
3) ආහාර සුරක්ෂිතතාව

## කොවිඩ්-19 නිවාරණය

1) ශිෂ්‍යයන් සහ අනෙකුත් සියලු කාර්ය මණ්ඩලය සඳහා 2021 ජනවාරි සිට සෞඛ්‍ය අධ්‍යාපනය ලබා දෙන ලදී.
2) සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය මගින් උපදෙස් හා පූර්වආරක්ෂක ක්‍රම.
3) අඛණ්ඩ එන්නත්කරණ වැඩසටහන.

## අනෙකුත් සේවා

| | | | |
|---|---|---|---|
| **ප්‍රතිකාර සහ විශේෂ පරීක්ෂණ** | තුවාල සැරහුම් | 230 | 337 |
| | නික්ෂේපණ | 45 | |
| | සුළු ශල්‍ය කර්ම (විශ්වවිද්‍යාල ඩෙන්ටල් නිලධාරී විසින් සිදුකරන ලද) | 05 | |
| | ECG | 57 | |
| **වෛද්‍ය පරීක්ෂණ** | බෝ නොවන රෝග | 10 | 10 |
| **වෛද්‍ය සහතික (වෛද්‍ය මධ්‍යස්ථානය නිකුත් කරනු ලැබූ)** | ශිෂ්‍යයන් සඳහා | 147 | 163 |
| | කාර්ය මණ්ඩලය | 16 | |
| **වෛද්‍ය සහතික (පිළිගනු ලැබූ)** | නවක ශිෂ්‍යයන් | 2570 | 2817 |
| | විභාග සහ වෙනත් | 140 | |
| | කාර්ය මණ්ඩලය | 89 | |
| | බාහිර | 18 | |
| **මහජන සෞඛ්‍ය සේවා** | ආපන ශාලා පරීක්ෂාව | 410 | 1710 |
| | නේවාසිකාගාර පරීක්ෂාව | 820 | |
| | පාරිසරික | 360 | |
| | අනෙකුත් පරිශ්‍ර | 120 | |

# ශාරීරික අධ්‍යාපනය

## ක්‍රීඩා උපදේශක මණ්ඩලයේ සභාපතිගේ ප්‍රකාශය

මාගේ උපරිම දැනුම ප්‍රකාරව මෙහි පහත සඳහන් ක්‍රීඩා ඉසව් සහ ජයග්‍රහණ නිවැරැදි මම මෙයින් සහතික කරමි. කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් සැලසුම් කළ ක්‍රීඩා ඉසව්වලට දැඩි බාධාවන් එල්ල විය. කෙසේවෙතත්, ඉසව් කිහිපයක් අතථ්‍ය වේදිකාකා ඔස්සේ අන්තර් විශ්වවිද්‍යාල මට්ටමින් පැවැත්වීමට හැකිවූ අතර රුහුණ විශ්වවිද්‍යාලය ඒවායේදී සතුටුදායක මට්ටමේ කාර්යසාධනයක් පෙන්නුම් කළේය. තවද, සංවිධාන කිහිපයක් විසින් සංවිධානය කරනු ලැබූ වෙස්, කරාවේ සහ ටයික්වොන්ඩෝ වැනි අතථ්‍යව ඇගයීමට ලක් කළ හැකි ජාතික හා ජාත්‍යන්තර ක්‍රීඩා ඉසව් කිහිපයක් රුහුණ විශ්වවිදයාලයේ ශිෂ්‍යයන් නියෝජනය කළ අතර එම තරඟවලදී ද සැලකිය යුතු ජයග්‍රහණ ලබා ගැනීමට රුහුණ විශ්වවිද්‍යාලය සමත් විය. එම ජයග්‍රහණ සැලකිල්ලට ගනිමින්, 2023 වසරේදී නැවැත පැවැත්වීමට තීරණය කරනු ලැබූ මීළඟ වර්ණ රාත්‍රියේ වර්ණ ප්‍රදානය සඳහා වර්ණලාභීන් 18 දෙනෙකු සහ විශේෂ සම්මානලාභීන් දෙදෙනෙකු තෝරා ගනු ලැබීය.

විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ ක්‍රීඩක ක්‍රීඩිකාවන් භෞතිකව පුහුණ කිරීමට හැකියාවක් ලැබෙන තුරු ඔවුන්ගේ උද්යෝගය පවත්වා ගනු පිණිස සියලු උපදේශකවරුන්, පුහුණුකරුවන් සහ ක්‍රීඩා භාර නිලධාරීන් ලෙස පත්කරනු ලැබූ අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයන් ඔවුන් සමග සමීපව කටයුතු කරයි. දැඩි අහිතකර බලපෑමක් ඇතිකළ කොවිඩ්-19 වසංගත තත්ත්වය මධ්‍යයෙහි ලැබූ සමස්ත ජයග්‍රහණ සම්බන්ධයෙන් රුහුණ විශ්වවිද්‍යාලයේ ක්‍රීඩා උපදේශක මණ්ඩලය සෑහීමකට පත්වේ. පැවැත්වීමට නොහැකි වූ ක්‍රීඩා තරඟ සියලු ශිෂ්‍යයන් සඳහා විශ්වවිද්‍යාලය විවෘත කිරීමෙන් පසුව පැවැත්වීමට ක්‍රීඩා උපදේශන මණ්ඩලය අදහස් කරයි.

## අන්තර් පීඨ ඉසව්

- කොවිඩ්-19 වසංගතය හේතුවෙන් පැවැත්වීමට නොහැකි විය.

## අන්තර් විශ්වවිද්‍යාල ඉසව්

| ඉසව්ව | ස්ථානය |
|---|---|
| වෙස් (කාන්තා) | කාන්තා වෙස් කණ්ඩායම දෙවන ස්ථානය දිනා ගන්නා ලදී.<br>එන් යසාරා මෙය (නායිකා) - වෛද්‍ය<br>එස් කුමාරසිංහ මෙය - වෛද්‍ය<br>එම්. ධනුදි මෙය - වෛද්‍ය<br>ටී.එදිරිවීර මෙය - වෛද්‍ය<br>පී.ජයසිරි මෙය - තාක්ෂණ<br>ඒ. තිලකරත්න මෙය - විද්‍යා<br>ටී.මෙන්ඩිස් මෙය - විද්‍යා<br>ටී. වීරසේකර මෙය - කෘෂිකර්මය |
| ටයික්වොන්ඩෝ | කොළඹ පටි කාණ්ඩයේ ලෝකඩ පදක්කමක් දිනා ගැනීමට පී.එච්.බී.එස්. සඳරුවන් (SC/2018/10468) ශිෂ්‍යයා සමත් විය. |
| කරාටේ (කාන්තා) | කේ.සී.එන්. ජයසේකර (MD/2019/5516) ශිෂ්‍යාව ජෝෂ්ඨ කාටා 4 මට්ටමේ ලෝකඩ පදක්කමක් දිනා ගන්නා ලදී.<br>එම්.එල්.පී. උපේෂිකා (SC/2018/10404) ශිෂ්‍යාව ජෝෂ්ඨ කාටා 3 මට්ටමේ ලෝකඩ පදක්කමක් දිනා ගන්නා ලදී. |

## ජාතික/අන්තර්ජාතික තරඟ

| ඉසව්ව | ජයග්‍රාහක |
|---|---|
| රුහුණ විශ්වවිද්‍යාලය නියෝජනය කරමින් 2021 ආසියානු විශ්වවිද්‍යාල වෙස් ශූරතාවලියට සහභාගි විය. මාර්ගගත වේදිකාවක් හරහා පැවැත්වූ මෙම ශූරතාවලිය ඉන්දුනීසියානු විශ්වවිද්‍යාල ක්‍රීඩා සම්මේලනය අනුග්‍රාහකත්වය දරන ලදී. | එස්.ඩී. කුමාරසිංහ ශිෂ්‍යාව (MD/2017/5068) |
| 2021 වසරේ පැවැති පළමු අතථ්‍ය ජාතික කරාටේ කාන්තා ශූරතාවලියේදී රුහුණ විශ්වවිද්‍යාලය නියෝජනය කරන ලදී. | කේ.ඩී. ප්‍රභාත් මධුශංඛ ශිෂ්‍යයා (EG/2020/4052) ලෝකඩ පදක්කමක් දිනා ගන්නා ලදී. |
| කොරියානු තානාපති කුසලාන-2021 ටයික්වොන්ඩෝ ශූරතාවලියේදී රුහුණ විශ්වවිද්‍යාලය නියෝජනය කරන ලදී. | ඒ.ඩී.ඩී.ඩී. මුතුමිණිතිලක ශිෂ්‍යාව (MF/2017/5041) රන් පදක්කමක් හා ලෝකඩ පදක්කමක් දිනා ගන්නා ලදී.<br><br>එච්.පී.පී. එරන්දි ශිෂ්‍යාව (SC/2018/10568) ලෝකඩ පදක්කම් දෙකක් දිනා ගන්නා ලදී.<br><br>කේ.එච්.කේ.එල්. ඩිල්ෂාන් ශිෂ්‍යයා (MF/2016/4548) ලෝකඩ පදක්කම් දෙකක් දිනා ගන්නා ලදී.<br><br>කේ.ඒ.ඩී.එම්.කේ.එම්. කත්‍රිආරච්චි ශිෂ්‍යයා (SC/2017/10234) රිදී පදක්කමක් දිනා ගන්නා ලදී.<br><br>පී.එච්.බී.එස්. සඳරුවන් (SC/2018/10468) ශිෂ්‍යයා ලෝකඩ පදක්කමක් දිනා ගන්නා ලදී.<br><br>ජී.එච්.එස්. ලක්ෂාන් ශිෂ්‍යයා (EG/2019/3651) ලෝකඩ පදක්ක දිනා ගන්නා ලදී. |

## වර්ණ ප්‍රදානය

- වර්ණ කාන්තා හා පිරිමි (2021) - 18 ක් නෝරාගන්නා ලදී (2023 දී පවත්වනු ඇත)
- විශේෂ සම්මාන කාන්තා හා පිරිමි - 02ක් නෝරාගන්නා ලදී (2023 දී පවත්වනු ඇත)

## අනෙකුත් ඉසව්

- රුහුණ විශ්වවිද්‍යාලය නියෝජනය කරමින් මෙවාන් ඉඳුවර ශිෂ්‍යයා (MD/2018/5377) සහ ආර්.එම්.කේ.එස්. ගිම්හානි (FM/FS/2017/515) ශිෂ්‍යාව ජාතික ඔලිම්පික් ඇකඩමියට සහභාගි විය.
- FISU ස්වේච්ඡා නායක ඇකඩමියේදී ශ්‍රී ලංකාව නියෝජනය කිරීම පිණිස මෙවාන් ඉඳුවර ශිෂ්‍යයා (MD/2018/5377) නෝරා ගන්නා ලදී.

# කොටස X

# ඒකක/මධ්‍යස්ථාන වාර්තා

# 1. වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය

## ➢ අධ්‍යක්ෂවරයාගේ ප්‍රකාශය

උපාධි අපේක්ෂකයන්ට සංකීර්ණ වැඩ ලෝකයෙහි අවශ්‍යතා සම්බන්ධයෙන් කටයුතු කිරීමට අවශ්‍ය කරනු ලබන ස්වයං ඇගයීම්, තොරතුරු සෙවුම් සහ තීරණ ගැනීමේ කුසලතා සහ හැකියා වර්ධනය කර ගැනීමට සහ යාවජීව ඉගෙනුම් අභිලාෂයන් වර්ධනය කර ගැනීමට වෘත්තිය මාර්ගෝපදේශන ඒකකය සහාය වේ. රුහුණ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන්ට අධ්‍යාපනයේ සිට අනාගත අවස්ථා දක්වා සංක්‍රමණය වීමට උපකාර වෙමින්, ඔවුනට නව්‍යකර්ණ හා අන්තර්කරණ සහාය ලබා දීම පිණිස වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය රුහුණ විශ්වවිද්‍යාලය විසින් ස්ථාපිත කරනු ලැබුයේ 2000 වසරේ මාර්තු මාසයේදීය. අභ්‍යන්තර තොරතුරු ලබා ගැනීම සහ වැඩි වර්ධන අවස්ථා ලබා දීම පිණිස පුළුල් පරාසයක සේවායන් සහ කර්මාන්ත වෘත්තිකයන් සමග හවුල්කාරිත්ව ගොඩනගා පවත්වා ගෙන යාමට අපි සැලසුම් කරමින් සිටින්නෙමු. වෘත්තීය මාර්ගෝපදේශනයේ සාර්ථකත්වය රඳා පවතිනුයේ පුහුණුව සහ රැකියා අවස්ථා පිළිබඳ යාවත්කාලීන කරන ලද තොරතුරු ලබා දීම සහ දේශීය සහ ජාත්‍යන්තර පුහුණු වෙළඳපොළ තුළ පවතින අවස්ථා පිළිබඳව මනා දැනුමක් තිබීම මතය. අන්තර්කරණ, විස්තිරණ සහ ප්‍රවේශ්‍යතාවය සහිත වෘත්තීන් සහ රැකියා නියුක්ත කරවීමේ සහාය සඳහා හැකියාව ඇති කරමින් ඒ සඳහා අන්තර්ක්‍රියාකාරී වැඩසටහන් සහ පුහුණු සැසි පැවැත්වීමට අපි සැලැසුම් කර ඇත්තෙමු.

## ➢ සපයනු ලැබූ සීමාවාසික/කර්මාන්ත පුහුණු

- කළමනාකරණ හා මූල්‍ය පීඨයේ ශිෂ්‍යයන් සඳහා 2021 මාර්තු සහ සැප්තැම්බර් මාසවලදී රැකියා පොළක් සංවිධානය කරන ලදී.
- විද්‍යා පීඨයේ ශිෂ්‍යයන් සඳහා 2021 නොවැම්බර් මස රැකියා පොළක් සංවිධානය කරන ලදී.

## ➢ වෘත්තීය මාර්ගෝපදේශ ක්‍රියාකාරකම්/ වැඩමුළු පැවැත්වීම

මෘදු කුසලතා සහ රැකියා නියුක්තිතා කුසලතා වර්ධනය කරන සහ ශිෂ්‍යයන්ගේ පෞරුෂය සංවර්ධනය කරන ගුණාත්මක වැඩසටහන් හා ක්‍රියාකාරකම් සිදු කිරීමට වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය කටයුතු කරයි.

විවිධ සම්පත් දායකයන් යොදා ගනිමින් විවිධ ස්ථානවලදී වෘත්තීය මාර්ගෝපදේශන ක්‍රියාකාරකම් පවත්වන ලදී. එසේම ශිෂ්‍යයන් මුහුණ පා ඇති විවිධ මානසික ගැටලු වෙනුවෙන් උපදේශන සේවා පවත්වා අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය යහපත් මානසිකත්වයක් ගොඩනැගීමට ඒකකය කටයුතු කරන ලදී.

එසේම පෞද්ගලික අංශයේ ආයතන සමග මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් එම අංශයේ පවතින අවස්ථාවන්ගෙන් නිසි ඵල නෙලා ගැනීමට අවශ්‍ය මාර්ගෝපදේශනය සපයන ලදී.

එසේම ශිෂ්‍යයන්ගේ සුවිශේෂී හැකියාවන් හඳුනාගෙන ඒවා වර්ධනය කිරීම පිණිස අවස්ථාවන් උදා කර දීමද ඒකකයේ වැදගත් සේවාවකි.

## ➢ පැවැත්වූ වැඩසටහන්

- කළමනාකරණ හා මූල්‍ය පීඨය සඳහා 2021 මාර්තු සහ සැප්තැම්බර් මාසවලදී රැකියා පොළ
- විද්‍යා පීඨය ශිෂ්‍යයන් සඳහා 2021 නොවැම්බර් මස රැකියා පොළ
- කර්මාන්ත පාර්ශවකරුවන් සමග සබඳතා ගොඩනගා ගැනීම පිණිස 2021 දෙසැම්බර් මස කර්මාන්ත සංසදයක් පවත්වන ලදී.
- ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේ වැඩමුළුවක් 2021 නොවැම්බර් මාසයේදී පවත්වන ලදී.

- රුහුණ විශ්වවිද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමයේ සහාය ඇතිව රුහුණ විශ්වවිද්‍යාලයේ සියලු පීඨවලින් තෝරා ගත් සිසුන් 23 දෙනෙකු සඳහා ශිෂ්‍යත්ව පිරිනමන ලදී.
- මාර්ගගත අභිප්‍රේරණ වැඩසටහන- ඩඩ්ලි සිරිසේන මහතා, ප්‍රකට ව්‍යාපාරික
- "ගැටලු විසඳීම සඳහා ඔබේ පරිකල්පනය සවිබල ගන්වන්න"- මහාචාර්ය සමන් වන්දන එදිරිවීර මයා
- යුනිලිවර් වැඩසටහන- "සම්මුඛ පරීක්ෂණයට මුහුණ දීමේ කුසලතා ඉහළ නැංවීම" - ආකිලා හනිෆා මිය, කුසලතා උපදේශක හා ඉගෙනුම් විශේෂඥ, යුනිලිවර් සමාගම
- යුනිලිවර් වැඩසටහන "අනුකාරක සම්මුඛ පරීක්ෂණ" - යුනිලිවර්, ශ්‍රී ලංකා
- වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය ලලිත කලා සංගමය- මාර්ගගත සැසිය (ප්‍රදීපාගාරයක පහන් එළිය) - ආචාර්ය නන්දසිරි කීඹියහෙට්ටි මහතා
- වෘත්තීය මාර්ගෝපදේශන ඒකක මාර්ගගත සැසිය "ව්‍යාපාර ආචාර ධර්ම, - මහාචාර්ය අමිල බුද්ධික සිරිසේන - අලෙවිකරණ අධ්‍යනාංශයේ ප්‍රධානී, ක.මූ.පී, රු.වි
- මූල්‍ය ක්ෂෙත්‍රයේ ඔබේ රැකියාව කඩිනමින් ආරම්භ කරන්න - සදීශා විජේවීර මිය
- මහජන කළමනාකරණ වරලත් ආයතනයේ සහයෝගිතාවයෙන් "සම්මුඛ පරීක්ෂණයකට මුහුණ දීමේ උපදෙස්" පිළිබඳ මාර්ගගත වැඩසටහන - ෂාන් යහම්පත් මහතා, වි.අ./ප්‍ර.වි.නි. බ්‍රේන් එච්ආර් (පුද්) සමාගම
- MS Word සළුල ලෙස භාවිතා කරන්න - ආචාර්ය මංජුල විදානගමච්චිගේ, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ගිණුම්කරණ අධ්‍යනාංශය
- පෞරුෂ සංවර්ධන වැඩසටහන- ඉරිෂි අළුවිහාරේ මිය, අධ්‍යක්ෂ, ඉමේජ් කන්සල්ටන්ට්
- වෘ.මා.ඒ. ටෝස්ට්මාස්ටර් ක්ලබ් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන, ඉංජිනේරු එම්.එන්.එම්. මුනව්වාර් මිය, එම්.ජී. ජීවන් ප්‍රදීප් මයා, පී. බාබුකුමාර් මයා, ටෝස්ට්මාස්ටර්ස් ජාත්‍යන්තරය, ශ්‍රී ලංකාව
- ඕස්ට්‍රේලියානු වෘත්තීය හා උසස් අධ්‍යාපනය වෙත මග පෙන්වීමක්- ආචාර්ය බන්දුල ගමගේ මහතා, ගිණුම්කරණ හා මූල්‍ය පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජේම්ස් කුක් විශ්වවිද්‍යාලය, ඕස්ට්‍රේලියාව
- උපාධිධාරින්ට වරාය නගරයේ ඇති අවස්ථා- කස්සප සෙනරත් මහතා, මහජන සබඳතා ප්‍රධානී, වරාය නගරය
- ව්‍යාපාරික සුසිරිත්, වෘත්තිකයකු වීම සඳහා ඔබේ ගමන් මග- කෙන් විජයකුමාර් මහතා, මානව සම්පත් අධ්‍යක්ෂ, වෝටර්ස් එජ් හෝටලය
- කාන්තා ව්‍යවසායකත්වය- ඔටාරා ගුණවර්ධන මිය, එම්බාක් කළමනාකාර අධ්‍යක්ෂ හා ඔඩෙල් හිටපු කළමනාකාර අධ්‍යක්ෂ
- මානසික රෝගයක් වළක්වාගන්නේ කෙසේද? - ආචාර්ය රුමී රූබන්, මනෝ චිකිත්සක, ශික්ෂණ රෝහල, කරාපිටිය
- "ආත්ම විශ්වාසය හා ධෛර්යය" දිනේෂ් ප්‍රියන්ත හේරත් මහතා, පැරාඔලිම්පික් රන් පදක්කම්ලාභී
- යුරෝපයේ සහ ඇමෙරිකා එක්සත් ජනපදයේ පශ්චාත් උපාධි අවස්ථා - මුදිත් එම්. වීරබද්දන මහතා
- ව්‍යවසායකත්වයේ සමාජ බලපෑම- සනත් පී. විදානගමගේ මහතා
- පුද්ගල සන්නාමකරණය-භාතිය හා සන්තුෂ් මහත්වරුන්
- "වෘත්තීය මෙවලම්"- ආකිලා හනිෆා මිය, කුසලතා උපදේශක හා ඉගෙනුම් විශේෂඥ, යුනිලිවර් සමාගම
- "කුසලතා, ආකල්ප හා ශක්තීන්" - ඔටාරා ගුණවර්ධන මිය, එම්බාක් ආරම්භක, ඔටාරා පදනම, අප කවුද හා ඔඩෙල්
- "වැවක් සාදා යායක් අස්වද්දන රුහුණ සරසවි යෝධයා"-ප්‍රසාද් මොරගොඩ මහතා, රුහුණ විශ්වවිද්‍යාලයේ ආදි විද්‍යාර්ථියෙක්
- "පුද්ගල ක්‍රියාශූරත්වයෙන් යුතුව නායකත්වය ලබා දෙන්න"- ජනනි ලියනගේ මිය, ආරම්භක, ඇජිලිටි ටියුන් අප් ට්‍රාන්ස්ෆොමේෂන් සර්විසස්, සම ආරම්භක, පර්සනල් ඇජිලිටි, ශ්‍රී ලංකාව, ව්‍යවසායකත්ව ක්‍රියාශූරත්ව පුහුණුකරු
- ඉංග්‍රීසි සන්නිවේදන කුසලතා පුහුණුව - ඇමෙරිකානු මධ්‍යස්ථානය, මාතර
- "ඔබේ විශ්වාසය ගොඩ නගා ගන්න- පරාජයන් තුළින් ජයග්‍රහණ ලබාගන්න" -ආශ්චර්යා පීරිස් ජයකොඩි, මෝස්තර සැලසුම් ශිල්පී, අභිප්‍රේරණ කථික
- සමාජ සුසිරිත් - මේජර් ජෙනරාල් කීර්ති කොට්ටවත්ත

- ‘‘ලින්ක්ඩ් ඉන්- ඔබේ ඩිජිටල් විද්‍යමානතාව ගොඩ නගාගන්න’’- ජෙන්සි පෝල් මිය, මානව සම්පත් සේවා කළමනාකරු, යුනිලිවර් ශ්‍රී ලංකා
- ගෝලීය ආර්ථිකය තුළ උපාධිධාරීන්ට මාර්ග සිතියමක් - ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි
- අවිනිශ්චිත වටපිටාවක් තුළ අනාගතය ගොඩ නැගීම- ඉන්දික ගුණවර්ධනය මයා
- ඉහළ ඵලදායිතාව සහිත උපාධිධරයකු වීමේ පදනම’’ - ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පී.හේවගේ මයා

# 2. ජාත්‍යන්තර කටයුතු මධ්‍යස්ථානය

## ➢ අධ්‍යක්ෂවරයාගේ ප්‍රකාශය

ගෝලීයව පිළිගත් විශ්වවිද්‍යාලයක් බවට පත්වීමේ ඉලක්කය කරා ගමන් කිරීම පිණිස රුහුණ විශ්වවිද්‍යාලය කැපව සිටියි. එහි ප්‍රතිඵලයක් ලෙස, රුහුණ විශ්වවිද්‍යාලය සහ ලොව පුරා විශ්වවිද්‍යාල අධ්‍යාපන සහ වෙනත් ආයතන අතර සම්බන්ධකයක් ලෙස කටයුතු කිරීම පිණිස ජාත්‍යන්තර කටයුතු මධ්‍යස්ථානය ස්ථාපිත කරනු ලැබීය. ගෝලීය අධ්‍යාපනය තුළ තරඟකාරිත්වය ඉහළ නංවා ගනිමින්, සිය ජාත්‍යන්තර ක්‍රියාකාරකම් පෙළක් මගින් ජාත්‍යන්තර කටයුතු මධ්‍යස්ථානය විශ්වවිද්‍යාලයේ සියලු අධ්‍යයනාංශ/ ඒකක සහ අනෙකුත් අංශ වෙත සිය සහයෝගය ලබා දෙයි. අධ්‍යයන, ආර්ථික, දේශපාලනික, සමාජීය සහ සංස්කෘතික අභිප්‍රේරණ රැසක් මගින් මෙම මූලාරම්භයන් ශක්තිමත් කරනු ලැබේ. සෑම වසරකම නව වැඩසටහන් හතරක් එක් කරමින් විදේශීය පාර්ශවකරුවන් සමග නව හවුල්කාරිත්ව 20ක් ගොඩ නගා ගැනීමට රුහුණ විශ්වවිද්‍යාලයට අපේක්ෂා කරන බව 2019-2023 සඳහා වූ එහි උපායමාර්ගික සැලැස්මේ සඳහන් වේ. ලොව පුරා විශ්වවිද්‍යාල සහ අනෙකුත් සංවිධාන රැසක් සමග නව සහයෝගිතා වැඩසටහන් ගණනාවක් ආරම්භ කිරීම මගින් ඉහත ඉලක්කය දැනටමත් සාක්ෂාත් කර ගෙන ඇති බව ජාත්‍යන්තර කටයුතු මධ්‍යස්ථානය සතුටින් වාර්තා කරයි.

## ➢ විවිධ ව්‍යාපෘති යටතේ ශිෂ්‍ය හුවමාරු

**නෝ(ර්)- ලංකා බිලූ ව්‍යාපෘතිය (විද්‍යා, කෘෂිකර්ම සහ ධීවර හා සාගර විද්‍යා සහ තාක්ෂණ පීඨ)**

- රුහුණ විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨය සහ කෘෂිකර්ම පීඨය, යාපනය විශ්වවිද්‍යාලය, ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය සහ නෝර්වේ-UiT ආක්ටික් විශ්වවිද්‍යාලය, ට්‍රොම්සෝ (රුහුණ විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨය විසින් සම්බන්ධීකරණය කරන ලදී) සමග සහයෝගීතාවයෙන් නෝ(ර්) ලංකා බිලූ ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වා ගෙන යන ලදී.

- ශ්‍රී ලංකාවේ දර්ශනපති ශිෂ්‍යයන් හත් දෙනෙකු සහ දර්ශනශූරී ශිෂ්‍යයකු 2021 පෙබරවාරි මස සිය අධ්‍යයන වැඩසටහන් සම්පූර්ණ කරන ලදී.
- 2021 වසරේ සිට එක් පූර්ණ කාලීන දර්ශනපති ශිෂ්‍යාවක් සිය පූර්ණ කාලීන විද්‍යාපති අධ්‍යයන වැඩසටහන හදාරමින් සිටියි.

**<u>කෘෂිකර්ම පීඨය</u>**

- එක් දර්ශනපති ශිෂ්‍යයෙක් මේ වන විට ශාක සහ පරිසරය ආරක්ෂණ ආයතනය, කෘෂිකර්මය සහ වන විද්‍යා පිළිබඳ බීජිං ඇකඩමිය, චීනය ඇයගේ පශ්චාත් උපාධි පර්යේෂණය සිදුකරමින් සිටී.

- ආර්. ජේ. රෙබෙකා ජෝයිසිකා (PG/AG/01/2019/169), අධීක්ෂක වරු - මහාචාර්ය ෂූක්ෂියාන් චොං, ශාක සහ පරිසරය ආරක්ෂණ ආයතනය, කෘෂිකර්මය සහ වන විද්‍යා පිළිබඳ බීජිං ඇකඩමිය, චීනය දේශීය අධීක්ෂක – කේ.එල්. වසන්ත කුමාර, කෘෂි ජීව විද්‍යා අධ්‍යනාංශය

**<u>ඉංජිනේරු පීඨය</u>**

- යුනිවර්සිටාස් ශිෂ්‍යත්ව - 2021 කැඳවුම , සංවර්ධනය වන රටවල ශිෂ්‍යයන් සඳහා බෙල්ජියමේ බ්‍රසල්ස්හි වීරියේ විශ්වවිද්‍යාලයේ විද්‍යාපති හා දර්ශනශූරී උපාධි වැඩසටහන (ඇමැතිය යුතු අය: එරංද ජයතුංග, අධ්‍යයනාංශ ප්‍රධානී/විද්‍යුත් හා තොරතුරු ඉංජිනේරු විද්‍යා අධ්‍යනාංශය)

- ඉංජිනේරු පීඨයේ විදුලි හා තොරතුරු ඉංජිනේරු විද්‍යා අධ්‍යනාංශයට අනුබද්ධ ශිෂ්‍යයන් තිදෙනෙක් (03) ඔවුන්ගේ දර්ශනපති උපාධි හැදෑරීම පිණිස තෝරාගන්නා ලදී.

  - මොරමැද වත්තේ ගෙදර වානුක කාවින්ද මොරමැද
  - සමරක්කොඩිගේ පසන් මාලින්ද සමරක්කොඩි
  - වර්ණකුලසූරිය ප්‍රමිත විදර්ශන ප්‍රනාන්දු

- විදුලි හා තොරතුරු ඉංජිනේරු විද්‍යා අධ්‍යනාංශයේ කථිකාචාර්යවරයකු (පරිවාස) වන චතුම් සංකල්ප මහතා තායිලන්තයේ තම්මාසාට් විශ්වවිද්‍යාලයේ සිරින්දෝන් ජාත්‍යන්තර තාක්ෂණික ආයතනයේ උසස් අධ්‍යාපනය හදාරමින් සිටියි.

**<u>විද්‍යා පීඨය</u>**

- TROPIMUNDO දර්ශනපති උපාධි වැඩසටහන - සම්බන්ධීකාරක - ආචාර්ය සුනන්ද කොඩිකාර, උද්භිද විද්‍යා අධ්‍යනාංශය - පහත දැක්වෙන ශිෂ්‍යයන් (විදේශ ශිෂ්‍යයන් 26 දෙනෙකු සහ මෙරට ගුවන් ගමන් බලපත්‍රයක් හිමි එක් ශිෂ්‍යයකු) නිවර්තන ජෛවවිවිධත්ව පාඨමාලාවේ ප්‍රායෝගික සංරචකයක් සඳහා ඇතුලත් වී එය සම්පූර්ණ කරන ලදී.

  - ලෝපෙස් විග්නොට් ඇන්ඩ්‍රියා
  - ටෘයිට්ස් ෆ්‍රාන්ශුවා ලුම් එම්
  - ලගුම්බේ අයිරීන් ජීන් කබාහග්
  - මෙලෝ ෆ්ලොරෙස් ලිනා ගැබ්‍රියෙලා
  - ලියු ජැස්මින් චෙරිල්
  - තන්ගසාමි නීධි කිරුබා
  - වැන්නොසි බ්‍රිටෝ වික්ටර්
  - නාන්දම් යෙනුපාක්
  - අයිටේ සැමුවෙල්
  - ලෝසුපසිරිරට් පපිචයා
  - මරුෆාටුස්සයාන්
  - මුරුගෙයටියෝ කෝල් අමාලියා
  - ටොරිස් මයිකල් ජෝසේ
  - ගොවින්දර් මහේෂ්වරන් එන්වර්නාදන්
  - රනිසෙස් ඩිනා මේ ලිඩෝ
  - වකෘයිස්සෙ කැමිල් කැතරින්
  - වැන්ඩෙන්ඩ්‍රියිෂේ මැතිල්ඩේ ලෝරන්ස් බී.
  - පෙට්ට්-බැග්නාඩ් ලෝරලින් එලනෝරා
  - සෙරුක්ස් මොර්ගානේ
  - හැසාඩ් ක්වෙන්ටින් ක්ලෙමන්ට් කාල්
  - ෆෝෂෝල්ට් ලී
  - න්‍යාන්ඩ්ව් අල්ෆොන්සේ
  - බර්නාඩ් ටොම් පියරේ- ලුයිස් එස්ටෙබාන් ගිලෝමේ
  - සැකර්සෙව්ස්කි සාරා
  - පෙරුසෝ සොෆියා
  - මුලර් අයිරිස්

**<u>ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨය</u>**

- බාර්බොරා වින්ටරෝවා - සීමාවාසික වැඩසටහනක් සඳහා වෙක් ජනරජයේ මසාරික් විශ්වවිද්‍යාලයේ හුවමාරු ශිෂ්‍යයෙක් (දර්ශනශූරී) - සම්බන්ධීකාරක- මහාචාර්ය පී.බී. ටර්න ප්‍රදීප් කුමාර

- එරාස්මස් මුන්ඩුස් ඒකාබද්ධ දර්ශනපති උපාධිය සඳහා ශිෂ්‍ය හුවමාරු වැඩසටහන -2020, පහත දැක්වෙන සිසුන් 19 දෙනා දර්ශනපති වැඩසටහන සඳහා බඳවා ගන්නා ලදී.

  - කේ.කේ.ඩී. වමෝදි
  - ඒ.එම්.ආර්.සී. අත්තනායක
  - සුනෙත් ගයාෂාන්
  - කේ.ඩී. ඉසුරි වීරසිංහ
  - ටී.එච්.පී.එල්. හේවගේ
  - ඩබ්.ඒ.වී. අකලංක
  - එස්.ලොකුහිටිගේ
  - එම්.ඒ.පී.එන්. ප්‍රේමරත්න
  - ඩබ්.එම්.එම් . වීරබද්දන
  - ඩී.ඒ.එන්. සිල්වා
  - එච්.එම්.යූ . අයේෂා
  - ඩී.යූ. හෙට්ටිආරච්චි
  - එල්.එන්. විජේවර්ධන
  - කේ.පී.ජී.කේ.පී. ගුරුගේ
  - එච්.එම්.ටී.සී. මධුශංක
  - ඒ.ඒ.ඒ. රනීෂා ඩි ෆොන්සේකා
  - කේ. ගුණාලන්
  - එස්.එස්. ගුණසේකර

**මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය**

- චීන භාෂා උපදේශක බායි ෆැන් මහතා රුහුණ විශ්වවිද්‍යාලයේ නූතන භාෂා සහ ශිෂ්ඨාචාර මධ්‍යස්ථානය විසින් පවත්වනු ලබන චීන භාෂා සහතිකපත්‍ර පාඨමාලාවේ ස්වේච්ඡා චීන භාෂා ගුරුවරයෙකු ලෙස 2018 ඔක්තෝබර් මාසයේ සිට 2021 ඔක්තෝබර් 03 වනදා දක්වා සේවය කළේය. ඔහුගේ සේවා කාලය අවසන්ව නැවත චීනය බලා පිටත් විය.

## ➢ රුහුණ විශ්වවිද්‍යාලයට සැපැමිණි විදේශ නියෝජිතයන්

**ඉංජිනේරු පීඨය**

- ඉංජිනේර් පීඨයේ විදුලි හා තොරතුරු ඉංජිනේරු විද්‍යා අධ්‍යයනාංශයේ විසින් මුලපුරන ලද සහයෝගිතා කාර්යයන්හි ප්‍රතිඵලයක් ලෙස අයර්ලන්තයේ ඩබ්ලින් විශ්වවිද්‍යාල විද්‍යායතනයේ පරිගණක විද්‍යා පාසලේ සහකාර මහාචාර්ය සහ උපාධි පර්යේෂණ අධ්‍යක්ෂ මහාචාර්ය මධුසංක ලියනගේ මහතා 2022 ජනවාරි මාසයේ 1වනදා සිට වසර දෙකක් සඳහා විදුලි සහ තොරතුරු ඉංජිනේරු විද්‍යා අධ්‍යනාංශයේ අනුබද්ධ මහාචාර්යවරයකු ලෙස වසර දෙකක් (2) කටයුතු කරනු ඇත.

- ඉංජිනේරු සැලසුම් ක්‍රමවේදය පිළිබඳව විදුලි සහ තොරතුරු ඉංජිනේරු විද්‍යා අධ්‍යනාංශයේ අධ්‍යයන කාර්යමණ්ඩලය පුහුණු කිරීම පිණිස ඇ.එ.ජනපදයේ උතුරු කැරොලිනාහි ඩියුක් විශ්වවිද්‍යාලය විසින් අතථ්‍ය වැඩමුළු හතරක් (04) පවත්වන ලදී. (සම්පත් දායක: ආචාර්ය ඇන් සේටර්බැක් සහ ආචාර්ය එරක් රිවඩ්සන්, ජෛවවෛද්‍ය ඉංජිනේරු විද්‍යා අධ්‍යනාංශය, ඩියුක් විශ්වවිද්‍යාලය) (ඇමතිය යුතු තැනැත්තා: ආචාර්ය නොයෙලින් පීරිස්, විදුලි සහ තොරතුරු ඉංජිනේරු විද්‍යා අධ්‍යනාංශය)

**මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය**

- 2021 මැයි 3 වනදා සිට 2021 සැප්තැම්බර් 31 දක්වා කාල සීමාව තුළ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් අධ්‍යනාංශය විසින් සංවිධානය කරන ලද අතථ්‍ය ඉංග්‍රීසි භාෂා අධිසාමාජික වැඩසටහන (සැසි පැය 155) මෙම වැඩසටහන දැනටමත් සම්පූර්ණ කර ඇත.

ඇ.එ.ජනපදයේ ක්‍රිස්ටෝෆර් ඇල්ෆඩ් මහතා අතථ්‍ය ඉංග්‍රීසි භාෂා අධිසාමාජික ලෙස කටයුතු කළ අතර එහිදී ඉලක්ක කණ්ඩායම් හතරක් එනම් පීඨවල අධ්‍යයන කාර්ය මණ්ඩල, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය, ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් අධ්‍යනාංශයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ 1000 මට්ටමේ ශිෂ්‍යයන් මෙම වැඩසටහනේ ප්‍රතිලාභ ලබා ගන්නා ලදී.

- ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලයන්හි සිටින ආබාධ සහිත සිසුන් සඳහා අන්තර්කරණ අධ්‍යාපනය සංවර්ධනය කිරීම පිළිබඳව ඉන්ක්ඵඩියු+ එරාස්මස් ව්‍යාපෘතියේ යුරෝපීය සංගම් කණ්ඩායමක් (චෙක් ජනරජය) ව්‍යාපෘතියේ ප්‍රගතිය සාකච්ඡා කිරීම පිණිස 2021 දෙසැම්බර් 3 වනදා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ සංචාරයක නිරත වන ලදී.

**විද්‍යා පීඨය**

- ඇ.එ.ජනපදයේ ෆෝට් ස්මිත්, ආර්කන්සාස් විශ්වවිද්‍යාලයේ 2020 ෆුල්බ්‍රයිට් අධිශිෂ්‍යත්වලාභී මහාචාර්ය රසුපති කන්නන් මහතා 2020 පෙබරවාරී 5 වැනි දින ගෞරව ආරාධිත මහාචාර්යවරයකු ලෙස සත්ත්ව විද්‍යා අධ්‍යනාංශයට පැමිණෙන ලදී. කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් 2020 මාර්තු මාසයේදී ෆුල්බ්‍රයිට් වැඩසටහන අත්හිටුවීමට සිදුවුවද අධ්‍යාපනික, ව්‍යාප්ති සහ ප්‍රජා

විනිදුම්කරණ ක්‍රියාකාරකම්වල නිරතවෙමින් ඒ මහතා දිගටම සත්ව විද්‍යා අධ්‍යනාංශයේ රැඳී සිටියේය. වසර පුරාම ඔහු මාතර කුරුළු සංගණනයක් සිදු කළ අතර එමගින් ශ්‍රී ලංකාවේ පක්ෂි විද්‍යා තොරතුරු සඳහා දැවැන්ත දායකත්වයක් ලබා දෙන ලදී. ආර්කන්සාස් විශ්වවිදයාලයේ දර්ශනපති උපාධි සඳහා අවස්ථා ලබාගැනීමට ඔහු රුහුණ විශ්වවිද්‍යාලයේ ආචාර්ය මණ්ඩලය සහ ශිෂ්‍යයන් දිරිමත් කරන ලදී.

**<u>විශ්වවිද්‍යාල මට්ටම</u>**

- චීනයේ ලොංහුවා ආයතනයේ මහාචාර්ය මාඕ වෙයිමින්, චීන ජාත්‍යන්තර දුම්රිය කණ්ඩායමේ ෂියා වෙයිගුඕ මහතා සහ කියාඕ සෙන් ලංකා ඉන්ටනැෂනල් (පුද්ගලික) සමාගමේ යෙ සුයිහුආ යන මහත්වරුන්ගේ නායකත්වයෙන් යුතු චීන දූත මණ්ඩලයක් 2021.04.12 දින රුහුණ විශ්වවිද්‍යාලයට පැමිණියේය.

- සහයෝගීතාව තවදුරටත් පවත්වා ගැනීම ඇතුළුව අධ්‍යාපන සහ පර්යේෂණ සඳහා චීන ශ්‍රී ලංකා ඒකාබද්ධ මධ්‍යස්ථානය ආශ්‍රිත වෙනත් කරුණු සාකච්ඡා කිරීම පිණිස චීන විද්‍යා ඇකඩමියේ සාගර විද්‍යාව පිළිබඳ දකුණු චීන මුහුදු ආයතනයේ අධ්‍යක්ෂ මහාචාර්ය ලිජුවන් ලොංග් මහතාගේ නායකත්වයෙන් යුතු දූත මණ්ඩලයක් සහ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සහ උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුජීව අමරසේන මහතා නායකත්වය දරන රුහුණ විශ්වවිද්‍යාලයේ කණ්ඩායමක් අතර මාර්ගගත රැස්වීමක් 2021 ජුනි මස 08 වන දින පැවැත්වීමට කටයුතු යොදා ඇත.

- රුහුණ විශ්වවිද්‍යාලය සහ ඉන්දියාවේ යුනයිටඩ් විශ්වවිද්‍යාලය අතර අධ්‍යාපන සහ පර්යේෂණ සහයෝගීතාව සම්බන්ධයෙන් සොයා බැලීම පිණිස 2021.10.26 දින එම විශ්වවිද්‍යාල දෙකෙහි දූත මණ්ඩල අතර මාර්ගගත රැස්වීමක් සංවිධානය කරනු ලැබීය.

- රුහුණ විශ්වවිදයාලය සහ තුර්කියේ මුගිලා සිටිකි කොක්මන් විශ්වවිද්‍යාලය අතර අධ්‍යාපන සහ පර්යේෂණ සහයෝගීතාව සම්බන්ධයෙන් සොයා බැලීම පිණිස විශ්වවිද්‍යාල දෙකෙහි දූත මණ්ඩල අතර මාර්ගගත රැස්වීමක් 2021.12.23 දින සංවිධානය කරනු ලැබීය.

## ➢ ව්‍යාපෘති

**<u>කෘෂිකර්ම පීඨය</u>**

- **යුනයිට් 4 ප්‍රත්‍යාස්ථිතිය ව්‍යාපෘතිය**

  - උපකුලපතිවරයා විසින් යථා උද්යෝගය ප්‍රශ්නාවලිය අත්සන් තැබීම සඳහා එක්සත් රාජධානියේ සැල්ෆඩ් විශ්වවිද්‍යාලය සහ රුහුණු විශ්වවිද්‍යාලය අතර ගිවිසුම රජයේ අනුමතිය ලබාගැනීම පිණිස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදී.

**<u>සම සෞඛ්‍ය විද්‍යා පීඨය</u>**

- **EUROcare ව්‍යාපෘතිය**

  - ස්වීඩනයේ ක්‍රිස්ටියන්ස්ටෙඩ් විශ්වවිද්‍යාලය සහ රුහුණ විශ්වවිද්‍යාලය අතර හවුල්කාරිත්ව ගිවිසුමක් අත්සන් තබන ලදී- ව්‍යාපෘති මාතෘකාව - ශ්‍රී ලංකාවේ ස්නායුපරිහාරක ආබාධ සහිත ජනතාවට සත්කාර කිරීමේ අභියෝග සම්බන්ධයෙන් කටයුතු කිරීම පිණිස ධාරිතා ගොඩනැංවීම සඳහා යුරෝපියානු මූලාරම්භයක් සිදු කරන ලදි.

<u>ඉංජිනේරු පීඨය</u>

- **EUSL-Energy ඒකාබද්ධ ව්‍යාපෘතිය**

  - ශ්‍රී ලාංකික පාර්ශවකරුවන් ලෙස මොරටුව විශ්වවිද්‍යාලය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය සහ රුහුණ විශ්වවිද්‍යාල සමග ඒකාබද්ධව ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය සහ විදේශීය පාර්ශවකරුවන් ලෙස ස්වීඩනයේ රාජකීය තාක්ෂණ ආයතනය, ප්‍රංශයේ සෙන්ට්‍රාලේ සුපෙලෙක් ඉංජිනේරු විද්‍යාතනය සහ නෙදර්ලන්තයේ ටිවෙන්ටේ විශ්වවිද්‍යාලය විසින් ඉදිරිපත් කරන ලද බලශක්ති චක්‍රීය ආර්ථිකයේ යුරෝපීය -ශ්‍රී ලංකා ධාරිතා ගොඩනැගීම "EUSL-Energy" ව්‍යාපෘතිය. යෝජනා කැඳවීම් සඳහා විශ්වවිද්‍යාල 2019- EAC/A03/2018 යටතේ එරස්මස්+ KA2- නව්‍යකරණය සහ යහපත් පරිවයන් හුවමාරුව සඳහා සහයෝගිතාව- උසස් අධ්‍යාපන ක්ෂෙත්‍රයේ ධාරිතා ගොඩනැගීම සඳහා වන මෙම ව්‍යාපෘතිය 2019 වසරේදී පිළිගනු ලැබීය. 2020 ජනවාරි 15 දින ව්‍යාපෘතිය ආරම්භ කරන ලද අතර එය අඛණ්ඩව පවත්වා ගෙන යනු ලැබේ. (සම්පූර්ණ කිරීමට අපේක්ෂිත දිනය වනුයේ 2023 ජනවාරි 15 වේ.) ව්‍යාපෘති යෝජනාව අනුව, ව්‍යාපෘති කාලසීමාවේ තුන්වැනි වසර තුළ චක්‍රීය ආර්ථිකය සඳහා බලශක්තිය පිළිබඳ විද්‍යාපති ඒකාබද්ධ අධ්‍යයන වැඩසටහනක් කොන්සෝටියම විසින් සකස් කළ යුතුව තිබේ.

- **ශ්‍රී ලංකාවේ පුනර්ජනනීය බලශක්ති තාක්ෂණවේද සඳහා පුහුණු කේන්ද්‍රය (ත්‍රී ලංකා) ඒකාබද්ධ ව්‍යාපෘතිය**

  - මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ යුරෝපීය විශ්වවිද්‍යාල සමග සාර්ථක දැනුම හුවමාරුවක් ඇති කර ගැනීම මගින් පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රයේ තිරසර සංවර්ධනය සඳහා අවශ්‍ය කරනු ලබන දැනුම් මට්ටම් ශ්‍රී ලංකාව තුළ වර්ධනය කිරීමයි. මෙම ව්‍යාපෘතියේ විශේෂිත අරමුණු වනුයේ: ශ්‍රී ලංකාව තුළ පුනර්ජනනීය බලශක්ති අංශයේ කුසලතා ඌනතාවය පිළිබඳ විස්තිරණ පරතර විශ්ලේෂණයක් සකස් කිරීම, ප්‍රකාශ වෝල්ටීය සහ අනෙකුත් පුනර්ජනනීය මූලාශ්‍රයන් පිළිබඳ පුහුණු වැඩසටහනක් සකස් කිරීම, ඩිප්ලෝමා හෝ දර්ශනපති පාඨමාලා දක්වා යොමු වන දන්නා සහ හඳුනාගත් කර්මාන්ත අවශ්‍යතා සපුරාලීම, පුනර්ජනනීය බලශක්ති ක්ෂෙත්‍රයේ කටයුතු කිරීම සඳහා අවශ්‍ය වන කුසලතා අත්කර ගැනීමට හෝ කුසලතා හෝ දැනුම යාවත්කාලීන කර ගැනීමට අවශ්‍ය අය සඳහා ගුණාත්මක ඉගැන්වීම් සහ අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය සඳහා අවස්ථා ඇති කිරීම, පුනර්ජනනීය බලශක්ති අධ්‍යාපනය/ පුහුණු වැඩසටහන් සඳහා කලාපීය විශිෂ්ඨතා මධ්‍යස්ථානයක් ලෙස ත්‍රී ලංකා පිළිගැනීම, එම මධ්‍යස්ථානය සඳහා අවශ්‍ය කරනු ලබන අධ්‍යයන සහ තාක්ෂණික සහයෝගය සඳහා ශ්‍රී ලංකාව සහ යුරෝපීය සංගමය අතර හුවමාරු සබැඳි ස්ථාපිත කිරීම උදා: ශ්‍රී ලංකා කාර්ය මණ්ඩලය යුරෝපා සංගම් පාර්ශවකාර ආයතනවල පුහුණු කිරීම සහ යුරෝපා සංගම් පාර්ශවකරුවන්ගේ කාර්ය මණ්ඩල ශ්‍රී ලංකාවේ ඉගැන්වීම් සඳහා යොදා ගැනීම, ඉගැන්වීමට නියමිත මොඩියුල සඳහා සම්පත් හා පර්යේෂණ සංවර්ධනය කිරීම, ශ්‍රී ලංකාව සහ යුරෝපීය සංගමය අතර ප්‍රායෝගික හා න්‍යායාත්මක පුහුණුවේ ඇති වෙනස්කම් ලේඛනගත කිරීම, THREE විෂයාන්තර බලශක්ති ආශ්‍රිත විෂයමාලාවේ ප්‍රතිලාභ ආදර්ශනය කිරීම, ශ්‍රී ලාංකික හා යුරෝපීය අධ්‍යාපනය සුසංගත කිරීම පිණිස පවතින අවස්ථා හඳුනා ගැනීම. මෙම ව්‍යාපෘතිය 2020 වසරේදී ආරම්භ කළ අතර අඛණ්ඩව පවත්වා ගෙන යනු ලබයි.

- ජපානයේ ටෝකියෝහි ඔවනොමිසු විශ්වවිද්‍යාලය, ජපානයේ කනසාවාහි කනසාවා විශ්වවිද්‍යාලය, තායිලන්තයේ බැංකොක්හි කැසෙට්සාර්ට් විශ්වවිද්‍යාලය සහ ඉංජිනේරු විද්‍යායතනය, ඉන්දියාවේ දෙරාදුන්හි ඛණිජ තෙල් හා බලශක්ති අධ්‍යයන විශ්වවිද්‍යාලය සමග සහයෝගිතා පර්යේෂණ කටයුතු ආරම්භ කරන ලදී (ආචාර්ය තුෂාර චමින්ද මයා- සිවිල් හා පාරිසරික ඉංජිනේරු විද්‍යා අධ්‍යනාංශය)

- උපාධි අපේක්ෂක හා පශ්චාත් උපාධි මට්ටම්වලදී ජපානයේ හොකයිඩෝ විශ්වවිද්‍යාලය සමග සහයෝගිතා පර්යේෂණ කටයුතු ආරම්භ කරන ලදී. (ආචාර්ය තුෂාර චමින්ද මයා- සිවිල් හා පාරිසරික ඉංජිනේරු විද්‍යා අධ්‍යයනාංශය සහ ආචාර්ය ඩබ්.එම්.කේ.ආර්.ටී.ඩබ්. බණ්ඩාර මයා - සිවිල් හා පාරිසරික ඉංජිනේරු විද්‍යා අධ්‍යයනාංශය)

- විදුලි හා තොරතුරු ඉංජිනේරු විද්‍යා අධ්‍යනාංශ උපාධි අපේක්ෂක වැඩසටහනේ සහයෝගිතා පර්යේෂණ ව්‍යාපෘති (අධ්‍යයන වර්ෂය 2021/2022)

    - රේඩියෝ සංඛ්‍යාත සංවේදන බලගැන්වූ සහ බ්ලොක්චේන් පාදක ආවලි අවභාවිත කිරීම් හඳුනාගැනීමේ පද්ධතිය (අධීක්ෂක - ආචාර්ය සී.කේ.ඩබ්. සෙනෙවිරත්න, සම අධීක්ෂක- ආචාර්ය මධුශංක ලියනගේ, (සහකාර මහාචාර්ය, ඩබ්ලින් විශ්වවිද්‍යාල විද්‍යායතනය, අයර්ලන්තය) ආචාර්ය අර්ජුන මදනායක (සහාය මහාචාර්ය, ෆ්ලොරිඩා ජාත්‍යන්තර විශ්වවිද්‍යාලය, ඇ.එ.ජ.)

    - සළා තරංග රැගෙන යන කාක්ෂික කෝණික වලන සඳහා අන්තාන්ත රැහැන් රහිත සංනිවේදන විඛම්බකයක් ක්‍රියාත්මක කිරීම -(අධීක්ෂක -එම්.ඊ.ජයතුංග, සම අධීක්ෂක- ආචාර්ය නජාත් අක්‍රම් (FPGA සැලසුම් ඉංජිනේරු, ජාබිල් සමාගම, ඇ.එ.ජ.) ආචාර්ය විදුනෙත් ආරියරත්න (රැහැන් රහිත පද්ධති පිලිබඳ ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු, NXP අර්ධසන්නායක, ඇ.එ.ජ.)

    - පුහුණු කිරීම් දත්ත කට්ටල වලංගුකරණය පිණිස බ්ලොක්චේන් සම්මුති යාන්ත්‍රණයක් - අධීක්ෂක - හේවාපතිගේ අසේල මයා, සම අධීක්ෂක - ආචාර්ය මධුශංක ලියනගේ, (සහකාර මහාචාර්ය, ඩබ්ලින් විශ්වවිද්‍යාල විද්‍යාතනය, අයර්ලන්තය)

    - අනුකලිත ප්‍රවේශය සහ බැක්හෝල් (IAB) සඳහා කෘතිම බුද්ධිය පාදක ආවලියක් වෙන් කිරීම (අධීක්ෂක- ආචාර්ය සී.කේ.ඩබ්. සෙනෙවිරත්න මයා, සම අධීක්ෂක - ආචාර්ය නන්දන රාජදේව මයා (මහාචාර්ය, ඔයුලු විශ්වවිද්‍යාලය, පින්ලන්තය)

    - රොබෝ මෙහෙයුම් පද්ධතියක් භාවිතා කරමින් සමායිත ස්ථිති ගෘහස්ථ පරිසරයක් තුළ ආවේක්ෂණ රොබෝවක් ස්වයංපාලක මං සෙවුම (අධීක්ෂක - ආචාර්ය බී.අයි.ඒ. මෙන්ඩිස්, සම අධීක්ෂක - මහාචාර්ය ෆ්‍රෑන්ක් වයි. ලි (මහාචාර්ය, ඇග්ඩර් විශ්වවිද්‍යාලය, නෝර්වේ)

    - ගැඹුරු ඉගෙනුම් පාදක සිංහල දෘශ්‍ය සහායක (අධීක්ෂක - ආචාර්ය කේ.එල්.කේ. සුධීර මයා, සම අධීක්ෂක - ජේ.සී.එස්. කඩුපිටිය මයා (පර්යේෂණ සහායක, ඉන්දියානා විශ්වවිද්‍යාලය, බ්ලූමින්ග්ටන්, ඇ.එ.ජ.)

- ඉංජිනේරු පීඨයේ සිවිල් සහ පාරිසරික ඉංජිනේරු විද්‍යා අධ්‍යයනාංශයේ සහයෝගිතා උපාධි අපේක්ෂක පර්යේෂණ ව්‍යාපෘති (අධ්‍යයන වර්ෂය 2021/2022):

    - ගොඩනැගිලිවල බලශක්ති කාර්යක්ෂමතාව හා තාප සුවපහසුව (අධීක්ෂක - ආචාර්ය බී.ඒ.ඩී.එස්. විමලසේන මයා, සම අධීක්ෂක - ආචාර්ය එම්.එන්. නසීර් මයා, ඉදිකිරීම් විද්‍යායතනය, දකුණු ඇල්බර්ටා තාක්ෂණ ආයතනය, කැල්ගාරි, කැනඩාව)

<u>**කළමනාකරණ පීඨය**</u>

- **ජාත්‍යන්තර කෘෂිකාර්මික පර්යේෂණ සඳහා ඕස්ට්‍රේලියානු මධ්‍යස්ථානයේ ව්‍යාපෘතිය**

    - ශ්‍රී ලංකා රජය සහ ඕස්ට්‍රේලියානු රජය අතර එකඟතා ගිවිසුමක් අත්සන් තැබීමට නියමිතව ඇති අතර එමගින් රුහුණ විශ්වවිද්‍යාලය මෙම ව්‍යාපෘතියේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනයක් බවට පත්ව තිබේ. යෝජිත ව්‍යාපෘතියේ අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ ජලාශවල යෝධ මිරිදිය ඉස්සන් හා අනෙකුත් මත්ස්‍ය විශේෂයන්හි රෝපිත පාදක ධීවර කර්මාන්තයක් සඳහා ශක්තිමත්, විද්‍යා පාදක කළමනාකරණ ක්‍රමවේදයක් හඳුන්වා දීම සහ දේශීය පිරිමින්ගේ සහ කාන්තාවන්ගේ ඵලදායිතාව, ලාභදායීතාව, ජීවනෝපාය සහ ආදායම සහතික කරමින් සැපයුම් දාමයේ විවිධ අංශ වැඩි දියුණු කිරීමයි. ව්‍යාපෘතිය සඳහා නම් කරන ලද ආයතනික නියෝජිතායතන වනුයේ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අමාත්‍යාංශය සහ ජාත්‍යන්තර කෘෂිකාර්මික පර්යේෂණ සඳහා ඕස්ට්‍රේලියානු මධ්‍යස්ථානයයි. තවත් දේශීය ආයතන දෙකක් සමග රුහුණ විශ්වවිද්‍යාලය එක් ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනයකි.

- ව්‍යාපෘතිය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමතිය 2021 මාර්තු 23 වන දින ලැබුණු අතර ගිවිසුම 2021 අප්‍රේල් 01 වනදා අත්සන් තබන ලදී.

## ➢ දැනට පවතින අවබෝධතා ගිවිසුම්

**<u>කෘෂිකර්ම පීඨය</u>**

- රුහුණ විශ්වවිද්‍යාලය සහ ගුයිෂු විද්‍යා ඇකඩමිය, චීනය අතර අවබෝධතා ගිවිසුම සඳහා 2021.07.16 දින අමාත්‍ය මණ්ඩල අනුමතිය හිමි විය.
- රුහුණ විශ්වවිද්‍යාලය සහ බීජිං වන විද්‍යා විශ්වවිද්‍යාලය චීනය අතර අවබෝධතා ගිවිසුම
- කර්ටින් විශ්වවිද්‍යාලය, ඕස්ට්‍රේලියාව සහ රුහුණ විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම
- රුහුණ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨය සහ චීනයේ බීජිංහි කෘෂිකර්ම විද්‍යා පිළිබඳ චින ඇකඩමියේ භෝග විද්‍යා ආයතනයේ භෝග ජනක ප්ලාස්ම මධ්‍යස්ථාන අතර අවබෝධතා ගිවිසුම
- රුහුණ විශ්වවිද්‍යාලය සහ ජපානයේ රුයුක්යුස් විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම උපාධි පාසල අතර අවබෝධතා ගිවිසුම් කාලය දීර්ඝ කිරීම
- රුහුණ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨය සහ සින්ට්‍රෙක්ස් ඉන්ඩස්ට්‍රියල් සොල්‍යුෂන්ස් (පුද්) සමාගම අතර අවබෝධතා ගිවිසුම
- රුහුණ විශ්වවිද්‍යාලය සහ චීනයේ නිරිතදිග මින්සු විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම
- රුහුණ විශ්වවිද්‍යාලය සහ නවසීලන්තයේ ග්‍රාස්ලන්ඩ් තාක්ෂණ ආයතනය අතර ද්‍රව්‍ය හුවමාරු ගිවිසුම
- රුහුණ විශ්වවිද්‍යාලය සහ ඊශ්‍රායලයේ ගැලිලී ජාත්‍යන්තර කළමනාකරණ ආයතනය අතර අවබෝධතා ගිවිසුම - 2021.07.19 දින අමාත්‍ය මණ්ඩල අනුමතිය හිමි විය

**<u>සම සෞඛ්‍ය විද්‍යා පීඨය</u>**

- රුහුණ විශ්වවිද්‍යාලය සහ තායිලන්තයේ චූලාබොම් උපාධි ආයතනය අතර අවබෝධතා ගිවිසුම

**<u>ඉංජිනේරු පීඨය</u>**

- එක්සත් රාජධානියේ නිව්කාස්ල්හි නෝදම්බ්‍රියා විශ්වවිද්‍යාලය සහ රුහුණ විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය අතර අවබෝධතා ගිවිසුම
- රුහුණ විශ්වවිද්‍යාලය සහ ඕස්ට්‍රේලියාවේ දකුණු ක්වින්ස්ලන්ත විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම
- රුහුණ විශ්වවිද්‍යාලය සහ ඕස්ට්‍රේලියාවේ රාජකීය මෙල්බර්න් තාක්ෂණ ආයතනය අතර අවබෝධතා ගිවිසුම
- රුහුණ විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය සහ ජපානයේ සයිටාමා විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම
- සිරින්දෝන් ජාත්‍යන්තර තාක්ෂණවේද ආයතනය, තම්මාසට් විශ්වවිද්‍යාලය , තායිලන්තය සහ ඉංජිනේරු පීඨය අතර ගිවිසුම

**<u>ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨය</u>**

- සුන් යැට්-සෙන් ජාතික විශ්වවිද්‍යාලය , තායිවානය සහ රුහුණ විශ්වවිද්‍යාලය අතර ගිවිසුම
- චීන විද්‍යා ඇකඩමිය (SCSIO) සහ රුහුණ විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම - ඉන්දියානු සාගර ගවේෂණය පිළිබඳ ඒකාබද්ධ පර්යේෂණ කණ්ඩායමක් සහ සහයෝගිතාවක් ස්ථාපිත කිරීම
- කොරියාවේ සීමාසහිත හැන්ටෙක් සමාගම සහ රුහුණ විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම
- ඕස්ට්‍රේලියාවේ චාර්ල්ස් ඩාවින් විශ්වවිද්‍යාලය රුහුණ විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම
- ඇ.එ.ජනපදයේ ජෙවගෝල පදනම සහ රුහුණ විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම
- ඇ.එ.ජනපදයේ හවායි පැසිෆික් විශ්වවිද්‍යාලය සහ රුහුණ විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම

**<u>මානව ශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා පීඨය</u>**

- රුහුණ විශ්වවිද්‍යාලය සහ බංගලාදේශයේ උතුර දකුණ විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම
- රුහුණ විශ්වවිද්‍යාලය සහ ඉරානයේ ටෙහෙරාන් විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම
- රුහුණ විශ්වවිද්‍යාලය සහ ඉරානයේ කරස්මි විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම
- රුසියානු ෆෙඩරේෂණයේ මොස්කව් රාජ්‍ය විශ්වවිද්‍යාලයේ ආසියානු අධ්‍යයන ආයතනය සහ රුහුණ විශ්වවිද්‍යාලය අතර සහයෝගිතාව පිළිබඳ ගිවිසුම

**<u>කළමනාකරණ පීඨය</u>**

- ස්ලෝවැකියාවේ පර්සොව් විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පීඨය සහ රුහුණ විශ්වවිද්‍යාලයේ කළමනාකරණ සහ මූල්‍ය පීඨය අතර අවබෝධතා ගිවිසුම
- රුහුණ විශ්වවිද්‍යාලය සහ ඉන්දියාවේ ඇප්ලෝස් සිස්ටම් එල්ලඑල්පී අතර කර්මාන්ත හවුල්කාරිත්වය පිළිබඳ අවබෝධතා ගිවිසුම

**<u>රුහුණ විශ්වවිද්‍යාලය</u>**

- රුහුණ විශ්වවිද්‍යාලය සහ රුසියාවේ සවුත් යුරල් රාජ්‍ය විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම
- ඉන්දියාවේ කොවින් විද්‍යා සහ තාක්ෂණ විශ්වවිද්‍යාලය සහ රුහුණ විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම

**<u>ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව</u>**

- බංගලාදේශ මහජන ජනරජයේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අතර උසස් අධ්‍යාපන ක්ෂෙත්‍රයේ සහයෝගය හා සහයෝගිතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම

## ➢ ආරම්භ කරන ලද නව අවබෝධතා ගිවිසුම්

**කෘෂිකර්ම පීඨය**

- රුහුණ විශ්වවිද්‍යාලය සහ චීනයේ සීමාසහිත හුනාන් යුආන්පින් කෘෂිකර්ම තාක්ෂණ සමාගම අතර අවබෝධතා ගිවිසුම
- රුහුණ විශ්වවිද්‍යාලය සහ මැලේසියාවේ ජාත්‍යන්තර සංස්කෘතික සන්නිවේදන මධ්‍යස්ථානය අතර අවබෝධතා ගිවිසුම
- ‘‘ඩිජිටල්කරණය තුළින් තාක්ෂණය පදනම් කරගත් සම්ප්‍රදායික කෘෂිකර්මය ශක්තිමත් කිරීම’’ ව්‍යාපෘතියට සහයෝගය පිණිස කැපවීම ප්‍රකාශ කිරීම
- තාක්ෂණවේද සඳහා පුහුණුව හා පර්යේෂණ පිළිබඳ අභිලාෂය පළකිරීම, ජර්මනිය

**සම සෞඛ්‍ය විද්‍යා පීඨය**

- පුද්ගලික සමාගමක් වන ජැපෑන් හොස්පිටැලිටි ල(ර්)නින් සෙන්ටර් ඇසෝෂියේෂන් සහ රුහුණ විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨය අතර අවබෝධතා ගිවිසුම

**ඉංජිනේරු පීඨය**

- ඩාලියාන් සමුද්‍රීය විශ්වවිද්‍යාලය සහ රුහුණ විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම
- රුහුණ විශ්වවිද්‍යාලය සහ නෝර්වේහි ස්ටැවන්ගර් විශ්වවිද්‍යාලය අතර එකඟතා ගිවිසුම
- රුහුණ විශ්වවිද්‍යාලය සහ ජපානයේ හොකයිඩෝ බුන්ක්යෝ විශ්වවිද්‍යාලය අතර අධ්‍යයන හුවමාරු ගිවිසුම
- E & R CIRECO ව්‍යාපෘතියට සහාය පිණිස පිටසන පළකිරීම - මහාචාර්ය සුධීර ද සිල්වා සහ මහාචාර්ය සුභාෂි ද සිල්වා
- ජපානයේ සයිටාමා විශ්වවිද්‍යාලය සමග අවබෝධතා ගිවිසුම අළුත් කිරීම

**මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය**

- චීන භාෂා මධ්‍යස්ථානය වෙනුවට ‘‘කොන්ෆියුසියස් පංතිකාමරය’’ ස්ථාපිත කිරීම සඳහා ගිවිසුම (SWMU සහ රුහුණ විශ්වවිද්‍යාලය අතර ප්‍රතිශෝධිත ගිවිසුම)
- රුහුණ විශ්වවිද්‍යාලය සහ කොළඹ විශ්වවිද්‍යාලයේ කොන්ෆියුසියස් ආයතනය අතර ගිවිසුම
- රුසියාවේ මූලා විශ්වවිද්‍යාලය සහ රුහුණ විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම
- ශ්‍රී ලංකාවේ වෙරළ තීරය ඔස්සේ මහජන සෞඛ්‍ය ස්වභාවික සම්පත් ප්‍රාග්ධනය සහ සමාජීය පරිණාමනය ඒකාබද්ධ කිරීම සඳහා ප්‍රයාපන ලිපිය - NORPART 2021 BLUE TOO (ආචාර්ය එස්. රණබාහු)

- ගුණාත්මක හා අන්තර්කරණ උසස් අධ්‍යාපනයක් සඳහා ගෝලීය දකුණ හා නොර්වේ අතර අධ්‍යයන සහයෝගිතාව ශිෂ්‍ය සංචලතාව සඳහා ප්‍රයාපන ලිපිය- NORPART 2022-2026 (මහාචාර්ය උපාලි පන්නිලගේ)

**<u>කළමනාකරණ හා මූල්‍ය පීඨය</u>**

- රුසියාවේ මූල්‍ය විශ්වවිද්‍යාලය සහ රුහුණ විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම

**<u>විද්‍යා පීඨය</u>**

- ‘‘නිවර්තන කලාපවල දේශගුණ සුහුරු හරිතාගාර අතුරු බෝග වගාව’’ ව්‍යාපෘතිය (මහාචාර්ය දම්මිනි ප්‍රෙමවන්ද්‍ර) සඳහා සහාය පිණිස අභිලාෂය පළ කිරීම

**<u>තාක්ෂණ පීඨය</u>**

- තායිලන්තයේ මේ ෆා ලුආන් විශ්වවිද්‍යාලය සහ රුහුණ විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨය අතර අවබෝධතා ගිවිසුම

**<u>විශ්වවිද්‍යාල මට්ටම</u>**

- නැෂනල් චෙන් කුන්ග් විශ්වවිද්‍යාල සහ රුහුණ විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම

## ➢ අත්සන් තැබූ නව අවබෝධතා ගිවිසුම් හා ව්‍යාපෘති

**<u>කෘෂිකර්ම පීඨය</u>**

- ඉන්දියාවේ වෙල්ලෝර් තාක්ෂණ ආයතනය සහ රුහුණ විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම - 2021.07.15 දින අත්සන් තබන ලදී.

- ජපානයේ ඔකයාමා විශ්වවිද්‍යාලය සහ රුහුණ විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම - 2021.04.20 දින අත්සන් තබන ලදී.

- එරස්මස්+ ප්‍රධාන ක්‍රියාමාර්ග යටතේ අධස්ත ආපදා අවදානම් ධාවකයක් ලෙස දේශගුණ විපර්යාස සම්බන්ධයෙන් කටයුතු කිරීම පිළිබඳ පර්යේෂණ ජාලකරණ - ශිෂ්‍යයන් සහ කාර්ය මණ්ඩලය සඳහා සංචලතාව උසස් අධ්‍යාපන ශිෂ්‍යයන් සහ කාර්ය මණ්ඩල සංචලතාව (CCA DRR) ව්‍යාපෘතිය 2021.02.25 දින අත්සන් තබන ලදී.

**<u>මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය</u>**

- අනධ්‍යන කාර්ය මණ්ඩලය පුහුණුව මගින් ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලවල පාලනය, කළමනාකරණය හා ප්‍රතිසංස්කරණ ඉහළ නැංවීම සඳහා ව්‍යාපෘතිය - 2021.03.02 දින අත්සන් තබන ලදී.

**කළමනාකරණ හා මූල්‍ය පීඨය**

- නෝර්වේහි අග්නිදිග විශ්වවිද්‍යාලය සහ රුහුණ විශ්වවිද්‍යාලය අතර හවුල්කාරිත්ව ගිවිසුම (TESS ව්‍යාපෘතිය) – 2021.02.02 දින අත්සන් තබන ලදී.

**විශ්වවිද්‍යාල මට්ටම**

- ඉන්දියාවේ ආර් කේ විශ්වවිද්‍යාලය සහ රුහුණ විශ්වවිද්‍යාලය අතර හවුල්කාරිත්ව ගිවිසුම (EngInes ව්‍යාපෘතිය) – 2021.01.21 දින අත්සන් තබන ලදී.

# 3. දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය

## ➢ ශිෂ්‍ය ලියාපදිංචිය

### ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධිය

අයදුම්කරුවන් 1425 දෙනෙකු අතුරින් අයදුම්කරුවන් 1257 දෙනෙකු ලියාපදිංචි කරන ලදී. අධ්‍යයන කටයුතු දෙසැම්බර් 5 වන දින ආරම්භ විය. සමාරම්භක උත්සවය සහ පෙර සූදානම් වැඩසටහන පිළිවෙළින් නොවැම්බර් 27 සහ දෙසැම්බර් 4 වන දින පවත්වන ලදී.

ඊට අමතරව, ශිෂ්‍යයන් පහත දැක්වෙන පාඨමාලා සඳහා ලියාපදිංචි කර තිබේ.

| වැඩසටහන | ලියාපදිංචිය සිදුකළ දිනය | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|
| මානව සම්පත් කළමනාකරණ ඩිප්ලෝමාව | අයදුම්පත් බාරගත් අවසාන දිනය 2020 දෙසැම්බර් 28 | 136 |
| විද්‍යාත්මක තේ නිෂ්පාදනය සහ තත්ත්ව කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 2020 ජනවාරි 30 වනදා | 23 |

## ➢ ඩිප්ලෝමා පාඨමාලා

| පාඨමාලාවේ නම | පාඨමාලා කාලසීමාව |
|---|---|
| මනෝවිද්‍යා උපදේශන ඩිප්ලෝමාව | අවුරුදු 1 යි |
| මානව සම්පත් කළමනාකරණ ඩිප්ලෝමාව | අවුරුදු 1 යි |
| ඉංග්‍රීසි ඩිප්ලෝමාව | අවුරුදු 1 යි |
| ඉංග්‍රීසි උසස් ඩිප්ලෝමාව | අවුරුදු 1 යි |
| ඉංග්‍රීසි උසස් සහතිකපත්‍ර පාඨමාලාව | අවුරුදු 1 යි |
| ඉංග්‍රීසි සහතිකපත්‍ර පාඨමාලාව | අවුරුදු 1 යි |
| ජෛවවිවිධත්වය සහ පාරිසරික පද්ධති කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව | අවුරුදු 1 යි |
| විද්‍යාත්මක තේ නිෂ්පාදනය සහ තත්ත්ව කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | අවුරුදු 1 යි |
| විද්‍යාත්මක තේ නිෂ්පාදනය සහ තත්ත්ව කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | මාස 6 යි |

## ➢ විභාග

| විභාගයේ නම | විභාගයට පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව | සමත්වූ සංඛ්‍යාව |
|---|---|---|
| ශාස්ත්‍රවේදී (බාහිර) උපාධිය කොටස II 2016, 2018, 2020 සහ 2016 (පුනරීක්ෂණ) | 1493 | ප්‍රතිඵල අපේක්ෂිතයි |
| මනෝවිද්‍යාත්මක උපදේශන ඩිප්ලෝමාව (12 වන කාණ්ඩය)-1 වැනි වර්ෂාර්ධය | 85 | ප්‍රතිඵල අපේක්ෂිතයි |
| මානව සම්පත් කළමනාකරණ ඩිප්ලෝමාව (1 වන ශිෂ්‍ය කාණ්ඩය) - 1 වැනි වර්ෂාර්ධය | 87 | ප්‍රතිඵල අපේක්ෂිතයි |

## ➢ උපාධි ප්‍රදානෝත්සවය

ශාස්ත්‍රවේදී (බාහිර) උපාධි වැඩසටහනේ උපාධි ප්‍රදානෝත්සවය අභ්‍යන්තර උපාධි ප්‍රදානෝත්සවය සමග ඒකාබද්ධ කොට 2022 වසරේදී පවත්වනු ඇත. උපාධි වැඩසටහන සාර්ථකව සම්පූර්ණ කළ උපාධි අපේක්ෂකයන් 221 දෙනෙකුට උපාධිය පිරි නැමීමට නියමිතය.

## ➢ බාහිර උපාධි අපේක්ෂක උපාධිවැඩසටහනේ බඳවාගැනීම් – 2021

| අධ්‍යයන වැඩසටහන | **2021 දෙසැම්බර් 31 දිනට ශිෂ්‍ය බඳවාගැනීම් (ලියාපදිංචි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව)** | | |
|---|---|---|---|
| | **පිරිමි** | **කාන්තා** | **එකතුව** |
| ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධිය (බාහිර)* (19වැනි කාණ්ඩය) | 139 | 1118 | 1257 |

## ➢ ශිෂ්‍යයන් සඳහා උපකාර

- ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය හඳුන්වා දෙන ලදී.
- ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි (බාහිර) වැඩසටහන් - කොටස II -2016 විභාගය සඳහා මාර්ගගත සම්මන්ත්‍රණ පවත්වන ලදී.
- අධ්‍යයන ක්‍රියාකාරකම්, විභාග සහ පරිපාලනය ආදිය පිළිබඳව නව ශාස්ත්‍රවේදී ශිෂ්‍ය කණ්ඩායම (19 වැන කණ්ඩායම) සඳහා දැනුවත් කිරීමේ සැසි
- පිළිතුරු පත්‍ර නැවැත සමීක්ෂණය
- දූ.අ.අ.ඒකකය යටතේ ලියාපදිංචි වී ඇති ශිෂ්‍යයන් සඳහා උපකාර කිරීම පිණිස දුක්ගැනවිලි කමිටුවක් ස්ථාපිත කිරීම
- අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ ඒකකයක් ස්ථාපිත කිරීම
- අයදුම් පත්‍ර, ආකෘති පත්‍ර සහ වෙනත් එවැනි අදාළ ලේඛන දූ.අ.අ.ඒකකයේ වෙබ් අඩවියේ පළ කිරීම

# 4. අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ මධ්‍යස්ථානය

## ➢ ක්‍රියාවට නැංවූ ප්‍රතිපත්ති

- **මාර්ගගත ඇගයීම් ප්‍රතිපත්තිය**

  - වෙනස්වන තත්ත්වයන් යටතේ සියලු පීඨවල මාර්ගගත ඇගයීම් යොදා ගැනීම සැලකිල්ලට ගනිමින්, මාර්ගගත ඇගයීම පිළිබඳ විශ්වවිද්‍යාල ප්‍රතිපත්තියක් තිබීමේ වැදගත්කම අවධාරණය කරනු ලැබූ අතර ඒ අනුව ප්‍රතිපත්තියක් සකස් කර ඒ සඳහා සනාතන සභාවේ අනුමතිය ලබා ගන්නා ලදී.

## ➢ අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ ඒකක සහ අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ කමිටු පිහිටුවීම හා ඒවායේ කළමනාකරණ කමිටු රැස්වීම්

- තත්ත්ව ආරක්ෂණය පිළිබඳ පිළිබඳ සනාතන සභා ස්ථාවර කමිටුවේ රැස්වීම් මාසිකව පවත්වනු ලබන අතර 2021 වසරේ රැස්වීම් 12ක් පවත්වන ලදී.

- තත්ත්ව ආරක්ෂණ කමිටුවල රැස්වීම්ද මාස්පතා පවත්වනු ලබන අතර ඒවායේ කාර්ය සටහන් තත්ත්ව ආරක්ෂණය පිළිබඳ සනාතන සභා ස්ථාවර කමිටුවේ රැස්වීම්වලදී සභාගත කරනු ලැබේ.

- පුස්තකාලය සහ දුරස්ථ හා අඛණ්ඩ ඉගැන්වීම් ඒකකය සඳහා නව තත්ත්ව ආරක්ෂණ කමිටු ස්ථාපිත කරනු ලැබීය.

- තත්ත්ව ආරක්ෂණය පිළිබඳ සනාතන සභා ස්ථාවර කමිටුවේ රැස්වීම් සෑම මසකම පළමු අඟහරුවාදා දින පවත්වනු ලැබේ.

## ➢ විශ්වවිද්‍යාලයේ තත්ත්ව ආරක්ෂණ ක්‍රියාකාරකම්

- තත්ත්ව ආරක්ෂණ මධ්‍යස්ථානය 2021 සැප්තැම්බර් 21 දින රුහුණ තත්ත්ව ආරක්ෂණ සැසිය සාර්ථකව පැවැත්වීය. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති එම සැසියේ ප්‍රධාන ආරාධිතයා ලෙස සහභාගි වූ අතර එය වාර්ෂික සැසියක් ලෙස පැවැත්වීමට සැලසුම් කර තිබේ.

- රුහුණ තත්ත්ව ආරක්ෂණ සැසිය උසස් අධ්‍යාපනයෙහි තත්ත්ව ආරක්ෂණයේ වඩා පුළුල් තේමාත්මක ක්ෂේත්‍රයන්හි පර්යේෂණ අනාවරණ සහ අනාගතවාදී අදහස් බෙදා හදා ගැනීමට විද්වතුන්ට සහ පරිපාලකයන්ට පහසුකම් සැපයීම හා දිරි ගැන්වීම පිණිස වන මෙහෙවරකි.

## ➢ අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ ඒකකය රුහුණ විශ්වවිද්‍යාලයේ පැවැත්වූ වැඩමුළු

- සෑම වසරකම ආරම්භයේදී, තත්ත්ව ආරක්ෂණ මධ්‍යස්ථානය සියලු පීඨවල පුහුණු අවශ්‍යතා රැස් කර එම පුහුණු අවශ්‍යතා සඳහා වැඩමුළු පැවැත්වීමට කටයුතු යොදයි.

- තත්ත්ව ආරක්ෂණ මධ්‍යස්ථානය විසින් පැවැත්වූ වැඩමුළු පහත පරිදිය.

- මොඩියුල තොරතුරු පත්‍රිකා සකස් කිරීම පිළිබඳ වැඩමුළුව අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා 2021 ජූලි 20 වන දින පවත්වන ලදී.

- ‘‘නාස්තිය අඩුකිරීම මගින් ගුණාත්මකභාවය ඉහළ නැංවීම’’ පිළිබඳ වැඩමුළුව 2021 ජූලි 20 වන දින ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ සහයෝගයෙන් පවත්වන ලදී. එහි සම්පත් දායක වූයේ ආචාර්ය සමාධි විතානගේ මහතායි.

- ‘‘විශ්වවිද්‍යාල ආචාර්යවරුන් අතර චිත්තවේගී බුද්ධිය ඉහළ නැංවීම’’ පිළිබඳ මාර්ගගත වැඩමුළුව 2021 අගෝස්තු 15 වන දින පවත්වන ලදී.

- මාර්ගගත විභාග පරීක්ෂාව පිළිබඳ වැඩමුළුවක් පවත්වන ලදී.

- ‘‘ඉතා ඉහළ ඵලදායිතාවක් ඇති මිනිසුන්ගේ පුරුදු හතක්’’ නම් වැඩමුළුව කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය සමඟ සහයෝගිතාවයෙන් 2021 අගෝස්තු 13 දින පවත්වන ලදී.

- කෘෂිකර්ම පීඨයේ ආචාර්ය දිමුතු සහ ආචාර්ය අධිකාරම්ගේ සහාය ඇතිව වෙබ් ශ්‍රේණිගත කිරීම සහ සම්බන්ධකතාව පිළිබඳ වැඩමුළුවක් සූම් තාක්ෂණය ඔස්සේ සාර්ථකව පවත්වන ලදී.

- ඊට අමතරව, 2021 දෙසැම්බර් මාසයේදී රුහුණ විශ්වවිද්‍යාලයේ ආයතනික සමාලෝචනයක් සිදුකරන ලදී.

# 5. නූතන භාෂා සහ ශිෂ්ඨාචාර මධ්‍යස්ථානය (CMLC)

මෙම මධ්‍යස්ථානය "නූතන භාෂා සඳහා සම්පත් මධ්‍යස්ථානය" ලෙස 2002 ජූලි 26 දින ස්ථාපිත කරන ලද අතර පසුව නූතන භාෂා සහ ශිෂ්ඨාචාර මධ්‍යස්ථානය ලෙස උසස් කරන ලදී. වත්මනෙහි මෙම මධ්‍යස්ථානය විසින් රුහුණ විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂකයන් මෙන්ම කාර්ය මණ්ඩලය භාෂා පාඨමාලා හතක් පවත්වනු ලබයි. නූතන භාෂා පිළිබඳ සියලු අධ්‍යයන වැඩසටහන් දේශීය හා විදේශීය කථිකාචාර්යවරුන්/ උපදේශකයන් කණ්ඩායමක් විසින් පවත්වනු ලබයි.

## ➢ නූතන භාෂා සහ ශිෂ්ඨාචාර මධ්‍යස්ථානය විසින් පවත්වනු ලබන පාඨමාලා හත

- ජපන් භාෂා උසස් සහතිකපත්‍ර පාඨමාලාව
- ජර්මන් භාෂා උසස් සහතිකපත්‍ර පාඨමාලාව
- චීන භාෂා උසස් සහතිකපත්‍ර පාඨමාලාව
- දෙමළ භාෂා උසස් සහතිකපත්‍ර පාඨමාලාව
- කොරියානු භාෂා උසස් සහතිකපත්‍ර පාඨමාලාව
- ප්‍රංශ භාෂා උසස් සහතිකපත්‍ර පාඨමාලාව
- හින්දි භාෂා උසස් සහතිකපත්‍ර පාඨමාලාව

## ➢ කාර්ය මණ්ඩල සාමාජිකයන්

- සම්බන්ධීකාරක
  ආචාර්ය ඒ.ඒ.රවිඳු ප්‍රියංක
  පාලි හා බෞද්ධ අධ්‍යයන අධ්‍යනාංශය

- ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
  තනුජා පතිරණ මිය
  මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය

## ➢ භාෂා සම්බන්ධීකාරකවරු

- හින්දි — කේ.වී.ජී. කෝෂලී මිය
  ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය

- චීන — කේ. හිරෝෂා ලක්මාලි මිය
  රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනාංශය

- ජපාන — පී.ඩබ්.එස්. ප්‍රනාන්දු මිය
  පාලි හා බෞද්ධ අධ්‍යයන අධ්‍යයනාංශය

- දෙමළ — සුමිත් උදයංග මයා
  සමාජ විද්‍යා අධ්‍යයනාංශය

- කොරියානු — ජයනි සමීරා මිය
  සිංහල අධ්‍යයනාංශය

- ප්‍රංශ — චක්‍රාංගි දහනායක මිය
  ඉංග්‍රීසි භාෂාව සහ ඉගැන්වීම් අධ්‍යයනාංශය

- ජර්මන් ආචාර්ය දිල්ශාන් රාජපක්ෂ මයා
  පාලි හා බෞද්ධ අධ්‍යයන අධ්‍යයනාංශය

## ➢ ජාත්‍යන්තර සබඳතා

- චීන භාෂාව ඉගැන්වීම පිණිස භාෂා ඒකකයක් ස්ථාපිත කිරීම පිණිස කොළඹ විශ්වවිද්‍යාලයේ කොන්ෆියුසියස් ආයතනය සහ රුහුණ විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුමක් ඇති කර ගැනීමට 2021 දෙසැම්බර් 02 දින පැවැති රුහුණ විශ්වවිද්‍යාලයේ 418 වැනි පාලක සභාවේදී අනුමත කරනු ලැබිය.
- චීන බ්‍රිජ් තරඟයට සහභාගි වූ ශිෂ්‍යයන් ජයග්‍රහණය කර සහතික පත්‍ර හා ත්‍යාග හිමිකරගන්නා ලදී.

# 6. සංස්කෘතික මධ්‍යස්ථානය

## ➢ සැපයූ සේවා/ පැවැත්වූ උත්සව - 2021 වසර

- ‘‘සංස්කෘතික අධ්‍යයනය සහ ශ්‍රී ලාංකික ප්‍රවණතා’’ පිළිබඳ මාර්ගගත දේශනය පැවැත්වීම
- "ලෝකයේ පවතින හැම විෂයකටම නාට්‍ය කලාව වැදගත්වන්නේ ඇයි? " මාර්ගගත දේශනය පැවැත්වීම
- "සංස්කෘතිය අධ්‍යනය සහ ශ්‍රී ලාංකීය ප්‍රවනතා" මාර්ගගත දේශනය පැවැත්වීම
- ‘‘සමාජ සංස්කෘතික දර්ශනය සහ කුමාරතුංග මුණිදාසය අභියෝග’’ මාර්ගගත දේශනය පැවැත්වීම
- "මැසිවිලි නඟන සිතුවිලි සමග ගනුදෙනු කිරීමේ කලාව" මාර්ගගත දේශනය පැවැත්වීම
- "වෙසක් කවි බණ" මාර්ගගතව පැවැත්වීම
- ‘‘ මිනිසුන්ගේ තේරුම කුමක්ද’’ මාර්ගගත දේශනය පැවැත්වීම
- ‘‘නව උදානයක්’’ අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය තරඟය පැවැත්වීම
- ‘‘රුහුණ ගී සරසි පදමාලා තරඟය’’ පැවැත්වීම
- ‘‘ ශ්‍රී ලංකාවේ දේශපාලන සංස්කෘතිය -එදා සහ අද’’ මාර්ගගත දේශනය පැවැත්වීම
- ‘‘චින්තන ප්‍රණාම නිර්මාණ තරගය-සහතිකපත්‍ර උත්සවය’’ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨ ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී.
- "ප්‍රකාශනය - අන්තරාවලෝකන ශාස්ත්‍රීය ග්‍රන්ථමාලා අංක 01" මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨ ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී.
- ‘‘ නාට්‍ය රසවිඳීමේ වැඩසටහන’’ මාර්ගගත දේශනය පවත්වන ලදී.
- ‘‘ශ්‍රී ලාංකික ජන සංගීතයෙන් පෝෂණය වූ නිර්මාණාත්මක සංගීතය’’ මාර්ගගත දේශනය පවත්වන ලදී.
- "විප්ලවයක් නොවන විප්ලවයක්! චින්තන විප්ලවයක්" මාර්ගගත දේශනය පවත්වන ලදී.
- ‘‘සඳට පෙම් බැඳි සිත්" ඊ- පිටපත එළි දක්වීම සිදුකරන ලදී.
- ‘‘නාට්‍ය සහ ජීවිතයේ යථාර්තය’’ මාර්ගගත දේශනය පවත්වන ලදී.
- "නාට්‍ය ගී රඟ වරුණ" මාර්ගගත දේශනය පවත්වන ලදී.
- "දේශීය රසකාරක සහ අපේ ආහාර" මාර්ගගත දේශනය පවත්වන ලදී.
- "වත්මන් අධ්‍යාපන ක්‍රියාවලිය හා සරසවි විද්‍යාර්ථියාගේ භූමිකාව" මාර්ගගත දේශනය පවත්වන ලදී.
- " ජන සමාජයේ යහපත උදෙසා නර්තනය " මාර්ගගත දේශනය පවත්වන ලදී.
- ‘‘සම්ප්‍රදායික සොකරි නාට්‍ය’’ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨ ශ්‍රවණාගාරයේදී වේදිකා ගතකරන ලදී.
- ‘‘සුබ සහ යස’’ වේදිකා නාට්‍යය මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨ ශ්‍රවණාගාරයේදී වේදිකා ගතකරන ලදී.
- ‘‘මනමේ’’ වේදිකා නාට්‍යය වෛද්‍ය පීඨ ශ්‍රවණාගාරයේදි පවත්වන ලදී.

# 7. කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය

පස්වන ඉලක්කය වන යහපාලන සහතික කිරීම සාක්ෂාත් කර ගැනීම සඳහා කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය වගකිවයුතු වේ. ප්‍රධාන කාර්යසාධක දර්ශක 5 ක් ඇති අතර කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම් 5.1 සහ 5.2 දර්ශකවලට සීමා වේ.

**දැක්ම - අපගේ සේවකයන් යාවජීව ඉගෙන ගන්නන් බවට පත් කරන නිපුණතා මධ්‍යස්ථානයක් වීම**

**මෙහෙවර - සේවකයන් නිපුණ සහ යාවජීව ඉගෙන ගන්නන් බවට පත් කිරීම**

ප්‍රධාන කාර්යසාධක දර්ශකය 5.1 සාක්ෂාත් කරගැනීම පිණිස අළුතින් බඳවාගනු ලැබූ කළමනාකරණ සහායකයන් සහ තාක්ෂණික නිලධාරීන් 40 දෙනෙකු සඳහා සේවාරම්භක පුහුණු වැඩසටහනක් මධ්‍යස්ථානය විසින් පවත්වනු ලැබීය (සති දෙකයි).

ප්‍රධාන කාර්යසාධක දර්ශකය 5.3 සාක්ෂාත් කරගැනීම පිණිස කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය පරිපාලන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා කෙටි පුහුණු වැඩසටහන් තිහක් පවත්වන ලදී.

- <u>අධ්‍යයන සහ පරිපාලන කාර්ය මණ්ඩලය</u>
    - CCPDHE පාඨමාලාව
    - කෙටි සැසි (සිකුරාදා දිනයන්හි)
- <u>අනධ්‍යයන කාර්ය මණ්ඩලය</u>
    - කෙටි සැසි (බදාදා දිනයන්හි)
    - සේවාරම්භක පුහුණුව (සති දෙකයි)
    - තො.ස.තා. පිළිබඳ සේවාස්ථ පුහුණුව (කළමනාකරණ සහායකයන් 50ක්)
- කා.ම.ස.මධ්‍යස්ථානය පහත දැක්වෙන පරිදි දැනුම හා කුසලතා සංවර්ධන වැඩමුළු හා පුහුණු සැසි පවත්වයි
    - සෑම සිකුරාදාම පෙ.ව. 8.00 සිට 10.00 දක්වා - අධ්‍යයන හා පරිපාලන කාර්ය මණ්ඩලය සඳහා
    - සෑම බදාදාම ප.ව. 1.00 සිට 3.00 දක්වා - අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා
- 2021 වසර තුළ පැවැත්වූ පුහුණු වැඩසටහන් සාරාංශය

| අංකය | දිනය | වැඩමුළුවේ මාතෘකාව | කාර්ය මණ්ඩලයේ ඉලක්ක කණ්ඩායම | සම්පත් දායකයන් |
|---|---|---|---|---|
| 1 | 2021.06.04 | භාණ්ඩ සෘජුව මිලදී ගැනීම | සියලු අධ්‍යයන, පරිපාලන සහ තාක්ෂණික නිලධාරීන් | ලේඛාධිකාරී<br>මූල්‍යාධිකාරී<br>SAB/සැපයුම් |
| 2 | 2021.06.11 | භාණ්ඩ සෘජුව මිලදී ගැනීම | සියලු අධ්‍යයන, පරිපාලන සහ තාක්ෂණික නිලධාරීන් | ලේඛාධිකාරී<br>මූල්‍යාධිකාරී<br>SAB/සැපයුම් |

| අංකය | දිනය | වැඩමුළුවේ මාතෘකාව | කාර්ය මණ්ඩලයේ ඉලක්ක කණ්ඩායම | සම්පත් දායකයන් |
|---|---|---|---|---|
| 3 | 2021.06.18 | ප්‍රසම්පාදන ක්‍රියාදාමයේ ප්‍රමාදයන් වළක්වා ගන්නේ කෙසේද? අත්දැකීම් බෙදා ගැනීම | සියලු අධ්‍යයන, පරිපාලන සහ තාක්ෂණික නිලධාරීන් | උප කුලපති<br>ලේඛාධිකාරී<br>මූල්‍යාධිකාරී |
| 4 | 2021.06.23 | විශ්වවිද්‍යාලයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සුසංවිධිත කිරීම | සියලු අධ්‍යයන, පරිපාලන සහ තාක්ෂණික නිලධාරීන් | අනුර ලොකුගමගේ මයා<br>ජ්‍යෙෂ්ඨ උපදේශක<br>ශ්‍රීලසපඅ |
| 5 | 2021.07.02 | විශ්වවිද්‍යාලයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය- ප්‍රශ්නෝත්තර සැසිය | සියලු අධ්‍යයන, පරිපාලන සහ තාක්ෂණික නිලධාරීන් | මඩුල්ල:-උප කුලපති<br>ලේඛාධිකාරී<br>මූල්‍යාධිකාරී<br>පී.වික්‍රමසිංහ මයා, ප්‍රධාන ගණකාධිකාරී, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතර<br>විශ්වවිද්‍යාලයේ ප්‍රසම්පාදන කමිටුවේ සාමාජික |
| 6 | 2021.07.07 | යහපත් විගණන වාර්තාව | සියලු අනධ්‍යාන කාර්ය මණ්ඩලය | උප කුලපති<br>ලේඛාධිකාරී<br>මූල්‍යාධිකාරී |
| 7 | 2021.07.09 | විගණන පනත හා විගණන විෂය පථය | සියලු අධ්‍යයන, පරිපාලන සහ තාක්ෂණික නිලධාරීන් | නිමල් තිලකරත්න මයා, සහකාර විගණකාධිපති, දකුණ ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක<br>ලේඛාධිකාරී<br>මූල්‍යාධිකාරී |
| 8 | 2021.07.14 | අපගේ ආයතනය සංවර්ධන සඳහා අප සළුලව හා කාර්යක්ෂමව දායක වන්නේ කෙසේද? | සියලු අනධ්‍යාන කාර්ය මණ්ඩලය | ආචාර්ය නන්දසිරි කිඹියහෙට්ටි, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය, රු.වි. |
| 9 | 2021.07.16 | විශ්වවිද්‍යාලයේ විගණන ක්‍රියාවලියේ වැදගත් අංග | සියලු අධ්‍යයන, පරිපාලන සහ තාක්ෂණික නිලධාරීන් | නිමල් තිලකරත්න මයා, සහකාර විගණකාධිපති, දකුණ<br>ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපතිවරු 10<br>ලේඛාධිකාරී<br>මූල්‍යාධිකාරී |
| 10 | 2021.07.30 | කාර්යසාධන හා පරිසර විගණනය | සියලු අධ්‍යයන, පරිපාලන සහ තාක්ෂණික නිලධාරීන් | නිමල් තිලකරත්න මයා, සහකාර විගණකාධිපති, දකුණ<br>ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපතිවරු 10<br>ලේඛාධිකාරී<br>මූල්‍යාධිකාරී |
| 11 | 2021.08.04 | “ඵලදායිතාව, ගුණාත්මකභාවය සහ ආරක්ෂාව වැඩි දියුණු කිරීම සඳහා සතුට, ස්වයං අභිප්‍රේරණය, ආකල්ප ගොඩ නගා පවත්වා ගන්නේ කෙසේද” | සියලු අනධ්‍යාන කාර්ය මණ්ඩලය | මහාචාර්ය එම්. තිලකසිරි, හිටපු අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය |
| 12 | 2021.08.06 | බිලූ ඕෂන් නායකත්වය | සියලු අධ්‍යයන, පරිපාලන සහ තාක්ෂණික නිලධාරීන් | මහාචාර්ය එම්. තිලකසිරි, හිටපු අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය |

| අංකය | දිනය | වැඩමුළුවේ මාතෘකාව | කාර්ය මණ්ඩලයේ ඉලක්ක කණ්ඩායම | සම්පත් දායකයන් |
|---|---|---|---|---|
| 13 | 2021.08.11 | ආයතනික නෛතික පරිසරය | සියලු අනධ්‍යාන කාර්ය මණ්ඩලය | ජී.එල්.එරත්න මයා, නියෝජ්‍ය ලේඛාධිකාරී, නෛතික හා ප්‍රලේඛන අංශය, රු.වි. |
| 14 | 2021.08.13 | සළල විද්වතකුගේ පුරුදු හතක් (තත්ත්ව ආරක්ෂණ ඒකකය සමග ඒකාබද්ධව සංවිධානය කරන ලදී) | සියලු අධ්‍යයන, පරිපාලන සහ තාක්ෂණික නිලධාරීන් | මහාචාර්ය පී.හේවගේ, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, භූගෝල විද්‍යා අධ්‍යනාංශය, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය, රු.වි. |
| 15 | 2021.08.27 | වෙබ් දෘශ්‍යතාව, විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම සහ ඔබේ දායකත්වය | සියලු අධ්‍යයන, පරිපාලන සහ තාක්ෂණික නිලධාරීන් | ආචාර්ය දිමුතු පියරත්න සහ ආචාර්ය ලසන්ත අධිකාරම්, පරිගණක ඒකකය, කෘෂිකර්ම පීඨය, රු.වි. |
| 16 | 2021.09.03 | ආයතනික නෛතික පරිසරය | සියලු අධ්‍යයන, පරිපාලන සහ තාක්ෂණික නිලධාරීන් | ජී.එල්.එරත්න මයා, නියෝජ්‍ය ලේඛාධිකාරී, නෛතික හා ප්‍රලේඛන අංශය, රු.වි. |
| 17 | 2021.09.04 | ටෝස්ට්මාස්ටර් වැඩසහන පිළිබඳ දැනුවත් කිරීමේ සැසිය | සියලු අධ්‍යයන, පරිපාලන සහ තාක්ෂණික නිලධාරීන් | ඉංජිනෙරු ශාන්ත සෙනරත්, කේ ආරියවංශ සහ ගුණතිලක මිය |
| 18 | 2021.09.13 | සම්පිණ්ඩිත ඇඟයීම්වල න්‍යායාත්මක අංග | සියලු අධ්‍යයන කාර්ය මණ්ඩලය | මහාචාර්ය සුකි ඒකරත්න, හිටපු අධ්‍යක්ෂ, කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය, කොළඹ විශ්වවිද්‍යාලය |
| 19 | 2021.09.22 | තත්ත්ව කළමනාකරණ පද්ධති වල සම්මත මෙහෙයුම් පරිපාටි සහ ක්‍රියාදාම කළමනාකරණය භාවිතය | සියලු අධ්‍යයන, පරිපාලන සහ තාක්ෂණික නිලධාරීන් | ආචාර්ය නිහාල් ආටිගල, ජ්‍යෙෂ්ඨ උපදේශක සහ කළමනාකරණ අධ්‍යක්ෂ,ට්‍රියොලොජී කන්සල්ටන්සි සර්විසස් පුද්ගලික සමාගම |
| 20 | 2021.10.01 | හොඳ ප්‍රශ්න පත්‍රයක් සකස් කිරීමේ න්‍යායාත්මක හා ප්‍රායෝගික අංග | සියලු අධ්‍යයන කාර්ය මණ්ඩලය | මහාචාර්ය අජිත් ජයවීර, හිටපු අධ්‍යක්ෂ, කා.ම.ස.ම., ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය |
| 21 | 2021.10.08 | හොඳ ප්‍රශ්න පත්‍රයක් සකස් කිරීමේ න්‍යායාත්මක හා ප්‍රායෝගික අංග | සියලු අධ්‍යයන කාර්ය මණ්ඩලය | මහාචාර්ය අජිත් ජයවීර, හිටපු අධ්‍යක්ෂ, කා.ම.ස.ම., ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය |
| 22 | 15.10.2021 | විශ්වවිද්‍යාල බුද්ධිමය දේපළ ප්‍රතිපත්තිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව, බුද්ධිමය දේපළ හා තාක්ෂණ පැවැරුම් ක්‍රියාකාරකම් | සියලු අධ්‍යයන කාර්ය මණ්ඩලය | විශ්වවිද්‍යාලයේ තාක්ෂණික පැවැරුම් කාර්යාලය විසින් සත්කාරකත්වය දරන ලදී |
| 23 | 2021.10.22 | පිළිතුරු පත්‍ර ලකුණු කිරීම හා ප්‍රශ්නපත්‍ර ලකුණු කිරීම සඳහා නිර්දේශ | සියලු අධ්‍යයන කාර්ය මණ්ඩලය | මහාචාර්ය අජිත් ජයවීර, හිටපු අධ්‍යක්ෂ, කා.ම.ස.ම., ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය |
| 24 | 2021.10.29 | රුහුණ විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පැවැරුම් ක්‍රියාකාරකම්: නිෂ්පාදන වාණිජකරණය පිළිබඳ පීඨයේ සාර්ථකත්ව ප්‍රවාද | සියලු අධ්‍යයන කාර්ය මණ්ඩලය | අධ්‍යක්ෂ/තාක්ෂණික පැවැරුම් කාර්යාලය, මහාචාර්ය තුසිත අබේතුංග, (AHEAD), සහ චින්ධ්‍යා විජේසිංහ මිය(COSTI) |

| අංකය | දිනය | වැඩමුළුවේ මාතෘකාව | කාර්ය මණ්ඩලයේ ඉලක්ක කණ්ඩායම | සම්පත් දායකයන් |
|---|---|---|---|---|
| 25 | 2021.11.12 | කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම පිණිස කළමනාකරණ පරිවයන් | අධ්‍යක්ෂ/තාක්ෂණික පැවැරුම් කාර්යාලය | මහාචාර්ය සමන්තු කුමාර, පීඨාධිපති, කළමනාකරණ හා මූල්‍ය පීඨය |
| 26 | 2021.11.17 | තාක්ෂණික පැවැරුම් ක්‍රියාදාමය සහ රුහුණ විශ්වවිද්‍යාලයේ තාක්ෂණික පැවැරුම් කාර්යාලයේ කාර්යභාරය | සියලු අනධ්‍යයන කාර්ය මණ්ඩලය | අධ්‍යක්ෂ/තාක්ෂණික පැවැරුම් කාර්යාලය, සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ, වෛද්‍ය පීඨයේ සහ කෘෂිකර්ම පීඨයේ සම්බන්ධීකාරකවරු |
| 27 | 2021.11.24 | නිල ලේඛන සකස් කිරීමේදී සිංහල භාෂාව නිවැරදිව භාවිතා කරන්නේ කෙසේද? | සියලු අනධ්‍යයන කාර්ය මණ්ඩලය | ආචාර්ය පූජ්‍ය මොරකන්දේගොඩ ආරියවංඹ ථෙර, සිංහල අධ්‍යනාංශය |
| 28 | 2021.11.26 | රුහුණ විශ්වවිද්‍යාලයේ ආයතනික සමාලෝචන ක්‍රියාදාමය | සියලු අධ්‍යයන සහ පරිපාලන කාර්ය මණ්ඩල සාමාජිකයන් | උපකුලපති හා තත්ත්ව ආරක්ෂණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ස ස්වයං ඇගයීම් සමාලෝචන කමිටු සභාපතිවරුන් |
| 29 | 2021.12.01 | නිල ලේඛන සකස් කිරීමේදී ඉංග්‍රීසි භාෂාව නිවැරදිව භාවිතා කරන්නේ කෙසේද? | සියලු අනධ්‍යයන කාර්ය මණ්ඩලය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය (විශ්‍රාමික) ගාමිණී පොන්සේකා සහ ආචාර්ය එස්.ජී.එස්. සමරවීර |
| 30 | 2021.12.31 | ලේඛණ චෞර්යය වළක්වාලීම පිණිස ‘ටර්නටින් සමානතා අනාවරණ සේවාව භාවිතා කරන්නේ කෙසේද? | සියලු අධ්‍යයන කාර්ය මණ්ඩලය | නිශාන්ත ගමගේ මහතා, ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති රුහුණ විශ්වවිද්‍යාලය |

# කොටස XI

# සහායක සේවා

# 1. සාමාන්‍ය පාලන අංශය

| **උපයෝගිතා බිල්පත් ගෙවීම** | **රු.** |
|---|---|
| - ජලය | 7,955,928.53 |
| - විදුලිය | 35,393,265.48 |
| - දුරකථන | 562,549.79 |
| - අන්තර්ජාල | 12,047,302.40 |
| **අනෙකුත් සේවා** | |
| - දුම්රිය බලපත්‍ර | 150,000.00 |
| - තැපැල් ගාස්තු | 600,000.00 |
| **ගිවිසුම්කර සේවා** | |
| - පිරිසිදු කිරීමේ සේවා | 81,852,428.62 |
| - පුද්ගලික ආරක්ෂක සේවා | 39,961,910.00 |
| **ප්‍රවාහන** | |
| - වාහන කුලියට ගැනීම, නඩත්තුව, අධිවේග ගාස්තු | 2,760,314.12 |
| - ඉන්ධන | 1,908,250.29 |
| - වාහන | 1,124,480.00 |
| **උපකරණ නඩත්තුව** | |
| - උපකරණ අළුත්වැඩියාව | 1,814,721.18 |
| **වෙනත් ආදායම්** | |
| - රවීන්ද්‍රනාත් තාගෝර් අනුස්මරණ ශ්‍රවණාගාරය | 5,662,275.00 |
| - අමුත්තන්ගේ නිවහන | 73,600.00 |

## 2. නෛතික හා ප්‍රලේඛන අංශය

**2021** වසරේදී ආයතනය විසින් මෙහයවනු ලැබූ නඩුකර

| නඩු කාණ්ඩය | මුළු නඩු සංඛ්‍යාව | | විශ්වවිද්‍යාලයට එරෙහිව පවරන ලද නඩු සංඛ්‍යාව | | විශ්වවිද්‍යාලය විසින් පවරන ලද නඩු සංඛ්‍යාව | | නඩුවල වත්මන් තත්ත්වය | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | විභාගවෙමින් පවතින නඩු සංඛ්‍යාව | | විභාගවෙමින් පවතින නඩු සංඛ්‍යාව | |
| | **1** | **2** | **1** | **2** | **1** | **2** | **1** | **2** | **1** | **2** |
| කම්කරු විනිශ්චය සභා/ සේවක වන්දි අධිකරණය ඉදිරියේ | - | 02 | - | 02 | - | - | - | 02 | - | - |
| විශ්වවිද්‍යාල සේවා අභියාචන මණ්ඩලය | 01 | 05 | 01 | 05 | - | - | 01 | 03 | 01 | 01 |
| දිසා අධිකරණය ඉදිරියේ | 01 | 02 | 01 | 02 | - | - | - | - | 01 | 02 |
| මහේස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ | - | 02 | - | - | - | 02 | - | 02 | - | - |
| අභියාචනාධිකරණය සහ සිවිල් මහාධිකරණය | 01 | 16 | 01 | 15 | - | 01 | 01 | 12 | - | 04 |
| ශ්‍රේෂ්ඨාධිකරණය | 03 | 08 | 02 | 08 | 01 | - | 02 | 06 | - | 02 |
| **මුළු නඩු සංඛ්‍යාව** | **06** | **35** | **05** | **32** | **01** | **03** | **05** | **25** | **02** | **09** |

සටහන 1- *ඉහතින් සඳහන් කළ කාලසීමාව තුල විසින්/එරෙහිව පවරනු ලැබූ නඩු*

2- *පෙර වසරේ විසින්/එරෙහිව පවරනු ලැබූ නඩු*

| නඩු කාණ්ඩය | | මුළු පරීක්ෂණ සංඛ්‍යාව | විභාගවෙමින් පවතින පරීක්ෂණ සංඛ්‍යාව | පරීක්ෂණ අවසන් වූ පරීක්ෂණ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| **ශිෂ්‍ය විනය පරීක්ෂණ** | | | | |
| ශිෂ්‍ය විනය පරීක්ෂණ | විධිමත් පරීක්ෂණ | 15 | 12 | 03 |
| | මූලික පරීක්ෂණ | 17 | 11 | 06 |
| මුළු පරීක්ෂණ සංඛ්‍යාව | | **32** | **23** | **09** |
| **සේවක විනය පරීක්ෂණ** | | | | |
| අනධ්‍යන සේවක විනය පරීක්ෂණ | විධිමත් පරීක්ෂණ | 09 | 08 | 01 |
| | මූලික පරීක්ෂණ | 02 | 02 | - |
| අධ්‍යන සේවක විනය පරීක්ෂණ | විධිමත් පරීක්ෂණ | 02 | 02 | - |
| | මූලික පරීක්ෂණ | - | - | - |
| **මුළු පරීක්ෂණ සංඛ්‍යාව** | | **13** | **12** | **01** |

# කොටස XII

# මූල්‍ය ප්‍රකාශන

## 1. ගණන්දීමේ නිලධාරියාගේ සහතිකය

**රුහුණ විශ්වවිද්‍යාලය**
**றுஹுணு பல்கலைக்கழகம்**
**UNIVERSITY OF RUHUNA**

මගේ අංකය
எனது எண்
My No.

ඔබේ අංකය
உங்களது எண்
Your No.

**වැල්ලමඩම මාතර 81000 ශ්‍රී ලංකාව** வெல்லமடம மாத்தறை 81000 இலங்கைWELLAMADAMA, MATARA 81000SRI LANKA

**2021 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා මූල්‍ය ප්‍රකාශන පිළිබඳ ගණන්දීමේ නිලධාරියාගේ සහතිකය, රුහුණ විශ්වවිද්‍යාලය**

2021 දෙසැම්බර් 31න් අවසන් මුදල් වර්ෂය සඳහා රුහුණ විශ්ව විද්‍යාලයේ ගිණුම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශනය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වා ඇති ස්වරූපයෙන් හා ආකාරයෙන් සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 106 සහ 107 වගන්ති සහ 1971 අංක 38 දරන මූල්‍ය පනත ප්‍රකාරව පිළියෙල කරන ලදුව මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයේ සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ සඳහන් කොට ඇති උපලේඛන සමග විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබීය.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කොට ඉදිරිපත් කර ඇත. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලැබූ මූල්‍ය නියමයන් සහ පරිපාටිවලට අනුකූලව කටයුතු කර ඇති අතර ගනුදෙනුවල විධි සාරුෂය සහ වියදමේ කාර්යක්ෂමතාවය සහතික කිරීම පිණිස ප්‍රායෝගිකව ඉටුකළ හැකි තාක් දුරට පද්ධති හා පාලන පවත්වා ගනු ලැබ තිබේ. මාගේ උපරිම දැනීමට අනුව, 2021 වසරට අදාළ ප්‍රකාශනය සතුටුදායක ලෙස සකස් කර ඇති අතර විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය පිළිබඳව සත්‍ය හා සාධාරණ මතයක් නිරූපණය කරයි.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුජීව අමරසේන
උප කුලපති
(ගණන්දීමේ නිලධාරී)

රුහුණ විශ්වවිද්‍යාලය
මාතර
2022 පෙබරවාරි 20

* ඉංග්‍රීසි පිටපතෙහි අත්සන් යොදා ඇත.

## 2. 2021 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය

**රුහුණු විශ්වවිද්‍යාලය -ශ්‍රී ලංකාව**
**මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය**
**2021 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා**
**(ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)**

| දෙසැම්බර් 31 දිනට | සටහන් | 2021 | 2020 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම වත්කම්** | | | |
| මුදල් හා මුදල් සමාන දෑ | 3 | 657,419,850 | 218,228,151 |
| අත්තිකාරම් හා පූර්ව ගෙවීම් | 4 | 6,771,721 | 9,587,346 |
| කාර්ය මණ්ඩලය සඳහා ණය හා අත්තිකාරම් | 5 | 19,296,630 | 23511775.96 |
| ප්‍රාග්ධන අත්තිකාරම් | 6 | 5,296,423 | 5,065,829 |
| වෙළඳ හා අනිකුත් ලැබිය යුතු දෑ | 7 | 149,652,065 | 347,261,610 |
| වට්ටෝරු භාණ්ඩ | 8 | 26,465,853 | 22,818,161 |
| **මුළු ජංගම වත්කම්** | | **864,902,541** | **626,472,873** |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 9 | 8,050,934,489 | 8,229,708,296 |
| නොනිමි වැඩ | 10 | 2,923,384,814 | 1,248,667,665 |
| අස්පෘශ්‍ය වත්කම් | 11 | 919,933 | 2,923,713 |
| දිගුකාලීන ආයෝජන | 12 | 90,672,124 | 73,000,517 |
| කාර්ය මණ්ඩල ණය හා අත්තිකාරම් | 5 | 55,744,328 | 54,992,588 |
| වෙනත් මූල්‍ය වත්කම් | 13 | 518,566,643 | 423,559,961 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **11,640,222,331** | **10,032,852,739** |
| **මුළු වත්කම්** | | **12,505,124,872** | **10,659,325,613** |
| **බැරකම්** | | | |
| **ජංගම බැරකම්** | | | |
| තැන්පතු | 14 | 23,357,060 | 34,645,437 |
| ණයහිමියෝ සහ ගෙවිය යුතු දෑ | 15 | 361,599,084 | 290,010,428 |
| අනාකුත් බැරකම් | 16 | 6,586,920 | 6,843,002 |
| විලම්බිත ආදායම | | 244,076,700 | 210,041,124 |
| **මුළු ජංගම බැරකම්** | | **635,619,764** | **541,539,991** |
| **ජංගම නොවන බැරකම්** | | | |
| ණය හිමියෝ හා ගෙවිය යුතු දෑ | 14 | 2,658,000 | 7,526,750 |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | | 1,578,078,479 | 1,533,344,467 |
| **මුළු ජංගම නොවන බැරකම්** | | **1,580,736,479** | **1,540,871,217** |
| **මුළු බැරකම්** | | **2,216,356,244** | **2,082,411,208** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධ** | | **10,288,768,628** | **8,576,914,404** |

| දෙසැම්බර් 31 දිනට | සටහන් | 2021 | 2020 |
|---|---|---|---|
| **සමුච්චිත අරමුදල් හා සංචිත** | | | |
| සමුච්චිත අරමුදල -ජංගම හා ප්‍රාග්ධන | 17 | 7,336,673,119 | 5,714,468,072 |
| සංචිත | 18 | 2,063,545,191 | 2,031,555,191 |
| පර්යේෂණ ප්‍රදාන | 19 | 23,917,947 | 19,158,120 |
| සීමිත අරමුදල් හා ප්‍රදාන | 20 | 285,901,265 | 132,811,593 |
| නම්කළ අරමුදල් | 21 | 508,178,197 | 613,155,784 |
| පරිත්‍යාග අරමුදල් | 22 | 70,552,909 | 65,765,645 |
| **මුළු ශුද්ධ වත්කම්/ස්කන්ධ** | | **10,288,768,628** | **8,576,914,404** |

පිටු අංක 11 සිට 50 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි අත්‍යවශ්‍ය කොටසක් වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කොට ඉදිරිපත් කර ඇත.

කේ.ඒ.ආර්.එස්.ජයකොඩි
මූල්‍යාධිකාරී
මූල්‍ය නිලධාරී

ඩී.එල්.ආර්. ද සොයිසා
සහකාර මූල්‍යාධිකාරී -ගිණුම්

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා පාලක සභා මණ්ඩලයේ සාමාජිකයක් වගකිව යුතු වේ. මෙම මූල්‍ය ප්‍රකාශන රුහුණ විශ්වවිද්‍යාලයේ පාලක සභා මණ්ඩලයේ සාමාජිකයන් අනුමත කර ඇත.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුජීව අමරසේන
උප කුලපති
ගණන්දීමේ නිලධාරී

පී.එස්. කලුගම
ලේඛකාධිකාරී
සහකාර ගණන්දීමේ නිලධාරී

පාලක සභාව වෙනුවෙන් අත්සන් තබන ලදී.

සුදත් ජයසේකර
පාලක සභා මණ්ඩල සාමාජික

කපිල සමරසිංහ
පාලක සභා මණ්ඩල සාමාජික

* ඉංග්‍රීසි පිටපතෙහි අත්සන් යොදා ඇත.

# 3. 2021 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

**රුහුණු විශ්වවිද්‍යාලය -ශ්‍රී ලංකාව**
**මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය**
**2021 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා**
**(ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)**

| දෙසැම්බර් 31 දිනට | සටහන් | 2021 | 2020 |
|---|---|---|---|
| **ආදායම** | | | |
| **හුවමාරු නොවන ගනුදෙනුවල ආදායම -ජංගම** | | | |
| පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය | | 4,308,000,000 | 4,027,000,000 |
| ශිෂ්‍යාධාර සඳහා වි.ප්‍ර.කොා.සභාවේ ප්‍රදානය | | 44,612,000 | 54,004,000 |
| විවිධ ආදායම | 24 | 636,650 | 706,317 |
| විනිමය ලාභ /අලාභ | | 3,669,823 | - |
| **හුවමාරු නොවන ගනුදෙනුවලින් මුළු ආදායම-ජංගම** | | **4,356,918,472** | **4,081,710,317** |
| හුවමාරු ගනුදෙනුවලින් ආදායම - ජංගම | | | |
| පොළී ආදායම | | 19,161,021 | 28,097,860 |
| කුලී ආදායම | | 4,961,626 | 1,934,598 |
| උත්පාදිත ආදායම - වෙනත් මූලාශ්‍ර | 23 | 27,803,551 | 39,246,627 |
| විවිධ ආදායම | 24 | 35,662,346 | 39,003,611 |
| ස්වයං මූල්‍යකරණ ක්‍රියාකාරකම්වලින් ආදායම | 26 | 52,889,763 | 39,031,350 |
| මාපලාන කෘෂිකර්ම ගොවිපොළෙන් ආදායම | 27 | 5,391,553 | 7,679,141 |
| බැහැර කළ වත්කම් මත ලාභ | | 9,988 | 14,932 |
| **හුවමාරු ගනුදෙනුවලින් මුළු ආදායම- ජංගම** | | **145,879,848** | **155,008,120** |
| **මුළු ආදායම -ජංගම** | | **4,502,798,321** | **4,236,718,437** |
| **හුවමාරු නොවන ගනුදෙනුවලින් ආදායම - ප්‍රාග්ධන** | 25 | | |
| ප්‍රාග්ධන පැවැරුම් | | 1,552,629,111 | 1,152,618,941 |
| ත්‍යාග, පරිත්‍යාග හා භාණ්ඩ පරිත්‍යාග -දේශීය | | 19,341,673 | 9,970,015 |
| ත්‍යාග, පරිත්‍යාග හා භාණ්ඩ පරිත්‍යාග -විදේශීය | | 545,445,170 | 81,528,162 |
| **හුවමාරු නොවන ගනුදෙනුවලින් මුළු ආදායම - ප්‍රාග්ධන** | | **2,117,415,955** | **1,244,117,117** |
| **මුළු ආදායම** | | **6,620,214,276** | **5,480,835,555** |
| **මෙහෙයුම් වියදම් - ජංගම** | | | |
| පුද්ගල පඩිනඩි | 28.1 | 3,684,235,833 | 3,622,040,993 |
| ගමන් වියදම් | 28.2 | 3,635,247 | 4,286,210 |
| සැපයුම් සහ පරිභෝජ්‍ය ද්‍රව්‍ය | 28.3 | 76,687,988 | 69,437,140 |
| නඩත්තුව | 28.4 | 23,480,202 | 26,826,202 |
| ගිවිසුම්කර සේවා | 28.5 | 303,682,498 | 299,858,022 |
| පර්යේෂණ හා සංවර්ධන | 28.6 | 3,912,831 | 852,819 |
| මහපොළ සහ ශිෂ්‍යාධාර ගෙවීම් | 28.7 | 44,612,000 | 54,004,000 |
| අනෙකුත් මෙහෙයුම් වියදම් | 28.6 | 79,639,770 | 77,304,019 |

| දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා | සටහන් | 2021 | 2020 |
|---|---|---|---|
| කල්බදු පොළී සහ අනෙකුත් මූල්‍ය පිරිවැය | 28.6 | - | 37,485 |
| පාරිතෝෂික ප්‍රතිපාදනය | 28.1 | 141,012,483 | 275,860,916 |
| ස්වයං මූල්‍යකරණ ක්‍රියාකාරකම් සඳහා වියදම් | 26 | 52,889,763 | 39,031,350 |
| මාපලාන කෘෂිකර්ම ගොවිපොළෙන් ආදායම | 27 | 11,885,228 | 13,141,180 |
| තොග භාණ්ඩ ලියාහැරීම් මත අලාභ | | 521,698 | - |
| **මුළු මෙහෙයුම් වියදම්** | | **4,426,195,543** | **4,482,680,336** |
| **මෙහෙයුම් නොවන වියදම්** | | | |
| ක්ෂයවීම හා ක්‍රමක්ෂය | 9 | 738,613,769 | 700,768,558 |
| පර්යේෂණ ශක්තිමත් කිරීම හා මානව ප්‍රාග්ධන සංවර්ධනය | | 3,096,274 | 3,859,369 |
| පුනරුත්ථාපන වියදම් - ප්‍රාග්ධන නොවන ස්වභාවයේ | | - | 277,130 |
| **මුළු මෙහෙයුම් නොවන වියදම්** | | **741,710,043** | **704,905,057** |
| **මුළු වියදම්** | | **5,167,905,586** | **5,187,585,393** |
| **කාලසීමාව සඳහා මුළු අතිරික්තය/හිඟය** | | **1,452,308,690** | **293,250,162** |

කාලසීමාව සඳහා මුළු අතිරික්තය/(හිඟය) පහත දැක්වෙන පරිදි කාලසීමාව සඳහා ජංගම සහ ප්‍රාග්ධන අතිරික්තය හෝ හිඟයෙන් සමන්විත වේ.

| | | |
|---|---|---|
| **කාලසීමාව සඳහා අතිරික්තය/හිඟය** | **76,602,778** | **(245,961,898)** |
| **කාලසීමාව සඳහා ප්‍රාග්ධන අතිරික්තය/හිඟය** | **1,375,705,912** | **539,212,060** |

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටසක් වන්නේය.

| | | |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුජීව අමරසේන | පී.එස්. කලුගම | කේ.ඒ.ආර්.එස්.ජයකොඩි |
| උප කුලපති | ලේඛකාධිකාරී | මුල්‍යාධිකාරී |
| ගණන්දීමේ නිලධාරී | සහකාර ගණන්දීමේ නිලධාරී | |

* ඉංග්‍රීසි පිටපතෙහි අත්සන් යොදා ඇත.

# 4. 2021 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශනය

**රුහුණු විශ්වවිද්‍යාලය -ශ්‍රී ලංකාව**
**මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය**
**2021 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා**
**(ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)**

| දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා | සටහන් | 2021 | 2020 |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින්/(යෙදවූ) මුදල් ප්‍රවාහය** | | | |
| කාල පර්චිඡේදය සඳහා අතිරික්තය/හිඟය | | 1,452,308,690 | 293,250,162 |
| **මුදල් නොවන සංචලන සඳහා ගැලපීම්** | | | |
| ක්‍රමක්ෂය | | | - |
| ක්ෂයකිරීම් සහ ක්‍රමක්ෂ වියදම් | | 738,613,769 | 700,768,558 |
| සාධාරණ වටිනාකම් වෙනස්වීම් මත ප්‍රතිලාභ - කෘෂිකර්ම ගොවිපොළ | | 39,865 | (1,565,678) |
| වත්කම් බැහැර කිරීම් මත ප්‍රතිලාභ | | (9,988) | (14,932) |
| ත්‍යාග, පරිත්‍යාග හා භාණ්ඩ පරිත්‍යාග -දේශීය | | (19,341,673) | (9,970,015) |
| ත්‍යාග, පරිත්‍යාග හා භාණ්ඩ පරිත්‍යාග -විදේශීය | | (545,445,170) | (81,528,162) |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | | 141,012,483 | 276,248,528 |
| අභාවිත වට්ටෝරු භාණ්ඩ ලියා හැරීම | | 521,698 | - |
| මූල්‍ය පිරිවැය | | - | 37,485 |
| පොදු සංචිතය සඳහා අනෙකුත් ගැලපීම් | | 6,309,258 | 55,054,253 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් අතිරික්තය** | | **1,774,008,931** | **1,232,280,199** |
| වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ වැඩිවීම්/(අඩුවීම්) | | 197,609,545 | (300,327,603) |
| කාර්ය මණ්ඩල ණය සහ අත්තිකාරම් වැඩිවීම්/(අඩුවීම්) | | 3,463,406 | 9,080,616 |
| වට්ටෝරු භාණ්ඩ වැඩිවීම්/(අඩුවීම්) | | (4,209,255) | 2,458,144 |
| අත්තිකාරම් හා පූර්ව ගෙවීම් වැඩිවීම්/(අඩුවීම්) සහ පූර්ව ගෙවීම් | | 2,815,626 | 7,353,518 |
| වැඩිවීම්/(අඩුවීම්) තැන්පතු | | (11,288,377) | (22,701,444) |
| වැඩිවීම්/(අඩුවීම්) විලම්බිත ආදායම | | 34,035,576 | 89,604,641 |
| වැඩිවීම්/(අඩුවීම්) ගෙවිය යුතු දෑ | | 88,093,681 | (2,682,653) |
| වැඩිවීම්/(අඩුවීම්) අනෙකුත් බැරකම් | | (256,082) | (10,053,386) |
| **මෙහෙයුම්වලින් ජනිත/(යෙදවූ) මුදල්** | | **310,264,121** | **(227,268,168)** |
| ගෙවනු ලැබූ පාරිතෝෂිකය | | (96,278,470) | (84,780,429) |
| ගෙවනු ලැබූ මූල්‍ය පිරිවැය | | - | (37,485) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින්/ (යෙදවූ) ශුද්ධ මුදල්** | | **1,987,994,582** | **920,194,117** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින්/ (යෙදවූ) ශුද්ධ මුදල්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ අත්කර ගැනීම් | | (154,104,112) | (98,755,892) |
| දේපළ, පිරියත හා උපකරණ විකිණීමෙන් ලත් මුදල් | | 9,988 | 14,932 |
| නොනිමි වැඩ | | (1,481,033,880) | (823,524,273) |
| ප්‍රාග්ධන අත්තිකාරම් - ශුද්ධ | | (230,594) | (4,472,444) |
| දිගු කාලීන ආයෝජන - ශුද්ධ | | (17,671,608) | (4,508,468) |
| අනෙකුත් මූල්‍ය වත්කම් - ශුද්ධ | | (95,006,682) | (96,645,069) |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින්/ (යෙදවූ) ශුද්ධ මුදල්** | | **(1,748,036,887)** | **(1,027,891,214)** |

| දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා | 2021 | 2020 |
|---|---|---|
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින්/ (යෙදවූ) මුදල් ප්‍රවාහය** | | |
| අනෙකුත් ප්‍රදාන, පරිත්‍යාග සහ අරමුදල්වලින් ශුද්ධ මුදල් ගලා ඒම(යාම) | 199,234,004 | (19,701,542) |
| කල්බදු ණය හිමියාගෙන් ලතු මුදල් (ආපසු ගෙවීම) | - | (826,929) |
| මූල්‍යකරණ ක්‍රියාකාරකම්වලින් (යෙදවූ) ශුද්ධ මුදල් ප්‍රවාහය | 199,234,004 | (20,528,471) |
| මුදල් හා මුදලට සමාන දේවල ශුද්ධ වැඩිවීම/ (අඩුවීම) | 439,191,699 | (128,225,567) |
| වර්ෂය ආරම්භයේදී මුදල් හා මුදලට සමාන දෑ | 218,228,152 | 346,453,719 |
| **කාල පරිච්ඡේදය අවසානයේදී මුදල් හා මුදලට සමාන දෑ** | **657,419,851** | **218,228,152** |

## 5. 2021 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය

**රුහුණු විශ්වවිද්‍යාලය -ශ්‍රී ලංකාව**
**මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය**
**2021 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා**
**(ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)**

| විස්තරය | ප්‍රත්‍යාගණන සංචිත | සමුච්චිත අරමුදල-ජංගම | සමුච්චිත අරමුදල-ප්‍රාග්ධන | පරිසීමිත අරමුදල් | එකතුව |
|---|---|---|---|---|---|
| **2020.01.01 දිනට ගැලපූ ශේෂය** | **1,969,605,080** | **(464,419,573)** | **5,503,603,945** | **851,659,217** | **7,860,448,669** |
| කාල පරිච්ඡේදය සඳහා හිඟය/අතිරික්තය | | (245,961,898) | 539,212,060 | | **293,250,162** |
| පරිසීමිත අරමුදල්වලින් ප්‍රාග්ධන පැහැදම් වෙත දායකත්වය | | | 40,313,161 | (40,313,161) | - |
| නම්කළ අරමුදල් සඳහා පැවැරුම් | | (39,246,627) | | 39,246,627 | - |
| පෙර වසරෙ ගැලපුම් (ශුද්ධ) | | 49,950,259 | 331,016,745 | | **380,967,004** |
| වර්ෂය තුළදී ශුද්ධ දායකත්වය | | | | (19,701,542) | **(19,701,542)** |
| ප්‍රත්‍යාගණන සංචිතය | 61,950,111 | | | | **61,950,111** |
| **2021.12.31 දිනට ශේෂය** | **2,031,555,191** | **(699,677,839)** | **6,414,145,911** | **830,891,141** | **8,576,914,404** |
| කාල පරිච්ඡේදය සඳහා හිඟය/අතිරික්තය | - | 76,602,778 | 1,375,705,912 | - | **1,452,308,690** |
| අධි ප්‍රතිපාදන වියදම් ප්‍රත්‍යාවර්තනය | - | 22,012,272 | - | - | **22,012,272** |
| පරිසීමිත අරමුදල්වලින් ප්‍රාග්ධන පැහැදම් වෙත දායකත්වය | - | | 57,048,374 | (57,048,374) | - |
| නම් කළ අරමුදල්වලට බැර කළ වෛද්‍ය පීඨය උත්පාදිත අරමුදල් ඒකාබද්ධ ආදායමට ප්‍රතිවර්තනය (පෙර වසරේ ගැලපුම්) | - | 112,330,004 | - | (112,330,004) | - |
| නම්කළ අරමුදල් සඳහා පැවැරුම් | - | (27,803,551) | - | 27,803,551 | - |
| පෙර වසරෙ ගැලපුම් (ශුද්ධ) | - | 6,309,258 | - | - | **6,309,258** |
| වර්ෂය තුළදී ශුද්ධ දායකත්වය | - | - | - | 199,234,004 | **199,234,004** |
| ප්‍රත්‍යාගණන සංචිතය | 31,990,000 | - | - | - | **31,990,000** |
| **2021.12.31 දිනට ශේෂය** | **2,063,545,191** | **(510,227,079)** | **7,846,900,197** | **888,550,318** | **10,288,768,628** |

# 6. 2021 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## 1. සාමාන්‍ය තොරතුරු

### 1.1 නෛතික හා නිත්‍ය වාස ස්වරූපය

රුහුණ විශ්වවිද්‍යාලය 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතින් ස්ථාපිත කර ඇති ශ්‍රී ලංකාව නිත්‍ය වාසස්ථානයක් කරගත් රාජ්‍ය විශ්වවිද්‍යාලයකි. වත්මනෙහි විශ්වවිද්‍යාලයේ පීඨ සංඛ්‍යාව 10 කි. මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා, කළමනාකරණ සහ මූල්‍ය, ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ, විද්‍යා සහ උපාධි අධ්‍යයන පීඨ මාතර, වැල්ලමඩම ප්‍රධාන පරිශ්‍රයේ පිහිටා ඇත. වෛද්‍ය, ඉංජිනේරු සහ සම සෞඛ්‍ය විද්‍යා පීඨ පිළිවෙළින් ගාල්ල දිස්ත්‍රික්කයේ කරාපිටිය, හපුගල සහ උළුවිටකේ පිහිටා ඇත. කෘෂිකර්ම හා තාක්ෂණ පීඨය මාතර කඹුරුපිටියේ පිහිටා ඇත.

### 1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය

කෘෂිකර්ම, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා, වෛද්‍ය, විද්‍යා, සම සෞඛ්‍ය විද්‍යා, කළමනාකරණ සහ මූල්‍ය, ඉංජිනේරු, ධීවර හා සාගර විද්‍යා සහ තාක්ෂණ යන ක්ෂේත්‍රයන්හි උසස් අධ්‍යාපනය සහ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම හා සංවර්ධනය කිරීම පිණිස විශ්වවිද්‍යාලය මූලිකවම දේශීය ශිෂ්‍යයන්ට අවස්ථා සපයයි.

### 1.3 මූල්‍ය කාලසීමාව

2021 ජනවාරි 01 සිට 2021 දෙසැම්බර් 31 දක්වා වන මාස දොළහක කාල පරිච්ඡේදය රුහුණ විශ්වවිද්‍යාලයේ මූල්‍ය කාලපරිච්ඡේදයයි.

### 1.4 නිකුත් කිරීම සඳහා බලය පැවැරූ දිනය

2021 පෙබරවාරි 24 වන දින පැවැති විශ්වවිද්‍යාලයේ පාලන මණ්ඩලයේ 420 වන රැස්වීමේදී 2021 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා රුහුණ විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම අනුමත කොට ඒ සඳහා බලය පවරන ලදී.

### 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ පදනම

#### 1.5.1 අනුකූලතා ප්‍රකාශනය

රුහුණ විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලවය.

මෙම මූල්‍ය ප්‍රකාශන මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය, මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය, ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශ සඳහාවූ සටහන්වලින් සමන්විත වේ.

විශ්වවිද්‍යාලය විසින් යොදාගෙන ඇති සියලු ගිණුම්කරණ ප්‍රතිපත්ති ඉකුත් වර්ෂයේ ප්‍රතිපත්තිවලට අනුරූපව ඉදිරිපත් කර ඇති අතර අවශ්‍ය තන්හිදී වත්මන් වසරේ සංඛ්‍යා ඉදිරිපත් කිරීමේදී වෙනස්වීම්වලට අනුකූල වන ලෙස සංසන්දනාත්මක සංඛ්‍යාවන්ට ගැලපීම් සිදු කර ඇත. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදාගත් මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත විස්තර කොට ඇත.

#### 1.5.2 මැණීමේ පදනම

අදාළ සටහන් මගින් පැහැදිළි කර ඇති සාධාරණ වටිනාකම සම්බන්ධයෙන් යෝග්‍ය අනාවරණ කරනු ලබන අවස්ථාවන් හැරුණු විට මෙම මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනමින් පිළියෙල කර ඇත.

#### 1.5.3 සන්සන්දනාත්මක තොරතුරු

ප්‍රවර්ථන කාල සීමාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අවබෝධය ඉහළ නැංවීම සඳහා සහ අන්තර් කාලසීමා සන්සන්දනීයභාවය වැඩිදියුණු කිරීම පිණිස, මූල්‍ය ප්‍රකාශනයන්හි වාර්තා කොට ඇති සියලු මුදල් ප්‍රමාණ සඳහා පෙර කාල සීමාවට අදාළ ප්‍රමාණාත්මක, ආඛ්‍යාන සහ විස්තරාත්මක තොරතුරු ඇතුළු සන්සන්දනාත්මක තොරතුරු හෙළිදරව් කරනු ලැබ ඇත. අවශ්‍ය විටදී, ප්‍රවර්ථන වසරේ ඉදිරිපත් කිරීම සමග අනුකූල වනසේ සංසන්දනාත්මක මුදල් ප්‍රමාණ නැවත සකස් කර ඇත.

#### 1.5.4 කෘත්‍යාත්මක සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් ඒකකය

මෙම මුදල් ප්‍රකාශන මණ්ඩලයේ කෘත්‍යාත්මක සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර ඇත. ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර ඇති සියලු මූල්‍ය තොරතුරු ආසන්නතම රුපියලට වටයනය කර ඇත.

#### 1.5.5 වැදගත් ගිණුම්කරණ ඇස්තමේන්තු සහ නීන්දු

ශ්‍රී.ල.ගි.ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය වාර්තා සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම, ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වාර්තා කරනු ලැබූ වත්කම්, බැරකම්, ආදායම් අනුකූලව මූල්‍ය වාර්තා සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම, ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වාර්තා කරනු ලැබූ වත්කම්, බැරකම්, ආදායම් සහ වියදම් ප්‍රමාණ

භාවිතය කෙරෙහි බලපාන්නා වූ තීන්දු, තක්සේරු සහ උපකල්පන සිදුකිරීමට කළමණාකාරීත්වයට නියම කරයි. යෙදා ගනු ලැබූ මෙම ඇස්තමේන්තු සහ තීන්දු සැබෑ ප්‍රතිඵලවලට වඩා වෙනස්විය හැක.

ඇස්තමේන්තු සහ පාදක උපකල්පන අඛණ්ඩ පදනමකින් සමාලෝචනය කරනු ලැබේ. ගිණුම්කරණ ඇස්තමේන්තු ප්‍රතිශෝධනය කිරීම අදාළ කාලසීමාවට පමණක් බලපාන්නේ නම්, ඒවා පිළිගනු ලබන්නේ එම ඇස්තමේන්තු ප්‍රතිශෝධනය කර ඇති කාලසීමාව තුළ වනඅතර ප්‍රවර්ථන හා යම් අනාගත කාලසීමාවන්ට එම ප්‍රතිශෝධනය බලපාන්නේ නම් ප්‍රතිශෝධන කාලසීමා හා අනාගත කාලසීමාවන් සඳහාද පිළිගනු ලැබේ. ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ තීරණාත්මක තීන්දුවල යම් වෙනස්වීම් මූල්‍ය ප්‍රකාශනවල අදාළ සටහන් මගින් හෙළිදරව් කොට ඇත.

**1.5.6 අඛණ්ඩ පැවැත්ම**

විශ්වවිද්‍යාලය අඛණ්ඩ පැවැත්ම සහිතය යන පදනම මත මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කොට ඇත.

**2. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන්වල සාරාංශය**

**2.1 වත්කම් හා ඒවායේ තක්සේරු පදනම**

**2.1.1 දේපළ, පිරියත හා උපකරණ**

**(අ) පිළිගැනීම සහ මැනීම**

දේපල, පිරියත හා උපකරණ හඳුනාගනු ලබන්නේ වත්කම හා ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ විශ්වවිද්‍යාලයට ගලා ඒමේ හැකියාවක් ඇත්නම් සහ වත්කමේ පිරිවැය විශ්වසනීය මැණිය හැකිවිටදීය.

සියලු දේපළ, පිරියත සහ උපකරණ අයිතම මුලින්ම හඳුනාගෙන ඇත්තේ පිරිවැයටය. දේපල, පිරියත හා උපකරණ අයිතම ප්‍රකාශ කර ඇත්තේ පිරිවැයට හෝ එකතු වූ ක්ෂය කිරීම් හා හානි අලාභ අඩුකොට සාධාරණ වටිනාකමටය. මූලික හඳුනාගැනීමෙන් අනතුරුව ඉඩම්, රථ වාහන සහ ගොඩනැගිලි කාණ්ඩ හැර දේපළ පිරියත හා උපකරණ මණිනු ලබන්නේ සමුච්චිත ක්ෂයවීම් අඩුකර පිරිවැයටය.ඉඩම්, රථ වාහන සහ ගොඩනැගිලි තදනන්තරව මණිනු ලබන්නේ ප්‍රත්‍යාගණන ආකෘතියට වන අතර ප්‍රත්‍යාගණන දිනයට යම් තදනන්තර සමුච්චිත ක්ෂය සහ තදනන්තර සමුච්චිත හානි අලාභ අඩු කොට එහි සාධාරණ වටිනාකම වන ප්‍රත්‍යාගණනය කරන ලද වටිනාකමට දක්වනු ලැබේ.

හුවමාරු නොවන ගනුදෙනු හරහා අත්කරගත් වත්කම් එසේ අත්කරගත් දිනයට සාධාරණ වටිනාකමට හඳුනාගනු ලැබේ. දේපළ පිරියත හෝ උපකරණවලට රජයේ ප්‍රදාන, ව්‍යාපෘති, පර්යේෂණ ප්‍රදාන, අභ්‍යන්තරිකව උත්පාදිත අරමුදල් සහ පරිත්‍යාග මගින් ලබාගත් වත්කම්ද ඇතුලත් වේ. පරිත්‍යාග සහ ත්‍යාග ලෙස ලත් දේපළ, පිරියත හා උපකරණවල වටිනාකම ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති 11 ප්‍රකාරව හුවමාරු නොවන ගනුදෙනුවලින් ලත් ආදායම ලෙස හඳුනාගනු ලැබේ. අලුත්වැඩියා හා නඩත්තු පිරිවැය දරන ලද විටදී මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ හඳුනා ගනු ලැබේ.

අළුතින් බඳවා ගන්නා සිසුන්ට ඉඩ පහසුකම් සැපයීම සඳහා නව ගොඩනැගිල්ලක් ඉදි කිරීම පිණිස ඉංජිනේරු පීඨයේ විදුලි සහ තොරතුරු ඉංජිනේරු විද්‍යා අධ්‍යයනාංශයට යාබදව පිහිටි "පියොන් ආරච්චිගේ වත්ත" නම් ඉඩම අත්පත් කර ගැනීම සඳහා 25%ක අත්තිකාරමක් ලෙස බෝඵේ පෝද්දල ප්‍රාදේශීය ලේකම් වෙත රු. මිලියන 4.5ක් 2020 වර්ෂයේදී ගෙවන ලදී. එහි හිමිකාරිත්වය විශ්වවිද්‍යාලයට පවරා නොමැති බැවින්, ඉඩමේ ප්‍රතිශ්ඨාව මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගෙන නොමැත. රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් අදාළ ඉඩම රුපියල් මිලියන 18 කට තක්සේරු කර ඇත.

"කෙසෙල්ගස්හේන වත්ත" නම් අක්කර තුනක ඉඩම වෛද්‍ය පීඨය සඳහා රුපියල් මිලියන 13.28ක ප්‍රතිශ්ඨාවකට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් පවරා ගනු ලැබ ඇත. එම ප්‍රතිශ්ඨාව සමාන වාරික 60කින් ගෙවීම සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව කැමැත්ත ලබා දී ඇත. 2021.12.31 දිනට ගෙවිය යුතු ශේෂය රුපියල් මිලියන 7.74 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ඇතුළත් කර ඇත. මෙම ඉඩම සඳහා මිලදී ගැනීමේ ප්‍රතිශ්ඨාව සහ දරන ලද අනෙකුත් මූලික වියදම් ප්‍රාග්ධනීකරණය කොට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ඇතුළත් කර ඇත.

රුහුණ විශ්වවිද්‍යාලය වෙනුවෙන් අති නවීන පහසුකම්වලින් සමන්විත ආසන 1500ක ධාරිතාවයෙන් යුත් "රවීන්ද්‍රනාත් තාගෝර් අනුස්මරණ ශ්‍රවණාගාරය" ඉදිකිරීමේ ව්‍යාපෘතිය නිමා කොට 2019 පෙබරවාරි 13 වන දින විශ්වවිද්‍යාලයට බාර දෙන ලදී. ඉන්දීය රජය වෙනුවෙන් ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපයන ලද්දේ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයයි. ව්‍යාපෘතියට අදාළ බදු සහ උපදේශන ගාස්තු ගෙවීම සඳහා අරමුදල් අධ්‍යාපන අමාත්‍යාංශය

විසින් දරනු ලැබීය. ඒ අනුව ඉහත ව්‍යාපෘතිය සඳහා දරන ලද සමස්ත පිරිවැය වත්කමේ සාධාරණ

වටිනාකම ලෙස හඳුනාගනු ලැබූ අතර පහත දැක්වෙන පරිදි ප්‍රාග්ධනීකරණය කර ඇත.

| විස්තරය | මුදල රුපියල් මිලියන |
|---|---|
| ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය විසින් අරමුදල් සැපයූ වැඩවල මුළු පිරිවැය | 260.55 |
| අධ්‍යාපන අමාත්‍යාංශය විසින් දරන ලද වැට බඳු, උපදේශන සහ අනෙකුත් ගෙවීම් | 49.21 |
| **ගොඩනැගිල්ලේ මුළු හඳුනාගත් වටිනාකම** | **309.76** |

ප්‍රධාන පරිශ්‍රයේ පවතින ගොඩනැගිල්ලේ, අමුත්තන්ගේ නිවහන ගොඩනැගිල්ලේ මූලික ප්‍රතිසංස්කරණ කාර්යයන් සහ කළමනාකරණ හා මූල්‍ය පීඨයේ ගොඩනැගිලි සංකීර්ණයේ දෝෂ නිවැරදි කිරීමේ කාර්යයන් වත්මන් මූල්‍ය වසර තුළ නිමා කර ඇත. කොන්ත්‍රාත්වල සමස්ත පිරිවැය ප්‍රාග්ධනීකරණය කර මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ හඳුනාගෙන ඇත. ප්‍රධාන පරිශ්‍රයේ පවතින ගොඩනැගිල්ලේ, තනිකඩ නිල නිවාස සහ තවදුරටත් සිදුකළ යුතු ප්‍රධාන ප්‍රතිසංස්කරණ කාර්යයන් සහ කළමනාකරණ හා මූල්‍ය පීඨ ගොඩනැගිලි සංකීර්ණයේ දෙවන අදියර වසර තුළ භෞතිකව සම්පූර්ණ කර ඇති නමුත් අවසන් බිල්පත් මෙතෙක් පියවා නොමැත. ගොඩනැගිල්ලේ පිරිවැය විශ්වසනීය ලෙස මැනීමට නොහැකි වූ අතර දේපළ, පිරියත හා උපකරණ යටතේ මූල්‍ය ප්‍රකාශනයේ පිළිගෙන නොමැත.

**(ආ) තදනන්තර පිරිවැය**

වත්කම්වල ඉපැයුම් ධාරිතාවය දිගටම පවත්වා ගනු හෝ ඉහළ නැංවීම පිණිස ස්ථීර ස්වභාවයේ වත්කම් අත්කර ගැනීම, ව්‍යාප්ත කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා දරන ලද තදනන්තර වියදම ප්‍රාග්ධන වියදම් ලෙස සලකා ඇත. ප්‍රධාන පරීක්ෂාකිරීම් සහ පූර්ණ අළුත්වැඩියා ඇතුළුව වෙනම ගිණුම් තබා ඇති දේපළ, පිරියත හෝ උපකරණ අයිතමයක සංරචකයක් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා දරන ලද වියදම ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ. අනෙකුත් තදනන්තර පිරිවැය ප්‍රාග්ධනීකරණය කරනු ලබන්නේ එම කොටස තුළ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ විශ්වවිද්‍යාලයට ගලා ඒමට හැකියාවක් ඇත්නම් සහ අයිතමයේ පිරිවැය විශ්වසනීය ලෙස මැණිය හැකිනම් පමණි.

**(ඇ) දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය**

වෘත්තීමය සුදුසුකම් ලත් තැනැත්තෙකු විසින් 2006 වසරේදී ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කරනු ලැබීය. ප්‍රත්‍යාගණනය කරනු ලැබූ අවස්ථාවේදී ගිණුම්ගත කරනු නොලැබූ ඉඩම්.එම ඉඩම් අත්පත් කරගත් අවස්ථාවේදී පැවැති අනුපාතයන් භාවිතා කරමින් තක්සේරු කොට ගිණුම්ගත කරන ලදී.

මුළු වාහන ඇණියම රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ වෘත්තිකයකු විසින් 2020 සහ 2021 වර්ෂ තුළදී ප්‍රත්‍යාගණනය කරන ලදී. ප්‍රත්‍යාගණනය කරන ලද වාහනවලින් ඇතිවූ ප්‍රත්‍යාගණන අතිරික්තය ප්‍රත්‍යාගණන සංචිතයට මාරු කරනු ලැබූ අතර මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ සමුච්චිත අරමුදලේ සහ සංචිතයේ අන්තර්ගත කර ඇත.

**(ඈ) ක්ෂයවීම**

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ ක්ෂයවීම හඳුනාගනු ලබන්නේ දේපළ, පිරියත සහ උපකරණ අයිතමයන් භාවිතයට ගනු ලැබූ දිනයේ සිට ඒවායේ ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා සරල රේඛීය ක්‍රමයටය. ඉඩම් ක්ෂය කරනු නොලැබේ.

වත්කම ප්‍රයෝජනය සඳහා ගත් මාසයේ සිට වත්කමක ක්ෂයවීම ආරම්භ වන අතර වත්කම හඳුනාගැනීම ඉවත් කරනු ලැබූ හෝ පූර්ණව ක්ෂය කරනු ලැබූ මාසයේ එය අවසන් වේ. ව්‍යාපෘති හා පර්යේෂණ ප්‍රදාන සහ සීමිත අරමුදලින් මිලදී ගනු ලැබූ දේපළ, පිරියත හා උපකරණ ක්ෂයවීම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට වැය බරක් වේ.

ඒවායේ ප්‍රයෝජනවත් ජීවිත කාලය පහත දැක්වෙන පරිදි වේ.

| වත්කම් කාණ්ඩය | ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීවිත කාලය |
|---|---|
| ගොඩනැගිලි | වසර 20 |
| ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | වසර 10 |
| දුරකථන භූවමාරුව | වසර 10 |
| ජල සැපයුම | වසර 10 |
| කාර්යාල උපකරණ | වසර 05 |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | වසර 05 |
| පරිගණක හා උපාංග | වසර 05 |
| ක්‍රීඩා භාණ්ඩ | වසර 05 |
| විද්‍යාගාර හා ඉගැන්වීම් උපකරණ | වසර 05 |
| පුස්තකාල පොත් සහ වාර ප්‍රකාශන | වසර 05 |
| රථ වාහන | වසර 05 |
| ලෝගු | වසර 05 |

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව පිරිවැය ආකෘතිය මත පදනම්ව හඳුනාගනු ලබන පූර්ණව ක්ෂයකරනු ලැබූ වත්කම්වල පිරිවැය

2021 දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 1,322 ක් විය.

**(ඉ) හඳුනාගැනීම ඉවත්කිරීම**

දේපළ, පිරියත හා උපකරණ අයිතමයක් භාවිතා කිරීම හෝ බැහර කිරීම මත අනාගත ප්‍රතිලාභ කිසිවක් අපේක්ෂා නොකරන විට එහි හඳුනාගැනීම ඉවත් කරනු ලැබේ. රථ වාහන හැර වත්කමක හඳුනාගැනීම ඉවත්කිරීම මගින් ඇතිවන කිසියම් ලාභයක් හෝ අලාභයක් ශුද්ධ බැහැර කිරීම් උත්පාදන සහ ධාරණ වඩිනාකම අතර වෙනස ලෙස ගණනය කරන අතර වත්කමේ හඳුනාගැනීම ඉවත් කළ වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ ඇතුලත් කරනු ලැබේ.

### 2.1.2 මූල්‍ය කල්බදු

කල්බදු නියමයන් මගින් භිමිකාරිත්වයේ සියලු අවදානම් සහ ප්‍රතිලාභ බදු ගැනුම්කරුට සාරනුකුලව පවරනු ලැබූ විටදී ඒවා මූල්‍ය කල්බදු ලෙස වර්ගීකරණය කරනු ලැබේ. 2020 වර්ෂය තුළ අශොක් ලේලන්ඩ් බස් රථයේ (NC 4780)) සහ ටොයොටා කැම්රි මෝටර් රථයේ (CAP 7905) කල් බදු සඳහා මූල්‍ය කල්බදු බැඳීම් වර්ෂය තුළදී මුළුමණින්ම පියවූ අතර කල්බදු ගත් වත්කම්වල භිමිකාරිත්වය විශ්වවිද්‍යාලයට පවරන ලදී. වර්ෂයේ අවසාන දිනයේදී කල්බදු සැකසුම්වලින් මතුවන කිසිදු ප්‍රාග්ධන බැඳීමක් නොවීය.

### 2.1.3 නොනිමි වැඩ සහ පුනරුත්ථාපනය

නොනිමි ප්‍රාග්ධන වැඩ සහ පුනරුත්ථාපනය පිරිවැයට ප්‍රකාශ කොට ඇත. මේවා ප්‍රාග්ධනායනය කිරීමට තිබෙන්නා වූ දේපළ, පිරියත හා උපකරණ ඉදිකිරීමේදී හා වැඩි දියුණුකිරීමේදී සෘජුවම දරන ලද ප්‍රාග්ධන ස්වරූපයේ වියදම් වේ. මූළු පිරිවැය විශ්වසනීය ලෙස මණිනු ලබන විටදී සහ වත්කම භාවිතය සඳහා ඇති විටදී නොනිම ප්‍රාග්ධන වැඩ සහ පුනරුත්ථාපන වියදම් දේපළ, පිරියත හා උපකරණවල අදාළ වත්කම් කාණ්ඩයට මාරු කරනු ලැබේ. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දිනයට හඳුනාගැනීමේ නිර්ණායක සපුරනු නොලැබූ වසර තුළ දරන ලද ප්‍රාග්ධන වියදම් නොනිමි ප්‍රාග්ධන වැඩ සහ පුනරුත්ථාපන ලෙස පෙන්වා ඇත.

### 2.1.4 අස්පෘශ්‍ය වත්කම්

වත්කමට ආරෝපණය කළ හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ හෝ සේවා විභවය විශ්වවිද්‍යාලයට ගලා ඒමට හැකියාවක් ඇත්නම් සහ අස්පෘශ්‍ය වත්කමේ පිරිවැය විශ්වාසනීය ලෙස මිණිය හැකි නම් අස්පෘශ්‍ය වත්කමක් හඳුනාගනු ලැබේ. වෙන වෙනම අත් කර ගනු ලබන සියලු අස්පෘශ්‍ය වත්කම් මුලින්ම පිරිවැයට මණිනු ලැබේ. අනතුරුව ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති 20 ප්‍රකාරව පිරිවැය ආකෘතිය යටතේ යම් සමුච්චිත ක්‍රමක්ෂයක් පිරිවැයට දක්වනු ලැබේ. හුවමාරු නොවන ගනුදෙනුවකින් අත්කර ගත් අස්පෘශ්‍ය වත්කම්වල පිරිවැය හුවමාරුවේ දිනයට ඒවායේ සාධාරණ වටිනාකම වේ.

පරිමිත ආයු කාලයක් ඇති සියලු අස්පෘශ්‍ය වත්කම් ප්‍රයෝජනවත් ජීවිත කාලය මත සරල රේඛීය ක්‍රමයට ක්‍රමක්ෂයකරනු ලබන අතර පහත දැක්වෙන පරිදි මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට වැය බරක් වේ.

**(අ) පරිගණක මෘදුකාංග**

අත් කර ගනු ලැබූ පරිගණක මෘදුකාංග බලපත්‍ර ඒවා අත් කර ගැනීමට සහ භාවිතයට ගැනීමට දරන ලද පිරිවැය මත පදනම්ව ප්‍රාග්ධනගත කරනු ලැබේ. එම පිරිවැය පස් (5) වසරක් වූ ඒවායේ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා සරල රේඛීය ක්‍රමයට ක්‍රමක්ෂය කරනු ලැබේ.

**(ආ) මානව ප්‍රාග්ධනය සංවර්ධනය සහ තත්ත්ව ආරක්ෂණ වියදම්**

මානව ප්‍රාග්ධන සංවර්ධනයෙන් සහ තත්ත්ව ආරක්ෂණයෙන් මතුවන අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයට ඇත්තේ ප්‍රමාණවත් නොවන පාලනයක් බැවින්,මෙම අයිතම සඳහා වන පිරිවැය අස්පෘශ්‍ය වත්කම්වල නිර්වචනය සපුරාලයි. මානව ප්‍රාග්ධන සංවර්ධනය සහ තත්ත්ව ආරක්ෂණ සඳහා දරන ලද ප්‍රාග්ධන ස්වරූපයේ සියලු වියදම් එසේ දරනු ලැබූ විටදී වියදමක් ලෙස හඳුනාගන්නා අතර මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ වැය බරක් සේ දක්වනු ලැබේ.

**(ඇ) අභ්‍යන්තරව උත්පාදක අස්පෘශ්‍ය වත්කම්**

**පර්යේෂණ වියදම්**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති 20 ප්‍රකාරව, පර්යේෂණ අදියරෙන් මතුවන කිසිදු අස්පෘශ්‍ය වත්කමක් හඳුනා නොගත යුතු අතර පර්යේෂණ වියදම් දරන ලද විටදී වියදමක් ලෙස හඳුනාගත යුතුය. ඒ අනුව, පර්යේෂණ සඳහා දරන ලද සියලු වියදම් එසේ දරන ලද වියදමක් ලෙස හඳුනා ගන්නා අතර මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ වැය බරක් සේ දක්වනු ලැබේ.

**(ඇ) සංවර්ධන වියදම්**

අභ්‍යන්තරව සංවර්ධිත සියලු අස්පෘශ්‍ය වත්කම් හඳුනාගනු ලබන්නේ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති 20හි 55 වන වගන්තිය ප්‍රකාරව පිළි සැකසුම් නිර්ණායක සපුරාලන්නේ නම් පමණි.

**2.1.5 ආයෝජන**

ස්ථාවර තැන්පතු සහ ඉතුරු කිරීම් ගිණුම් ආශ්‍රිත ආයෝජන පිරිවැයට ප්‍රකාශ කරනු ලබන අතර, කෙටි කාලීන අරමුදල්වල ආයෝජන මත උපචිත වූ පොළිය මූල්‍ය ප්‍රකාශනයේ ලැබිය යුතු දෙයක් ලෙස ගිණුම් ගත කරනු ලබන අතර පරිත්‍යාග අරමුදල්, නම් කළ අරමුදල් සහ ව්‍යාපෘති උපලබ්ධිවීම වීම මත හඳුනාගෙන අදාළ පරිසීමිත අරමුදල් ගිණුමට බැර කරන අතර මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ඇතුළත් කරනු ලැබේ.

**2.2 වට්ටෝරු භාණ්ඩ**

**2.2.1 වට්ටෝරු භාණ්ඩ (තොග)**

අභාවිත අයිතම සඳහා නිසි ගැලපීම් සිදුකිරීමෙන් පසු වට්ටෝරු භාණ්ඩ පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගයෙන් වඩා අඩු අගයට ප්‍රකාශ කර ඇති අතර පිරිවැය තීරණය කරනු ලැබුයේ ප්‍රථමයෙන් ලැබූ ප්‍රථමයෙන් නිදහස් කළ පදනමිනි. මෙම පිරිවැයට තොග භාණ්ඩ අත්කර ගැනීමේ සහ ඒවා දැනට තිබෙන ස්ථානයට සහ තත්ත්වයට ගෙන ඒමට දරන ලද වියදම ද ඇතුළත්ය. විශ්වවිද්‍යාලයේ වට්ටෝරු භාණ්ඩවලට ලිපිද්‍රව්‍ය, පාරිභෝජ්‍ය ද්‍රව්‍ය, නඩත්තු තොග සහ වෛද්‍ය තොග ඇතුළත් වේ.

**2.2.2 පශු සම්පත්**

කෘෂිකර්ම පීඨයේ ගොවිපොළ විසින් කළමනාකරණය කරනු ලබන කෘෂිකාර්මික ක්‍රියාකාරකම් සඳහා යොදා ගනු ලබන ජීවී සතුන්ගෙන් පශු සම්පත් සමන්විත වේ. මූලික හඳුනා ගැනීම මත සහ එක් එක් වාර්තාකරණ දිනයට විකිණීම සඳහා පිරිවැය අඩුකොට සාධාරණ වටිනාකමට පශු සම්පත් මනිනු ලැබේ. පශු සම්පත්වල සාධාරණ වටිනාකම තීරණය කරනු ලැබුයේ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ප්‍රකාශිත අනු ප්‍රමාණ සහ සමාන වත්කම්වල

වත්මන් වෙළඳපොළ මිල පදනම්වය. පශු සම්පතක් එහි සාධාරණ වටිනාකමට සහ සාධාරණ වටිනාකමේ වෙනස්වීම්වලට හඳුනාගැනීම මත පැන නගින ලාභයක් හෝ පාඩුවක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති 18 ප්‍රකාරව එය පැන නැගුණු කාල සීමාව සඳහා අතිරික්තයේ හෝ හිඟයේ ඇතුලත් කරනු ලැබේ.

**2.2.3 එලදා තොග**

එලදා තොග කෘෂිකර්ම ගොවිපොළේ නෙලාගත් නිෂ්පාදනවලින් සමන්විත වේ. එලදා තොග සත්‍යාපනයේ දිනයට වෙළඳපොළ මිල මත පදනම් වේ.

**2.2 මුදල් හා මුදල් සමාන දෑ**

අතැති මුදල්, ජංගම ගිණුමේ ඇති මුදල්, කාල තැන්පතු සහ ඉල්ලීම මත ගෙවිය යුතු බැංකු ණය ගැනුම්වලින් ප්‍රමාණ මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ. එහෙත්, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කිරීමේ කාර්යය සඳහා, ශිෂ්‍යත්ව සහ රන් පදක්කම් තැන්පතු වැනි පරිසීමිත මුදල් තැන්පතු මුදල් හා මුදල් සමාන දෑවල කොටසක් ලෙස හඳුනාගනු නොලැබේ..

2021 වර්ෂය තුළ විශ්වවිද්‍යාලය පහත දැක්වෙන පරිසීමිත බැංකු ගිණුම් පවත්වාගෙන යන ලදි.

| බැංකු ගිණුමේ නම | ගිණුම් අංකය | අරමුදල් අධිකාරිය | කාර්යය |
|---|---|---|---|
| නෝහෙඩ් CPDS ව්‍යාපෘතිය | මහජන බැංකුව/ 032-1001-900-42806 | නොරාඩ් | නොහෙඩ් ව්‍යාපෘතිය ප්‍රකාරව පීඨ, දර්ශනශූරී විද්වතුන්, විද්‍යාපති ශිෂ්‍යයන් සහ අධ්‍යයන කාර්ය මණ්ඩලය හුවමාරුව, සුළු පර්යේෂණ ව්‍යාපෘති, ඒකාබද්ධ ප්‍රකාශන, සම්පදස්ථ සමාලෝචිත සඟරා ආදිය සඳහා විධිවිධාන සපයයි. |
| නෝහෙඩ් දේශගුණික විපර්යාස ව්‍යාපෘතිය | මහජන බැංකුව/ 032-1001-000-44126 | නොරාඩ් | ශ්‍රී ලංකාවේ ධීවර සහ ජලජීවී වගා කළමනාකරණයට දේශගුණික වෙනස්වීම් සහ පාරිසරික පද්ධති ප්‍රවේශ අන්තර්ගත කරයි. |
| දකුණු චීන සාගර ආයතන ව්‍යාපෘතිය | මහජන බැංකුව/ 032-1001-100-42592 | දකුණු චීන සාගර විද්‍යා ආයතනය | අධ්‍යාපනය සහ පර්යේෂණ සඳහා චීන- ශ්‍රී ලංකා ඒකාබද්ධ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා අධ්‍යාපන සහයෝගිතාව ඇති කරයි. |
| AHEAD OTS ව්‍යාපෘතිය | මහජන බැංකුව 032-1-001-000-2-0053209 | ලෝක බැංකුව | ප්‍රමුඛතා ශික්ෂාවන් සඳහා බඳවාගැනීම් පුළුල් කරයි, උපාධි වැඩසටහන්වල ගුණාත්මකබව ඉහළ නංවයි, උසස් අධ්‍යාපන අංශයේ පර්යේෂණ හා නවෝත්පාදන ප්‍රවර්ධනය කරයි. |
| BRIATE ව්‍යාපෘතිය යුරෝ | ලංකා බැංකුව/84869161 | යුරෝපීය කොමිෂම | උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යයන, කළමනාකරණ, පරිපාලන සහ තාක්ෂණික කාර්ය මණ්ඩලයේ පාර්ශවකරුවන්ගේ නිපුණතා සහ කුසලතා, කළමනාකරණ, පාලන සහ නව්‍යකරණ ධාරිතා ඉහළ නැංවීම |
| ත්‍රී ලංකා ව්‍යාපෘතිය (යුරෝ) | ලංකා බැංකුව/0086439101 | යුරෝපීය කොමිෂම | ශ්‍රී ලංකාවේ පුනර්ජනනීය බලශක්ති පුහුණු කේන්ද්‍රයක් සඳහා ව්‍යාපෘතිය ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා විදේශ මුදල් ගනුදෙනු සහ ශ්‍රී ලංකා රුපියල්වලින් දේශීයය වියපැහැදීම් ගෙවීම සඳහා පහසුකම් සැපයීම (ත්‍රී ලංකා) |

## 2.4 බැරකම් හා ප්‍රතිපාදන

### 2.4.1 බැරකම්

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දිනය වන විට දන්නා සියලු බැරකම් මූල්‍ය වාර්තාවන්හි අන්තර්ගත කර ඇති අතර ඉල්ලුම මත හෝ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දින සිට වසරක් තුළ ගෙවීමට නියමිතව ඇති බැඳීම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ජංගම බැරකම් ලෙස සලකනු ලැබේ.. මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයේ දින සිට වසරකින් පසුව ගෙවිය යුතු බැරකම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ජංගම නොවන බැරකම් ලෙස සලකනු ලැබේ.

### 2.4.2 ප්‍රතිපාදන

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස විශ්වවිද්‍යාලයට බැඳීමක් ඇති විටදී සහ බැඳීම නිරාකරණය සඳහා ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලායාමත් අවශ්‍ය කරනු ලැබීමට ඉඩ ඇති විටදී සහ බැඳීම විශ්වසනීය ලෙස මැණිය හැකි විටදී මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ප්‍රතිපාදන පිළිගනු ලැබේ.

### 2.4.3 ප්‍රාග්ධන බැඳීම් සහ අසම්භාව්‍යතා

අසම්භව්‍යතා යනු අතීත සිදුවීමකින් පැන නගින විභව්‍ය වත්කම් හෝ බැඳීම් වන අතර විශ්වවිද්‍යාලයේ පාලනයෙන් පරිබාහිර අවිනිශ්චිත අනාගත සිදුවීම් හට ගැනීමෙන් හෝ හට නොගැනීමෙන් පමණක් සනාථ කරනු ලබනු ඇත. අසම්භාව්‍යතා වගකීම් සහ ප්‍රාග්ධන බැඳීම් විශ්වවිද්‍යාලය හඳුනා නොගන්නා නමුත් ආර්ථික ප්‍රතිලාභ හෝ සේවා විභවය මූර්තිමත් කරන්නා වූ සම්පත් ගලා යාමක හෝ ගලා ඒමක භව්‍යතාව දුරස්ථ නම් හැර, යම් අසම්භාව්‍යතාවක් පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්වල හෙළිදරව් කරනු ලැබේ.

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දිනයට පහත දැක්වෙන නඩු හබ අඛණ්ඩව පැවැති අතර නඩුකීම් ක්‍රියාකාරකම්වලින් මතුවන බැඳීම්වලට අදාළව ගිණුම්වල කිසිදු ප්‍රතිපාදනයක් සලසා නොමැත.

නඩු සංඛ්‍යාව

| නඩු වර්ගය | නඩු සංඛ්‍යාව |
|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණ නඩු | 09 |
| අභියාචනාධිකරණ නඩු | 08 |
| පළාත්බද මහාධිකරණ නඩු | 03 |
| සිවිල් අභියාචනා මහාධිකරණය | 01 |
| දිසා අධිකරණ නඩු | 01 |
| කම්කරු විනිශ්චය සභා | 01 |
| සේවක වන්දි විනිශ්චය සභා | 01 |
| විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය | 04 |
| අභ්‍යන්තර විමර්ශන | 11 |

**නඩු පිළිබඳ විස්තරාත්මක ලැයිස්තුව**

| නඩු අංකය | අදාළ පාර්ශවය |
|---|---|
| **ශේෂ්ඨාධිකරණයේ නඩු** | |
| SC/FR/232/16 | වී.ජී.එස් විජිත් කුමාර මයා |
| SC/FR/235/16 | පූජ්‍ය සංඛපාල පඤ්ඤාසාර ථේර |
| SC/FR/236/16 | පූජ්‍ය කොටියාගල උපරත්න ථේර |
| SC/FR/308/17 | මහාචාර්ය කේ.ජී.අමරසේකර |
| SC/FR/74/20 | හිරෝෂිණී පියදාස මිය |
| SC/FR/267/20 | ඒ.ඩබ්. නිරාෂා මෙය |
| SC/SP/LA/74/21 | බී.පී.එදිරිසිංහ මහතා සහ තවත් පස් දෙනෙකු |
| SC/FR/309/21 | මහාචාර්ය කේ.ජී.අමරසේකර |
| SC/FR/431/21 | බී.එච්.ඩී. පෙරේරා මිය |
| **අභියාචනාධිකරණයේ නඩු** | |
| CA/404/Writ/19 | ඉන්දික විදානපතිරණ මහතා |
| CA/408/Writ/19 | ඒ.ඩබ්.පී. ද සිල්වා මහතා |
| CA/562/Writ/21 | මධුශංක බණ්ඩාර මහතා |
| CA/230/Writ/20 | සම්මානිත මහාචාර්ය ඩබ්.එම්.එම්.පී. විජේරත්න |
| CA/231/Writ/20 | ආචාර්ය විනීතා විජේරත්න මිය |
| CA/232/Writ/20 | සම්මානිත මහාචාර්ය ඩබ්.ඩබ්.ඩී.ඒ. ගුණවර්ධන |
| CA/233/Writ/20 | සම්මානිත මහාචාර්ය ආර්.එච්.එස්. රාජපක්ෂ |
| CA/234/Writ/20 | සම්මානිත මහාචාර්ය පී.ආර්.ටී. කුමාරතුංග මයා |
| **සිවිල් අභියාචනා මහාධිකරණය** | |
| SP/HCCR/MR/32/2018 | ආචාර්ය දර්ශන වික්‍රමසිංහ මයා |
| **පළාත්බද මහාධිකරණයේ නඩු** | |
| HC/230/2020/Appeal | එච්.ආර්. ගාමිණී මයා |
| HC/1454/2020/Appeal | ආචාර්ය ඩබ්ලිව්. වික්‍රමසිංහ මයා |
| CHC/3/2020/MR | ලංකා ඉංජිනියරින් (පුද්) සමාගම |
| **දිසා අධිකරණ නඩු** | |
| M/18531 | කේ.වයි.එස්. සෙකියුරිටි සර්විසස් |
| **කම්කරු විනිශ්චය සභා නඩු** | |
| LT/04/36/20 | හිරෝෂිණී පියදාස මිය |
| **සේවක වන්දි විනිශ්චය සභා** | |
| C/03/158/MTR | එල්.පී.චන්ද්‍රලතා මිය |
| **විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය** | |
| USAB 889 | වී.ජී.එස් විජිත් කුමාර මයා |
| USAB 893 | පූජ්‍ය සංඛපාල පඤ්ඤාසාර ථේර |
| USAB 892 | පූජ්‍ය කොටියාගල උපරත්න ථේර |
| USAB 1038 | ජී.ජී.ඩී.ඩි. ගුණවර්ධන |

**i. නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම - විශ්‍රාම පාරිතෝෂිකය**

නිර්වචිත ප්‍රතිලාභ සැලැසම් යනු නිර්වචිත දායකත්ව සැලැස්මක් නොවන පශ්චාත් රැකියා නියුක්තික ප්‍රතිලාභ සැලැස්මකි. ඒ අනුව 1983 අංක 12 දරන පාරිතෝෂික පනතේ විධිවිධාන යටතේ පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන සලසා ඇත. පාරිතෝෂික වගකීම සඳහා බාහිරින් අරමුදල් සපයනු නොලබන අතර ආයුගණකව තක්සේරු නොකරයි. 2019 ජූනි 04 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අංක 05/0219 චක්‍රලේඛය අනුව කාර්ය මණ්ඩලය සඳහා ගෙවනු ලබන අධ්‍යයන දීමනාව සහ මාසික හානිපූරක දීමනාව, 1983 අංක 12 දරන පාරිතෝෂික පනත ප්‍රකාරව 2019 ජූනි 01 සිට බල පැවැත්වෙන පරිදි අධ්‍යයන කාර්යමණ්ඩල සහ අනධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයන් සඳහා පාරිතෝෂික ගණනය කිරීමේදී සලකා බලනු ලැබේ.

| විස්තරය | මුදල මිලියන (රු.) |
|---|---|
| වර්ෂය ආරම්භයේදී ශේෂය | 1,5331.34 |
| වර්ෂය තුළ සලසන ලද ප්‍රතිපාදනය | 141.77 |
| වර්ෂය තුළ සිදු කළ ගෙවීම් | (96.44) |
| **වර්ෂය අවසානයේදී ශේෂය** | **1,578.07** |

**ii. නිර්වචිත දායකත්ව සැලැස්ම - විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල, සේවක භාරකාර අරමුදල සහ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය**

නිර්වචිත දායකත්ව සැලැස්මක් යනු පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ සැලැස්මක් වන අතර එහිදී අස්තිත්වයක් ස්ථීර දායක මුදලක් වෙනම අස්තිත්වයක් වෙත ගෙවන අතර තවත් වැඩිපුර මුදලක් ගෙවීම සඳහා නෛතික හෝ සම්මුතික බැඳීමක් නොමැත. නිර්වචිත දායකත්ව සැලසුම් සඳහා බැඳීම් ඒවා ලැබීමට නියමිත විටදී මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ වියදමක් ලෙස හඳුනාගනු ලැබේ.

අදාළ ව්‍යවස්ථාපිත නීති සහ රෙගුලාසි ප්‍රකාරව සේවකයන් 'විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල', සේවක භාරකාර අරමුදලේ දායකත්ව මුදල් සහ විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල සඳහා සුදුසුකම් ලබයි. ඒවා දැරූ විටදී මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ වියදමක් ලෙස හඳුනාගනු ලැබේ. සේවකයන්ගේ දළ පඩිනඩිවලින් 8%, 3%, සහ 7% ක් විශ්වවිද්‍යාල අර්ථසාධක, විශ්වවිද්‍යාල භාරකාර අරමුදල සහ විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල වෙත විශ්වවිද්‍යාලය දායක කරයි.

## 2.5 පරිසීමිත අරමුදල් සහ ප්‍රදාන

හඳුනාගත් ව්‍යාපෘතියක හෝ ක්‍රියාකාරකමක භාවිතය සඳහා ප්‍රදාන/පරිත්‍යාග ලැබුණු විටදී, එවැනි අරමුදල් පරිසීමිත අරමුදල ගිණුමක රඳවා ගනු ලබන අතර භාවිතයට නොගත් අරමුදල් ඒවායේ අදාළ අරමුදල් ගිණුම්වල රඳවාගෙන ඒවා අවශ්‍ය වන තෙක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ සමුච්චිත අරමුදල් සහ සංචිත යටතට ඇතුලත් කරනු ලැබේ. එවැනි අනුමත ප්‍රදානයක වියදම ලැබුණු ආදායම ඉක්මවා යන විටදී සහ ශේෂය ලැබෙන බවට නියතතාවක් ඇති විටදී, එම මුදල් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ලැබිය යුතු දෑ ලෙස හඳුනාගනු ලබයි.

## 2.6 නම්කළ අරමුදල්

පාලන මණ්ඩලයේ අනුමතිය ඇතිව යම් විශේෂිත කාර්යයක් සඳහා විශ්වවිද්‍යාලය විසින් නම්කළ යම් අරමුදලක් නම්කළ අරමුදලක් ලෙස හඳුනාගනු ලැබේ. අභාවිත අරමුදල් අදාළ අරමුදල් ගිණුම්වල රඳවා ගනු ලබන අතර ඒවා අවශ්‍ය වන තෙක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ සමුච්චිත අරමුදල් සහ සංචිත යටතට ඇතුලත් කරනු ලැබේ.

## 2.7 පරිත්‍යාග අරමුදල්

පරිත්‍යාගයක් ලෙස වත්කම් ලැබෙන විටදී, එවැනි වත්කම්වලින් උපයන ආදායම් පමණක් හඳුනාගැනීමට සහ ආදායමක් ලෙස භාවිතා කිරීමට ඉඩ ඇත. ඉහත එක් එක් කාණ්ඩ යටතේ පවතින අරමුදල්වලින් උපලබ්ධි වන අයෝජන ආදායම සහ අනෙකුත් ප්‍රතිලාභ, අදාළ ගිවිසුම් හෝ කාර්යසටහන්වලින් අන්‍යාකාරයෙන් විධිවිධාන සලස්වා ඇත්තේ නම් මිස, උචිත අරමුදල්වලට වෙන්කරනු ලැබේ.

තැන්පතු යටතේ රඳවා ගන්නා රන් පදක්කම් සහ ශිෂ්‍යත්ව වැනි පරිත්‍යාග අරමුදල් ප්‍රතිවර්ගීකරණය කොට සමුච්චිත අරමුදල් සහ සංචිත යටතේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ පරිත්‍යාග අරමුදල් යටතේ ඉදිරිපත් කරනු ලැබේ.

## 2.8 උසස් අධ්‍යාපනය ව්‍යාප්තිය සහ සංවර්ධනය කඩිනම් කිරීමේ (AHEAD) ප්‍රදානය

ප්‍රමුඛ ශික්ෂාවන් සඳහා බඳවාගැනීම් පුළුල් කිරීම, උපාධි වැඩසටහන්වල ගුණාත්මකබව ඉහළ නැංවීම සහ උසස් අධ්‍යාපන ක්ෂෙත්‍රයේ පර්යේෂණ හා නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් උසස් අධ්‍යාපනය ව්‍යාප්තිය සහ සංවර්ධනය කඩිනම් කිරීමේ මෙහෙයුම ශ්‍රී ලංකා රජය සඳහා ලෝක බැංකුව අරමුදල් සපයනු ලබන ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වනුයේ අධ්‍යාපන අමාත්‍යාංශයයි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ මෙහෙයුම් අධීක්ෂණ සහ උපකාරක කණ්ඩායම විශ්වවිද්‍යාල තුළ ව්‍යාපෘති ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කරයි.

ඉහත ව්‍යාපෘතිය රුහුණු විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් තාක්ෂණික ලේකම් කාර්යාලය (OTS) හරහා වෙනමම ක්‍රියාත්මක කරනු ලබන බැවින්, AHEAD මෙහෙයුම්වල ප්‍රදාන ලැබීම් සහ වියදම් මූල්‍ය ප්‍රකාශනයේ අන්තර්ගත කර නොමැත. කෙසේ වෙතත් දේපළ, පිරියත හා උපකරණ, නිමා කරන ලද ඉදිකිරීම් වැඩ සහ මානව ප්‍රාග්ධන සංවර්ධන වියදම් ඇතුළුව මෙම ප්‍රදානය හරහා අත්කර ගත් ප්‍රාග්ධන වත්කම්, ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති 11 ප්‍රකාරව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ හුවමාරු නොවන ගනුදෙනුවලින් ලත් ආදායම ලෙස හඳුනා ගනු ලබන අතර මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ප්‍රාග්ධන අතිරික්තය/(හිඟය) යටතේ දක්වනු ලැබේ.

2018 සිට 2021 දක්වා කාලසීමාව තුළ, AHEAD ව්‍යාපෘතිය යටතේ රුහුණ විශ්වවිද්‍යාලයට ප්‍රදාන කිහිපයක් පිරිනමා ඇති අතර අවසන් වූ වර්ෂය සඳහා එක් එක් උප වැඩසටහනේ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ සාරාංශයක් පහත දක්වා ඇත.

| ප්‍රදාන විස්තරය | පීඨය/අධ්‍යනාංශය | අනුමත ප්‍රදානය (රු.) | 2021.12.31 දක්වා නිකුත් කරන ලද අක් මුදල් | 2021.12.31 දක්වා සමුච්චිත වියදම |
|---|---|---|---|---|
| STEM ව්‍යාප්තිය- දේශන ශාලාව ඉදිකිරීම ගොඩනැගිලි සංකීර්ණය, තාක්ෂණ පීඨය | | 390.00 | 327.92 | 327.92 |
| STEM ව්‍යාප්තිය උපකරණ (01,02 සහ 03 වටය) | වෛද්‍ය<br>තාක්ෂණවේදය<br>ඉංජිනේරු | 90.00<br>130.00<br>90.00 | 243.98 | 254.32 |
| HRD ආචාර්ය උපාධි ශිෂ්‍යත්වය | ආචාර්ය උපාධිධාරී විද්‍යාර්ථීන් (අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් 14) | 115.97 | 65.10 | 66.73 |
| ELTA – ELSE පීඨ සංවර්ධන ව්‍යාපෘතිය | විද්‍යා<br>කළමනාකරණ<br>රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යනාංශය | 120.00<br>120.00<br>18.00 | 121.33 | 81.51<br>53.55<br>13.11 |
| ELTA – ELSE අධ්‍යනාංශ සංවර්ධන ව්‍යාපෘතිය | කෘෂි ආර්ථික විද්‍යා අධ්‍යනාංශය<br>රසායන විද්‍යා අධ්‍යනාංශය<br>භූගෝල අධ්‍යනාංශය | 18.00<br>18.00<br>18.00 | 33.28 | 5.88<br>8.96<br>10.29 |
| විශ්වවිද්‍යාල ව්‍යාපාරික සබැඳිය | තාක්ෂණික පැවැරුම් කාර්යාලය | 13.00 | 5.29 | 5.13 |
| නව්‍යකරණ වාණිජකරණ අභිවර්ධනය | භෞතික වද්‍යා අධ්‍යනාංශය | 40.00 | 32.22 | 31.56 |
| පර්යේෂණ, නව්‍යකරණය සහ වාණිජකරණය | පරිගණක විද්‍යා අධ්‍යනාංශය<br>රසායන විද්‍යා අධ්‍යනාංශය | 35.00<br>40.00 | 19.12<br>11.36 | 19.39<br>11.04 |
| සංවර්ධන දිශානත පර්යේෂණ | රසායන විද්‍යා අධ්‍යනාංශය<br>උද්භිද විද්‍යා අධ්‍යනාංශය,<br>ජෛව රසායන අධ්‍යනාංශය,<br>වෛද්‍ය පීඨය | 40.00<br>40.00<br>35.00 | 53.88 | 10.93<br>28.92<br>22.38 |
| OTS කාර්යමණ්ඩල වැටුප් | | අදාළ නොවේ | 13.50 | 13.54 |
| ලැබීමට නියමිත ප්‍රදාන | | | 38.18 | |
| **මුළු එකතුව** | | **1,370.97** | **965.16** | **965.16** |

*STEM - විද්‍යාව, තාක්ෂණවේදය,ඉංජිනේරු විද්‍යාව සහ ගණිතය
ELTA- ELSE - ඉගෙනුම් අභිවර්ධනය, ඉගැන්වීම් ඇගයීම සහ ඉංග්‍රීසි භාෂා නිපුණතා අභිවර්ධනය

### 2.9 ආදායම හඳුනාගැනීම

වර්ෂය තුළ විශ්වවිද්‍යාලය වෙත ලැබුණු සහ ලැබිය යුතු ආර්ථික ප්‍රතිලාභ හෝ සේවා විභවයේ දළ ගලා ඒම්වලින් ආදායම සමන්විත වන අතර ශුද්ධ වත්කම්/ස්කන්ධවල වැඩිවීමක් නිරූපණය කරයි. ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති 10හි (හුවමාරු ගනුදෙනුවලින් ආදායම) සහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති 11හි (හුවමාරු නොවන ගනුදෙනුවලින් ආදායම) නිර්ණායක අනුගමනය කරමින් විශ්වවිද්‍යාලය ආදායම හඳුනා ගනියි.

#### 2.9.1 හුවමාරු ගනුදෙනුවලින් ආදායම

**(අ) උපාධි අපේක්ෂක සහ වෙනත් අභ්‍යන්තර ආදායම**

උපාධි අපේක්ෂක උපාධි වැඩසටහන්වලින් ව්‍යුත්පන්න සියලු ආදායම් සහ වෙනත් අභ්‍යන්තර ආදායම් මුදල් පදනමකින් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ පිළිගනු ලැබේ.

(ආ) **ස්වයං මූල්‍යයන ක්‍රියාකාරකම්වලින් උත්පාදිත අරමුදල්**

උපදේශන, පශ්චාත් උපාධි ඉගැන්වීම් පාඨමාලා, බාහිර උපාධි වැඩසටහන්, පරීක්ෂා කිරීම් ආදිය ස්වයං මූල්‍යයන ක්‍රියාකාරකම් වන අතර. වියදම පමණක් ආපසු අයකර ගැනීමේ හා ලාභාර්ථී නොවන පදනමින් සිදු කරනු ලැබේ. ස්වයං මූල්‍යයන ක්‍රියාකාරකම්වල සංවර්ධන වැය ශීර්ෂ සඳහා ආදායම, වියදම හා දායක මුදල් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ 26 වැනි සටහන යටතේ හෙළිදරව් කර ඇත.

කාල පරිච්ඡේදය සඳහා දරන ලද වියදම් සහ අනාගත වියදම්වල ප්‍රමාණයට ස්වයං මූල්‍යයන ක්‍රියාකාරකම්වල ආදායම හඳුනාගනු ලබන අතර සංවර්ධන වැය ශීර්ෂ සඳහා දායකත්වය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ විලම්බිත ආදායම යටතේ පෙන්නුම් කෙරේ.

**(ඇ) පොළී ආදායම**

වියදම් සඳහා ලබා දුන් මුදල් ප්‍රමාණය පමණක් ආදායම් ලෙස පෙන්නුම් කරන බාහිරව සීමාකරනු ලැබූ පරිත්‍යාග හා අරමුදල් මත ඉපැයූ ආයෝජන ආදායම් සඳහා හැර අදාළ කාල පරිච්ඡේදය සඳහා ලත් පොළී ආදායම මූල්‍ය ප්‍රකාශනයන්හි ආදායම ලෙස වාර්තා කරනු ලැබේ. ඉපැයූ ආයෝජන ආදායම වියදම් සඳහා ලබාදුන් ප්‍රමාණය ඉක්මවන වර්ෂයක් සඳහා එම අතිරික්තය පරිත්‍යාග හෝ පරිසීමිත අරමුදල්වල සෘජු වැඩිවීමක් ලෙස වාර්තා කරනු ලැබේ.

රන් පදක්කම් හා ශිෂ්‍යත්ව අරමුදල් ආයෝජන මත පොළිය ගිණුම්කරණ කාලසීමාව තුළ කල් නොපිරුණහොත් මුදල් පදනමින් ගිණුම්ගත කරනු ලැබේ.

**(ඈ) කුලී ආදායම**

විශ්වවිද්‍යාල වත්කම් කුලියට දීමෙන් ලැබෙන කුලී ආදායම කුලී කාලය තුළ සරල රේඛීය ක්‍රමය මත ගිණුම්ගත කරන අතර ආදායමට ඇතුලත් කරනු ලැබේ.

**(ඉ) කෘෂිකර්ම ගොවිපොළෙන් ආදායම**

මාපලාන කෘෂිකර්ම ගොවිපොළ ආශ්‍රිත ආදායම හා වියදම මූල්‍ය ප්‍රකාශනයේ සටහන 27 යටතේ වෙනම හඳුනාගනු ලැබේ.

#### 2.9.2 හුවමාරු නොවන ගනුදෙනුවලින් වන අයභාර

හුවමාරු නොවන ගනුදෙනු යනු හුවමාරුවේදී ආසන්න වශයෙන් සමාන වටිනාකමක් ලබා නොදී වෙනත් අස්තිත්වයකින් (උදා: මුදල් හෝ වෙනත් වත්කම්) විශ්වවිද්‍යාලය වෙත වටිනාකමක් ලැබෙන ඒවා වේ.

වත්කමක නිර්වචනය සපුරාලන භාණ්ඩවලින් ලැබෙන සේවාවන් හැර හුවමාරු නොවන ගනුදෙනුවලින් සම්පත් ගලා ඒම වත්කමක් ලෙස පිළිගනු ලබන්නේ:

- විශ්වවිද්‍යාලයට ආර්ථික ප්‍රතිලාභයක් හෝ සේවා විභවයක් ලැබීමට ඉඩ ඇති විටදී; සහ
- සාධාරණ වටිනාකම විශ්වසනීයව මැණිය හැකි විටදී පමණි.

වත්කම් ලෙස හඳුනාගනු ලබන හුවමාරු නොවන අය භාරවලින් සම්පත් ගලාඒම, එම ගලා ඒමට අදාළව බැරකමක් හඳුනා නොගන්නා ප්‍රමාණයට හුවමාරු නොවන අය භාර ලෙස හඳුනාගනු ලැබේ.

විශ්වවිද්‍යාලයේ හුවමාරු නොව ගනුදෙනුවලට අදාළව නිශ්චිත හඳුනාගැනීමේ නිර්ණායක පහත දැක්වෙන පරිදි වේ.

**(අ) රජයේ ප්‍රදාන/පැවැරුම්**

රජයේ ප්‍රදානවලින් පැන නගින වත්කම් හා අය භාර සාධාරණ වටිනාකමට හුවමාරු පැවැරුම් අනුගමන වන කාල සීමාව තුළ හඳුනාගනු ලැබේ. පැවැරුමක් කොන්දේසිවලට යටත් වන විටදී සහ හුවමාරු නොවන ගනුදෙනුවක ප්‍රතිඵලයක් ලෙස වර්තමාන බැඳීමක් පැන නගින විටදී, කොන්දේසිය සපුරාලන තුරු විශ්වවිද්‍යාලය බැරකමක් හඳුනා ගනියි.

රජයේ ප්‍රදානවලින් පැන නගින වත්කම් හා අය භාර හඳුනාගැනීමේ දිනයට සාධාරණ වටිනාකමට මණිනු ලැබේ. මූල්‍ය වත්කම් ඒවායේ නාමික වටිනාකමට මණිනු ලැබේ.

**(ආ) පුනරාවර්තන ප්‍රදාන**

පුනරාවර්තන ස්වරූපයේ අය භාර සඳහා ලැබෙන රජයේ ප්‍රදාන මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ හුවමාරු නොවන ගනුදෙනු යටතේ හඳුනාගනු ලැබේ.

2020 වසර සඳහා පුනරාවර්තන ප්‍රදාන ලෙස රු. මිලියන 4,308ක රජයේ ප්‍රදාන ලැබුණි.

| විස්තරය | මුදල (රු) මිලියන |
|---|---|
| අනුමත පුනරාවර්තන අයවැය | 4,488 |
| **වසර සඳහා නිකුත් කරන ලද අක් මුදල්** | 4,308 |
| පුද්ගල පඩිනඩි | 3,806 |
| අනෙකුත් පුනරාවර්තන | 502 |

**(ඇ) ප්‍රාග්ධන නියත ප්‍රදාන සහ අනෙකුත් පැවැරුම්**

ප්‍රාග්ධන වියදම් සඳහා ලැබුණු රජයේ ප්‍රදාන සහ අනෙකුත් ප්‍රාග්ධන පැවැරුම් 2020 මූල්‍ය වර්ෂයේ සිට බල පැවැත්වෙන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති 11- හුවමාරු නොවන ගනුදෙනුවල අය භාර ප්‍රකාරව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ. ප්‍රාග්ධන ගනුදෙනුවලින් පැන නගින ප්‍රාග්ධන අතිරික්තය/(හිඟය) සමුච්චිත අරමුදල- මූල්‍ය ප්‍රකාශනයේ ඇති ප්‍රාග්ධනය යටතේ දක්වනු ලැබේ.

**2.9.3 සමුච්චිත අරමුදල් ප්‍රාග්ධනයට ප්‍රත්‍යාවර්තනය කිරීම**

2020 වසරේ සිටබල පැවැත්වෙන පරිදි විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති 11- 'හුවමාරු නොවන ගනුදෙනුවල අය භාර' පිළි ගෙන ආදේශ කරනු ලබයි.

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සුසංගත කිරීම පිණිස, වැය කළ ප්‍රාග්ධන ප්‍රදානය, වැය නොකළ ප්‍රාග්ධන ප්‍රදානය සහ ත්‍යාග සර පරිත්‍යාගවලට අදාළ සංසන්දනාත්මක සංඛ්‍යා ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති 11 සහ ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීන්ගේ සංගමය නිකුත් කරන ලද මාර්ගෝපදේශ ප්‍රකාරව "සමුච්චිත අතිරික්ත ප්‍රාග්ධනය" බවට ප්‍රතිවර්ගීකරණය කරනු ලැබේ.

වර්ෂය සඳහා ලැබුණු ප්‍රාග්ධන ප්‍රදානවල සාරාංශය පහත පරිදි වේ.

| විස්තරය | 2021 (රු) මිලියන |
|---|---|
| භාණ්ඩාගාර ප්‍රදාන ප්‍රාග්ධනය | 357.50 |
| උසස් අධ්‍යාපන අමාත්‍යාංශය- 12 මහල් ගොඩනැගිල්ල සඳහා ප්‍රදානය වෛද්‍ය පීඨය | 127.91 |
| විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව - තාක්ෂණවේද විෂය ධාරාව සඳහා ප්‍රදානය | 18.00 |
| විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව - තො.තා. යටිතල පහසුකම් | 15.00 |
| උසස් අධ්‍යාපන අමාත්‍යාංශය- දස මහල් ගොඩනැගිලි සංකීර්ණය ,වෛද්‍ය | 342.67 |
| උසස් අධ්‍යාපන අමාත්‍යාංශය- දක්ෂිණ මධ්‍යස්ථානය සඳහා මධ්‍යස්ථානය ඉංජිනේරු පීඨය | 118.45 |
| උසස් අධ්‍යාපන අමාත්‍යාංශය- සම සෞඛ්‍ය විද්‍යා පීඨ සංකීර්ණය | 387.85 |
| AHEAD ව්‍යාපෘතිය (අතිරේක ශිෂ්‍ය බඳවා ගැනීම් ප්‍රදානය) | 185.22 |
| **මුළු ප්‍රාග්ධන ප්‍රදානය** | **1,552.62** |

**2.9.4 ත්‍යාග, පරිත්‍යාග සහ ද්‍රව්‍ය ලෙස ලැබුණු භාණ්ඩ**

ත්‍යාග සහ පරිත්‍යාග කොන්දේසිවලින් තොරව විශ්වවිද්‍යාලයට ලැබුණු මුදල් හෝ අනෙකුත් මූල්‍ය වත්කම් සහ භාණ්ඩ සහ සේවා ඇතුළුව ස්වේච්ඡා පැවරුම් වේ.

අනාගත ආර්ථික ප්‍රතිලාභ හෝ සේවා විභවය විශ්වවිද්‍යාලය වෙත ගලා ඒමට ඉඩ ඇති විටදී සහ වත්කම්වල සාධාරණ වටිනාකම විශ්වසනීය ලෙස මැනිය හැකි විටදී, ලැබුණු ත්‍යාග සහ පරිත්‍යාග සහ භාණ්ඩ සහ සේවා

ඒවායේ සාධාරණ වටිනාකමට හුවමාරු නොවන අය භාර ලෙස හඳුනාගනු ලැබේ.

2021 වර්ෂය තුළදී, රුහුණ විශ්වවිද්‍යාලය සඳහා දක්ෂිණ ව්‍යාපාර රැකවර්ණ මධ්‍යස්ථානයක් ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා නව නිපැයුම් කොමිෂන් සභාව රු. මිලියන 19.20ක වටිනාකමින් යුත් වත්කම් පරිත්‍යාග කළ අතර මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ හුවමාරු නොවන ගනුදෙනුවලින් අයභාර යටතේ සාධාරණ වටිනාකමට හඳුනාගනු ලැබේ. ඊට අමතරව, වර්ෂය තුළදී පහත දැක්වෙන ත්‍යාග හා පරිත්‍යාග ලැබුණි.

| ප්‍රදායක | සාධාරණ වටිනාකම (රු.) මිලියන |
|---|---|
| මහජනතාවගෙන් සහ ප්‍රජාවෙන් (දේශීය ප්‍රදාන) | 19.34 |
| AHEAD ව්‍යාපෘතිය | 545.45 |
| **මුළු ත්‍යාග සහ පරිත්‍යාග** | **564.78** |

### 2.10 වියදම හඳුනා ගැනීම

වැඩසටහන/ව්‍යාපෘතිය/අරමුණ අනුව වියදම විශ්ලේෂණය කර ඇති අතර ඒවා දරන ලද කාල සීමාව තුළ පොදු වාර්තාකරණ ආකෘතිය සමග අනුකූල වන පරිදි විශ්වවිද්‍යාල කොමිෂන් සභාවේ මාර්ගෝපදේශ මත පදනම්ව විවිධ වැය ශීර්ෂ යටතේ වර්ගීකරණය කරනු ලැබේ. උපාධි අපේක්ෂක අධ්‍යාපනයට අදාළව දරන ලද සියලු වියදම් උපචිත පදනමකින් හඳුනාගනු ලැබ ඇති අතර මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට වැය බරක් සේ දක්වනු ලැබේ.

### 2.11 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

වක්‍ර ක්‍රමය යටතේ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02 ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙළ කර ඇත.

### 2.12 වාර්තාකරණ කාලසීමාවෙන් පසු සිදුවීම්

වාර්තාකරණ දිනයෙන් පසු සිදුවීම්ව ප්‍රමාණාත්මකබව සලකා බලනු ලැබ ඇති අතර යෝග්‍ය තැන්හිදී, ගිණුම්වල ගැලපීම් සිදුකර ඇත.

### 2.13 විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු

ශ්‍රී ලංකා රුපියල් හැර වෙනත් ගනුදෙනු ව්‍යවහාර මුදල්, ගනුදෙනුවල දිනයේදී පැවැති තත්‍ය අනුපාතයන්ට ඉතා ආසන්න අනුපාත අනුව ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කරනු ලැබේ.

### 2.14 අන්තර් අංශ ගනුදෙනු

අන්තර් අංශ ගනුදෙනු සහ නොපියවා ඇති ශේෂ ඉවත් කිරීම මගින් මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත. පහත දැක්වෙන අන්තර් අංශ ශේෂ ඉවත් කරනු ලැබිය.

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන ඒකකය ගෙවිය යුතු රු. මිලියන 40ක ශේෂය සහ ලැබිය යුතු මුදල් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙන් ඉවත් කරන ලදී.

### 2.15 සම්බන්ධිත පාර්ශව ගනුදෙනු

විශ්වවිද්‍යාලයේ ප්‍රධාන කළමනාකරණ පිරිස් වනුයේ විශ්වවිද්‍යාල පාලන මණ්ඩලයේ සාමාජිකයන් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්ව පිරිස් වේ. උප කුලපති, නියෝජ්‍ය උප කුලපති සහ පීඨවල පීඨාධිපතිවරු, සනාතන සභාව විසින් තෝරා පත් කර ගනු ලබන සාමාජිකයන් දෙදෙනෙකු සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන බාහිර සාමාජිකයන්ගෙන් සමන්විත විශ්වවිද්‍යාල පාලන සභාව විශ්වවිද්‍යාලයේ විධායක ආයතනය සහ පාලන අධිකාරිය වේ.

සෘජු හෝ වක්‍ර බැඳියා සහිත ප්‍රධාන කළමනාකරණ පිරිස්වල කවර හෝ සාමාජිකයකු විශ්වවිද්‍යාලය සමග ගිවිසුම්වලට එළඹ නොමැති අතර විකුණුම්, මිලදී ගැනීම්, ණය, පැවරුම්, කල්බදු සැකසුම්, ඇප සහ කාල සීමාව තුළ සපයනු ලැබූ සේවා සඳහා සේවක පාරිශ්‍රමික සහ දීමනා හැර සම්බන්ධිත පාර්ශව වෙතින් ලැබිය යුතු හෝ වෙත ගෙවිය යුතු මුදල් ඇතුළුව සම්බන්ධිත පාර්ශව සමග කිසිදු ගනුදෙනුවක් සිදුව නොමැත.

### 2.16 අයවැය සහ තත්‍ය මුදල් ප්‍රමාණ සංසන්දනය

අයවැය සහ ගිණුම්කරණ පදනම වෙනස් වේ. විශ්වවිද්‍යාල සඳහා අයවැය වාර්ෂිකව මුදල් පදනමින් අනුමත කරනු ලැබේ. විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශනවලින් විශ්වවිද්‍යාලයේ සියලු මූල්‍ය ක්‍රියාකාරකම් ආවරණය වන නමුත් අයවැය අනුමත කරනුයේ රජයේ ප්‍රදානය සඳහා පමණි. අයවැය සහ තථ්‍ය මුදල් ප්‍රමාණ සංසන්දනය කිරීමේ ප්‍රකාශනය අනුරූපී අයවැයගත මුදල් ප්‍රමාණ ගණනය කරනු ලැබූ පදනමින්ම තථ්‍ය මුදල් ප්‍රමාණ අවසාන අයවැයට සංසන්දනය කරයි.

**රුහුණ විශ්වවිද්‍යාලය- ශ්‍රී ලංකාව**
**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**
**2021 දෙසැම්බර් 31ත් අවසන් වසර සඳහා**

**සටහන 03: මුදල් හා මුදල් සමාන දෑ**

| නම | දෙසැම්බර් 31 දිනට | රු. 2021 | රු. 2020 |
|---|---|---|---|
| **භාණ්ඩාගාර හා පොදු අරමුදල්** | | | |
| පුනරාවර්තන - මහජන බැංකුව - 032-1-001-1-2477589 | | 23,320,425 | 5,584,778 |
| ප්‍රාග්ධන- මහජන බැංකුව 032-1-001-9-2477590 | | 237,575,308 | 11,419,389 |
| පුනරාවර්තන - ලංකා බැංකුව -0033695757 | | 8,953,887 | 3,192,011 |
| කෘෂිකර්ම පීඨය - මහජන බැංකුව -133-10016-0000029 | | 7,387,684 | 125,838 |
| වෛද්‍ය පීඨය - ලංකා බැංකුව -0000402437 | | 7,305,653 | 3,074,906 |
| කෘෂිකර්ම පීඨය - ලංකා බැංකුව -4441897 | | 19,984,027 | 12,479,365 |
| ඉංජිනේරු පීඨය - මහජන බැංකුව -169-1-001-2-1871753 | | 12,458,030 | 294,854 |
| විදේශ ගිණුම - මහජන බැංකුව -32100152477592 | | 125,625 | 19,365 |
| වෛද්‍ය පීඨය - මහජන බැංකුව -343100121924633 | | 530,703 | 297,412 |
| සම සෞඛ්‍ය විද්‍යා පීඨය - මහජන බැංකුව -343100170011983 | | 78,254 | 2,589,383 |
| තාක්ෂණ පීඨය - මහජන බැංකුව -133100140070650 | | 80,472 | 176,169 |
| පරිසීමිත අරමුදල් හා සංචිත | | | |
| බාහිර විභාග ගිණුම - මහජන බැංකුව -032-1-001-1-2477594 | | 47,173,870 | 9,671,582 |
| M.B.A.- මහජන බැංකුව -032-1-1001-7-2477591 | | 3,508,411 | 3,508,411 |
| සේවා විද්‍යාගාරය - ලංකා බැංකුව -3695842 | | 169,211 | 163,711 |
| ව්‍යාප්ති ඉංග්‍රීසි පාඨමාලාව - ලංකා බැංකුව -3695841 | | 2,432,008 | 2,432,003 |
| මනෝ විද්‍යා ඩිප්ලෝමාව - ලංකා බැංකුව -5287099 | | - | 5 |
| පශ්චාත් උපාධි පාඨමාලාව මහජන බැංකුව - 032-1-001-6-0036374 | | 21,450,142 | 21,710,652 |
| NORHEAD-CPDS ව්‍යාපෘතිය - මහජන බැංකුව - 032-1-001-9-0042806 | | 101,089 | 4,148,686 |
| චීන ශ්‍රී ලංකා ඒකාබද්ධ අධ්‍යාපනය - මහජන බැංකුව - 032-1-001-1-0042952 | | 20,426,712 | 15,739,002 |
| බැඳුම්කර හා ගිවිසුම්කර උල්ලංඝනය - මහජන බැංකුව - 032-1-001-5-0043049 | | 2,380,958 | 3,092,652 |
| NORHEAD-දේශගුණික වෙනස්වීම් - මහජන බැංකුව - 032-1-001-0-0044126 | | 4,672,495 | 5,382,639 |
| මුදල් වෙළඳපොළ ඉතුරුම් - මහජන බැංකුව - 032200160049747 | | 7,123,423 | 6,896,997 |
| රුහුණු විශ්වවිද්‍යාලය එකතු කිරීමේ ගිණුම - මහජන බැංකුව -032100170050213 | | 4,467,242 | 13,692,571 |
| ව්‍යාපෘති හා පර්යේෂණ ප්‍රදානය - මහජන බැංකුව 0032100120055581 | | 13,931,456 | 10,477,679 |
| ව්‍යාපෘති ගිණුම - ඉංජිනේරු පීඨය - ලංකා බැංකුව - 0085191762 | | 10,644,475 | 16,055,966 |
| නේ.වි.ගිණුම - මහජන බැංකුව -032-4-02142780602 | | 94,270,903 | 47,216,839 |
| BRIATE ව්‍යාපෘතිය - EURO ගිණුම - ලංකා බැංකුව - 84869161 | | 87,381,996 | 18,785,285 |
| ත්‍රී ලංකා ව්‍යාපෘතිය -යුරෝ ගිණුම-ලංකා බැංකුව -86439101 | | 12,729,386 | - |
| ව්‍යාපෘති ගිණුම -ස.සෞ.පී- ලංකා බැංකුව- 88138300 | | 6,756,003 | - |
| **මුදල් හා මුදල් සමාන දෑ එකතුව** | | **657,419,850** | **218,228,151** |

**රුහුණ විශ්වවිද්‍යාලය- ශ්‍රී ලංකාව**
**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**
**2021 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා**

**සටහන 04: අත්තිකාරම් හා පූර්ව ගෙවීම්**

| නම | | දෙසැම්බර් 31 දිනට | රු. **2022** | රු. **2020** |
|---|---|---|---|---|
| තැපැල් අත්තිකාරම් | 05001 | | 245,873 | 254,880 |
| පූර්ව ගෙවීම් තැන්පතු | | | 1,451,999 | 1,455,499 |
| පර්යේෂණ අත්තිකාරම් (වැල්ලමඩම) | | | - | 262,000 |
| පර්යේෂණ අත්තිකාරම් (ඉංජිනේරු) | | | 229,340 | 1,092,377 |
| විවිධ අත්තිකාරම් (වැල්ලමඩම) | | | 136,113 | 10,311 |
| විවිධ අත්තිකාරම් (වෛද්‍ය) | | | - | 12,604 |
| විවිධ අත්තිකාරම් (ඉංජිනේරු) | | | 1,617,508 | 2,083,366 |
| විවිධ අත්තිකාරම් (දු.අ.අ.ඒ සහ උ.අ.පී) | | | 373,640 | 247,644 |
| පර්යේෂණ අත්තිකාරම් ශක්තිමත් කිරීම (ඉංජිනේරු) | | | 100,000 | 100,000 |
| විවිධ අත්තිකාරම් (උපාධි අධ්‍යයන පීඨය) | | | 254,220 | - |
| පර්යේෂණ ප්‍රදානයෙන් ගෙවන ලද අත්තිකාරම් | | | 183,879 | 403,781 |
| ව්‍යාපෘති ප්‍රදානයෙන් ගෙවන ලද අත්තිකාරම් | | | 335,726 | 798,319 |
| සුළු මුදල් අත්තිකාරම් (වැල්ලමඩම) | | | - | 23,143 |
| විදේශ ආන්තික ගිණුම - මහජන බැංකුව | | | 25,623 | 1,025,623 |
| ස්ථාවර වත්කම් සඳහා ආරක්ෂිත තැන්පතුව | | | 1,817,800 | 1,817,800 |
| **අත්තිකාරම් හා පූර්ව ගෙවීම් එකතුව** | | | **6,771,721** | **9,587,346** |

**සටහන 05: කාර්ය මණ්ඩලයට ණය හා අත්තිකාරම්**

| නම | වසරක් තුළ අයකර ගත හැකි | වසරකට වැඩි කාලයක් තුළ අයකර ගත හැකි | රු. **2021** | රු. **2020** |
|---|---|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | | | | |
| පරිගණක ණය | 29,500 | 45,000 | 74,500 | 68,986.54 |
| ආපදා ණය | 18,848,063 | 53,793,054 | 72,641,117 | 75,049,798 |
| කාර්යමණ්ඩල ණය | 271,692 | 552,670 | 824,362 | 1,098,577 |
| වාහන ණය | 25,050 | 58,105 | 83,155 | 167,226 |
| උත්සව අත්තිකාරම් | 88,850 | - | 88,850 | 58,850 |
| වැටුප් අත්තිකාරම් (වැල්ලමඩම) | 200 | - | 200 | 200 |
| වැටුප් අත්තිකාරම් (වෛද්‍ය) | - | - | - | 30,000 |
| වැටුප් අත්තිකාරම් (ඉංජිනේරු) | 8,225 | - | 8,225 | - |
| විශේෂ අත්තිකාරම් (වැල්ලමඩම) | 25,050 | - | 25,050 | 31,050 |
| වැටුප් අත්තිකාරම් (තාක්ෂණ) | - | - | - | - |
| ස්වභාවික ආපදා ණය | - | - | - | 704,178 |
| UPFA වෙතින් අයකර ගැනීමට නියමිත | - | 1,295,498 | 1,295,498 | 1,295,498 |
| | **19,296,630** | **55,744,328** | **75,040,958** | **78,504,364** |

**රුහුණ විශ්වවිද්‍යාලය- ශ්‍රී ලංකාව**
**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**
**2021 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා**

**සටහන 06: ප්‍රාග්ධන අත්තිකාරම්**

| නම<br>දෙසැම්බර් 31 දිනට | රු.<br>2021 | රු.<br>2020 |
|---|---|---|
| ප්‍රාග්ධන අත්තිකාරම | 4,742,727 | 4,500,000 |
| පුස්තකාල පොත් හා වාර ප්‍රකාශන සඳහා අත්තිකාරම් (විදේශීය) | 553,696 | 564,029 |
| පුස්තකාල පොත් හා වාර ප්‍රකාශන සඳහා අත්තිකාරම් (දේශීය) | - | 1,800 |
| **ප්‍රාග්ධන අත්තිකාරම් එකතුව** | **5,296,423** | **5,065,829** |

**සටහන 07: වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ**

| නම<br>දෙසැම්බර් 31 දිනට | රු.<br>2021 | රු.<br>2020 |
|---|---|---|
| ස්වයං මූල්‍යයන ක්‍රියාකාරකම්වලින් ලැබිය යුතු දෑ | 12,225,484 | 17,573,825 |
| වි.ප්‍ර.කොා. ස. සහ වෙනත් මූලාශ්‍රවලින් ලැබිය යුතු දෑ | 102,418,145 | 298,744,013 |
| ගිවිසුම්කර උල්ලංඝනය කිරීම්වලින් ලැබිය යුතු දෑ | 33,525,408 | 30,255,712 |
| ශිෂ්‍යයන්ගෙන් ලැබිය යුතු දෑ (ඉංජිනේරු-කොවිඩ් අරමුදල) | 1,443,727 | 688,060 |
| වාහන රක්ෂණය -ලැබියයුතු හිමිකම් | 39,300 | - |
| **වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ මුළු එකතුව** | **347,261,610** | **347,261,610** |

**සටහන 08: තොග භාණ්ඩ**

| නම<br>දෙසැම්බර් 31 දිනට | රු.<br>2021 | රු.<br>2020 |
|---|---|---|
| ප්‍රධාන ගබඩාව (වැල්ලමඩම) | 15,475,216 | 7,540,420 |
| අයකර ගත යුතුව තිබෙන නැතිවූ තොග (වැල්ලමඩම) | - | 125,965 |
| උප ගබඩා (වෛද්‍ය) | 3,427,799 | 3,482,749 |
| උප ගබඩා (කෘෂිකර්මය) | 1,869,315 | 1,491,778 |
| පශු සම්පත් (කෘෂිකර්මය - ගොවිපොළ ) | 2,560,523 | 3,185,963 |
| උප ගබඩා (ඉංජිනේරු) | 1,481,742 | 1,099,274 |
| අස්වනු තොග (කෘෂිකර්මය - ගොවිපොළ) | 21,650 | 131,636 |
| නඩත්තු තොග ( වැල්ලමඩම ) | 683,805 | 5,283,196 |
| ගොවිපොළ තොග (කෘෂිකර්මය) | 497,534 | 477,180 |
| ඖෂධ තොග (වෛද්‍ය මධ්‍යස්ථානය, වැල්ලමඩම) | 253,482 | - |
| ඖෂධ තොග (වෛද්‍ය මධ්‍යස්ථානය, කෘෂිකර්ම) | 139,828 | - |
| ඖෂධ තොග (වෛද්‍ය මධ්‍යස්ථානය ඉංජිනේරු) | 54,961 | - |
| **මුළු තොග භාණ්ඩ** | **26,465,853** | **22,818,161** |

**රුහුණ විශ්වවිද්‍යාලය- ශ්‍රී ලංකාව**
**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**
**2021 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා**

**සටහන 09 : දේපළ, පිරියත හා උපකරණ**
**(**සංඛ්‍යා දක්වා ඇත්තේ ශ්‍රී ලංකා රුපියල්වලිනි**)**

**දේපළ, පිරියත හා උපකරණවල පිරිවැය**

| වත්කම් | 2021/01/01 දිනට පිරිවැය | පෙර වසරේ ගැලපුම | වසර තුළ එකතුකිරීම්/ ප්‍රත්‍යාගණන | වසර තුළ බැහැර කිරීම් | 2021/12/31 දිනට පිරිවැය |
|---|---|---|---|---|---|
| ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම් | 1,658,710,992 | - | - | | **1,658,710,992** |
| ගොඩනැගිලි හා ඉදිකිරීම් | 8,656,261,651 | (185,613) | 134,430,747 | | **8,790,506,786** |
| ගෘහභාණ්ඩ හා සවිකුරු | 380,321,825 | (1,244,012) | 33,303,296 | | **412,381,109** |
| විදුලිය සැපයුම | 40,210,605 | - | - | | **40,210,605** |
| ජල සැපයුම් යෝජනා ක්‍රමය | 8,113,558 | - | - | | **8,113,558** |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | 133,194,800 | 854,001 | 69,186,906 | | **203,235,707** |
| කාර්යාල උපකරණ | 633,637,270 | (117,368) | 15,942,016 | | **649,461,919** |
| පුස්තකාල පොත් හා වාර ප්‍රකාශන | 422,501,185 | | 4,325,856 | (9,988) | **426,817,053** |
| මෝටර් රථවාහන | 120,259,076 | - | (3,489,436) | | **116,769,640** |
| විද්‍යාගාර හා ඉගැන්වීම් උපකරණ | 1,514,716,727 | (104,000) | 104,426,512 | | **1,619,039,239** |
| උපාධි ලෝගු හා උපාංග | 10,689,040 | - | 265,000 | | **10,954,040** |
| දුරකථන භූවමාරුව | 5,804,982 | - | | | **5,804,982** |
| ක්‍රීඩා උපකරණ | 48,027,760 | - | 308,000 | | **48,335,760** |
| පරිගණක හා උපාංග | 504,342,596 | (500) | 163,446,573 | | **667,788,669** |
| නේවාසිකාගාර උපකරණ | 106,524,270 | (9,765) | - | | **106,514,505** |
| වැටුප් හා වේතන | 787,271,344 | 771,685,351 |
| වි.වි.අ. | 185,413,175 | 185,896,442 |
| විශ්‍රාම වැටුප් | 96,487,119 | 88,241,304 |
| සේ.හා.අ. | 56,424,061 | 54,822,270 |
| වැඩබැලීම සඳහා ගෙවීම් | 369,410 | 436,649 |
| පර්යේෂණ දීමනාව 25% | 231,206,651 | 229,885,920 |
| Mca - අධ්‍යයන | - | - |
| අධ්‍යයන දීමනා | 1,019,548,072 | 982,428,992 |
| සමකාර දීමනා | 156,984 | 188,492 |
| වෙනත් දීමනා | 4,989,484 | 4,080,467 |
| පාරිතෝෂිකය | 106,332,056 | 185,751,588 |
| වෙනත් දීමනා | 7,806,484 | 8,486,491 |
| ජීවන වියදම් දීමනාව | 75,924,007 | 79,044,983 |
| 20% අතිරේක දීමනාව | 137,820,452 | 133,140,303 |
| සංග්‍රහ වියදම් | 4,400,606 | 3,870,935 |
| අතුරු හානිපූරක දීමනාව | - | - |
| 20% අතිරේක දීමනාව - අදියර 02 | 95,619 | 147,650 |
| **අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා එකතුව** | **2,714,245,523** | 2,728,107,837 |
| **අනධ්‍යයන කාර්ය මණ්ඩලය** | | |
| වැටුප් හා වේතන | 478,277,178 | 475,176,848 |
| වි.වි.අ | 75,968,792 | 77,171,094 |
| විශ්‍රාම වැටුප් | 41,041,331 | 39,266,776 |
| සේ.හා.අ. | 23,401,274 | 23,295,959 |
| වැඩබැලීම සඳහා ගෙවීම් | 1,063,115 | 610,090 |
| පර්යේෂණ දීමනාව -අනධ්‍යයන | 3,180,112 | 7,034,833 |
| මාසික හානිපූරක දීමනාව- අනධ්‍යයන | 250 | 7,084 |
| අතිකාල | 40,226,743 | 57,596,520 |
| නිවාඩු දින ගෙවීම් | 575,901 | 544,118 |
| වෙනත් දීමනා | 8,443,304 | 7,783,731 |
| භාෂා ප්‍රවීණතා දීමනාව | - | 3,059 |
| පාරිතෝෂිකය | 34,680,427 | 86,147,695 |

| | | |
|---|---|---|
| දේපළ ණය | 5,270,089 | 6,019,529 |
| ජීවන වියදම් දීමනාව | 89,912,602 | 90,055,226 |
| 20% අතිරේක දීමනාව | 94,849,624 | 94,442,378 |
| සංග්‍රහ වියදම් | 575,162 | 515,237 |
| 20% අතිරේක දීමනාව - අදියර 02 | 213,536,825 | 212,655,035 |
| **අනධ්‍යයන කාර්ය මණ්ඩල එකතුව** | **1,111,002,729** | **1,178,325,211** |
| **පුද්ගල පඩිනඩි සමස්ත එකතුව** | **3,825,248,252** | **3,906,433,048** |

**28.2** ගමන් වියදම් හා යැපීම් දීමනා

| | | |
|---|---|---|
| දේශීය | 1,637,775 | 2,007,638 |
| විදේශීය | 1,997,472 | 2,286,064 |
| **ගමන් වියදම් හා යැපීම් දීමනා එකතුව** | **3,635,247** | 4,293,702 |

**28.3 සැපයුම් හා පාරිභෝජ්‍ය ද්‍රව්‍ය**

| | | |
|---|---|---|
| ලිපි ද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා | 24,334,628 | 20,753,824 |
| ඉන්ධන හා ලිහිසි තෙල් | 8,843,361 | 9,665,272 |
| නිල ඇඳුම් හා මැසීමේ ගාස්තු | 3,350,727 | 4,417,154 |
| යාන්ත්‍රික හා විදුලි භාණ්ඩ | 4,848,080 | 3,146,901 |
| රසායනික ද්‍රව්‍ය හා වීදුරු භාණ්ඩ | 9,610,731 | 7,853,543 |
| වෛද්‍ය සැපයුම් | 1,302,687 | 893,355 |
| අනෙකුත් සැපයුම් | 24,397,774 | 24,927,114 |
| **මුළු සැපයුම්** | **76,687,988** | **71,657,164** |

**28.4 නඩත්තුව**

| | | |
|---|---|---|
| වාහන | 6,847,326 | 5,141,482 |
| දේපළ, පිරියත හා උපකරණ | 15,966,053 | 16,751,666 |
| ගොඩනැගිලි හා ඉදිකිරීම් | 290,223 | 2,200 |
| ගෘහ භාණ්ඩ | - | 4,650 |
| වෙනත් | 376,601 | 4,946,903 |
| **මුළු සැපයුම්** | **23,480,202** | **26,846,902** |

**28.5 ගිවිසුම්කර සේවා**

| | | |
|---|---|---|
| ප්‍රවාහන | 11,766,913 | 14,826,885 |
| විදුලි සංදේශ | 6,880,455 | 9,140,953 |
| තැපැල් ගාස්තු | 1,612,272 | 2,339,134 |
| විදුලි | 57,578,787 | 66,059,569 |
| ආරක්ෂක සේවා | 46,271,260 | 38,153,911 |
| ජලය | 15,263,289 | 21,097,738 |
| පිරිසිදු කිරීමේ සේවා | 115,912,831 | 102,514,008 |

| | | |
|---|---|---|
| කුලී හා කුලියට දීමේ ගාස්තු | 35,054,207 | 33,583,795 |
| පළාත් පාලන ආයතනයට වරිපනම් හා බදු | 10,331,503 | 8,754,107 |
| මුද්‍රණ, ප්‍රචාරණ වියදම් | 587,693 | 2,578,747 |
| වෙනත් නඩත්තු වියදම් | 2,423,289 | 3,168,294 |
| **මුළු නඩත්තු වියදම** | **303,682,498** | **302,217,141** |

### 28.6 වෙනත් පුනරාවර්තන වියදම්

| | | |
|---|---|---|
| විශ්වවිද්‍යාල ආචාර්යවරුන් සඳහා ගමන් ප්‍රදාන | 5,750 | 552,503 |
| විශේෂ සේවා -පාලක මණ්ඩලය හා සනාතන සභාව | 2,768,071 | 3,660,125 |
| විශේෂ සේවා - වෘත්තික | 3,207,293 | 5,720,002 |
| වැඩමුළු, සම්මන්ත්‍රණ වියදම් | 1,130,628 | 710,784 |
| අධ්‍යයන පර්යේෂණ | 3,912,831 | 852,819 |
| කාර්ය මණ්ඩල සංවර්ධනය | 1,353,556 | 334,500 |
| වෙනත් සංවිධාන සඳහා ප්‍රදාන | 800,000 | 34,399 |
| නිවාඩු දින ගමන් බලපත්‍ර හා වාරික ප්‍රවේශපත්‍ර ගාස්තු | 161,550 | 804,440 |
| සංග්‍රහ වියදම් | 3,941,404 | 5,337,425 |
| බැංකු ගාස්තු | 96,934 | 226,314 |
| පරිදාන හා හානිපූරණ | 1,654,732 | 857,666 |
| දායක මුදල් හා සාමාජිකත්ව ගාස්තු | 815,657 | 624,199 |
| උපාධි ප්‍රදානෝත්සවය | 4,563,695 | 3,385,979 |
| විභාග වියදම් | 40,724,626 | 36,262,289 |
| වෙනත් - ප්‍රවෘත්ති පත්‍ර, සඟරා වියදම් | 6,056,120 | 3,802,690 |
| බාහිර කථිකාචාර්ය ගාස්තු | 6,810,526 | 8,376,224 |
| පාඨමාලා හා ඉගෙනුම් ද්‍රව්‍ය | 1,814,194 | 42,690 |
| විශ්වවිද්‍යාල ක්‍රීඩා ක්‍රියාකාරකම් | 800,553 | 3,519,424 |
| ආයතනික සැලසුම්කරණය, පාලනය | - | - |
| සීමාවාසික, ප්‍රායෝගික පුහුණු, වෘත්තීය සංවර්ධන වියදම් | - | 2,460 |
| ශිෂ්‍ය සංවර්ධන මූලාරම්භ | 2,043,455 | 1,742,715 |
| ශිෂ්‍ය හා සේවක සුබසාධනය | 891,027 | 1,347,382 |
| රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ වියදම් | - | - |
| **වෙනත් පුනරාවර්තන වියදම් මුළු එකතුව** | **83,552,601** | **78,197,028** |

### 28.7 ශිෂ්‍යයන් සඳහා මූල්‍යාධාර

| | | |
|---|---|---|
| ශිෂ්‍යාධාර | 44,612,000 | 54,004,000 |
| **ශිෂ්‍යයන් සඳහා මූල්‍යාධාර මුළු එකතුව** | **44,612,000** | **54,004,000** |

# කොටස XIII

# විගණකාධිපති වාර්තාව සහ පිළිතුරු

# 1. විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. MTR/C/FS/UOR/21

ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2022 ජූලි 18 දින

345
25 JUL 2022
RECEIVED
Office of the Vice-Chancellor

උපකුලපති,
රුහුණ විශ්වවිද්‍යාලය.

රුහුණ විශ්වවිද්‍යාලයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත් : 1. ලේකම් - අධ්‍යාපන අමාත්‍යාංශය.
2. සභාපති - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. MTR/C/FS/UOR/21

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2022 ජූලි 18 දින

උපකුලපති,
රුහුණ විශ්වවිද්‍යාලය,
මාතර.

රුහුණ විශ්වවිද්‍යාලයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

රුහුණ විශ්වවිද්‍යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, අරමුදල් සහ සංචිත වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, රුහුණ විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1 හි 99 ඡේදය ප්‍රකාරව, සියලුම ආදායම් අතිරික්තය හෝ ඌනතාවයට ඇතුළත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළදී වැටුප් ආපසු අය කර ගැනීම්, අය කර තිබුණු බැදුම්කර වට්ටනාකම් සහ ස්ථාවර තැන්පතු පොලී ආදායම් එකතුව රු.17,202,390 ක් ආදායම් ලෙස හඳුනා නොගෙන ඉන් රු.15,869,102 ක් බැදුම්කර හා ගිවිසුම් කඩකිරීමේ අරමුදල් ගිණුමට හා රු.1,333,288 ක් අග්‍රහාර රක්ෂණ අරමුදල් ගිණුමට බැර කර තිබීම හේතුවෙන් රු.17,202,390 කින් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය හා 2021 දෙසැම්බර් 31 දිනට සමුච්චිත අරමුදල් සහ සංචිත පිළිවෙලින් අඩුවෙන ැඩියෙන් දැක්වුණි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල. ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 2
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබීම හේතුවෙන් පිරිවැය රු.6,880,250 ක් වූ වාහන 08 ක් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු නමුත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2021 දෙසැම්බර් 31 දිනට ජංගම වගකීම් යටතේ දක්වා තිබුණු විලම්බිත ආදායම රු.244,076,700 ක් වූ අතර ඒ ඒ වර්ෂය සඳහා හඳුනාගත යුතු ආදායම ක්‍රමක්ෂය කර නොතිබීම හේතුවෙන් ඉන් රු.20,544,858 ක් වර්ෂ ගණනාවක සිට නොවෙනස්ව පැවතුණි.

(ඈ) විශ්වවිද්‍යාලයේ වැල්ලමඩම පරිශ්‍රයේ, හපුගල ඉංජිනේරු පීඨයේ හා මාපලාන කෘෂි පීඨයේ ස්ථාපිත කර තිබුණු සන්නිවේදන කුළුණු වෙනුවෙන් 2021 දෙසැම්බර් 31 දින වන විට අයවිය යුතු කුලී රු.3,930,000 ක නිවැරදිකාවය තහවුරු කර ගැනීම සඳහා විශ්වවිද්‍යාලය අදාළ සන්නිවේදන සේවා සමාගම සමඟ එළඹී එකඟතා ගිවිසුම් විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා විශ්වවිද්‍යාලය විසින පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (I) (ඈ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (I) (ඈ) (IV) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට විශ්වවිද්‍යාලය සම්බන්ධව යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | නිරීක්ෂණය |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 394 (ඇ) | විශ්වවිද්‍යාලයේ පීඨ හා ඒකක 05 කට අදාළව 2019, 2020 සහ 2021 වර්ෂවලදී අවලංගු කර තිබුණු රු.932,643 ක්වූ නිකුත් කළ චෙක්පත් 138 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 2014 පෙබරවාරි 11 දිනැති අංක 02/2014 දරන කළමණාකරණ සේවා චක්‍රලේඛයේ 4(II) ඡේදය | පර්යේෂණය ආරම්භ කළ දින සිට මාස 06 ක් ඇතුළත පර්යේෂණ ප්‍රගතිය ඇතුළත් අන්තර් පර්යේෂණ වාර්තාවක් පර්යේෂණ කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය ඇතුළු ඉකුත් වර්ෂ 04 කදී පර්යේෂණවල ප්‍රගතිය ඇතුළත් අන්තර් පර්යේෂණ වාර්තාවක් එම කමිටුව වෙත ඉදිරිපත් කර නොතිබුණු කරාපිටිය වෛද්‍ය පීඨයේ අධ්‍යයනාංශ 17 ක අධ්‍යයන කාර්යමණ්ඩල නිලධාරීන් 358 දෙනෙකු වෙත එකතුව රු.137,268,775 ක් වූ සම්පූර්ණ පර්යේෂණ දීමනාව ගෙවා තිබුණි. |
| (ඇ) | 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා 2018 මාර්තු 19 දිනැති අංක 01/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය | වාහන අපහරණය කිරීමෙන් ලැබෙන සියලුම මුදල් ඒකාබද්ධ අරමුදලට බැරකළ යුතු වුවද, ඉකුත් වර්ෂවලදී වාහන විකිණීමෙන් ලැබී තිබුණු රු.5,203,365 ක් ඒකාබද්ධ අරමුදලට බැරකර නොතිබුණි. |
| (ඈ) | 2018 මාර්තු 19 දිනැති අංක 01/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය | 2016 වර්ෂයේ සිට ධාවනයෙන් ඉවත් කර තිබුණු අත් ට්‍රැක්ටරය හා ට්ලරය විධිමත්ව අපහරණය කිරීමට 2022 මැයි 25 දින වන විටත් කටයුතු කර නොතිබුණි. |
| (ඉ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව, 2021 දෙසැම්බර් 31 දිනට මුළු පිරිවැය රු.174,331,393 ක් වූ පරිගණක මෘදුකාංග හා දෘඩාංග සඳහා වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඊ) | 2019 ජූලි 25 දිනැති අංක SC & PMU/Grant/19 දරන විදේශ සම්පත් දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය | වෙනත් රාජ්‍යයන්, විදේශ සංවර්ධන පාර්ශවකරුවන් හා විදේශ ආයතන විසින් ලබා දෙන විදේශ ප්‍රදානයන් හා ශිල්පීය ආධාර, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා එම දෙපාර්තමේන්තුවේ අනුදැනුම හා එකඟතාවය මත ලබාගෙන මුදල් රෙගුලාසි 610 සිට මුදල් රෙගුලාසි 626 දක්වා වූ උපදෙස් ප්‍රකාරව කටයුතු කරමින් උපයෝජනය කළ යුතු වුවද, කරාපිටිය වෛද්‍ය පීඨයේ පරපෝෂී විද්‍යා අධ්‍යයනාංශය වෙත ලැබී තිබුණු රු.51,591,900 ක විදේශ ප්‍රදාන සම්බන්ධයෙන් එපරිදි කටයුතු නොකර බරවා රෝගීන් සම්බන්ධයෙන් සිදුකර තිබුණු ව්‍යාපෘතියක් සඳහා උපයෝජනය කර තිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ බලතල කර්තව්‍යයට හා කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතාකර නොමැති බව.

**2.3 වෙනත් කරුණු**

(අ) 2006 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ අවස්ථා 08 කදී පොත් හා සඟරා මිලදී ගැනීම සඳහා විදේශීය සැපයුම්කරුවන් වෙත අත්තිකාරම් ලෙස රු.553,695 ක් ගෙවා තිබුණු නමුත් 2021 දෙසැම්බර් 31 දින වන විටත් ඇනවුම් කළ පොත් හා සඟරා ලැබී නොතිබුණි. නමුත් එම පොත් හා සඟරා සපයා ගැනීමට හෝ ගෙවූ මුදල් ආපසු අයකර ගැනීමට හෝ අපොහොසත්වී තිබුණි.

(ආ) 2021 ජුනි 17 දිනැති 413 වන පාලක සභා තීරණය මඟින් 2020 ජනවාරි සිට බලපැවැත්වෙන පරිදි ඉහළ දමා තිබුණු බදු ප්‍රතිශත පදනම් කරගෙන 2020 ජනවාරි සිට 2021 ඔක්තෝබර් මාසය දක්වා වූ මාස 22 ක සඳහා වැල්ලමඩම පරිශ්‍රයේ බදු නිවාස වලින් අයවිය යුතු හිඟ බදු රු.3,498,300 ක් 2021 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ඇස්තමේන්තු පිරිවැය රු.මිලියන 341.60 ක් වූ වැල්ලමඩම පරිශ්‍රයේ ක්‍රීඩා පිටිය වැඩිදියුණු කිරීම සහ ක්‍රීඩා මණ්ඩපය ඉදිකිරීමේ කර්මාන්තයේ පස් පරීක්ෂා කිරීම සඳහා රු.200,750 ක් ද, ප්‍රසම්පාදන කමිටු දීමනා ලෙස රු.85,000 ක්ද ලංසු පිළියෙල කිරීමේ දීමනා ලෙස රු.243,576 ක්ද වශයෙන් 2017 සහ 2018 වර්ෂවලදී රු.529,326 ක් වැයකර තිබුණු නමුත්, 2021 දෙසැම්බර් 21 දින වන විටත් ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි.

(ඈ) ඇස්තමේන්තු පිරිවැය රු.මිලියන 400.42 ක් වූ වැල්ලමඩම පරිශ්‍රයේ පරිපාලන ගොඩනැගිල්ලේ ප්‍රධාන නවීකරණ කටයුතු වෙනුවෙන් උපදේශක සේවා වෙනුවෙන් හා තාක්ෂණික ඇගයීම් කමිටු දීමනා ලෙස 2020 වර්ෂයේදී රු.1,898,164 ක් වැය කර තිබුණු නමුත්, 2021 දෙසැම්බර් 21 දින වන විටත් එම නවීකරණ කටයුතු ආරම්භ කර නොතිබුණි.

(ඉ) අවශ්‍යතාවයට වඩා වැඩිපුර තොග මිලදී ගැනීම හේතුවෙන් 2022 ජුනි 23 දින වන විට පිරිවැය රු.99,092 ක් වූ තීන්ත ලීටර් 161 ක් කල් ඉකුත්වී වැල්ලමඩම නඩත්තු තොග ගබඩාව තුළ තබා තිබුණි.

(ඊ) වැල්ලමඩම පරිශ්‍රයේ හා එයට අයත් නේවාසිකාගාරවල සමාලෝචිත වර්ෂයට අදාළ විදුලි බිල්පත් සඳහා නියමිත කාලය තුළදී ගෙවීම් කර නොතිබීම හේතුවෙන් රු.53,137 ක දඩයක් ගෙවීමට සිදුවී තිබුණි. ඊට වගකිව යුතු පාර්ශවයන් හඳුනාගැනීමට හා ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය වෙනුවෙන් පිහිටුවා තිබුණු අග්‍රහාර රක්ෂණ අරමුදල් ගිණුම තර කර ගැනීම සඳහා ඉකුත් වර්ෂවලදී සැපයුම්කරුවන්ගෙන් අයකර තිබුණු ප්‍රමාද ගාස්තු රු.10,000,000 ක් යොදාගෙන තිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

## 2. විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු

**රුහුණ විශ්වවිද්‍යාලයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාවෙන් විමසීම් කරන ලද කරුණු සඳහා පිළිතුරු**

| ඡේද අංකය | විගණකාධිපති විසින් විමසීම් කරන ලද කරුණු | විශ්වවිද්‍යාලය විසින් ලබාදී ඇති පිළිතුර |
|---|---|---|
| 1<br><br>1.1 | **මූල්‍ය ප්‍රකාශන**<br><br>**<u>තත්ත්වාගණනය කළ මතය</u>**<br><br>රුහුණ විශ්වවිද්‍යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, අරමුදල් සහ සංචිත වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාර මාගේ වාර්තාව යථාකාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.<br><br>මාගේ වාර්තාවේ තත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, රුහුණ විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ. | දැන ගැනීම සඳහා |
| 1.2 | **<u>තත්වාගණනය කළ මතය සඳහා පදනම</u>**<br><br>(අ). ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1 හි 99 ඡේදට ප්‍රකාරව, සියලුම ආදායම් අතිරික්තය හෝ ඌනතාවයට ඇතුළත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළදී වැටුප් ආපසු අය කර ගැනීම්, අය කර නිබුණු බැඳුම්කර වටිනාකම් සහ ස්ථාවර තැන්පතු පොලී ආදායම් එකතුව රු. 17,202,390ක් ආදායම් ලෙස හඳුනා නොගෙන ඉන් රු.15,869,102ක් බැඳුම්කර හා ගිවිසුම් කඩකිරීමේ | 1998/08/18 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා වක්‍රලේඛ අංක 737 ප්‍රකාරව ගිවිසුම් හා බැඳුම්කර කඩකිරීම හේතුවෙන් අයකරගන්නා සියලු මුදල් වෙනම ආයෝජනය කළ යුතු අතර එමගින් උපයන ලද ආදයම් පමණක් උපයෝජනයට ප්‍රතිපාදන සලසා ඇත. ඒ අනුව එම මුදල් සීමාකරන ලද අරමුදලක් (Restricted Fund ) හෙයින්ද , ඒ අනුව කාර්යමණ්ඩල බැඳුම්කර හා ගිවිසුම් කඩවීම හේතුවෙන් අයකරගත් මුදල් ආයෝජනය කිරීම වෙනම ප්‍රතිපාදන සලසා ඇති හෙයින්ද, එදිනෙදා මෙහෙයුම් ක්‍රියාකාරකමක් මඟින් ජනිත වූ ආදායමක් |

| ඡේද අංකය | විගණකාධිපති විසින් විමසීම් කරන ලද කරුණු | විශ්වවිද්‍යාලය විසින් ලබාදී ඇති පිළිතුර |
|---|---|---|
| | අරමුදල් ගිණුමට හා රු. 1,333,288ක් අග්‍රහාර රක්ෂණ අරමුදල් ගිණුමට බැර කර තිබීම හේතුවෙන් රු. 17,202,390කින් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය හා 2021 දෙසැම්බර් 31 දිනට සමුච්චිත අරමුදල් සහ සංචිත පිළිවෙලින් අඩුවෙන් හා වැඩියෙන් දැක්වුණි. | නොවන හෙයින් ද මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයට විශ්ව විද්‍යාලයේ ආදායමක් ලෙස ඇතුලත් නොකල අතර කාර්යමණ්ඩල බැඳුම්කර හා ගිවිසුම් කඩවීම මගින් ලද මුදල් , අරමුදල් ගිණුමට බැර කර ස්ථාවර තැන්පතු හි ආයෝජනය කර ඇත. එසේම මූල්‍ය තත්ව ප්‍රකාශනයේ හා සටහන් අංක 21 හි දක්වා ඇති අතර එමගින් උපයන ලද පොලී ආදායම් විගණනය විසින් දක්වා ඇති පරිදි විශ්ව විද්‍යාල ආදායමට බැර කර මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ දක්වා ඇත. එසේම ඉහත ගිණුම්කරණ ප්‍රතිපත්තිය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වක්‍රලේඛය නිකුත් කර ඇති දින සිට මේ දක්වා අඛණ්ඩව පවත්වාගෙන එන ලද්දකි.<br><br>403 වන පාලක සභාවේ අනුමැතිය මත භාණ්ඩාගාර අරමුදල් ශේෂයන් ආයෝජනයෙන් උපයන පොලී ආදයම් රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කර ඇති අතර , **උත්පාදිත අරමුදල් මගින් උපයන ලද පොලී ආදායම්** පමණක් අග්‍රහාර රක්ෂණ දායක මුදල් ගෙවීමට 2018/15 හා 2018.12.10 දිනැති වි.වි.ප්‍ර.කොමිෂන් සභා වක්‍රලේඛයට අනුව අග්‍රහාර රක්ෂණ අරමුදලට බැර කර ඇත.<br><br>එසේම විගණනය විසින් දක්වා ඇති පරිදි ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ සංශෝධනය කර ඉදිරිපත් කරනු ඇත. |
| | (ආ). ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායි ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබීම හේතුවෙන් පිරිවැය රු. 6,880,250ක් වූ වාහන 08ක් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු නමුත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | 1/2017 කොම්ප්‍රොලර් ජෙනරාල් කාර්යාලයේ වත්කම් කලමනාකරණ වක්‍රලේඛය ප්‍රකාරව සියලුම මෝටර් රථ තක්සේරුව මගින් සිදුකල යුතුය. ඒ අනුව 2019 වර්ෂයේ රුහුණ විශ්වවිද්‍යාලයේ මෝටර් වාහන තක්සේරු කරන ලෙස ඉල්ලුම් කරන ලදී.ඒ අනුව 2021/12/31 දිනට විශ්වවිද්‍යාලය සතු වාහන 55 න් 47ක් තක්සේරු කර ඇති අතර ඉතිරි වාහන 8 අදාල තක්සේරු වාර්ථා මේ වන තෙක් ලැබී නොමැත.<br><br>ඒ අනුව මෙම කාරණය විශ්වවිද්‍යාල පාලනයෙන් තොරවූ කාරණාවක් හෙයින් බාහිර පාර්ශවයන්ගෙන් තක්සේරු කරගැනීමට ඉහත වක්‍රලේඛය ප්‍රකාරව අවකාශ නොමැති හෙයින් ද මෙම විමසුම් මතය සඳහා වූ එම තක්සේරු කරන ලද සියලු මෝටර් රථ ශ්‍රීලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන වල ගැලපීම සිදුකර ඇත. |
| | (ඇ). 2021 දෙසැම්බර් 31 දිනට ජංගම වගකීම් යටතේ දක්වා තිබුණු විලම්භීත ආදායම රු.244,076,700 ක් වූ අතර ඒ ඒ වර්ෂය සඳහා හඳුනාගත යුතු ආදායම ක්‍රමක්ක්ෂය කර නොතිබීම හේතුවෙන් ඉන් රු.20,544,858ක් වර්ෂ ගණනාවක සිට නොවෙනස්ව පැවතුණි. | රු. 20,544,858 ක මුදල ප්‍රවර්ථන වර්ෂයේ විලම්භිත කල ආදායමේ ප්‍රමාණය හා ශේෂ පත්‍රයේ දක්වා ඇති විලම්භීත ශේෂයේ අතර වෙනස වේ. එම ශේෂය අවසන් කරන ලද පාඨමාලවන්ට අදාලව එක් එක් සංවර්ධන අරමුදල් සඳහා බෙදාහැරිය යුතු ඉතිරි ශේෂයන්ගෙන් සමන්විත වේ. මේ වනවිට එම පාඨමාලාවන්හි අවසාන ගිණුම් පිලියෙල කර එම ශේෂයන් සංවර්ධන වැය ශීර්ෂයන් අතරේ බෙදා හැර ඇත. |
| | (ඈ). විශ්වවිද්‍යාලයේ වැල්ලමඩම පරිශ්‍රයේ, හපුගල ඉංජිනේරු පීඨයේ හා මාපලාන කෘෂි පීඨයේ ස්ථාපිත කර තිබුණු සන්නිවේදන කුළුණු වෙනුවෙන් 2021 දෙසැම්බර් 31 දින වන විට අයවිය යුතු කුලී රු.3,930,000ක නිවැරදිතාවය තහවුරු කර ගැනීම සඳහා විශ්වවිද්‍යාලය අදාළ සන්නිවේදන සේවා සමාගම සමඟ එළඹී එකඟතා ගිවිසුම් විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. | වැල්ලමඩම පරිශ්‍රයේ හා ඉංජිනේරු පීඨ සන්නිවේදන කුලුන ලබාදීම සඳහා අවශ්‍ය ගිවිසුම් හා එකඟතාවයන් කෙටුම්පත් කරමින් පවතී. විධිමත් ගිවිසුම් බැඳීමක් නොමැති වීම හේතුවෙන් හා එම විදුලි බිල්පත් ගෙවීමට එකඟතාවයක් ලැබී නොමැති හෙයින් කුලුනට විදුලිය සැපයීම වෙනුවෙන් ලැබිය යුතු මුදලක් ලෙස අන්තර්ගත කළ නොහැකි අතර, අදාළ පාර්ශවය ගෙවීමට එකඟ වූ පසු එම මුදල මූල්‍ය ප්‍රකාශනයන්ට ලැබිය යුතු මුදලක් සේ ගිණුම්ගත කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව විගණනය අවධානය යොමු කරමි. |

| ඡේද අංකය | විගණකාධිපති විසින් විමසීම් කරන ලද කරුණු | විශ්වවිද්‍යාලය විසින් ලබාදී ඇති පිළිතුර |
|---|---|---|
| | ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. | |
| 1.3 | **<u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්</u>**<br><br>මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.<br><br>මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.<br><br>විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.<br><br>2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උපවගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. | දැන ගැනීම සඳහා |
| 1.4 | **<u>මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම</u>**<br><br>සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන | දැන ගැනීම සඳහා |

| ඡේද අංකය | විගණකාධිපති විසින් විමසීම් කරන ලද කරුණු | විශ්වවිද්‍යාලය විසින් ලබාදී ඇති පිළිතුර |
|---|---|---|
| | ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් මත රදා පවතී.<br><br>ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැක මුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,<br><br>• ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමෙන් අවදනම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.<br><br>• අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.<br><br>• භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.<br><br>• සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා | දැන ගැනීම සඳහා |

| ඡේද අංකය | විගණකාධිපති විසින් විමසීම් කරන ලද කරුණු | විශ්වවිද්‍යාලය විසින් ලබාදී ඇති පිළිතුර |
|---|---|---|
| | විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.<br><br>• මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.<br><br>මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි. | දැන ගැනීම සඳහා |
| 2 | <u>වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව</u> | දැන ගැනීම සඳහා |
| 2.1 | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ. | |
| 2.1.1 | මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා විශ්වවිද්‍යාලය පවත්වාගෙන ගොස් නිබුණි. | |
| 2.1.2 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ. | |
| 2.1.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (I) (ඈ) (IV) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත. | |

<table>
<tr><th>ඡේද අංකය</th><th>විගණකාධිපති විසින් විමසීම් කරන ලද කරුණු</th><th>විශ්වවිද්‍යාලය විසින් ලබාදී ඇති පිළිතුර</th></tr>
<tr><td>2.2</td><td>අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.</td><td rowspan="2">දැන ගැනීම සඳහා</td></tr>
<tr><td>2.2.1</td><td>2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට විශ්වවිද්‍යාලය සම්බන්ධව යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.</td></tr>
<tr><td>2.2.2</td><td>2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.
<table>
<tr><th>නීතිරීති විධානයට යොමුව</th><th>නිරීක්ෂණය</th></tr>
<tr><td>(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 394 (ඇ)</td><td>විශ්වවිද්‍යාලයේ පීඨ හා ඒකක 05 කට අදාළව 2019, 2020 සහ 2021 වර්ෂ වලදී අවලංගු කර තිබුණු රු. 932,643 ක් වූ නිකුත් කළ චෙක්පත් 138 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.</td></tr>
<tr><td>(ආ) 2014 පෙබරවාරි 11 දිනැති අංක 02/2014 දරණ කළමණාකරණ සේවා චක්‍රලේඛය 4(II) ඡේදය</td><td>පර්යේෂණ ආරම්භ කළ දින සිට මාස 06 ක් ඇතුළත පර්යේෂණ ප්‍රගතිය ඇතුළත් අන්තර් පර්යේෂණ වාර්තාවක් කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කළ යුතු වූවද, සමාලෝචිත වර්ෂය ඉකුත් වර්ෂ 04කදී පර්යේෂණවල ප්‍රගතිය ඇතුළත් අන්තර් පර්යේෂණ වාර්තාවක් එම</td></tr>
</table></td><td>චෙක්පත් හි වලංගු කාලය ඉක්මවීම හේතුවෙන් එම චෙක්පත් තාවකාලිකව අවලංගු චෙක්පත් ගිණුමට බැර කර , අදාල චෙක්පත් නිකුත් කල පාර්ශවයන්ට අදාල චෙක්පත් හී කාලය දීර්ඝ කර ගන්නා ලෙස උපදෙස් දී ඇත .එසේ කාලය දීර්ඝ කර නොගත් හා නැවත චෙක්පතක් නිකුත් නොකර අවලංගු කරන ලද චෙක්පත් (Cheques cancelled with no cheque issued in lieu ) සම්බන්ධයෙන් විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි මුදල් රෙගුලාසි 394 ප්‍රකාරව අවශ්‍ය කටයුතු සිදු කරනු ඇත.<br><br>පර්යේෂණ දීමනා ගෙවීම් සඳහා පර්යේෂණ යෝජනාවක් ඉදිරිපත් කරන අවස්ථාවේදීම ඊට පෙර වසර සඳහා ඉදිරිපත් කරන ලද යෝජනාවේ පර්යේෂණ වාර්තාව අනිවාර්යයෙන්ම ඉදිරිපත් කළ යුතුවේ<br><br>මාස 06කට වරක් පර්යේෂණ යෝජනාවට අදාලව ප්‍රගතිය ඇතුලත් වාර්තාවක් ලබා ගැනීම ප්‍රායෝගිකව අපහසු වන අතර ඉදිරියේදී එය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.</td></tr>
</table>

| ඡේද අංකය | විගණකාධිපති විසින් විමසීම් කරන ලද කරුණු | | විශ්වවිද්‍යාලය විසින් ලබාදී ඇති පිළිතුර |
|---|---|---|---|
| 2.2.2 | නීතිරීති විධානයට යොමුව | නිරීක්ෂණය | |
| | | කමිටුව වෙත ඉදිරිපත් කර නොතිබුණු කරාපිටිය වෛද්‍ය පීඨයේ අධ්‍යයනාංශ 17 ක අධ්‍යයන කාර්යමණ්ඩල නිළධාරීන් 358 දෙනෙකු වෙත එකතුව රු. 137,268,775ක් වූ සම්පූර්ණ පර්යේෂණ දීමනා ගෙවා තිබුණි. | |
| | (ඇ) 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා 2018 මාර්තු 19 දිනැති අංක 01/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය විගණන විමසුමෙන්ද කළමනාකරණය දැනුවත් කර තිබුණද නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වාහන අපහරණය කිරීමෙන් ලැබෙන සියලුම මුදල් ඒකාබද්ධ අරමුදලට බැරකළ යුතු වුවද, ඉකුත් වර්ෂවලදී වාහන විකිණීමෙන් ලැබී තිබුණු රු.5,203,365 ක් ඒකාබද්ධ අරමුදලට බැරකර නොතිබුණි. | විගණනයේ නිරීක්ෂණ සමඟ එකඟවේ. මහා භාණ්ඩාගාරයෙන් ප්‍රමානවත් පරිදි අරමුදල් නොලැබීම හේතුවෙන් , එම මුදල් ආපසු හරවා යවා නොමැති අතර 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙල කිරීමේදී අදාල මුදල රජයේ ආදායමට බැර කරනු ඇත. |
| | (ඇ) 2018 මාර්තු 19 දිනැති අංක 01/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛ | 2016 වර්ෂයේ සිට ධාවනයෙන් ඉවත් කර තිබුණු අත් ට්‍රැක්ටරය හා ට්‍රේලරය විධිමත්ව අපහරණය කිරීමට 2022 මැයි 25 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | මෙම අත් ට්‍රැක්ටරය වසර 20ක් පමණ පැරණි විශ්වවිද්‍යාලය ආරම්භයේදී මිලදී ගත් එකකි. 2012 සිට මෙම අත්ට්‍රැක්ටරය අලුත්වැඩියා කිරීම නිරන්තරව සිදුවීම නිසා 2016 වසරේදී නඩත්තු අංශය සඳහා අලුතෙන් අත් ට්‍රැක්ටරයක් හා ට්‍රේලරයක් මිලදී ගන්නා ලදී. ඒ නිසා මෙම අත්ට්‍රැක්ටරය භාවිතයෙන් ඉවත්කර අපහරණය කිරීම සඳහා පාලන අංශය දැනුවත් කර ඇත. මෙම අත්ට්‍රැක්ටරය ආරක්ෂිතව රඳවා තැබීම සඳහා යාන්ත්‍රික කොටස නඩත්තු අංශයේත් අත්ට්‍රැක්ටර් රථ ගාලේත් ට්‍රේලරය නඩත්තු අංශ පරිශ්‍රය තුල ගාල් කර ඇත. මෙම ට්‍රේලරයද භාවිතයට නුසුදුසු තත්ත්වයක පවතී. |
| | (ඉ) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව, 2021 දෙසැම්බර් 31 දිනට මුළු පිරිවැය රු.174,331,393 ක් වූ පරිගණක මෘදුකාංග හා | රුහුණ විශ්වවිද්‍යාලය සතුව පරිගණකගත කළ ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යන අතර මෙය තුළ විශ්වවිද්‍යාලයේ ස්ථාවර වත්කම් ඇතුළත් කර යාවත්කාලීන කර ඇත. එම පරිගණක මෘදුකාංගය තුළින් සියලුම ස්ථාවර වත්කම් ආවරණය වන පරිදි සකසා ඇති හෙයින් පරිගණක මෘදුකාංග හා දෘඩාංග සඳහා දත්ත හා තොරතුරු ලබාගැනීමට හැකියාව පවතී. මීට අතිරේකව අදාළ චක්‍රලේඛ ප්‍රකාරව පරිගණක මෘදුකාංග හා දෘඩාංග |

| ඡේද අංකය | විගණකාධිපති විසින් විමසීම් කරන ලද කරුණු | | විශ්වවිද්‍යාලය විසින් ලබාදී ඇති පිළිතුර |
|---|---|---|---|
| | නීතිරීති විධානයට යොමුව | නිරීක්ෂණය | |
| | | දෘඩාංග සඳහා වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | සම්බන්ධයෙන් ඒ ඒ මෘදුකාංග භාවිතා කරන අංශවල වෙන වෙනම ලිපිගොනු පවත්වාගෙන යන අතර ඒ තුළින් තොරතරු ලබා ගැනීමට හැකියාව පවතී. |
| | (ඊ) 2019 ජූලි 25 දිනැති අංක SC & PMU/Grant/19 දරන විදේශ සම්පත් දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය | වෙනත් රාජ්‍යයන්, විදේශ සංවර්ධන පාර්ශවකරුවන් හා විදේශ ආයතන විසින් ලබා දෙනු ලබන විදේශ ප්‍රදානයන් හා ශිල්පීය ආධාර, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා එම දෙපාර්තමේන්තුවේ අනුදැනුම හා එකඟතාවය මත ලබාගෙන මුදල් රෙගුලාසි 610 සිට මුදල් රෙගුලාසි 626 දක්වා වූ උපදෙස් ප්‍රකාරව කටයුතු කරමින් උපයෝජනය කළ යුතු වුවද, කරාපිටිය වෛද්‍ය පීඨයේ පරපෝෂී විද්‍යා අධ්‍යයනාංශය වෙත ලැබී තිබුණු රු.51,591,900 ක විදේශ ප්‍රදාන සම්බන්ධයෙන් එපරිදි කටයුතු නොකර බරවා රෝගීන් සම්බන්ධයෙන් සිදුකර තිබුණු ව්‍යාපෘතියක් සඳහා උපයෝජනය කර තිබුණි. | මෙම මූල්‍ය ප්‍රදානයන්ට අදාලව විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට අදාල කටයුතු සිදුකර ඇත. |
| 2.2.3 | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ බලතල , කර්තව්‍යයට හා කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව. | | දැන ගැනීම සඳහා |
| 2.2.4 | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව. | | දැන ගැනීම සඳහා |

| ඡේද අංකය | විගණකාධිපති විසින් විමසීම් කරන ලද කරුණු | විශ්වවිද්‍යාලය විසින් ලබාදී ඇති පිළිතුර |
|---|---|---|
| 2.3 | **වෙනත් කරුණු**<br><br>(අ) 2006 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ අවස්ථා 08කදී පොත් හා සඟරා මිලදී ගැනීම සඳහා විදේශීය සැපයුම්කරුවන් වෙත අත්තිකාරම් ලෙස රු.553,695 ක් ගෙවා තිබුණු අතර 2021 දෙසැම්බර් 31 දින වන විටත් ඇනවුම් කළ පොත් හා සඟරා ලැබී නොතිබුණි. නමුත් එම පොත් හා සඟරා සපයා ගැනීමට හෝ ගෙවූ මුදල් ආපසු අයකර ගැනීමට හෝ අපොහොසත් තිබුණි. | විගණනය විසින් දක්වා ඇති විදේශීය සැපයුම්කරුවන් වෙත ගෙවන ලද රු.553,695 ක මෙතෙක් නොපියවූ අත්තිකාරම් ශේෂය පිලිබඳ විශේෂ අභ්‍යන්තර විගණනයක් සිදු කර ඇති අතර එම අභ්‍යන්තර විගණන නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිණිස මුදල් කමිටුවේ නිර්දේශ මත පාලක හා අනුමැතියට ඉදිරිපත් කර ඇත. ඒ අනුව මේ වනවිට 423 වන පාලක සභාවේ අනුමැතිය මත (ඇමුණුම 01 ) ඉහත ශේෂය සම්බන්ධයෙන් අදාල ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| | **(ආ)** 2021 ජුනි 17 දිනැති 413 වන පාලක සභා තීරණය මගින් 2020 ජනවාරි සිට බලපැවැත්වෙන පරිදි ඉහළ දමා තිබුණු බදු ප්‍රතිශත පදනම් කරගෙන 2020 ජනවාරි සිට 2021 ඔක්තෝබර් මාසය දක්වා වූ මාස 22 ක සඳහා වැල්ලමඩම පරිශ්‍රයේ බදු නිවාස වලින් අයවිය යුතු හිඟ බදු රු. 3,498,300ක් 2021 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | දිගින් දිගටම රටේ පවතින අර්බුදකාරී තත්වය නිසා මෙයට අදාළ බදු මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් පාලක සභාවෙන් තීරණයක් ගැනීම ප්‍රමාද වී තිබේ. ඒ ඒ පුද්ගලයන්ගෙන් අයවිය යුතු හිඟ බදු මුදල් ප්‍රමාණය ගණනය කිරීම් තරමක් සංකීර්ණ කටයුත්තකි. මෙම බදු මුදල් නැවත අයකර ගැනීම් සම්බන්ධයෙන් අවසාන තීරණයක් පාලක සභාවෙන් ගෙන අදාළ බදු මුදල් නැවත අයකර ගැනීමට මේ වසර තුළ සිදුකිරීමට සැලසුම් කර තිබේ. අදාල බදු මුදල් නැවත අයකර ගැනීම සිදු කරන ආකාරය සම්බන්ධයෙන් මේ වන විට සාකච්ඡා කරමින් සිටී. |
| | (ඇ) ඇස්තමේන්තු පිරිවැය රු.මිලියන 341.60ක් වූ වැල්ලමඩම පරිශ්‍රයේ ක්‍රීඩා පිටිය වැඩිදියුණු කිරීම සහ ක්‍රීඩා මණ්ඩපය ඉදිකිරීමේ කර්මාන්තයේ පස් පරීක්ෂාව කිරීම සඳහා රු. 200,750ක් ද, ප්‍රසම්පාදන කමිටු දීමනා ලෙස රු.85,000ක් ද ලංසු පිළියෙල කිරීමේ දීමනා ලෙස රු.243,576 ක්ද වශයෙන් 2017 සහ 2018 වර්ෂවලදී රු.529,326ක් වැයකර තිබුණු නමුත්, 2021 දෙසැම්බර් 21 දින වන විටත් ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. | රුහුණ විශ්වවිද්‍යාලයේ වැල්ලමඩම පරිශ්‍රයේ ක්‍රීඩා පිටිය වැඩිදියුණු කිරීම සහ ක්‍රීඩා මණ්ඩපය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා මූලික ඇස්තමේන්තු සහ ව්‍යාපෘති යෝජනා සකස් කර ඉදිරි කටයුතු සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කරන ලද අතර 2018.07.18 වැනි දින උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මෙම ව්‍යාපෘතිය සඳහා මූල්‍ය ප්‍රතිපාදන වෙන් කරන ලද බවත් කැබිනට් අනුමැතිය ලද බවත් ප්‍රසම්පාදන කටයුතු අරඹන ලෙසත් දන්වන ලදී. (ඇමුණුම 02)<br><br>මෙම ව්‍යාපෘතියේ මූලික සැලසුම් සකස් කිරීම සඳහා පස් සාම්පල් අංශු (Soil Test) පරීක්ෂා කිරීමට අවශ්‍ය විය. පස් සාම්පල් අංශු පරීක්ෂා කිරීම සඳහා මිළ ගණන් කැඳවීමෙන් අනතුරුව තෝරා ගත් උපදේශන ආයතනයට රු. 200,750.00 මුදලක් ගෙවීමට සිදුවිය. (ඇමුණුම 03) මෙයට අමතරව උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටු සාමාජිකයින්ගට රු. 85,000.00ක මුදලක් ගෙවීමට සිදුවිය. (ඇමුණුම 04) එමෙන්ම ලංසුපත් පිළියෙල කිරීමේ කමිටුව සඳහා රු.243,575.65ක ගෙවීමක් සිදුකරන ලදී. (ඇමුණුම 05) ඒ අනුව මෙම ව්‍යාපෘතියේ මූලික වැඩ කටයුතු සඳහා රු. 529,325.65ක මුදලක් දැරීමට විශ්වවිද්‍යාලයට සිදු විය.<br><br>මෙම ව්‍යාපෘතිය සඳහා ලංසු කැඳවා ලංසු ඇගයීම් කටයුතු සිදු කර නිමවුවත්, 2020.09.14 වන දින මුදල් අමාත්‍යාංශය විසින් යොමු කරන ලද කැබිනට් අනුමැතිය අනුව, මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ වැඩ කටයුතු වෙනත් අදියරකදී ආරම්භ කරන ලෙස දන්වන ලදී. (ඇමුණුම 06) එම නිසා මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට නොහැකි විය. |

| ඡේද අංකය | විගණකාධිපති විසින් විමසීම් කරන ලද කරුණු | විශ්වවිද්‍යාලය විසින් ලබාදී ඇති පිළිතුර |
|---|---|---|
| | (ඇ) ඇස්තමේන්තු පිරිවැය රු.මිලියන 400.42ක් වූ වැල්ලමඩම පරිශ්‍රයේ පරිපාලන ගොඩනැගිල්ලේ ප්‍රධාන නවීකරණ කටයුතු වෙනුවෙන් උපදේශක සේවා වෙනුවෙන් හා තාක්ෂණික ඇගයීම් කමිටු දිමනා ලෙස 2020 වර්ෂයේදී රු.1,898,164ක් වැය කර තිබුණු නමුත්, 2021 දෙසැම්බර් 21 දින වන විටත් එම නවීකරණ කටයුතු ආරම්භ කර නොතිබුණි. | රුහුණ විශ්වවිද්‍යාලයේ වැල්ලමඩම පරිශ්‍රයේ පරිපාලන ගොඩනැගිල්ලේ ප්‍රධාන නවීකරණ කටයුතු ආරම්භ කිරීම සඳහා 2018.09.11 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණි. ඉන් අනතුරුව උපකුලපතිතුමාගේ අනුමැතිය මත තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කරන ලදී. විශ්වවිද්‍යාල ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මත ජාතික තරඟකාරී ලංසු පටිපාටිය අනුගමනය කරමින් ලංසු කැඳවීම සඳහා 2020.06.02 දින පුවත්පත් දැන්වීම් පළ කරන ලදී. ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මත ඩැරින්ටන් කන්ස්ට්‍රක්ෂන් ආයතනය වෙත මෙම කොන්ත්‍රාත්තුව පිරිනමන ලදී.<br><br>ඉන් අනතුරුව කොන්ත්‍රාත්කරු විසින් සම්පූර්ණ ගොඩනැගිල්ලම පුනරුත්ථාපන වැඩ කටයුතු ආරම්භ කිරීම සඳහා ලබා දෙන ලෙස ඉල්ලීම් කරන ලදී. පරිපාලන ගොඩනැගිල්ල තුළ පවතින මූල්‍ය අංශයේ වාර්ෂික අවසන් ගිණුම් සකස් කිරීමේ වැඩ කටයුතු සිදුකල බැවින් සම්පූර්ණයෙන්ම එකවර ලබා දිය නොහැකි වූ එම අංශය හැර අනෙකුත් නිදහස් කළ හැකි අංශවල වැඩ ආරම්භ කරන ලෙස වැඩ ඉංජිනේරුතුමා විසින් කොන්ත්‍රාත්කරුට උපදෙස් ලබා දී ඇත. එමෙන්ම කොන්ත්‍රාත්කරු විසින් අත්තිකාරම් මුදල් ඉල්ලුම් කර තිබුනද එවකට පැවති මූල්‍ය අපහසුතා හේතුවෙන් අත්තිකාරම් මුදල් ලබාදීමට නොහැකි විය.<br><br>2021.01.19 දී පැවති ප්‍රසම්පාදන කමිටු තීරණයට හා 2021.02.24 දින පැවති පාලක සභා තීරණයට අනුව ද්විපාර්ශවීය එකඟතාවයක් මත කොන්ත්‍රාත්තුව අත්හිටුවීමට තීරණය කරන ලදී. (ඇමුණුම 07 හා 08) ඒ අනුව 2021.09.14 දින කොන්ත්‍රාත්තුව අත්හිටුවීමට අදාල ගිවිසුම අත්සන් කරන ලදී.<br><br>මෙම ව්‍යාපෘතියේ උපදේශන සමාගම වූ ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට ලංසුපත් සකස් කිරීම සඳහා රු. 1,867,164.38ක මුදලක් උපදේශන සමාගම සමඟ ඇතිකරගත් ගිවිසුම ප්‍රකාරව ගෙවීමට සිදු විය. (ඇමුණුම 09)<br><br>මෙයට අමතරව තාක්ෂණ ඇගයීම් කමිටුව සඳහා රු. 31,000.00ක මුදලක් ගෙවීමට සිදු විය. (ඇමුණුම 10) ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුව කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමෙන් අනතුරුව මෙම මුදල් ගෙවීම් කළ යුතුව ඇත.<br><br>මෙම ව්‍යාපෘතිය වෙනත් අදියරකදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරයි. |
| | (ඉ) අවශ්‍යතාවයට වඩා වැඩිපුර තොග මිලදී ගැනීම හේතුවෙන් 2022 ජූනි 23 දින වන විට පිරිවැය රු. 99,092ක් වූ තීන්ත ලීටර් 161ක් කල් ඉකුත් වී වැල්ලමඩම නඩත්තු තොග ගබඩාව තුළ තබා තිබුණි. | මෙම තීන්ත මිලදී ගනු ලැබුවේ 2020 වර්ෂයට අවශ්‍ය වන අවම තීන්ත ප්‍රමාණය සැලකිල්ලට ගෙනය. කෙසේ වෙතත් කොවිඩ් 19 තත්ත්වය හේතුවෙන් මාස කිහිපයක් විශ්වවිද්‍යාලය වසා තැබීමට සිදුවීම නිසා අපේක්ෂිත පරිදි නඩත්තු කටයුතු සිදු කර ගැනීමට නොහැකි විය. |

| ඡේද අංකය | විගණකාධිපති විසින් විමසීම් කරන ලද කරුණු | විශ්වවිද්‍යාලය විසින් ලබාදී ඇති පිළිතුර |
|---|---|---|
| | (ඊ) වැල්ලමඩම පරිශ්‍රයේ හා එයට අයත් නේවාසිකාගාරවල සමාලෝචිත වර්ෂයට අදාළ විදුලි බිල්පත් සඳහා නියමිත කාලය තුළදී ගෙවීම් කර නොතිබීම හේතුවෙන් රු. 53,137ක දඩයක් ගෙවීමට සිදුවී තිබුණි. ඊට වගකිව යුතු පාර්ශවයන් හඳුනාගැනීමට හා ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල බිල්පත් ගෙවීම් ප්‍රමාද වී ඇත්තේ එවකට රටේ පැවැති වසංගත තත්වය නිසා එම බිල්පත් ගෙවීම් සඳහා සැකසීම ප්‍රමාදව වීම නිසාය. මෙම තත්ත්වය නිසා විශාල කාල පරිච්ඡේදයක් රට වසා දමා තිබූ අතර එම කාලය තුළ දී අදාළ බිල්පත් වලට ගෙවීම් සිදු කිරීමට නොහැකි වී තිබේ. එසේම ඉදිරියේදී සිදුවිය හැකි මෙවැනි ප්‍රමාදයන් වලකා ගැනීම සඳහා බිල්පත් ප්‍රමාදවී පාලන අංශයට ලැබීම වලලකා ගැනීම සඳහා එම නේවාසිකාගාරවල උප ශාලාධිපතිවරුන් වෙත ලබාදී තිබේ.එවකට රටේ පැවතුණු වසංගත තත්ත්වයෙන් සැලකිල්ලට ගෙන මෙම දඩ මුදල් වලින් විශ්වවිද්‍යාලය නිදහස් කරන ලෙස ඉල්ලීමක් ලංකා විදුලිබල මණ්ඩලයෙන් ඉල්ලීමක් සිදුකර තිබේ. |
| | (උ) විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය වෙනුවෙන් පිහිටුවා තිබුණු අග්‍රහාර රක්ෂණ අරමුදල් ගිණුම තර කර ගැනීම සඳහා ඉකුත් වර්ෂවලදී සැපයුම්කරුවන්ගෙන් අයකර තිබුණු ප්‍රමාද ගාස්තු රු.10,000,000ක් යොදාගෙන තිබුණි. | විගණනය විසින් දක්වා ඇති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 1998 අගෝස්තු 18 දිනැති අංක 737 දරණ වක්‍රලේඛය මඟින් කාර්යමණ්ඩල බැඳුම්කර හා ගිවිසුම් කඩකිරීම මත අයකරනු ලබන මුදල් වෙනුවෙන් පමණක් වන අතර අග්‍රහාර රක්ෂණය සඳහා යොදාගෙන ඇත්තේ විශ්වවිද්‍යාලයට භාණ්ඩාගාරයෙන් ලද භාණ්ඩාගාර අරමුදල් නොව සැපයුම්කරුවන්ගෙන් අයකරගන්නා ලද ගිවිසුම් කඩවීම් මගින් අයකරගත් අරමුදල් මගින් බව විගණනයේ කාරුණික අවධානයට යොමු කරමි. |

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුජීව අමරසේන
උපකුලපති
රුහුණ විශ්වවිද්‍යාලය